# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,948 - 2016 ජනවාරි මස 01 වැනි සිකුරාද - 2016.01.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 2736 |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 02 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1 - B 81018 — 5,447 (2016/01)
F 1 -

# අතුරු ව්‍යවස්ථා

**බදුල්ල මහා නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 267 (1) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 272 වන වගන්තිය යටතේ මහා නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව බදුල්ල මහා නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තිය සමඟ කියවිය යුතු, ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය චාමර සම්පත් දසනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 ක් වූ නොවැම්බර් මස 18 වැනි දින,

චාමර සම්පත් දසනායක,
පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
ඌව පළාත් සභාව.

**01 වන කොටස**

***සියළු අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා***

1. බදුල්ල මහා නගර සභාව විසින් මේ අතුරු ව්‍යවස්ථා යථා පරිදි පිළිගනු ලැබීමෙන් අනතුරුව, මේ අතුරු ව්‍යවස්ථාවල 02 වන කොටසේ XXXI සිට LII වන කොටස දක්වා වන කොටස්වල ඇතුළත් අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

''කොමසාරිස්වරයා'' යන්නෙන්, අදාළ බදුල්ල මහා නගර සභාවේ කොමසාරිස්වරයා ද,

''ලේකම්වරයා'' යන්නෙන්, අදාළ බදුල්ල මහා නගර සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියෙකු ද,

''බදුල්ල මහා නගර සභා ප්‍රදේශය'' යන්නෙන්, බදුල්ල මහා නගර සභාව සංයුක්ත වන බල ප්‍රදේශය ද,

''බදුල්ල මහා නගර සභාව'' යන්නෙන්, බදුල්ල මහා නගර සභාව ද,

''පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය'' යන්නෙන්, කවර හෝ දිනයක පෙරවරු 06.00 සිට පස්වරු 06.00 දක්වා කාලය අදහස් වන අතර මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක ඊට පටහැනි වෙනත් යම් සාධාරණ වේලාවක් එකී කොටසේ විශේෂයෙන් සඳහන් කර නියම කරනු ලැබ ඇත්නම්, එකී කොටසේ සඳහන් නියමයන් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට එසේ විශේෂයෙන් සඳහන් කළ කාලය අදහස් විය යුතු ය,

''පොදු ජල මාර්ගය'' යන්නෙන්, ගඟක්, ඇලක්, දොළක්, දිය පාරක්, ළිඳක්, වැවක්, පොකුණක්, කාණුවක් හා අදහස් වන අතර බලපත්‍ර ලත් ස්ථානය ඇතුළත අප ජලය ගලා යාමට ඉදිකර ඇති යම් කාණුවක් ඇතුළත් නොවිය යුතු ය,''පොදු ස්ථානය'', යන්නෙන්, කිසියම් මාර්ගයක්, මං මාවතක්, වීථියක්, පටු මඟක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම් පොළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇලක්, දොළක්, වැවක්, පොකුණක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, බස් නැවතුම් පොළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන් කර ඇති රජය සතු යම් ඉඩමක් හෝ මහජනතාවගේ පොදු පරිහරනයට ලක්වන වෙනත් ඕනෑම පොදු ස්ථානයක් ද,

''සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි යන්නෙන්'' බදුල්ල මහා නගර සභා ප්‍රදේශය ආවරණය වනසේ පත්කර ඇති සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිළධරයෙක් සහ සේවා අධ්‍යක්ෂවරයා ද, ඒ සෞඛ්‍ය වෛද්‍ය නිළධරයා හෝ ඒ සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිළධරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තකු ඊට අදාළ වේ.

''බලපත්‍රලාභියා'' යන්නෙන්, මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තෙකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන් හි පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

''බලපත්‍ර ලත් ස්ථානය'' යන්නෙන්, මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, තත්කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති බදුල්ල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද,

අදහස් වේ.

2. 1 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නොවන එහෙත් මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක සඳහන් වන වෙනත් කිසියම් පදයක් හෝ පද සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් අවශ්‍ය වන අවස්ථාවක, එකී පදය හෝ පද සම්බන්ධ අර්ථ නිරූපණය ඒ කොටස අවසානයේ විශේෂයෙන් සඳහන් කර ඇති අර්ථ නිරූපණය ඒ කොටසට පමණක් අදාළව බලපැවැත්විය යුතු ය.

01 - II වන කොටස

*සියළුම අතුරු ව්‍යවස්ථාවලට ම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. මේ අතුරු ව්‍යවස්ථාවල 02 වන කොටසේ XXXI සිට LII වන කොටස දක්වා වන කවර හෝ කොටසක් යටතේ බදුල්ල මහා නගර සභාව විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියෙකු විසින් කවර හෝ යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක්, -

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපෑලට භාර දෙනු ලැබුවහොත්, හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්, හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්, හෝ

එකී දැන්වීම නිසි ආකාරයෙන් භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කවර ආකාරයකින් හෝ භාර දීම නීත්‍යානුකූල විය යුතු ය.

2. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ කොමසාරිස්වරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් බදුල්ල මහා නගර සභාවේ කවර හෝ නිලධාරියෙකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තෙකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත්ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මේ අතුරු ව්‍යවස්ථාවලින් නාගරික කොමසාරිස්වරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍ර ලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

XXXI වන කොටස

*ප්‍රචාරක දැන්වීම්*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමග කියවිය යුතු 27 වැනි උප වගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ යම් වීථියක, පාරක, ඇළක හෝ වැවක සිට පෙනෙන පරිදි දැන්වීම් තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම හෝ පාලනය කිරීම සහ එසේ දැන්වීම් තැබීම සහ ප්‍රදර්ශනය කිරීම පිළිබඳ සාදන ලද අතුරු ව්‍යවස්ථාවට අනුකූලව තබනු ලබන හෝ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01 බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ යම් පොදු ස්ථානයක යම් වීථියක, පාරක, ඇළක හෝ වැවක සිට පෙනෙන පරිදි දැන්වීම් තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම, හෝ පාලනය කිරීම සහ ඒ වෙනුවෙන් ගාස්තු අයකිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාව යි.

02 බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ කවරේද? යන්න බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකිය. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශ පිළිබඳ කලින් කළ බදුල්ල මහා නගර සභාව විසින් ගනු ලබන තීරණය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට සැළැස්වීම

කොමසාරිස්වරයාගේ කාර්යය වන අතර, එකී නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනය හෝ එහි නිශ්චිතව දැක්වෙන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

03 *(අ)* ඉහත 02 වන වගන්තිය යටතේ බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු කවර හෝ ප්‍රදේශයක බදුල්ල මහා නගර සභාව සතු කවර හෝ ඉඩමක හෝ බදුල්ල මහා නගර සභාව විසින් ඇති කර ගනු ලබන ගිවිසුමක් අනුව ලබා ගන්නා වෙනත් කිසියම් තැනැත්තකු සතු ඉඩමක හෝ මාර්ග රක්ෂිතයක හෝ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කළ හැකි දැකුම් පැළැලි ඉදිකර පවත්වාගෙන යාමට බදුල්ල මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදය යටතේ බදුල්ල මහා නගර සභාව විසින් ඉදි කරනු ලැබ ඇති කිසියම් දැකුම් පැළැල්ලක හෝ වෙනත් ස්ථානයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා බදුල්ල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන වාර්ෂික *ගැසට් පත්‍ර* මගින් ප්‍රකාශිත ගාස්තු සහ ඇප මුදල් ප්‍රදර්ශකයන්ගෙන් අයකර ගැනීමට බදුල්ල මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

05 කිසියම් තැනැත්තකු විසින් යම් වීථියක, පාරක, ඇළක හෝ වැවක සිට පෙනෙන පරිදි දැන්වීම් තැබීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම, ඒ සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රයක බලය යටතේ මිස, කරනු නොලැබිය යුතු ය.

06 එසේ වුවද ඉහතින් ඇති විධිවිධාන, ප්‍රතිදීප්ත දැන්වීමක් හෝ ගුවන් දැන්වීම් පුවරුවක් වන්නේ නම් මිස, පහත සඳහන් ප්‍රචාරක දැන්වීම් මෙහි ඇති විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(i) ලබන ශුද්ධ මුදල් ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක්,
(ii) කිසියම් ප්‍රසංගයක් පවත්වනු ලබන ස්ථානයේ ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්,
(iii) රජය හෝ පලාත් සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්,
(iv) ආගමික, දේශපාලනික හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්,
(v) කිසියම් ගොඩනැගිල්ලක කවුළුවක ඇති ප්‍රචාරක දැන්වීමක්,
(vi) ''කුලියට දීමට තිබේ'' යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්,
(vii) ''විකිණීමට තිබේ'' යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්,
(viii) ගෘහ නාම පුවරුවක්,
(ix) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන, වර්ග ප්‍රමාණය වර්ග අඩියක් නොඉක්මවන නාම පුවරුවක්,
(x) වෙළෙඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන ලද වාහනය, ඒ වාහනයේ අයිතිකරුගේ නම සහ ලිපිනය දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්,
(xi) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති ස්ථානයේ පවත්වාගෙන යන කර්මාන්තය හෝ ව්‍යාපාරය පිළිබඳ ප්‍රචාරක දැන්වීමක්,

07 *(අ)* කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර නිකුත් කරන ලද වලංගු අවසරපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

*(ආ)* ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු අවසරපත්‍රයක් ලබා ඇත්තේ වුවද කුමන හෝ ප්‍රචාරක දැන්වීමක්, ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි අදාළ බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයක හෝ ස්ථාන වල හැර වෙනත් කවර හෝ ස්ථානයක ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

08 මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම අවසරපත්‍රයක් ම, කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස ඒ අවසරපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව සඳහා පමණක් වලංගු වන්නේ ය.

09 07 (අ) යටතේ ඇති ඉල්ලුම් පත්‍රය සමඟ ඉල්ලුම්කරු ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

10 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍රයක් අවශ්‍ය කරන සෑම තැනැත්තකුම, අවම වශයෙන් එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට වැඩ කරන දින දෙකකට පෙර මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කල යුතු ය.

11 මෙම වගන්තියේ පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම ඉල්ලුම්කරු විසින් නිසිලෙස සම්පූර්ණ කර ඇත්තේ නම් කොමසාරිස්වරයා විසින් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

*(අ)* 02 වන වගන්තියෙහි සඳහන් වන ආකාරයට බදුල්ල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන කලාපයක් තුළට අයත් ස්ථානයක ප්‍රදර්ශනය කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් විය යුතු ය.

*(ආ)* දැන්වීම ප්‍රදර්ශනය කිරීමට ඉල්ලා ඇති ස්ථානය සඳහා වෙනත් තැනැත්තකුට කළින් නිකුත් කළ අවසරපත්‍රයක, කළින් නිකුත් කළ කාල සීමාව අවසන් වී තිබිය යුතු ය. එසේ වුවද කලින් නිකුත් කළ සහ තවදුරටත් වලංගු අවසරපත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් දැන්වීම් පුවරුවක සඳහන් දැන්වීම දර්ශනය වීමට බාධාවක් නොවන පරිදි ඊට ආසන්නයේ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට අවසරපත්‍රයක් නිකුත් කිරීමට මේ විධිවිධාන බාධාවක් නොවිය යුතු ය.

(ඇ) ප්‍රදර්ශනය සඳහා අවසරපත්‍ර ඉල්ලා සිටින දැන්වීම අසභ්‍ය හෝ පිළිකුල් සහගත හෝ සදාචාර සම්පන්න නොවන හෝ කිසියම් සංස්කෘතියකට හෝ කවර හෝ ආගමකට හෝ ජනවර්ගයකට හෝ ජන කොට්ඨාසයකට හානිවන හෝ එවැනි තත්ත්වයක් ඇති වීමට ඉඩ තිබෙන හෝ ආකාරයේ දර්ශන හෝ වදන් හෝ ඇතුලත් වන ආකාරයේ දැන්වීමක් නොවිය යුතු ය.

(ඈ) 03 වන වගන්තියෙහි සඳහන් බදුල්ල මහා නගර සභාව විසින් ඉදි කරනු ලැබ ඇති දැකුම් පැළැල්ලක ප්‍රදර්ශනය කිරීමට අවසරපත්‍රයක් ඉල්ලා ඇති අවස්ථාවක එකී දැකුම් පැළැල්ලේ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩක් තිබිය යුතු අතර, ඒ අවස්ථාව වන විටත් කලින් නිකුත් කළ කිසියම් අවසර පත්‍රයක් යටතේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා නිකුත් කළ කාලය ඉකුත් වී තිබිය යුතු ය.

(ඉ) කවර හෝ ලිඛිත නීතියකින් තහනම් කර හෝ සීමා කර ඇති ආකාරයේ ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීමක් නොකළ යුතු ය.

(ඊ) අවසරපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කරන සෑම ඉල්ලුම්පත්‍රයක් සමඟ මිලි මීටර් 220 x මිලිමීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමානයට අනුව පිළියෙල කළ දැන්වීමේ ආදර්ශයක් ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන ස්ථානය හෝ ස්ථානවල මිලි මීටර් 220 ෦ මිලිමීටර් 297 ප්‍රමාණයේ කඩදාසියක 1:1000 පරිමානයට අනුව අඳින ලද භූමි සැළැස්මක්/සැළැසුමක් පිළියෙල කර තිබිය යුතු අතර, ප්‍රචාරක දැන්වීමේ නියම දිග සහ පළල එහි සටහන් කර තිබිය යුතු ය.

(උ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය,

(i) බදුල්ල මහා නගර සභාව විසින් 04 වන වගන්තිය යටතේ ඉදි කර ඇති දැකුම් පැළැල්ලක් වන විට ඒ දැකුම් පැළැල්ලේ දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා වගන්තියෙහි(ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබ ඇති ගාස්තු බදුල්ල මහා නගර සභාව වෙත ගෙවා තිබිය යුතු ය. නැතහොත්

(ii) ඉල්ලුම්කරු නොවන වෙනත් යම් තැනැත්තකුට හෝ යම් අධිකාරයකට අයත් ස්ථානයක් වන විට ඒ තැනැත්තා හෝ ඒ අධිකාරිය විසින් එකී ප්‍රචාරක දැන්වීම ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමට අවසර දී ඇති බව තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

12 ප්‍රචාරක දැන්වීම අසලින් ගමන් කරන කවර හෝ තැනැත්තකුට හෝ වාහනයකට හෝ අවහිරවීමක් හෝ අනතුරක් සිදුවිය හැකි පරිදි කවර හෝ තැනැත්තකු විසින් කිසිදු ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතු ය. තව ද වාහන පදවාගෙන යන කිසියම් රියදුරකුගේ අනවධානයට ලක් කරන හෝ ඔහුගේ දර්ශනයට අවහිරයක් වන පරිදි විදුලි ආලෝක ධාරා සවිකිරීම හෝ ප්‍රතිදීප්ත කිරීම නොකළ යුතු ය.

13 ඉදිරිපත් කර ඇති කිසියම් ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති විටක ඒ බව කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිළධාරියා විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. ඉල්ලුම්කරුට එකී දැන්වීම ලැබුනු පසු ඔහු 14 වන වගන්තිය යටතේ තීරණය කල ගාස්තු සහ ඇප මුදල් බදුල්ල මහා නගර සභාව වෙත ගෙවීමෙන් අනතුරුව අදාල අවසරපත්‍රය නිකුත් කිරීම කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිළධාරියාගේ කාර්යය වන්නේ ය.

14 (අ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන කිසියම් අවසරපත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස එම බලපත්‍ර නිකුත් කලේ කුමන වර්ෂයකටද, එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 (තිස් එක) දිනෙන් අවසන් විය යුතු ය.

(ආ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නිකුත් කරන ලද අවසරපත්‍රයේ කාලය අවසන් වීමෙන් අනතුරුව අනුගාමී වර්ෂය තුල දී එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන අවස්ථාවේ දී එම අනුගාමී වර්ෂයේ දී එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් නව අවසරපත්‍රයක් ලබා ගත යුතු ය. තව ද, ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් වෙනුවෙන් අනුගාමී වර්ෂ තුල අයකිරීමට බදුල්ල මහා නගර සභාව විසින් සම්මත කර ඇති බලපත්‍ර ගාස්තුව අදාළ විය යුත්තේ ය.

(ඇ) බදුල්ල මහා නගර සභාව විසින් පනවන ලද වාර්ෂික බලපත්‍ර ගාස්තු වාර්ෂිකව මහ සභාවේ අනුමැතිය ඇතිව සංශෝධනය විය හැකිය. තවද මෙම සංශෝධිත අවසරපත්‍ර ගාස්තු පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* නිවේදනය කිරීම කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය.

(ඉ) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ මුදලින් නිදහස් ප්‍රචාරක දැන්වීම් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ ඇති අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන්ම අදාල වන්නේ ය.

15 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීමට පෙර බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කල යුතු ඇප මුදල් ප්‍රමාණ පිළිබඳ වාර්ෂිකව මහා සභාවේ අනුමැතිය ඇතිව සංශෝධනය වීමෙන් අනතුරුව ඇප තැන්පත් මුදල් පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* නිවේදනය කිරීම කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය.

16 ප්‍රදර්ශනය කරනු ලබන සෑම දැන්වීමක් සඳහා නිකුත් කළ අවසර පත්‍රයේ අංකය ඒ දැන්වීම හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට පෙර එක් එක් දැන්වීමේ දකුණු පස පහළ කෙළෙවරේ සටහන් කිරීම අවසරපත්‍රලාභියාගේ වගකීම වන්නේ ය.

17 (අ) කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම සඳහා යොදා ගනු ලබන කවර හෝ දැකුම් පැළැල්ලක්, ආධාරකයක්, ඉදි කිරීමක් හෝ සවිකිරීමක් පරිසරයට හානි වන ආකාරයේ හෝ කිසියම් තැනැත්තකුට හෝ තැනැත්තකුගේ දේපලකට අන්තරාදායක හෝ හානි

වන ආකාරයේ පවතින අවස්ථාවක එය නිශ්චිත කාලයක් ඇතුළත යථා තත්වයකට පත් කරන ලෙස අවසරපත්‍රධාරියාට යොමු කරන දැන්වීමක් මගින් නියම කිරීමට කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය ඇත්තේ ය.

(ආ) ඉහත (අ) ඡේදයේ දැක්වෙන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තකු එකී දැන්වීම සඳහන් කාලය තුල ඒ දැන්වීමේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම කර ඇති අවස්ථාවක දී, කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී ප්‍රචාරක දැන්වීම සඳහා නිකුත් කල අවසරපත්‍රය අවලංගු කිරීම සහ ඒ ප්‍රචාරක දැන්වීම ගලවා ඉවත් කිරීමට නීතියෙන් බාධාවක් නොවන්නේ ය.

(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන යටතේ කිසියම් අවසරපත්‍රයක් අවලංගු කර ඇති අවස්ථාවක එකී ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කරන ලද ඇප මුදල බදුල්ල මහා නගර සභාව සතු වුවහොත් හැර ඒ ඇප මුදල ඉල්ලා සිටීමට වෙනත් කවර හෝ තැනැත්තකුට හිමිකමක් නොමැත්තේ ය.

18 ප්‍රදර්ශනය සඳහා වලංගු අවසරපත්‍රයක් ලබාගෙන ප්‍රදර්ශනය කරන කවර හෝ දැන්වීමකට සිදුවන හානියක් හෝ විකෘති වීමක් හෝ ඉවත් කිරීමක් සම්බන්ධයෙන් බදුල්ල මහා නගර සභාව විසින් කවර හෝ වගකීමකට යටත් නොවන්නේ ය.

19 මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ නියමයක් කඩ කර ඇති අවස්ථාවක, ඒ කඩ කිරීම පිළිබඳ අවධානය යොමු කරන නිවේදනයක් සමඟ නිකුත් කරනු ලැබූ කිසියම් අවසරපත්‍රයක් අවලංගු කිරීමට කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය ඇත්තේ ය.

20 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා මෙහි අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද අවසරපත්‍රයක් මගින් එම දැන්වීමේ සඳහන් අර්ථය හෝ ප්‍රකාශිතය ඉදිරිපත් කිරීම සඳහා දෙනු ලබන නීතිමය අවසරය ඇතුළත් වූවක් ලෙස නොසැලකිය යුතු අතර, එලෙස තේරුම් නොගත යුතු වන්නේ ය.

21 කිසියම් ප්‍රචාරක දැන්වීමක් ඉදිකිරීම සඳහා පාවිච්චි කරන ලද කවර හෝ ඉදිකිරීමක ආධාරකයක්, සවිකිරීමක්, හෝ ඒ සඳහා පාවිච්චි කරන වෙනත් යම් කිසිවක් නිසා හෝ එකී ප්‍රචාරක දැන්වීමෙන් ප්‍රකාශිත අර්ථය හෝ ගම්‍ය වන අන්‍යාර්ථයක් හේතුවෙන් කිසියම් පාර්ශවයකට සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති කිසියම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් අවසරපත්‍රලාභියා වගකීමට යටත් විය යුතු ය.

22 මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසරපත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කරන අවසාන දිනයෙන් පසුව පැය 48ක් (හතලිස් අටක්) ගත වීමට පෙර, අදාළ ප්‍රචාරක දැන්වීම සහ ඊට අදාළ අනිකුත් ද්‍රව්‍ය ඒ ඒ ස්ථාන හා ස්ථානවලින් ඉවත් කිරීම අවසරපත්‍රලාභියා විසින් සිදුකල යුතු ය.

23 (අ) මෙහි 22 වැනි වගන්තිය අනුව ක්‍රියා කිරීමෙන් අනතුරුව කොමසාරිස්වරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත අදාළ අවසරපත්‍රය ලබාගැනීමට පෙර බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කරන ලද තැන්පත් මුදල් ලබා ගැනීමට අවසරපත්‍රලාභියාට හැකි ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ආකාරයට ලිඛිත ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව එකී තැන්පත් මුදල අවසරපත්‍රලාභියා වෙත ලබාදීමට පෙර පහත කරුණු ඉටුකර ඇත්දැයි කොමසාරිස්වරයා විසින් විමසා බැලිය යුතු ය.

(i) 22 වැනි වගන්තියට අනුව සිය කටයුතු අවසරපත්‍රලාභියා විසින් සිදුකර ඇති බව,

(ii) දැන්වීම ප්‍රදර්ශනය කර ඇත්තේ බදුල්ල මහා නගර සභාව විසින් ඉදිකරන ලද දැකුම් පැළැල්ලක නම් ඒ දැන්වීම ඉවත් කිරීමේ දී හෝ අවසරපත්‍රලාභියා විසින් වගකිව යුතු වෙනත් කිසියම් කාර්යයක් හේතුවෙන් හෝ ඒ දැකුම් පැළැල්ලට කිසියම් හානියක් සිදුවී තිබේ ද? යන්න පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම,

(ඇ) අවසරපත්‍රලාභියා විසින් 22 වන වගන්තියට අනුව ක්‍රියා කර ඇති බව සහ බදුල්ල මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී නොමැති බව (ආ) ඡේදයේ සඳහන් වන ආකාරයට තහවුරු කර ගැනීමේ දී කොමසාරිස්වරයා සෑහීමකට පත් වන්නේ නම් මිස එකී තැන්පත් මුදල අවසරපත්‍රලාභියා වෙත සම්පූර්ණයෙන්ම නිදහස් නොකල යුතු ය. කිසියම් අවසරපත්‍රලාභියකු විසින් 21 වැනි වගන්තියේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක හෝ බදුල්ල මහා නගර සභාවේ දැකුම් පැළැල්ලට හානියක් සිදුවී ඇති විට අවස්ථානුකූලව ඒ කාර්යය කිරීම හෝ දැකුම් පැළැල්ල අලුත්වැඩියා කිරීම හෝ ඒ කාර්යයන් දෙකම සඳහා බදුල්ල මහා නගර සභාවට දරන්නට සිදුවන වියදම් තැන්පත් මුදලින් අඩු කරගත යුතු අතර, ඉතිරි යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල පමණක් අවසරපත්‍රලාභියාට ආපසු ගෙවිය හැකිය.

(ඇ) (ඇ) ඡේදයේ සඳහන් ආකාරයට ක්‍රියා කිරීමේ දී බදුල්ල මහා නගර සභාවට අයකර ගත යුතු මුදල තැන්පත් කරන ලද ඇප මුදලට වඩා වැඩි වන අවස්ථාවක එසේ වැඩිදුරටත් අයවිය යුතු මුදල අවසරපත්‍රලාභියා විසින් බදුල්ල මහා නගර සභාවට ගෙවිය යුතු ය.

24 බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන කිසියම් ව්‍යාපාරික ස්ථානයක හෝ කර්මාන්ත ශාලාවක නාමය, ලිපිනය සහ එකී ව්‍යාපාරික ස්ථානයේ කරනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය හෝ කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය හෝ පෙන්නුම් කරන දැන්වීම් පුවරු එකක් පමණක් එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ කර්මාන්ත ශාලාවේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීම, ගෘහ නාම පුවරු සහ කිසියම් දේපලක් බදු දීමට හෝ විකිණීමට හෝ කුලියට දීමට හෝ එකී දේපල මත ප්‍රදර්ශනය කරන ලද ''බදු දීමට තිබේ'' හෝ ''විකිණීමට තිබේ'' හෝ ''කුලියට දීමට තිබේ'' යනුවෙන් සඳහන්වන ප්‍රචාරක දැන්වීම් එකක් පමණක් සඳහා මෙම

අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල නොවන අතර එක් දැන්වීමකට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරන යම්කිසි අවස්ථාවක එසේ වැඩි වන සෑම දැන්වීමක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ කර ගත යුතු ය.

25 රජය හෝ පළාත් සභාව හෝ මහා නගර සභාව විසින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

26 කිසියම් ව්‍යාපාරික ස්ථානයක නාමය, අංකය, සහ ලිපිනය සමඟ වෙනත් කිසියම් වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරන ලද අවස්ථාවක සහ කිසියම් නිවාසයක කවර හෝ ආකාරයේ වෙළඳ භාණ්ඩයක හෝ සේවාවක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කරන ලද අවස්ථාවක,ඒ ප්‍රචාරක දැන්වීම හෝ කටවුට් හෝ ප්‍රචාරක දැන්වීම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් වන්නේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන සම්බන්ධයෙන් අවසරපත්‍ර ලබා ගත යුතු තැනැත්තා ලෙස එකී ව්‍යාපාරික ස්ථානයේ හෝ නිවාසයේ හිමිකරු, කළමණාකරු හෝ ඒ අවස්ථාවේ එහි පාලනය භාරව සිටි කවර හෝ තැනැත්තකු වන්නේ ය.

27 කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීමක් පොදු ගොඩනැගිල්ලක හෝ එවැනි ස්ථානයකට යාබදව තිබෙන ගසක, ගසක කඳක, අත්තක, හෝ වෙනත් කිසියම් කොටසක හෝ කිසියම් පොදු ගොඩනැගිල්ලකට සම්බන්ධ කර සවි කිරීම, ඇලවීම, එල්ලීම, බැඳතැබීම, හෝ ප්‍රක්ෂේපනය කිරීම කවරකු විසින් හෝ නොකල යුතු ය.

28 මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන අවසරපත්‍රධාරියකු හෝ යම් අයකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව, හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

29 මේ අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම්,

(i) ''කටවුට් යනු'' ලී හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් සකස් කළ කිසියම් රාමුවක අලවන හෝ සවිකරන ලද ප්‍රචාරක දැන්වීමක්,

(ii) ''දැකුම් පැළැල්ල'' යනු, ජනතාවගේ දැනගැනීම හෝ අවධානය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කිසියම් ප්‍රචාරක දැන්වීමක් සවිකිරීම හෝ රඳවා තැබීම පිණිස ඉදිකරනු ලබන කවර හෝ ආකාරයක ස්ථිර පුවරුවක් ද,

(iii) ''ප්‍රචාරක දැන්වීම'' යනු, කවර හෝ තැනැත්තකු විසින් කිසියම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ නිර්මිතයක ඉහලින් හෝ ඒ මත සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන හා ජනතාවගේ දැනගැනීම හෝ අවධානය පිණිස ප්‍රදර්ශනය කරන, අලවන, සවිකරන, ඉදිකරන, එල්ලා තබන හෝ වෙනත් ආකාරයෙන් ස්ථාන ගත කරන ප්‍රචාරන කාර්යය සඳහා යොදා ගනු ලබන කිසියම් අක්ෂර හෝ සළකුණක් හෝ වචන හෝ රූප සටහන් හෝ ඇතුළත් වන ප්‍රචාරක දැන්වීමක් හෝ බැනරයක් හෝ කටවුට් එකක් හෝ කිසියම් ආකාරයක අනුරුවක් හෝ දැන්වීමක් හෝ නිවේදනයක් හෝ වෙළඳ දැන්වීමක් ද, අදහස් වේ.

### පළමුවන උපලේඛනය

*බදුල්ල මහා නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා වන අවසරපත්‍රය*

ගෙවන ලද අවසරපත්‍ර ගාස්තුව රු. ........................................................ අවසරපත්‍රයේ අනුක්‍රමික අංකය ........................................................ ඇප මුදලේ ප්‍රමාණය රු. ........................................................ හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක ........................................................ දරන හැඳුනුම්පත්‍රයේ හිමිකරු වන ........................................................ යන අයට, ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත්ව 20......................මස ................. වැනි දින සිට 20...................මස ..................... වැනි දින දක්වා වන කාලය ඇතුළත බදුල්ල මහා නගර සභා සීමාවේ පහත සඳහන් ස්ථානයේ / ස්ථානවල ප්‍රචාරක දැන්වීම/දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට මෙයින් අවසරය දෙනු ලැබේ.

ප්‍රචාරක දැන්වීම/දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසරය ලබා දී ඇති ස්ථානය/ස්ථාන

01 ........................................................................................................
02 ........................................................................................................
03 ........................................................................................................
04 ........................................................................................................
05 ........................................................................................................

දිනය :............................................

..........................................................................................
නාගරික කොමසාරිස්/බලයලත් නිලධාරියා,
බදුල්ල මහා නගර සභාව.

### දෙවන උපලේඛනය

*ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම :........................................................................................................
02. ලිපිනය :........................................................................................................
03. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :........................................................................................................
04. දුරකතන අංකය :........................................................................................................
05. ප්‍රචාරක දැන්වීම පිළිබඳ විස්තර :........................................................................................................
   (i) දැන්වීමේ ප්‍රමාණය : දිග සෙ. මී :...................................... පළල සෙ. මී. :......................................
   (ii) දැන්වීම් සංඛ්‍යාව :........................................................................................................
   (iii) ස්ථාන ගත කරන අන්දම :........................................................................................................
   (iv) ස්ථාන ගත කරන තැන් :........................................................................................................
   (v) දැන්වීමේ අන්තර්ගතය :........................................................................................................

(11 වන අතුරු ව්‍යවස්ථාවේ ''ඊ'' උපවගන්තියේ සඳහන් ආකාරයේ ආදර්ශයක් අමුණන්න.)

06. ඉල්ලා සිටින අවසරපත්‍රය වලංගු විය යුතු කාලසීමාව :

ආරම්භක දිනය 20 :...................................... මස :...................................... වන දින
අවසන්වන දිනය 20 :...................................... මස :...................................... වන දින

ප්‍රචාරක දැන්වීම විධිමත් කිරීම, අධීක්ෂණය සහ පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් සියල්ල පිළිපදින බවටත්, අවසරපත්‍ර වලංගු කාලය අවසන් වී දින දෙකක් ගත වීමට මත්තෙන්, අවසරපත්‍රයට අදාළ ප්‍රචාරක දැන්වීම/දැන්වීම්/හා ඊට යොදාගෙන ඇති සියලු ද්‍රව්‍යයන් මාගේ වියදමින් එකී ස්ථානයෙන් / ස්ථානවලින් ඉවත් කිරීමටත් ක්‍රියා කරන බවට මෙයින් පොරොන්දු වෙමි.

දිනය :......................................

......................................
ඉල්ලුම්කරුගේ අත්සන.

### තුන්වන උපලේඛනය

*13 වන අතුරු ව්‍යවස්ථාව*

*ප්‍රචාරක දැන්වීම සඳහා ගාස්තු නියම කිරීම*

| *අනු. අංක* | *විස්තරය* | *බලපත්‍ර ගාස්තුව* | |
|---|---|---|---|
| | | *මාසයක් හෝ ඉන් කොටසක් සඳහා* | *අවුරුද්දක් සඳහා* |
| 01 | වේදිකා නාට්‍යයක් හෝ නාටකයක් හෝ සිනමා ලේඛිත ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 කට හෝ ඉන් කොටසකට | | |
| 02 | සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳ, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 කට හෝ ඉන් කොටසකට | | |
| 03 | සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳ, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 කට හෝ ඉන් කොටසකට | | |
| 04 | සිනමා ලේඛිත ප්‍රසංගයක් හෝ වෙනත් යම් ප්‍රසංගයක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් නොවන්නා වූ ද, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කර ඇත්තා වූද ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 කට හෝ ඉන් කොටසකට | | |
| 05 | සිනමා ලේඛිත ප්‍රසංගයක් පිළිබඳ ප්‍රචාරක දැන්වීමක් නොවන, ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග මීටර් 0.09 කට හෝ ඉන් කොටසකට | | |
| 06 | යම් පුවරුවක හෝ ආධාරකයක ප්‍රදර්ශනය කරන්නා වූද යම් තැනැත්තකු විසින් ගෙන යනු ලබන්නාවූ නැතහොත් ධාවනය වන වාහනයකට සවි කර ඇත්තාවූද ප්‍රචාරක දැන්වීමක් සඳහා | | |
| | *(අ)* එම දැන්වීම වර්ග මීටර් 0.675 ක් ඉක්මනොවන විට මීටරයකට හෝ ඉන් කොටසකට | | |
| | *(ආ)* එම දැන්වීම වර්ග මීටර් 0.675 ක් ඉක්මවන විට, එක් වර්ග මීටරයකට හෝ ඉන් කොටසකට | | |

මෙහි සඳහන් මිල ගණන් මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරන අතර එවැනි යෝජනා සම්මතයක් මගින් ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකිය. සභාවේ අනුමැතිව ඇතිව වාර්ෂිකව ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පලවීමෙන් අනතුරුව ගාස්තු අය කිරීම වලංගු වන්නේ ය.

**XXXII වන කොටස**

***පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන සහ 267 වන වගන්ති සමඟ කියවිය යුතු 28 (ආ) වැනි වගන්තියට අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු පිහිණුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිටි පිහිණුම් තටාක ඉදිකිරීම සහ පවත්වාගෙන යාම විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථා යි.

02. (අ) නාගරික කොමසාරිස්වරයා විසින් තත්කාර්ය සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මකවන දිනයවන විටත් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඉදිකර තිබෙන කිසියම් පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මකවන දින සිට මාස 03 ක කාලයක් ලබා දෙන අතර එකී කාලය අවසන් වීමෙන් අනතුරුව බලපත්‍රයක් ලබා නොගෙන ඒ පිහිණුම් තටාකය පවත්වාගෙන යාම නොකළ යුතු ය.

03. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ පිහිණුම් තටාකයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) තටාකයේ පිහිණීමට පෙර පූර්ව ස්නානය සඳහා වතුර මල් සපයා තිබිය යුතු ය.

(ආ) පූර්ව ස්නානය සඳහා සහ පිහිණුම් තටාකය සඳහා සපයන ජලය කොමසාරිස්වරයා විසින් නිර්දේශිත ප්‍රමිතියෙන් යුක්තව සැපයීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදයේ සඳහන් ජල සැපයුම් සඳහා ප්‍රමාණවත් විෂබීජ නාශක යොදා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙල යොදා තිබිය යුතු ය.

(ඈ) එකී පිහිණුම් තටාකයේ සම්පූර්ණ ජල ධාරිතාව පැය විසිහතරක කාලයක් තුළ දෙවතාවක් පවිත්‍රකරණය සහ විෂබීජ හරණය සඳහා ජලය සංසරණය කෙරෙන පොම්ප සහිත පෙරන කට්ටලයක් සවිකර තිබිය යුතු ය.

(ඉ) පිහිණුම් තටාකයේ එක් එක් ස්ථානයේ ගැඹුර කොපමණ ද යන්න තටාක වේදිකාවේ පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

(ඊ) පිහිණුම් තටාකය වටේ අවම වශයෙන් සෑම මීටර් 8 කට එකක් බැගින් වනසේ පිහිණුම් තටාකයට බැසීමට සහ තටාකයෙන් පිටතට පැමිණීම සඳහා මල නොබැඳෙන වානේවලින් සාදන ලද අත් වැටක් සහ ඉණිමඟක් බැගින් සවිකර තිබිය යුතු ය.

(උ) පිහිණුම් තටාකයට ජලය පිරවීමෙන් අනතුරුව එහි පතුල සහ බිත්ති හොඳින් පෙනෙන ආකාරයේ වර්ණයෙන් යුතු වූ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඌ) වයස අවුරුදු දොළහෙන් පහළ ළමයින්ට පිහිණීමට ඉඩදෙනු ලබන්නේ නම් ඒ සඳහා මීටර් 1 කට නොවැඩි ගැඹුරකින් යුක්ත වෙනම කොටසක් තනා තිබිය යුතු ය.

(එ) පිහිණුම් තටාකයේ දිය මතට පැනීමට අට්ටාල තනා තිබේ ඒවා කොන්ක්‍රීට්වලින් තනා තිබිය යුතු අතර එහි ඉහළට නැගීමට යකඩ හෝ වානේවලින් තැනූ ශක්තිමත් ඉණිමඟක් සවිකර තිබිය යුතු ය.

(ඒ) ප්‍රමාණවත් ජීවිතාරක්ෂක සහ ප්‍රථමාධාර වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

(ඔ) පිහිණුම් තටාකය පරිහරණය කරන්නන්ට ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන්ව ඇඳුම් මාරු කිරීමේ ස්ථාන සහ වැසිකිළි සපයා තිබිය යුතු ය.

(ඕ) පස්වරු 06.30 න් පසුව ද පිහිණීම සඳහා ඉඩදෙනු ලබන්නේ නම් තටාකය ඇතුළතට සහ පිටතට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතු ය.

04. පිහිණුම් තටාකයේ පුරවා ඇති ජලයේ විෂබීජ නාශනය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරයා විසින් නියම කරනු ලබන ආකාරයේ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු අතර ඔහු විසින් නියම කරනු ලබන ආකාරයේ උපකරණ සපයා තිබිය යුතු ය.

05. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය

(ii) වීදුරු

(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්

(vi) අන්තරායකර අපද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

06. සෑම පිහිණුම් තටාකයක ම -

(අ) කොටු කළ ප්‍රදේශය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගත යුතු ය.
(ආ) වැසිකිළිවල සහ නාන ස්ථානවල පාවිච්චි කරන ජලය බාධාවකින් තොරව ගලා යන පරිදි කාණු පද්ධතියක් සකස් කර තිබිය යුතු ය.
(ඇ) පතුලේ තැන්පත් වන අපද්‍රව්‍ය යටත් පිරිසෙයින් දිනකට වරක් බැගින් ඉවත් කළ යුතු ය.
(ඈ) පිහිණුම් තටාකයේ සම්පූර්ණ ජල ධාරිතාව අවම වශයෙන් දිනකට දෙ වතාවක් පවිත්‍රකරණය සහ විෂබීජ හරණය කළ යුතු ය.
(ඉ) පිහිණීම සඳහා පැමිණෙන පාරිභෝගිකයන් පූර්ව ස්නානය කිරීමකින් තොරව සහ පිහිණීම සඳහා වෙන්කළ ඇඳුමක් පාවිච්චි නොකර පිහිණුම් කටාකය පාවිච්චි කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

07. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පිහිණුම් තටාකයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 03 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

08. 07 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

09. පිහිණුම් තටාකය පිහිටා ඇති ප්‍රදේශයේ හෝ ඊට ආසන්න ප්‍රදේශයක කිසියම් වසංගත රෝගයක් හෝ ආසාදන රෝගයක් හෝ පවතින බව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරයා විසින් තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක එකී පිහිණුම් තටාකය වසා තැබීමේ නියමයක් කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය.

10. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිළධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කිසියම් තැනැත්තෙකුට පිහිණුම් තටාකය පාවිච්චි කිරීමට ඉඩ දී ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

12. 08 වන වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

13. වැසිකිළි සහ පූර්ව ස්නානය සඳහා වතුර මල් සපයා ඇති ස්ථානවල බිම හා බිත්ති පිගන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

14. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උප වගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු 1000/= කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවනිවර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු: 2000/= කට නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන්වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට යටත් වන්නේ ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

1 ''පිහිණුම් තටාකය'' යන්නෙන්, ව්‍යායාම කිරීම සඳහා හෝ විනෝදය සඳහා හෝ පිහිණීම ඉගෙන ගැනීම සඳහා හෝ පිහිණීමට පිටතින් පැමිණෙන කවර හෝ තැනැත්තෙකුගෙන් ගාස්තුවක් අයකර හෝ ගාස්තු අයකිරීමකින් තොරව පිහිණීම සඳහා ඉදි කරන කරන ලද කිසියම් ජල කටාකයක් අදහස් වේ.

## XXXIII වන කොටස

### *ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරණ සංශෝධනයේ 272 වන සහ 267 වන වගන්ති සමඟ කියවිය යුතු 28 වැනි උප වගන්තියේ (ඉ) ඡේදයට අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. මෙම අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ පොදු ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බදුල්ල මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඉදිරිපත් කළ යුතු ය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත බදුල්ල මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස් වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් ම බදුල්ල මහා නගර සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතු ය. එසේ වුව ද ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ලැබෙන අයදුම්පත්‍ර අතරින් කිසියම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් වන අයදුම් පත්‍රයකට ඉහළ ප්‍රමුඛතාව දිය යුතු ය.

(ආ) මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආදර්ශ ගාස්තු වක්‍රයට අනුව බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට ක්‍රීඩා භූමි වෙන් කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

4. කවර හෝ තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමියක් වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේදී ම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම නාගරික කොමසාරිස් වරයා ගේ කාර්යය වන්නේ ය.

5. කිසියම් කාර්යයක් සඳහා වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක්, එසේ වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව නගරික කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 03 වන සහ 08 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත් ව විය යුතු ය.

6. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන්කර ගන්නා ලද කිසියම් ක්‍රීඩා භූමියක, එකී වෙන්කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉඩ දීමට නාගරික කොමසාරිස්වරයාට හැකි ය.

(අ) වෙන්කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ දිනට,

(i) මාස තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,

(ii) මාස දෙකකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,

(iii) මාසයකට පෙර වනවිට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහලොවක්,

(iv) දින පහලොවකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසි පහක්,

(v) දින හතකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්,

(vi) දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,

බදුල්ල මහා නගර සභා අරමුදලේ රඳවා ගැනීමට යටත්ව විය යුතු ය.

(ආ) වෙන්කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයක දී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(ඇ) කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටක දී එකී වෙන්කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම තිබිය යුතු ය.

(ඈ) කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ ක්‍රීඩා භූමියක් වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

(ඉ) ක්‍රීඩා භූමියක් වෙන්කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

07. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ක්‍රීඩා භූමියක් අදාළ කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(අ) ක්‍රීඩා භූමිය හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම, සහ

(ආ) ක්‍රීඩා භූමිය වෙන්කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව,අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

08. පරිහරණය කිරීම සඳහා ක්‍රීඩා භූමියක් වෙන්කර ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන්කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදුකළ යුතු ය. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම, ක්‍රීඩා භූමිය වෙන්කර ගැනීමට අවශ්‍ය වන දිනට දින තුනකට පෙර ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි අතර එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම 5 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව විය යුතු ය.

09 මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල දැක්වෙන විධිවිධාන අනුව ක්‍රීඩා භූමියක් කිසියම් කාර්යයක් සඳහා වෙන්කර නොමැති කවර හෝ අවස්ථාවක එකී ක්‍රීඩා භූමිය, ක්‍රීඩා කිරීම හෝ ක්‍රීඩා පුහුණුවීම් කටයුතු හෝ සඳහා යොදා ගැනීමට ඉඩදීම නාගරික කොමසාරිස් වරයාගේ කාර්යය විය යුතු ය.

10. කවර හෝ තනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභාව සතු කිසියම් ක්‍රීඩා භූමියකට හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු අතර ක්‍රීඩා භූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන්, කොටළුවන් හෝ බල්ලන් ඇතුල්කිරීම නොකළ යුතු ය. එසේම තව දුරටත්, නාගරික කොමසාරිස් වරයාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ ක්‍රීඩා භූමියකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

11. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් එසේ වෙන්කර ගනු ලැබූ දිනයේ දී බදුල්ල මහා නගර සභාවේ කිසියම් අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, එකී වෙන්කිරීම අවලංගු කිරීමට නාගරික කොමසාරිස් වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම් එකී අවලංගු කිරීම ක්‍රීඩා භූමිය වෙන්කරනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුවාත් හැර ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. තවදුරටත් එසේ ම, එවැනි අවලංගු කිරීමක්, වෙන්කර ගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකළ යුතු ය.

12. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංගනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්,මහා නගර සභා ආඥා පනතේ 267 වනි වගන්තියේ 03 වන උප වගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= කට නො ඉක්මවන දඩයකට ද,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= කට නොඉක්මවන දඩයකටද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන්වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''ක්‍රීඩා භූමිය'' යන්නෙන්, ක්‍රීඩා කිරීම සඳහා බදුල්ල මහා නගර සභාව විසින් වෙන්කර දෙනු ලැබූ කිසියම් ක්‍රීඩා භූමියක් අදහස් වන අතර ක්‍රීඩා භූමිය වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවිකිරීමක් හෝ උපකරණ ද ඊට ඇතුළත් විය යුතු ය,

''ක්‍රීඩාව'' යන්නෙන්, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ ඊට දී ඇති අර්ථය ම අදහස් විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

*2 වන අතුරු ව්‍යවස්ථාව*

බදුල්ල මහා නගර සභාවේ ......................... ක්‍රීඩා භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලුම් පත්‍රය

01. ඉල්ලුම්කරුගේ නම :...............................................................

ලිපිනය :...............................................................

ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය :...............................................................

02. ක්‍රීඩා භූමිය ඉල්ලුම්කරන කාරණය :...............................................................

03. අවශ්‍ය කරන දිනය හා වේලාව :

| දින සිට | දින තෙක් | වේලාව |
|---|---|---|
| ............................................ | ............................................ | ............................................ |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ක්‍රීඩා භූමිය වෙන්කර දෙනු ලැබුවහොත් එම ක්‍රීඩා භූමියේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට සහ සවිකිරීම්වලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් බදුල්ල මහා නගර සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟවන අතර එකී තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් බදුල්ල මහා නගර සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ක්‍රීඩා භූමි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

දිනය :............................................ ............................................,
අයදුම්කරුගේ අත්සන.

**දෙවන උපලේඛනය**

*3 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය*

ක්‍රීඩා භූමියක් පරිහරණය කිරීමට ඉඩදීමට අයකරන ගාස්තු චක්‍රය

| | *ක්‍රීඩා භූමියේ නම* | *ගාස්තුව*<br>*රු. ශත* | *තැන්පත් මුදල*<br>*රු. ශත* | *අතිරේක පැයකට ගාස්තුව*<br>*රු. ශත* |
|---|---|---|---|---|
| 01. | | ................................ | ................................... | ................................. |
| 02. | | ................................ | ................................... | ................................. |

***XXXIV* වන කොටස**

*ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන සහ 267 වන වගන්ති සමඟ කියවිය යුතු 28 වැනි උප වගන්තියේ (ඉ) ඡේදයට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ප්‍රජාශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. මෙම අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඉදිරිපත් කළ යුතු ය.

3. 2 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශාලාවක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී මෙහි පහත දැක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) ප්‍රජා ශාලාවක් ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක් ම බදුල්ල මහා නගර සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව සලකා බැලිය යුතු ය. එසේ වුව ද ප්‍රජාශාලාව පිහිටා ඇති ප්‍රදේශයේ කිසියම් සිවිල් සංවිධානයක රැස්වීමක් හෝ එවැනි සංවිධානයක් විසින් පවත්වනු ලබන පොදු කාර්යයක් වෙනුවෙන් ඉහළ ප්‍රමුඛතාව දිය යුතු ය.

(ආ) මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආදර්ශ ගාස්තු චක්‍රයට අනුව බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට ප්‍රජාශාලා වෙන්කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද, ප්‍රජාශාලාව පිහිටා ඇති ප්‍රදේශයේ කිසියම් සිවිල් සංවිධානයක රැස්වීමක් හෝ එවැනි සංවිධානයක් විසින් පවත්වනු ලබන පොදු කාර්යයක් වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය කිරීම නොකළ යුතු ය.

4. කිසියම් කාර්යයක් සඳහා වෙන්කරනු ලැබූ ප්‍රජාශාලාවක් අදාළ කාර්යය සඳහා පාවිච්චි කිරීමෙන් අනතුරුව බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන් :-

(අ) ප්‍රජා ශාලාව හෝ එහි යම් කොටසකට හෝ සිදුවී ඇති යම් අලාභයක් වේ නම් ඒ අලාභයේ වටිනාකම, සහ
(ආ) ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

5. කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රජාශාලාවක් වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී, එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේදී ම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම්දීම නාගරික කොමසාරිස්වරයා ගේ කාර්යය වන්නේ ය.

6. පරිහරණය කිරීම සඳහා ප්‍රජාශාලාවක් වෙන්කර ගැනීමට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන්කිරීම අපේක්ෂාකරන දිනයට අවම වශයෙන් දින තුනකට පෙර සිදුකළ යුතු ය. එසේ වුව ද බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ ජීවත්ව සිටි යම් තැනැත්තෙකුගේ හෝ එවැනි තැනැත්තෙකුගේ ඥාතියෙකුගේ හෝ මෘත දේහයක් තැන්පත් කර තැබීම සඳහා ප්‍රජා ශාලාවක් වෙන්කර ගැනීමට කෙරෙන ඉල්ලීම් වෙනුවෙන් මෙම සීමාව අදාළ නොවිය යුතු ය. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම, ප්‍රජා ශාලාව වෙන්කර ගැනීමට අවශ්‍ය වන දිනට දින තුනකට පෙර ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි අතර එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම 07 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව විය යුතු ය.

7. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ වෙන්කර ගන්නා ලද කිසියම් ප්‍රජා ශාලාවක, එකී වෙන්කර ගැනීම අවලංගු කරවා ගැනීමට යම් ඉල්ලුම්කරුවකුට අවශ්‍ය වන අවස්ථාවක පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉඩ දීමට නාගරික කොමසාරිස්වරයාට හැකි ය.

(අ) වෙන්කිරීමක් අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ දිනට,

(i) මාස තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහක්,
(ii) මාස දෙකකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට දහයක්,
(iii) මාසයකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පහළොවක්,
(iv) දින පහළොවකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට විසි පහක්,
(v) දින හතකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක්,
(vi) දින තුනකට පෙර වන විට, ගෙවනු ලැබූ ගාස්තුවෙන් සියයට හැත්තෑ පහක්,
බදුල්ල මහා නගර සභා අරමුදලේ රඳවා ගැනීමට යටත්ව විය යුතු ය.

(ආ) වෙන්කිරීම අවලංගු කිරීමට ඉල්ලීම කරනු ලබන්නේ, ප්‍රජා ශාලාව වෙන්කර ගනු ලැබූ දිනට දින තුනකට වඩා අඩු කාලයක දී නම් ගෙවනු ලැබූ ගාස්තුව ආපසු ගෙවනු නොලැබිය යුතු ය.

(ඇ) කිසියම් වෙන් කිරීමක් අවලංගු කරවා ගනු ලැබූ විටක දී එකී වෙන්කර ගැනීම සඳහා ගෙවනු ලැබූ තැන්පතු මුදල සම්පූර්ණයෙන් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම තිබිය යුතු ය.

(ඈ) කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ ප්‍රජා ශාලාවක් වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

(ඉ) ප්‍රජා ශාලාවක් වෙන්කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක්, කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

08. කිසියම් කාර්යයක් සඳහා වෙන්කර ගනු ලැබූ ප්‍රජා ශාලාවක්, එසේ වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව නාගරික කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 03 වන සහ 08 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත් ව විය යුතු ය.

09. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ වෙන්කර ගනු ලැබූ කිසියම් ප්‍රජා ශාලාවක් එසේ වෙන්කර ගනු ලැබූ දිනයේ දී බදුල්ල මහා නගර සභාවේ කිසියම් අත්‍යවශ්‍ය කාර්යයක් සඳහා අවශ්‍ය වන විටක, එකී වෙන්කිරීම අවලංගු කිරීමට නාගරික කොමසාරිස් වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද එවැනි අවලංගු කිරීමක් සිදු කරනු ලබන්නේ නම් එකී අවලංගු කිරීම ප්‍රජා ශාලාව වෙන්කරනු ලැබූ දිනට දින තුනකට පෙර ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දිය යුතුවාත් හැර ඔහු විසින් ගෙවන ලද ගාස්තුව සහ තැන්පත් මුදල සම්පූර්ණයෙන් ම ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය. තවදුරටත් එසේ ම, එවැනි අවලංගු කිරීමක්, වෙන්කර ගනු ලැබූ දිනට පෙර දින තුනකට වඩා අඩු කාලයකදී සිදු නොකළ යුතු ය.

10. කවර හෝ තනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභාව සතු කිසියම් ප්‍රජා ශාලාවකට හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු අතර ප්‍රජා ශාලාව තුළ දුම් පානය කිරීම, මත්පැන් පානය කිරීම, සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ කිසියම් දුරාචාරයක නිරත වීම නොකළ යුතු ය.

11. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වෙනි වගන්තියේ 03 වන උප වගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= කට නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= කට නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල.-

''පොදු කාර්යය'' යන්නෙන්, බදුල්ල මහා නගර සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ජනතාවගේ පොදු යහපත පිණිස හෝ අවශ්‍යතාව පිණිස කිසියම් සිවිල් සංවිධානයක් විසින් සංවිධානය කරනු ලබන කිසියම් රැස්වීමක්, සාකච්ඡාවක්, වෛද්‍ය සායනයක්, ආධාර පිරිනැමීමේ කාර්යයක්, එවැනි ස්වභාවයේ වන කිසියම් කාර්යයක් හෝ ආගමික හෝ සමාජයීය කාර්යයක් අදහස් වන අතර කිසියම් වාණිජ ස්වභාවයේ කාර්යයක් ඊට ඇතුළත් නොවිය යුතු ය,

''ප්‍රජා ශාලාව'' යන්නෙන්, බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන බදුල්ල මහා නගර සභා ප්‍රදේශය ඇතුළත වාසය කරන ජනතාවගේ පොදු පරිහරණය සඳහා වෙන්කර ඇති කිසියම් ඉඩමක් හෝ පරිශ්‍රයක් අදහස් වන අතර ඒ වටා ඉදිකර ඇති තාප්පය හෝ වැට හෝ ඒ තුළ ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් හෝ ඒ කිසියම් ඉදිකිරීමක කොටසක් හෝ කිසියම් සවිකිරීමක් හෝ උපකරණ ද ඊට ඇතුළත් විය යුතු ය,

''සිවිල් සංවිධානය'' යන්නෙන්, බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ වාසය කරන ජනතාවගේ සහභාගිත්වයෙන් පිහිටුවාගෙන ඇති කිසියම් ස්වේච්ඡා සංවිධානයක් අදහස් වන අතර බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ වාසය කරන ජනතාවගේ යහපත හෝ අභිවෘද්ධිය වෙනුවෙන් බදුල්ල මහා නගර සභා ප්‍රදේශයෙන් බැහැරව පිහිටුවා ගෙන ඇති වෙනත් කිසියම් ස්වේච්ඡා සංවිධානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

*2 වන අතුරු ව්‍යවස්ථාව*

බදුල්ල මහා නගර සභාවේ .............................. ප්‍රජා ශාලාව පරිහරණය සඳහා අවසර ලබා ගැනීමට ඉල්ලුම්පත්‍රය

01. ඉල්ලුම්කරුගේ නම :........................................................................

ලිපිනය :........................................................................

ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය :........................................................................

02. ප්‍රජා ශාලාව ඉල්ලුම්කරන කාරණය :........................................................................

03. *අවශ්‍ය කරන දිනය හා වේලාව ඃ*

| දින සිට | දින තෙක් | වේලාව |
|---|---|---|
| .................................... | .................................... | .................................... |
| .................................... | .................................... | .................................... |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලීමට අනුව අදාළ ප්‍රජා ශාලාව වෙන්කර දෙනු ලැබුවහොත් එම ප්‍රජා ශාලාවේ ගොඩනැගිලිවලට, ඉදිකිරීම්වලට, උපකරණවලට සහ සවිකිරීම්වලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් බදුල්ල මහා නගර සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟවන අතර එකී තැන්පත් මුදල ඒ අයකිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තවදුරටත් අවශ්‍ය වන මුදල් බදුල්ල මහා නගර සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම ප්‍රජා ශාලා විධිමත් කිරීම, අධීක්‍ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

දිනය ඃ.................................... ..................................................

අයදුම්කරුගේ අත්සන.

*දෙවන උපලේඛනය*

3 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය

**ප්‍රජා ශාලාවක් පරිහරණය කිරීමට ඉඩදීමට අයකරන ගාස්තු චක්‍රය**

| | *ප්‍රජා ශාලාවේ නම* | *ගාස්තුව* රු. ශත | *තැන්පත් මුදල* රු. ශත | *අතිරේක පැයකට ගාස්තුව* රු. ශත |
|---|---|---|---|---|
| 01. | | .................. | .................. | ................. |
| 02. | | .................. | .................. | ................. |
| | | | | |

## XXXV වන කොටස

**මහජන පුස්තකාල සේවාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන සහ 267 වන වගන්තී සමඟ කියවිය යුතු 28 (ඉ) වැනි උප වගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යන මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභාව සතු පුස්තකාල සේවා විධිමත් කිරීම, පාලනය කිරීම, සහ ඒ සඳහා ගාස්තු අය කිරීම පිළිබඳව වු අතුරු ව්‍යවස්ථාවයි.

02. බදුල්ල මහා නගර සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන මහජන පුස්තකාලය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විත විය යුතු ය ඃ

*අ.* පොත් බැහැර දෙන පුස්තකාලය.
*ආ.* කියවීම් ශාලාව.
*ඇ.* ළමා පුස්තකාලය.
*ඈ.* සඟරා අංශය.
*ඉ.* ජංගම අංශය.
*ඊ.* විමර්ශන අංශය.
*උ.* ශ්‍රවණාගාර ඇතුළු ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය.
*ඔ.* නැණසල ඒකකය

03. 1. මහජන පුස්තකාලයේ උපදේශක කමිටුව වෙත ස්ථාපිත කළයුතු අතර, පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය.

*අ.* සභාවේ එවකට සිටින නගරාධිපතිගෙන්,
*ආ.* සභාව මඟින් පත් කරනු ලැබිය හැකි නගර සභාවේ සභිකයින් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් එක් අයෙකු කමිටුවේ සාමාජිකයෙකු විය යුතු ය,
*ඇ.* සභාව මඟින් පත් කරනු ලබන නාගරික සීමාව තුළ පිළිගත් වියතුන් හතර දෙනෙකු,
*ඈ.* පුස්තකාල පාඨක සමාජයේ සභාපති හා පුස්තකාලයාධිපතිගේ නර්දේශය අනුව සභාව විසින් නම් කරනු ලබන පුසත්කාලයේ අනුග්‍රහකයින් අයෙකු,
*ඉ.* පළාත් පාලන කොමසාරිස්තුමා හෝ නියෝජිතයෙකු,
*ඊ.* නාගරික කොමසාරිස්ගෙන් සමන්විත විය යුතු ය.

03. 2. පුස්තකාලයේ විනය පවත්වා ගැනීම පිළිබඳව පුස්තකාලය භාරව පුස්තකාලයාධිපති වගකිව යුතු අතර, ඔහු හෝ ඇය නිළ බලයෙන්ම උපදේශක කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු ය.

03. 3. (1) අතුරු ව්‍යවස්ථාවේ (ආ) , (ඇ) සහ (ඈ) යන අනුඡේද යටතේ තෝරා ගනු ලැබූ අයවළුන් නම් කරනු ලැබූ දින සිට අවුරුද්දක් නිළයේ රැඳී සිටිය යුතුයි. අවශ්‍ය වුවහොත් ඔවුන් නැවත පත්කර ගැනීම ද කළ හැක.

04. 1. සභාවේ නගරාධිපති නිළ බලයෙන් උපදේශක කමිටුවේ සභාපති විය යුතු අතර, ඔහු කමිටුවේ සෑම රැස්වීමකට මුලසුන දැරිය යුතු ය. නගරාධිපති පැමිණ නැති යම් රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ කාර්යය සඳහා පත්කර කරගනු ලබන සභාවේ සාමාජිකයෙක්. නාගරික මන්ත්‍රීවරයෙක් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

2. යම් ප්‍රශ්නයක් සඳහා, ඡන්ද විමසීමේ දී සමාන ඡන්ද සංඛ්‍යාවක් දෙපක්ෂයටම ලැබුනහොත් රැස්වීමේ මුලසුන උසුලන සාමාජිකයාට තම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

05. 1. උපදේශක කමිටුවේ ගණපූර්ණය 05 දෙනෙකි.

11. සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත සණපූර්ණයක් නොමැති නම් කමිටුවේ යම් රැස්වීමක දී එවර වැඩකටයුතු කරගෙන යෑම නොකළ යුතු ය.

06. අවශ්‍ය යයි සැලකෙන කොන්දේසිවලට මහජන පුස්තකාලයට අයත් යම් අංශයක් අධ්‍යාපන හා සංස්කෘතික කටයුත්තක් සඳහා පාවිච්චි කිරීමට යම් තැනෙත්තෙකුට අවසරය දීමට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවල කිසිවක් උල්ලංඝණය කර ඇති යම් තැනැත්තෙකුට පුස්තකාලයේ යම් අංශයක් පාවිච්චි කිරීමට තහනම් කිරීමට බලය කමිටුවට තිබිය යුතු ය.

**පොත් බැහැර දෙන පුස්තකාලය**

07.1. පොත්පත් බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වීමට කැමැති සෑම තැනැත්තෙක්ම පුසත්කාලයාධිපතිගෙන් ලබා ගන්නා අයදුම්පත්‍රය සම්පූර්ණ කළයුතු අතර, සාමාජිකයා පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

අ. වයස අවුරුදු 14 ට නොඅඩු නම්,
ආ. කියවීමට දන්නෙහි නම්,
ඇ. නගර සභා සීමාව තුළ රු. 15,000.00 නොඅඩු වාර්ෂික වටිනාකමක් ඇති නිවසක අයිතකරුවෙකු විසින් ඇපවී වී තිබේ නම්,
ඈ. මහා නගර සභාවේ පාලන සීමාව තුළ පදිංචිකරුවෙකු විය යුතු ය.
ඉ. සාමාජිකයා විසින් සාමාජික අයදුම්පත්‍රය අදාළ ග්‍රාමසේවා නිලධාරී මහතාගෙන් පදිංචිය තහවුරු කළ යුතු ය.
ඊ. ඇපකරුගේ පදිංචිය කර ගැනීම පිණිස වරිපනම් ලේඛනය පරීක්ෂා කළ යුතු ය.
උ. එසේ සම්පූර්ණ වූ අයදුම් පත්‍රය අනුමත වූ පසු ලිපිනය තහවුරු කරගැනීම පිණිස තැපැල් මඟින් සාමාජිකයා වෙත යැවිය යුතු ය.
ඌ. පාසල් ශිෂ්‍යයකු රු. 50.00 පාසල් නොයන රු. 100.00 නගර සීමාවෙන් පිට රු. 200.00 මුදලක් පුස්තකාලයාධිපති වෙත තැන්පත් කරන අයෙකු මිස වෙනත් අයෙකු පොත්පත් බැහැරව දෙන පුස්තකාලයේ සාමාජිකයන් වශයෙන් බඳවා නොගත යුතු ය.

07.2 ඒ අයදුම් පත්‍රය පහත සඳහන් අයගෙන් එක් අයෙකු ලවා සහතික කර ගත යුතුය,

අ. දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු
ආ. ඌව පළාත් සභා මන්ත්‍රීවරයෙකු,
ඇ. නගරාධිපති / නි. නගරාධිපතිතුමා,
ඈ. නාගරික මන්ත්‍රීවරයෙකු,
ඉ. මහා නගර සභා සීමාව තුළ පිහිටි විද්‍යාලයක විදුහල්පතිවරයෙකු,
ඊ. වාර්ෂික වැටුප රු. 60,000.00 වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු,

07.3 සාමාජිකයෙකුගේ අයවිය යුතු දඩ මුදල් ගැනත් සාමාජිකයා විසින් නැති කරුණු ලබන හෝ හානී පමුණුවන ලද පුස්තකාලයට අයත් පොත්පත් ප්‍රකාශන හෝ වෙනත් ඕනෑම භාණ්ඩයක් ගැනත් ඇපකරුවා වගකිව යුතු ය.

07.4 ඉහතින් සඳහන් 07.2 වගන්තිය අනුව අයදුම්පත පිටසන් කිරීමට බලය ඇති තැනැත්තෙකු තමාගේ ඉල්ලුම්පත පිටසන් කරවා ගැනීම සඳහා අවශ්‍ය නොවිය යුතු ය. එහෙත් ඔහු 07.1 ඇ වගන්තිය අනුව අයදුම්පත ඇපකරුවෙකු ලවා සහතික කරවා ඉදිරිපත් කළ යුතු ය.

08. පොත්පත් බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු තමන් වෙත නිකුත් කරනු ලැබූ සාමාජික පත්‍රයක් වෙනුවෙන් ගෙනයනු ලබන යම් පොතක් ගැන වගකිව යුතු ය.

09. පොත්පත් බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් බඳවා ගනු ලබන සෑම තැනැත්තකුට පුස්තකාලයාධිපති විසින් සාමාජික කාඩ්පත් දෙකක් නිකුත් කළ යුතුය. එක් වරකට එක් සාමාජිකයෙකුට එක් පොතක් බැගින් ගෙනයා හැකි අතර, පොත් බැහැර ගෙන යාමේ දී සාමාජික පත් පුස්තකාලයේ තබා යා යුතුය.

10. පොත්පත් බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු විසින් 08 වැනි වගන්තිය යටතේ තමාවෙත නිකුත් කරනු ලබන සාමාජික පතක් නැතිවුවහොත් ඒ බව පුස්තකාලයාධිපති වෙත නොපමාව දැනුම් දිය යුතුය. එසේ නැති වූ සාමාජික පොත්පත් වෙනුවට කිසිම පොතක්, පොත්පත් බැහැරදෙන පුස්තකාලයේ බැහැර ගෙන ගොස් නැති බවට පුස්තකාලයාධිපතිට ඒත්තු ගියහොත් එසේ නැති වූ කාඩ්පත සාමාජික පත්‍රය වෙනුවෙන් රු. 10.00 ක මුදලක් අය කිරීමෙන් අනතුරුව දෙවැනි පිටයතක් නිකුත් කිරීම පුස්තකායාධිපති විසින් කලයුතු ය. සාමාජික පත නැති වූ බැව් තමා වෙත දැන්වූ දිනයේ සිට යටත් පිරිසෙයින් දින 30 ක් වත් ගත වනතෙක් පුස්තකාලයාධිපති සාමාජික පතෙහි දෙවැනි පිටපතක් නිකුත් නොකළ යුතු ය. එසේ සාමාජික පතෙහි දෙවැනි පිටපත නිකුත් කිරීම මුලින් නිකුත් කරනු ලැබූ සාමාජික පතක් වෙනුවෙන් යම් අවස්ථාවක ගෙන යන ලද

11. පුස්තකාලයාධිපතිගේ අභිමතය පරිදි තැන්පත් මුදල සහ සාමාජික පත් නැවතත් ආපසු නිකුත් නොකිරීමේ කොන්දේසියට යටත්ව සාමාජිකයෙකුගේ පදිංචියේ (හෝ රාජකාරී) ලිපිනයෙහි වෙනසක් වුවහොත් ඒ බැව් එසේ වෙනස් වී සතියක් ඇතුළත පුස්තකාලයාධිපති වෙත ලියවිල්ලක් දැනුම්දිය යුතු ය. සාමාජික පත් නැවත නිකුත් කිරීම පුස්තකාලයාධිපතිගේ අභිමතය පරිදි විය යුතු ය.

12. මහා නගර සභා සීමාවෙන් පිටතට සිය පදිංචිය වෙනස් කරන හෝ පුස්තකායෙන් ප්‍රයෝජන ගැනීම නවත්වන සාමාජිකයින් තම සාමාජිකපත් අවලංගු කිරීම සඳහා පුස්තකාලයාධිපති වෙත භාර දිය යුතු ය. එසේ නොකළහොත් ඔවුන්ගේ සාමාජික පත මාර්ගයෙන් බැහැර ගෙන යන පොත් සඳහා ඔවුන් වගකිව යුතු ය.

13. සාමාජිකත්වය දෑවුරුද්දකට වරක් අලුත්කර ගත යුතු වේ. ඒ සඳහා 7.1 (ඇ) වැනි වගන්තිය ප්‍රකාර ඇප කරුවෙකු ලවා සහතික කරන ලද අයදුම්පතක් නිසි ලෙස පුරවා ඉදිරිපත් කළ යුතු ය. එසේ අලුත් කර ගැනීමේ දී නැවතත් රු. 25.00 ක මුදලක් ගෙවිය යුතු ය.

14. (අ) පොත්පත් බැහැරදෙන අංශයෙන් සාමාජිකයෙකු විසින් බැහැර ගෙන යන ලද යම් පොතක් එය නිකුත් කරන ලද දින සිට දින 14 ක් ඇතුළත ආපසු පුස්තකාලයාධිපතිට භාර දිය යුතු ය.

(ආ) වෙනත් සාමාජිකයෙකු විසින් ඉල්ලා නොමැති යම් පොතක් නැවතත් දින 14 ක කාල සීමාවකට නැවත ලබා දිය හැකිය. පොත් පුද්ගලිකව හා පුස්තකාලයට ගෙනවිත් හෝ පුස්තකාලයාධිපති ඇමතූ ලිපියක් මගින් හෝ එසේ කල් තබා ගැනීම කළ හැකිය.

15. 14 වැනි වගන්තියෙහි සඳහන් දින 14 ක කාල සීමාව ඇතුළත පොත්පත් බැහැරදෙන අංශයෙන් ගෙනගිය පොතක් ආපසු භාර දීමට යම් සාමාජිකයෙකු අපොහොසත් වුවහොත් පොතක් භාර දීමට නියමිත දිනෙන් පසුව ආපසු භාර දීමට පමා වන සෑම දිනයකටම එකී පොතකට රු. 5.00 බැගින් වූ දඩ මුදලක් සාමාජිකයා විසින් ගෙවිය යුතු ය. පුස්තකාලය වසා තබන දිනයන් මෙහිලා ගණන් ගැනීම නොකළ යුතු ය.

16. (අ) බැහැර අංශයේ සාමාජිකත්ව ලබන සාමාජිකයෙකු ලබා ගත් යම් පොතක් ආපසු භාර දීමට දින තිහක් ඇතුළත අපොහෝසත් වුවහොත් නාගරික කොමසාරිස්ගේ තීරණ පරිදි ක්‍රියා කළ යුතු ය.

(ඇ) සාමාජිකයෙකු දින 30 ක් ඇතුළත එසේ පොත් භාරදීමට අපොහොසත් වුවහොත් පොතේ වටිනාකම මෙන් දෙගුණයක් ප්‍රමාද ගාස්තු වශයෙන් හා 25 අමතර ගාස්තුවක් අය කර ගැනීමේ බලය නාගරික කොමසාරිස් සතුය. එසේ නොවන්නේනම් නීතිමය ක්‍රියා මාර්ග ගත යුතු ය.

17. පොත්පත් බැහැර දෙන අංශයෙන් ගෙන යනු ලබන පොතකට කිසිදු අයුරකින් වත් අලාභහානියක් හෝ පලුද්දක් කිසිම සාමාජිකයකු විසින් නොකල යුතු ය. සාමාජිකයන් විසින් පොත් ඉතා පිරිසිදුව තබා ගත යුතු අතර, පොත් වල පිටු නැමීම, පැන්සල් වලින් ලකුණු කිරීම, වෙනත් සලකුණු කිරීම නොකල යුතු ය.

18. පොත් පත් බැහැර දෙන අංශයෙන් ගෙන යාමට අදහස් කරනු ලබන පොතකට යම් අලාභහානියක් හෝ පලුද්දක් වුවහොත් ඒ බව පුස්තකාලයාධිපතිගේ අවධානයට ලක් කිරීම සෑම සාමාජිකයෙකුගේම යුතුකම විය යුතු ය. එවැනි අලාභහානියක් හෝ පලුද්දක් පුස්තකාලයාධිපති වෙත දැන්වීමට ඔහු අපොහොසත් වුවහොත් පොත නිකුත් කිරීමේ දී කිසිම අලාභහානියක් නොමැතිව නිකුත් කළා සේ සැලකිය යුතු ය.

19. යම් සාමාජිකයෙකු විසින් ආපසු භාර දෙන ලද පොතක් (සාමාන්‍ය පාවිච්චියේ දී සිදු වන වෙනස්කම් හැර) නොයෙකුත් දේ ලිවීමෙන්, ලකුණු කිරීමෙන්, හෝ වෙනත් අන්දමකින් අලාභහානි වී ඇති බව පුස්තකාලයාධිපතිට ඒත්තු ගියහොත් ඔහුට සාමාජිකයාගෙන් පොතේ වටිනාකම අයකර ගත හැකිය. ඒ මුදල ගෙවීමට සාමාජිකයා අපොහොසත් වුවහොත් ඒ මුදල ගාස්තුව ද සමඟ අයකර ගැනීමට නාගරික කොමසාරිස් විසින් නීති මඟින් ක්‍රියා කළ හැකිය. සාමාජිකයා විසින් අලාභහානි වූ පොත, මහජන පුස්තකාලයේ අලාභහානි වූ ලෙස විකුණන ලදී යන පුස්තකාලයාධිපති අත්සන සහිත මුද්‍රාව තැබීමෙන් පසු එම අලාභහානි වූ පිටපත ලබා ගැනීමට එම සාමාජිකයාට හිමිකම් තිබිය යුතු ය.

20. කිසිම සාමාජිකයෙකු විසින් පොත්පත් බැහැර දෙන අංශයෙහි ගෙන යනු ලැබූ පොතෙහි වගකීම ඔහු දැරිය යුතු ය.

21. අ. කිසියම් බෝවෙන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙලෙන්නකු විසින් පාවිච්චි කරනු ලැබූ බවට සැක කරන පොතක් කිසිම සාමාජිකයෙකු විසින් පුස්තකාලයට ආපසු භාර නොදිය යුතු ය.

ආ. සාමාජිකයෙකු විසින් පොත්පත් බැහැර දෙන අංශයෙන් ගෙන යන ලද පොතක් එසේ බෝවන රෝගයකින්, ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙළෙන යම් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබූ වේ නම්, එම පොත විනාශ කර දැමිය යුතු අතර, එම පොත නැවත ලබා ගැනීමේ ගාස්තුව සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතු ය.

22. යම් පොතක් කුමන සාමාජිකයෙකු විසින් ගෙන යා යුතු දැයි පොත් පත් බැහැර දෙන අංශයේ සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු අතර අර්බුදයක් ඇති වුවහොත් එම අර්බුද පිළිබඳව පුස්තකාලයාධිපතිගේ තීරණය බලපැවැත්විය යුතු ය.

23. පුස්තකාලයේ සාමාජිකත්වයෙන් අස්වීමේ දී 7.1 ඉ ඡේදයේ අනුව ගෙවන ලද ඇප තැන්පත් මුදලින් පුස්තකාලයට අයවිය යුතු මුදලක් තිබේ නම් එය අය කොට ගෙන ඉතිරි මුදල සාමාජිකයාට ගෙවිය යුතු ය.

24. පුස්තකාලය වසා ඇති දිනයන් හා නගර සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් දිනයක හෝ දිනයන් හැර පොත් පත් බැහැර දෙන පුස්තකාලය සෑම දිනකම පෙරවරු 8.00 සිට පස්වරු 18.00 දක්වා විවෘතව තැබිය යුතු ය.

### විමර්ශන අංශය

25. විමර්ශන අංශයේ සාමාජිකත්වය වර්ෂයකට රු.50.00ක් ගෙවා ලබා ගත් ඕනෑම සාමාජිකයෙකුට එහි පොත්පත් පරිහරණය කළ හැකිය.

26. විමර්ශනය සඳහා පමණක් දෙනු ලැබූ පොතක් හෝ පුස්තකාලයේ එකතු කර ඇති දේපළ කොටසක් වන වෙනත් යම් පොතක්, පත්‍රිකාවක්, සඟරාවක්, චිත්‍රයක්, පින්තූරයක්, කැටයමක්, ලියවිල්ලක් මුද්‍රිත ප්‍රකාශනයක්, සටහනක්, සැළැස්මක්, අත්පිටපතක්, ප්‍රවෘත්ති පත්‍රයක්, හෝ විමර්ශන අංශයට අයත් ඕනෑම ප්‍රකාශයක් නගරාධිපතිගෙන් හෝ නාගරික කොමසාරිස්වරයාගෙන් කලින් ලබාගත් අවසරයක් නොමැතිව විමර්ශන පුස්තකාලයෙන් පිටතට ගෙන නොයා යුතු ය.

27. පුස්තකාලය වසා ඇති දින නගර සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් දිනයක හෝ දිනවල විමර්ශන පුස්තකාලය සෑම දිනයකම පෙරවරු 8.00 සිට පස්වරු 18.30 දක්වා විවෘතව තැබිය යුතු ය.

### සඟරා අංශය

28. පුස්තකාලයේ කියවීම් ශාලාවේ තබා ඇති හෝ ඊට අයත් කිසිම පොතක් ප්‍රවෘත්ති පත්‍රයක්, සඟරාවක් කාණ්ඩයක්, කලාපයක්, චිත්‍රයක්, පින්තූරයක්, සැළසුමක්, සටහනක්, සිතියමක්, ලියවිල්ලක්, මුද්‍රිත ප්‍රකාශයක් සටහනක්, සැළැස්මක්, අත්පිටපතක්, ප්‍රවෘති පත්‍රයක්, හෝ සඟරා අංශයට අයත් වෙනත් කිසිම දෙයක් සඟරා අංශයෙන් අවසරයක් නොමැතිව පිටතට ගෙන නොයා යුතු ය.

29. පුස්තකාලය වසා ඇති දිනයන්හි හෝ නගර සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් යම් දිනයක හෝ දිනයන්හි හැර සඟරා අංශය සෑම දිනයකම පෙරවරු 8.00 සිට පස්වරු 18.30 දක්වා විවෘතව තැබිය යුතු ය.

### ළමා අංශය

30. මහා නගර සභා පාලන සීමාව තුළ පදිංචි හෝ මහා නගර සභා පාලන සීමාව ඇතුළත පිහිටි පාසලක ඉගෙන ගන්නා ළමයින් ළමා පුස්තකාලයේ සාමාජිකයින් වශයෙන් ඇතුළත් කර ගත හැක. කිසිම ළමයෙකු,

අ. වයසින් අවු. 5 ට නොඅඩු නම් සහ 14ට වැඩි නොවේ නම් ද,
ආ. කියවීමට හැකිනම් ද මිස ළමා අංශයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත නොගත යුතු ය.

32. ළමා අංශයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් වීමට කැමැති සෑම ළමයෙක්ම පහත දැක්වෙන අවශ්‍යතාවයන් සපරා ලිය යුතු ය.

අ. සාමාජිකයා විසින් සාමාජික අයදුම්පත්‍රය අදාළ ග්‍රාම නිලධාරි මහතා විසින් පදිංචිය තහවුරු කළ යුතු ය.
ආ. ඇපකරුගේ පදිංචිය තහවුරු කර ගැනීම පිණිස වරිපනම් ලේඛනය පරීක්ෂා කර බැලිය යුතු ය.
ඇ. එසේ සම්පූර්ණ වූ අයදුම්පත අනුමත වූ පසු ලිපිනය තහවුරු කර ගැනීම පිණිස තැපැල් මඟින් සාමාජිකයාට යැවිය යුතු ය.
ඈ. පුසත්කාලයාධිපති වෙත නගර සභා සීමාව තුළ පදිංචි අයෙකු රු. 25.00ක මුදලක් ද නගර සීමාවෙන් පිටත පදිංචි අයෙකු රු. 50.00 ක මුදලක් ද තැන්පත් කළ යුතු ය.
ඉ. ඇපකරු වශයෙන් මව/ පියා භාරකරු අයදුම්පත සහතික කළ යුතු ය.
ඊ. පාසල් යන ශිෂ්‍යයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් තමා ඉගෙනුම ලබන පාඨශාලාවේ, විද්‍යාලයේ විද්‍යාලාධිපතිවරයා ලවා නිර්දේශ කරවා ගතයුතු ය. ව්‍යවස්ථාවේ ප්‍රකාර පිටසන් කරවා ගත යුතු ය.

33. ළමා අංශයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගන්නා ලද තැනැත්තාට සාමාජිකපත් දෙකක් නිකුත් කළ යුතු අතර, එම තැනැත්තාට එකී වරකට එම සාමාජික පත්‍රවලට පොත් දෙක බැගින් ගෙනයාමට හිමිකම් කියනු ලැබේ. පොත් බැහැර ගෙන යාමේදී සාමාජික පත් පුස්තකාලයෙහි තබා යා යුතු ය.

34. සාමාජිකපත් වලින් බැහැර ගෙන යනු ලැබෙන සියලුම පොත්පත්වලට සාමාජිකපත් හිමිකරු වගකිය යුතු හෙයින්, සාමාජිකපත් නැති නොකර තබා ගන්නා ලෙස ළමා අංශයේ සාමාජිකයින්ට අවවාද කරණු ලැබේ.

35. සාමාජිකයාගෙන් අයවිය යුතු සියලු දඩ මුදල් ගැනත් ඔහු විසින් නැති කරනු ලබන හෝ හානි පමුණුවනු ලබන පොතපත් ප්‍රමාණය හෝ වෙනත් ඕනෑම භාණ්ඩයක් ගැනත් ඇපකරුවා වගකිය යුතු ය.

36. ළමා අංශයේ සාමාජිකයෙකු විසින් 33 වන වගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලබන සාමාජික පතක් නැතිවුවහොත් ඒ බවට නොපමාව පුස්තකාලයාධිපති වෙත දැනුම් දිය යුතු ය. නැති වූ සාමාජික පත වෙනුවෙන් කිසිම පොතක් ළමා අංශයෙන් ගෙන ගොස් නැති බවට පුස්තකාලයාධිපතිට ඒත්තු ගියහොත් රු. 5.00 ක මුදලක් අයකිරීමෙන් අනතුරුව දෙවැනි පිටපතක් එම සාමාජිකා වෙත නිකුත් කළ හැකිය. සාමාජිකපත නැති වූ බව තමා වෙත දැන්වූ දිනයේ සිට යටත් පිරිසෙයින් දින 30ක් වත් ගතවන තෙක් සාමාජික පතේ දෙවැනි පිටපතක් නිකුත් කිරීම මුලින් නිකුත් කරනු ලැබූ සාමාජිකපත වෙනුවෙන් යම් අවස්ථාවක ගෙන යන ලද පොත් වෙනුවෙන් සාමාජිකයා වගකීමෙන් නිදහස් කිරීමට හේතුවක් නොවිය යුතු ය.

37. ළමා අංශයෙන් බැහැරව ගියහොත් 14 වැනි වගන්තියෙහි සඳහන් දින 14 තුළ ආපසු භාරදීමට සාමාජිකයා සාමාජිකයා අපොහොසත් වූ විට එසේ නියමිත දිනට වඩා පමාවන සෑම දිනකටම පොතකට රු. 5.00 බැගින් වූ දඩ මුදලක් සාමාජිකයා විසින් ගෙවිය යුතු ය. පුස්තකාලය වසා ඇති දින මේ කාර්යයෙහිලා ගණන් ගනු නොලැබේ.

38. සාමාජිකයෙකු ළමා අංශයෙන් බැහැර ගෙන ගිය පොතක් දින 30ක් ඇතුළත ආපසු භාර දීමට අපොහොසත් වුවහොත් පොත හෝ නාගරික කොමසාරිස්තුමාගේ විකල්ප තීරණ පරිදි පොතේ වටිනාකමට මෙන් දෙගුණයක් හා බැදීම් ගාස්තු 37 වන වගන්තිය අනුව එබඳු පමා වූ පොතකට දඩ මුදල් ද සාමාජිකයාගෙන්, සාමාජිකයාගේ දෙමාපියන්ගෙන් හෝ ඇපකරුවාගෙන් (භාරකරුගෙන්) නීති මඟින් අදාළ ගාස්තු අයකර ගැනීමේ බලය මහා නගර සභාවට හිමිවිය යුතු ය.

39. පුස්තකාලය වසා ඇති දින හා නගර සභාව මඟින් තීරණය කරනු ලබන වෙනත් යම් දිනයක හෝ දිනයන්හි හැර, ළමා අංශය සෑම දිනයකම පෙරවරු 8.00 සිට පස්වරු 17.30 දක්වා තැබිය විවෘතව යුතු ය.

40. මෙම අතුරු ව්‍යවස්ථාවේ 13, 16, 17, 18, 20, 21 හා 23 වැනි වගන්තිය ළමා අංශය කෙරෙහි ද අදාළ විය යුතු ය.

**ජංගම පුස්තකාල අංශය**

41. මහා නගර සභාව මඟින් තීරණය කරනු ලබන කලාපයක් සඳහා ජංගම සේවාවන් ආරම්භ කර පවත්වාගෙන යා යුතු ය. කලාපය තුළ ප්‍රජා සෞඛ්‍ය සහයක නිලධාරි මහතුන්ගේ හෝ බලය පැවරූ නිලධාරියකුගේ උපදෙස් පරිදි ළමා සමාජ පිහිටුවා ගත යුතු අතර, එම ළමා සමාජ සාමාජිකයින් තුළින් ජංගම පුස්තකාල සේවාවට සාමාජිකයින් බඳවා ගනු ලැබේ.

42. කිසිම ළමයෙකු,

අ. වයසින් අවු 5ට නොඅඩු වේ නම් 14ට නොවේ නම් ද,
ආ. කියවීමට හැකි නම් ද, මිස ජංගම පුස්තකාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත නොගත යුතු ය.

43. ජංගම පුසත්කාලයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් වීමට කැමැති සෑම ළමයෙක්ම පහත දැක්වෙන අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

අ. පුස්තකාලයාධිපති වෙත රු. 25.00 ක මුදලක් ඇප තැන්පත් කළ යුතු ය.
ආ. ඇපකරුවන් වශයෙන් දෙමාපියන් එකඟ විය යුතු ය.
ඇ. සෑම අයදුම්පතක් සඳහාම ප්‍රජා සෞඛ්‍ය සහයකගේ හෝ බලය පැවරූ නිලධාරියෙකුගේ නිර්දේශ ලබා තිබිය යුතු ය.

44. මෙම අතුරු ව්‍යවස්ථාවේ ළමා අංශයට අයත් පහත සඳහන් අංක 33, 34, 35, 36, 37, හා 38 වගන්ති ජංගම පුස්තකාල සේවා අංශයට අදාළ වේ.

45. පුස්තකාලය වසා ඇති දින හා නගර සභාව මඟින් තීරණය කරනු ලැබූ වෙනත් යම් දිනයක හෝ දිනයන් හැර ජංගම පුස්තකාල සේවාව ක්‍රියාත්මක වේ.

**සාමාන්‍ය කරුණු**

46. කිසියම් බෝවන රෝගයකින්, ස්පර්ශයෙන්, බෝවන රෝගයකින් හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතදී පෙලුන හෝ එබඳු රෝගයකින් පෙලෙන හෝ පෙලෙන කෙනෙකුට සාත්තු කිරීමේ යෙදී සිටින හෝ පිට අයෙකු එම බීජෞෂන සමය සහ බෝවන කාලය ගෙවී අවසන් වනතෙක් පුස්තකාලයේ මොනව කාරණයකටවත් ඇතුළත් නොවිය යුතු ය.

47. කිසිම තැනෙත්තෙකු,

1. පුස්තකාල ගොඩනැඟිල්ල තුළ දී හෝ ඒ අවට අවිනීත නැතහොත් අසංවර අන්දමින් හැසිරීම නොකළ යුතු ය.

2. පුස්තකාලය තුළ හෝ ඒ අවට ඇති සභාවට අයත් කිසිම බඩු බාහිරාදියකට, ගොඩනැඟිල්ලකට හෝ දේපළකට අලාභ හානි නොකළ යුතු ය.

3. සැහීමකට පත්වීමට පුළුවන් එසේම යුක්ති සහගත පිළිතුරක් දීමට හැකි නම් මිස පුස්තකාලයේ අයත් ගොඩනැඟිල්ලේ පුස්තකාලය තුළ හෝ ඒ අවට පුස්තකාලය වැසූ පසු සැරිසැරීම හෝ ඒ තුළ නැවතීම නොකල යුතු ය.

4. පුස්තකාලය තුළ දී කෙළ ගැසීම හෝ දුම්බීම නොකළ යුතු ය.

5. පුස්තකාලය තුළ දී කඩදාසි කඩදාසි කුට්ටම් මඟින් සුදු ක්‍රීඩා කිරීම හෝ වෙනත් යම් ක්‍රීඩා කිරීම නොකළ යුතු ය.

6. පුස්තකාලය තුළ හෝ ඒ අවට ශබ්ද නගා ඝෝෂා කිරීමෙන් සිංදු කීමෙන් හෝ වෙනත් යම් අන්දමකින් හෝ පාඨකයින්ට කරදර නොකළ යුතු ය.

7. අවිනීත අන්දමින් ඇඳුම් ඇඳගෙන පුස්තකාලයට ඇතුළත් නොවිය යුතු ය.

8. පුස්තකාලයට යම් බල්ලෙක් හෝ වෙනත් යම් කිසිම සතෙක් හෝ රැගෙන නොයා යුතු ය.

9. පුස්තකාල ගොඩනැගිල්ල තුළ දී හෝ ඒ අවට කිසිම ආහාරයක් හෝ මත්පැන් පානය කර පැමිණීම හෝ ගැනීම හෝ නිදා ගැනීම නොකළ යුතු ය.

10. කුඩ, තොප්පි, සැරයටි, උර, පාර්සල්, හෝ වෙනත් භාණ්ඩ පිළිබඳ ආරක්ෂාව සඳහා වගකීම් කාර්‍යය මණ්ඩලයේ කිසිම කෙනෙකුට නොපැවරිය යුතු ය. එවැනි භාණ්ඩ සියල්ලක්ම අයිතිකරුවන්ගේම වගකීම පිටම තැබිය යුතු ය.

11. පුස්තකාලයේ මහජනයාගේ ප්‍රයෝජනය සඳහා වෙන් නොකරන ලද කිසිම තැනකට හෝ අංශයකට ඇතුළත් වීමට හෝ නැවතී සිටීම නොකළ යුතු ය.

12. පුස්තකාලයට අයත් භාණ්ඩයක් වශයෙන් සලකනු ලබන පොතක්, පතක්, භාණ්ඩයක් හෝ ලියවිල්ලක් විනාශ කිරීම ඒ පිට ලිවීමෙන්, කැපීමෙන්, ඉරීමෙන් හෝ විරූපී කිරීමෙන් අලාභ හානි කිරීම පුස්තකාලයේ ප්‍රයෝජනයට ඇති ලී බඩුවලට හෝ වෙනත් භාණ්ඩයකට හෝ සවි කිරීමකට කිසිම අලාභ හානි කිරීම නොකළ යුතු ය.

13. මේ අතුරු ව්‍යවස්ථා මාලාව යටතේ තම බලතල නීත්‍යානුකූලව පාවිච්චි කිරීමේ දී පුස්තකාලයාධිපති හෝ ඔහුගේ නියෝගය පිට සේවය කරන වෙනත් තැනැත්තෙකුට හෝ බාධා නොකල යුතු ය.

48. පුස්තකාල ගොඩනැගිල්ල තුළ දී හෝ ඒ ඒ ස්ථානයේ යම් තැනැත්තෙකු,

අ. අසංවර අන්දමින් හෝ අවිනීත අන්දමින් හැසිරෙන්නේ නම්,

ආ. වේගවත් අපහාසාත්මක හෝ අසත්‍ය හෝ භාෂාවක් පාවිච්චි කරන්නේ නම්,

ඇ. ඔට්ටු ඇල්ලීමේ හෝ සූදු ක්‍රීඩාවෙහි යෙදෙන්නේ නම් නැතහොත් පුස්තකාලය මහජනයාට විවෘතව තබන කාල සීමාවෙන් පසුව පුස්තකාලය තුළ දී රැඳී සිටීමට උත්සාහ දරන යමෙකු වේ නම් හෝ පුස්තකාලය පාවිච්චි කිරීමට හිමිකම් ඇති අයෙකු වේ නම් එවැනි අය පුස්තකාලයෙන් පිටතට යැවීම හෝ පිටතට හැරීම පුස්තකාලයාධිපති හෝ සභාවේ නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් කල හැකි ය.

49. මෙම ව්‍යවස්ථාවේ 26, 29, 46, 47, හෝ 48 යන වගන්ති, යමෙකු විසින් උල්ලංඝණය කලහොත් නාගරික කොමසාරිස්තුමා නියම කරන ලද ගාස්තුවක් පුස්තකාල අරමුදලට ගෙවිය යුතු ය.

50. 16, 17, 18, 19, 20, 26, 29, 46, 47, හා 48 වැනි වගන්ති එකික් හෝ ඊට වැඩිගණනක් උල්ලංඝණය කරන අයගේ සාමාජිකත්වය නගරාධිති හෝ කොමසාරිස්වරයා විසින් අවලංගු කළ යුතු අතර, එසේ වරක් සාමාජිකත්වය අවලංගු කරනු ලැබූ සාමාජිකයෙකුට නැවතත් මොනම අන්දමකින්වත් සාමාජිකත්වය ලබාදීමට නොහැකි විය යුතු ය.

51, මෙහි පහත සඳහන් පරිදි පුස්තකාල අරමුදලක් මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන්නේ ය.

**පුස්තකාල අරමුදල**

51.1 අරමුණු.-

මෙම අරමුදල, මහජන පුස්තකාල අරමුදල, වශයෙන් හැඳින් වේ. මෙම අරමුදලේ අරමුණු වන්නේ පුස්තකාලයට අවශ්‍ය වන සියලුම වර්ගයේ පොත්පත් සඟරා මෙන්ම ලී බඩු උපකරණ හා පාඨකයාට අවශ්‍ය නව දැනුම හා තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය නව තාක්ෂණික උපකරණ හා සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය මුදල් එක් රැස් කිරීමයි.

51.2 අරමුදලට ආධාර ලැබීම.-

මහා නගර සභාව මඟින් වෙන් කරන මුදල්, රජයේ වෙනත් දෙපාර්තුමේන්තු වලින් ලැබෙන ආධාර මුදල්, පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන මුදල්, ස්වේච්ඡා ආයතනවලින් සහ රාජ්‍ය නොවන ආයතනවලින් ලැබෙන මුදල්, විදේශ රටවලින් ලැබෙන ආධාර මෙම අරමුදලට එකතු

කෙරේ. මහජන පුස්තකාලයට දෛනිකව ලැබෙන ආදායම ද මෙම අරමුදලට එකතු කළ යුතු ය. අරමුදලට සංවර්ධනය කිරීම සඳහා පවත්වන විවිධ ව්‍යපෘති වලින් එකතු කරන මුදල් ද මෙම අරමුදලට එකතු කෙරේ.

51.3 අරමුදල් කමිටුව.-

අරමුදල පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුත් කමිටුවක් මඟින් පාලනය කෙරේ.

1. ගරු නගරාධිපතිතුමා හෝ නියෝජ්‍ය නගරාධිපතිතුමා
2. නාගරික කොමසාරිස්
3. නාගරික ලේකම්
4. නාගරික ගණකාධිකාරි
5. උපදේශක කමිටුව සාමාජිකයන් අතරින් තිදෙනෙක්, (එක් අයෙක් නාගරික මන්ත්‍රීවරයෙකු විය යුතු ය.)
6. ප්‍රධාන පුස්තකාලයාධිපති
7. ආයුර්වේද කමිටුවේ සභාපති හෝ සාමාජිකයෙකු

අරමුදල.-

කමිටුව සාමාජිකයන් 09 කින් යුක්ත වන අතර, රැස්වීමේ ගණපූර්ණය 04ක් විය යුතු ය. අරමුදල් කමිටුවේ සභාපති ධුරය නිළ බලයෙන්ම ගරු නගරාධිපතිතුමාට හෝ නියෝජ්‍ය නගරාධිපතිතුමාට හිමිවන අතර, ලේකම් ධුරය ප්‍රධාන පුස්තකාලයාධිපතිට හිමිවේ. අවම වශයෙන් මසකට එක් වරක්වත් අරමුදල කමිටුව රැස්විය යුතු ය. ව්‍යවස්ථාවට යම් සංශෝධනයක් කරන්නේ නම් පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශය ලබා සහා අනුමැතිය ලබාගත යුතු ය.

51.4 අරමුදලේ මුදල් පරිහරණය -

අරමුදලේ මුදල් ගෙවීමේ දී සියලුම ගෙවීම් සඳහා අරමුදල කමිටුවේ අනුමැතිය ලබාගත යුතු ය. මුදල් ජංගම හෝ ඉතිරි ගිණුමක තැන්පත් කළ යුතු ය. නාගරික ගණකාධිකාරි විසින් සෑම වර්ෂයකටම ගිණුම් වාර්තාවන් ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දාට පෙර මහා සභාවට ඉදිරිපත් කළ යුතු ය. අරමුදලේ ගිණුම් කටයුතු විගණනයට ලක් කළ යුතු ය. අරමුදලේ මුදල් පරිහරණය සඳහා පහත සඳහන් අයගේ අත්සන වලංගු වේ. නාගරික කොමසාරිස් හෝ නාගරික ලේකම් හෝ ප්‍රධාන පුස්තකාලයාධිපති සහ ගණකාධිකාරි අනිවාර්ය විය යුතු ය.

51.5 සාමාන්‍ය කරුණු. -

අරමුදලට අදාළව ව්‍යවස්ථාවේ පරමාර්ථ තුළින් බාහිරව ගන්නා සෑම තීරණයක දී ම අරමුදල් කමිටුවේ තීරණය වන්නේ ය.

52 නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය

1 බදුල්ල මහා නගර සභා පාලන සීමාව තුළ පදිංචි හෝ මහා නගර සභා පාලන සීමාව ඇතුලත පිහිටි පාසලක ඉගෙන ගන්නා ළමයින් නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයින් වශයෙන් ඇතුලත් කර ගත හැක. කිසිම ළමයෙකු,

2 අ. වයසින් අවු. 5 ට නොඅඩු නම් සහ 14ට වැඩි නොවේ නම් ද,
ආ. කියවීමට හැකිනම් හෝ පරිඝණක හැසිරවිය හැකිනම් ද, මිස නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කර ගත නොගත යුතු ය.

11. නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුලත් වීමට කැමැති සෑම ළමයෙක්ම පහත දැක්වෙන අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.

අ. සාමාජිකයා විසින් සාමාජික අයදුම්පත්‍රය අදාළ ග්‍රාම නිලධාරි මහතා විසින් පදිංචිය තහවුරු කළ යුතු ය.

ආ. ඇපකරුගේ පදිංචිය තහවුරු කර ගැනීම පිණිස වරිපනම් ලේඛනය පරික්ෂා කර බැලිය යුතු ය.

ඇ. එසේ සම්පූර්ණ වූ අයදුම්පත අනුමත වූ පසු ලිපිනය තහවුරු කර ගැනීම පිණිස තැපැල් මඟින් සාමාජිකයාට යැවිය යුතු ය.

ඈ. පුස්තකාලයාධිපති වෙත නගර සභා සීමාව තුළ පදිංචි අයෙකු රු. 25.00ක මුදලක් ද, නගර සීමාවෙන් පිටත පදිංචි අයෙකු රු. 50.00ක මුදලක් ද තැන්පත් කළ යුතු ය.

ඉ. ඇපකරු වශයෙන් මව/ පියා භාරකරු අයදුම්පත සහතික කළ යුතු ය.

ඊ. පාසල් යන ශිෂ්‍යයන් විසින් ඔවුන්ගේ අයදුම්පත් තමා ඉගෙනුම ලබන පාඨශාලාවේ විද්‍යාලයේ විද්‍යාලයාධිපතිවරයා ලවා නිර්දේශ කරවා ගත යුතු ය. ව්‍යවස්ථාවේ ප්‍රකාර පිටසන් කරවා ගත යුතු ය.

iii. නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු වශයෙන් ඇතුලත් කර ගන්නා ලද තැනැත්තාට සාමාජිකපතක් නිකුත් කළ යුතු අතර, එම තැනැත්තාට එම සාමාජික පත්‍රය ඉදිරිපත් කර නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ පරිඝණක භාවිතා කල හැකි ය.

iv. නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු විසින් 33 වන වගන්තිය යටත් තමා වෙත නිකුත් කරනු ලබන සාමාජික පතක් නැතිවුවහොත් ඒ බවට නොපමාව පුස්තකාලයාධිපති වෙත දැනුම් දිය යුතු ය. නැති වූ සාමාජික පත වෙනුවෙන් හෝ සාමාජිකයකු විසින් පරිඝණකයකට කිසියම් හානියක් වුවහොත් සාමාජිකයා විසින් වගකිව යුතු ය.

v. නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයේ සාමාජිකයෙකු විසින් පරිඝණක භාවිතා කිරීමට පෙර හෝ පසු අදාල ගාස්තු ගෙවා නැණසර තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානයෙන් පිටව යා හැකි ය.

53. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝණ කරන සෑම තැනැත්තෙකුම වරදකරු කරනු ලැබූ විට මහා නගර සභා ආඥාපනතේ 267 (3) වගන්තියෙන් සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= කට නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

54. මෙම අතුරු ව්‍යවස්ථාවල පද සම්බන්ධයෙහිලා අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ''පුස්තකාලයාධිපති'' යනු පුස්තකාලය භාරව කටයුතු කිරීමට පත් කරන තැනැත්තා වේ. පුස්තකාල සහායක යන පාඨයෙන් පුස්තකාලයාධිපතිගේ සහායකයෙකු අදහස් වේ.

## XXXVI වන කොටස

### *ගලී රථ වාහන සැපයීම, සේවාවන් ලබා දීම, ගාස්තු නියම කිරීම, අය කිරීම සහ පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

252 වන අධිකාරය වන මහා නගර සභාවේ ආඥා පනතේ 267 සහ 272 වන වගන්ති සමග කියවිය යුතු (5) වන උප වගන්තියේ (ආ) ඡේදයේ පරිදි මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ ගලී රථ වාහන සැපයීම, සේවාවන් ලබා දීම, ගාස්තු නියම කිරීම, අය කිරීම සහ පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් පනවනු ලැබේ.

01. මෙම අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභාවේ ගලී රථ වාහන සැපයීම, සේවාවන් ලබා දිම, ගාස්තු නියම කිරීම, අය කිරීම සහ පැනවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නමින් හඳුන්වනු ලැබේ.

02. (අ) බදුල්ල මහා නගර සභා සීමාව තුළ අපජලය බැහැරලීම/ අප ද්‍රව්‍ය ඉවත් කිරීම/ පූතික ටැංකි පිරිසිදු කිරීම / වැසිකිළි වලවල් පිරිසිදු කිරීම / උරා ගැනීමේ වලවල් පිරිසිදු කිරීම / කාණු සහ බාධා ස්ථානවල ඇති අපජලය/ අප ද්‍රව්‍ය ඉවත් කිරීම සහ නැවත රැගෙන ඒම සහ සුදුසු ස්ථානවල බැහැරලීම විධිමත් කිරීම, පාලනය කිරීම,ගාස්තු නියම කිරීම, අය කිරීම සහ පැනවීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව පනවන ලදි.

(ආ) මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි නිවාස, ව්‍යාපාරික ස්ථාන / රාජ්‍ය ආයතන / රාජ්‍ය නොවන ආයතන / ආගමික ස්ථාන/පාසල් / කර්මාන්ත / පොදු වෙළඳපළවල්/ සුපිරි වෙළෙඳපලවල්/ මධ්‍යම වෙළඳපළ ආර්ථික මධ්‍යස්ථාන/ දුම්රිය ස්ථාන/ සතිපොළ/ ඉරිදා පොළ/ දිනපතා පොළ/ පොදු වැසිකිළි/ පෞද්ගලික වැසිකිළි හා කැසිකිළිවලට භාවිතා කරනු ලබන වළ/ පූතික ටැංකි/අපදෝවන ටැංකි/ගලි ටැංකි/සිමෙන්ති බෞලෝ ටැංකි/ප්ලාස්ටික් ටැංකි/ කෘතිම ටැංකිවලින් ඉවතලන අප ජලය හා අප ද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැරලීම සඳහා සහ මහජන සෞඛ්‍ය ආරක්‍ෂාව පවත්වාගෙන යෑම සඳහා සහ පළාත් පාලන නීති රීති සහ රෙගුලාසිවලට යටත්ව මේ සඳහා මහා නගර සභා ගලී රථ සේවාව ලබා ගත යුතු ය.

(ඇ) මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි නිවාස, ව්‍යාපාරික ස්ථාන/ රාජ්‍ය ආයතන/ රාජ්‍ය නොවන ආයතන / ආගමික ස්ථාන/ පාසල්/ කර්මාන්ත /පොදු වෙළඳපළවල් /සුපිරි වෙළෙඳපලවල් /මධ්‍යම වෙළඳපළ/ ආර්ථික මධ්‍යස්ථාන / දුම්රිය ස්ථාන/ සතිපොළ/ ඉරිදා පොළ/ දිනපතා පොළ/ පොදු වැසිකිළි / පෞද්ගලික වැසිකිළි හා කැසිකිළි වල භාවිතා කරනු ලබන වළ / පූතික ටැංකි / අපදෝවන ටැංකි /ගලි ටැංකි /සිමෙන්ති බෞලෝ ටැංකි /ප්ලාස්ටික් ටැංකි / කෘතිම ටැංකි වලින් ඉවතලන අප ජලය හා අප ද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැරලීම සඳහා සහ මහජන සෞඛ්‍ය යතාවත් පරිදි පවත්වාගෙන යෑම සඳහා සහ පළාත් පාලන නීති රීති සහ රෙගුලාසි වලට යටත්ව උරා ගැනීමේ වලක් හෝ පූතික ටැංකි ඉදිකර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

03. (අ) නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව බදුල්ල මහා නගර සභාවට අයත් බල ප්‍රදේශය සහ මෙම සේවාවන් සපයනු ලබන විකල්ප සේවා අවශ්‍යතා වලට අනුව වෙනත් පළාත් පාලන බල ප්‍රදේශ වල සේවාවන් සැපයීම නොකළ යුතු ය.

(ආ) සේවාවන් ලබා ගැනීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරු 01 (පළවන) උපලේඛණයේ සඳහන් අයදුම් පත්‍රය සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍රයක් බදුල්ල නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) අදාල අයදුම්පත මෙම මහා නගර සභාව සහ අයදුම්කරු අතර ගිවිසුමක් ලෙස සැළකිය යුතු ය.

(ඉ) අයදුම්කරුගේ ඉල්ලීම මත මෙම මහා නගර සභාවේ අයදුම්පත සම්පූර්ණ කර අනුමැතිය ලැබීමෙන් පසු අදාල ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතු ය. (දෙවන උපලේඛනය අදාල ගාස්තු වැටි මුදලට යටත්වේ.) අදාල ගාස්තු ගෙවීමෙන් පසු පමණක් සේවාවන් සැපයීමට කටයුතු කළ යුතු ය. මෙම ගාස්තු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

(ඊ) අයදුම්පතට අනුමැතිය ලැබීමෙන් පසු මහා නගර සභා සැපයීමේ පොරොත්තු ලේඛණයට අනුව අදාල සේවාවන් ලබාදෙනු ලැබේ.

(උ) අයදුම්කරුගේ ලිපිනයේ සඳහන් ස්ථානයේ තිබෙන ගලිවල / වැසිකිළිවල / අප ජලය ගබඩාටැංකි වල පිරී තිබෙන අපද්‍රව්‍ය ඉවත් කිරීමට (මහජන සෞඛ්‍යයට අහිතකර නොවන පරිදි) අදාල මහා නගර සභා සේවකයින් සහ ස්ථානයේ භාරකරු හා සේවක මණ්ඩලය මේ සඳහා සහයෝගයෙන් කටයුතු කර අදාල සේවාව ලබා ගත යුතුයි.

04. (අ) අයදුම්පත් භාර ගැනීමෙන් පසු කුමන හෝ බාධාවක් හේතුකොට ගෙන හෝ නොවැලැක්විය හැකි හේතුවක් මත මෙම සේවාවන් ලබා දීමට නොහැකි අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් අයදුම්කරු මහා නගර සභාව විසින් ගනු ලබන තීරණ වලට හා උපදෙස් වලට එකඟ විය යුතු ය.

(ආ) අයදුම්කරුගේ ඉල්ලීම මත අයදුම් පත්‍රයේ සඳහන් ස්ථානයේ මිස වෙනත් ස්ථානයක ගලී රථ සේවය සැපයිය නොහැකි ය.

05. (අ) ගලීරථ වාහනය සැපයීම, සේවාවන් ලබා දීම, ගාස්තු අය කිරීම, බදුල්ල මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර, එවැනිම යෝජනා සම්මතයක් මගින් කලින් කළ මෙම ගාස්තු සංශෝධනය කළ හැකි ය.

(ආ) බදුල්ල මහා නගර සභාවේ ගලීරථ වාහන සැපයීම සේවාවන් ලබා දීමේ දී එහි අප ද්‍රව්‍ය සහ අප ජලය නැවත ගලී මධ්‍යස්ථානය වෙත රැගෙන ඒම සඳහා ගාස්තු අය කළ යුතු ය.

06. (අ) ගලී රථ වාහනය සහ සේවාවන් ලබා දීමේ ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කළ සංශෝධනය ගාස්තු රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ මෙම මහා නගර සභාවේ සහ නාගරික සෞඛ්‍ය අංශයේ අයදුම්පත් භාර ගන්නා ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීමද කළ යුතු ය.

(ඇ) අය කරන ගාස්තු මෙහි පළමු වන උපලේඛණයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පැනවනු ලැබිය හැකිය.

07. (අ) අදාළ සේවාව අවශ්‍ය ස්ථානය සම්බන්ධව අයදුම්කරු විසින් අදාළ ස්ථානයේ අයිතිකරු/ පදිංචිකරු / භාරකරු හෝ වගකිව යුතු තැනැත්තා විසින් අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතු ය.

(ආ) තවද ඒ සම්බන්ධයෙන් වගකීම ඔහු/ ඇය විසින් දැරිය යුතු ය.

(ඇ) අයදුම්කරු හෝ පදිංචිකරු, අයිතිකරු, භාරකරු හෝ වගකිව යුතු තැනැත්තා එම ස්ථානය සම්බන්ධයෙන් ගැටළුවක් වන්නේ නම් අයිතිය හා තමන්ගේ වගකීම වෙනුවෙන් ඔහු/ඇය විසින් දැරිය යුතු ය.

(ඉ) අයදුම්කරු හෝ පදිංචිකරු, අයිතිකරු, භාරකරු හෝ වගකිවයුතු තැනැත්තා එම ස්ථානය හෝ අවට මේ සේවාව ලබා ගැනීම සම්බන්ධයෙන් ගැටළුවක් වන්නේ නම් වගකීම සහතික ඔහු/ඇය විසින් කළ යුතු ය.

08. (අ) අදාළ සේවාවන් ඉටු කිරීමට යාමේ දී මෙම කටයුතු අවසන් වන තුරු යම් වීථියක හෝ පාරක රිය මඟට යාමට නොහැකි වන අවස්ථාවක හෝ භූමියේ පිහිටීමට අනුව මෙම වාහනය එම ස්ථානයට ගැනීමට නොහැකි වන අවස්ථා වලදී නොහැකිවන පාඩු අයදුම්කරු විසින් දැරිය යුතු ය.

(ආ) යම් වීථියක හෝ පාරක රිය මඟට යාමට නොහැකි වන අවස්ථාවක හෝ භූමියේ පිහිටීමට අනුව මෙම වාහනය එම ස්ථානයට ගැනීමට නොහැකි වන අවස්ථා වලදී හෝ වාහනයට සිදු වන අලාභ හානි සඳහා වන වියදම් අයදුම්කරු විසින් දැරිය යුතු ය.

(ඇ) ගලීරථ සේවාව ලබා දීමට එම ස්ථානය සුදුසු තත්වයක තිබිය යුතු අතර, නිසි නඩත්තු කිරීමකින් යුතුව එම ස්ථානය පවත්වාගෙන යා යුතු ය.

(ඉ) මෙම සේවාව ලබා දීමේදී අදාළ රථ වාහනය සහ සේවකයින් එම ස්ථානයට වාර්තා කිරීමේ දී ඉල්ලුම්කරු හෝ අදාළ පුද්ගලයින් එම ස්ථානයේ නොසිටීම සහ එම ස්ථානය වසා තැබීම, යාමට නොහැකි වන අවස්ථා වලදී සේවාවන් සැපයීමට නොහැකි වීම සම්බන්ධයෙන් එහි වගකීම ඉල්ලුම්කරු විසින් දැරිය යුතු ය.

(උ) ඉහත (ඉ) ඡේදයේ සඳහන් අවස්ථාවක දී ප්‍රවාහන ගාස්තුව ඇතුලත්ව මහා නගර සභාව විසින් නියම කරනු ලබන ගාස්තු තැන්පත් මුදලින් අය කර ගැනීමට මහා නගර සභාවට බලය ඇත.

(ඌ) මෙම සේවාව ඉල්ලුම්කරු වෙත සැපයීමට යම් බාධාවක් අවහිරතාවයක් හෝ වෙනත් ඕනෑම හේතුවක් මත ඉල්ලුම්කරු තැන්පත් කරන ලද මුදල් ප්‍රවාහන ගාස්තු, පරීක්ෂණ වියදම් අය කිරීමට මහා නගර සභාවට බලය ඇත.

09. (අ) තවද මෙම සේවාව ඔහු විසින් සපයන්නේ නම් (ඉල්ලුම්කරු විසින් අදාල අප ද්‍රව්‍ය සහ අපජලය වෙනම බහාලීමට පහසුකම් සපයා ගන්නේ නම්) අදාල ගාස්තු අය කරනු ලැබේ.

(ආ) මහා නගර සභා සීමාව තුළ පදිංචිකරුවකුගේ ඉල්ලීම මත සේවාව සැපයීමට නොහැකි අවස්ථාවක ඉල්ලුම්කරු තැන්පත් කරන ලද මුදල වෙනත් පරිපාලන වියදම් කොටසක් දරා ඇත්නම්, එම මුදල මහා නගර සභාවට අයකර ගැනීමෙන් පසු ඉල්ලුම්කරුගේ එකඟතාවය මත වෙනත් යම් බදු මුදලක් ගාස්තුවක් සඳහා අය වීමට ඇති මුදලක් වේ නම් එය හිලව් කර ගැනීමට මහ නගර සභාවට බලය ඇත.

(ඇ) මෙම ඉවත් කරනු ලබන අප ද්‍රව්‍ය මහජන සෞඛ්‍යට අහිතකර නොවන ආකාරයට සහ අදාල පළාත් පාලන ආයතනයේ නීති රීති සහ රෙගුලාසි වලට යටත් විය යුතු ය.

10. (අ) කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගන්නා ලද භාජන සෝදා හරිනු ලබන ජලය ඇළකට හෝ දොලකට හෝ ජල පහරකට හෝ පොදු හෝ විවෘත භූමියකට මුදා නොහළ යුතු ය.එසේම එම අප ජලය ගබඩා කර පසුව ගලි සේවාව මගින් ඉවත් කිරීමට කටයුතු කල හැකිය.

(ආ) වාහන සේවා කිරීමෙන් අනතුරුව මුදාහරිනු ලබන අප ජලය සහ සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස, එකී අප ද්‍රව්‍ය

(i) ජෛවභායන අපද්‍රව්‍ය.
(ii) වීදුරු
(iii) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර. ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති, වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති, අප ද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

11. නාගරික කොමසාරිස් වරයා හෝ නාගරික කොමසාරිස්වරිය විසින් ලිඛිතව හෝ පොදුවේ බලය පවරන ලද නිලධාරියෙකුට යුක්ති සහගත සාධාරණ වේලාවන් තුල දී අප ජලය විධිමත්ව බැහැර නොකරන නිවෙස් වලට, ව්‍යාපාරික ස්ථාන වලට ඇතුළු වී අවශ්‍ය උපදෙස් ලබා දීම හා නිත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝණය කරන සෑම තැනැත්තෙකුම වරදකරු කරනු ලැබූ විට මහා නගර සභා ආඥාපනතේ 267 (3) වගන්තියෙන් සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු 1000/= කට නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රුඃ 2000/= කට නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

මේ කොටසේ අතුරු ව්‍යවස්ථා වල, ගලීරථ සේවය, යන්නෙන් ගලියේ සේවාව කිරීම, සේවාව සැපයීම සහ රථ වාහන ලබා දීම, අප ද්‍රව්‍ය සහ අප ජලය ඉවත් කිරීම.

**පළමුවන උපලේඛනය**

බදුල්ල මහා නගර සභාව - නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

***වැසිකිළි අපද්‍රව්‍ය ඉවත්කර ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. ඉල්ලුම්කරුගේ නම ආයතනය :...........................................................................

2. ලිපිනය :...........................................................................
...........................................................................

3. මහා නගර සභා කාර්යාලයේ සිට ඇති ආසන්න දුර :...........................................................................

4. ගලී රථය ගමනාගමනයට සුදුසු මාර්ගයක් ද :...........................................................................

5. වැසිකිළි වලේ සිට ගලීරථ වාහනය නවත්වා ගලියේ බට දැමීමට ඇති දුර :...........................................................................

6. ඉවත් කරනු ලබන අප ද්‍රව්‍ය බැහැරලීම සඳහා සුදුසු ස්ථානයක් තිබේ ද :...........................................................................

7. ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය බැහැරලීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති නම් මහ නගර සභා ගලීරථ මධ්‍යස්ථානයට ගෙන ඒමට සිදුවේ ද ?
:...........................................................................

8. සේවය අවශ්‍ය දිනය :...........................................................................

9. ගමන් මාර්ගය (විස්තර සඳහන් කරන්න) :...........................................................................

10. නිවසේ / ආයතනයේ දුරකතන අංකය :...........................................................................

............................................ ......................................................
දිනය ඉල්ලුම්රුගේ අත්සන

---

11. ඉහත සඳහන් ස්ථානය සඳහා ගලි රථ සේවය ලබා දීමට අනුමැතිය පතමි.

............................................ ......................................................
දිනය මහජන සෞඛ්‍ය පරීක්ෂක

12. ගලි රථයේ සේවය ලබා දීමට අනුමත කරමි / නොකරමි.

......................................................
නාගරික කොමසාරිස්

---

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පිණිසයි)

ගෘහ සේවා සඳහා ගාස්තු

| | නගර සීමාව තුළ | නගර සීමාවෙන් පිටත |
|---|---|---|
| සේවා ගාස්තු | | |
| ප්‍රවාහන ගාස්තු | | |
| කම්කරු / රියදුරු යැපීම් දීමනා | | |
| අමතර ද්‍රව්‍ය නැවත ගෙන ඒම සඳහා ගාස්තු | | |
| අදාළ වැට් මුදල | | |
| ගෙවිය යුතු මුදල | | |

වාණිජ සේවා සඳහා ගාස්තු (බවුසර් ලෝඩ් 01ක් සඳහා)

| | නගර සීමාව තුළ | නගර සීමාවෙන් පිටත |
|---|---|---|
| සේවා ගාස්තු | | |
| ප්‍රවාහන ගාස්තු | | |
| කම්කරු / රියදුරු යැපීම් දීමනා | | |
| අමතර ද්‍රව්‍ය නැවත ගෙන ඒම සඳහා ගාස්තු | | |
| අදාළ වැට් මුදල | | |
| ගෙවිය යුතු මුදල | | |

නාගරික ගණකාධිකාරි

ඉහත සඳහන් පරිදි රු. ........................................................................................................ අය කර ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

........................................................ ................................................................

මහජන සෞඛ්‍ය පරීක්ෂක ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක

...........................

දිනය

---

සෞඛ්‍ය පරිපාලක

ඉහත ඉල්ලීම පරිදි අවශ්‍ය කටයුතු කර වාර්තා කරන්න.

.................... ..........................................................

දිනය මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ගලී රථය යෙදවීම

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය :........................................................................................................................................................................

2. ගමන් මාර්ගය :..................................................................................................................................................................

3. ආරම්භ වන ධාවන මීටරයේ අංකය :....................................................................................... අවසාන අංකය :...........................................................................

4. යොදවනු ලබන දිනය :.................................................................................................................................

5. යොදවනු ලබන සේවකයින්ගේ නම් :1. ........................................................................................................

2. ........................................................................................................

6. ආරම්භ කරන ලද වේලාව :.................................................................................................................................

අවසන් කරන ලද වේලාව :.................................................................................................................................

ඉහත සඳහන් පරිදි කටයුතු නිසි ලෙස සිදු කරන ලද බව සහතික කරමි.

........................ ..................................

දිනය රියදුරු අත්සන

---

7. නිවාස / ව්‍යාපාර අයිතිකරුගේ නම :................................................................................................................................

මා විසින් ඉල්ලුම් කර ඇති පරිදි ගලී රථ සේවය ................................. දින පෙ.ව / ප.ව ................................. සිට පෙ.ව / ප.ව ................................. සැපයූ බවත්, එදින ලෝඩ් ................................. ක ප්‍රමාණයක් ඉවත් කර අද දින කාර්ය නිසි පරිදි ඉටු කර ඇති බව මෙයින් තහවුරු කරමි.

.............................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

ඉහත සඳහන් කටයුතු නිසි පරිදි ඉටු කරන ලද බව වාර්තා කරමි.

........................ .....................................

දිනය සෞඛ්‍ය පරිපාලක

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා
නාගරික කොමසාරිස් / ගණකාධිකාරී

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................

........................ ............................................................
දිනය මහජන සෞඛ්‍ය පරීක්ෂක

---

ඉතිරි මුදල ආපසු ගෙවන්න.

...................... ..................................................
දිනය නාගරික කොමසාරිස්

...................................................................................................... පහත සඳහන් මිල ගණන් මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරන අතර එවැනි යෝජනා සම්මතයක් මගින් ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකිය. සභාවේ අනුමැතිව ඇතිව වාර්ෂිකව ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පලවීමෙන් අනතුරුව ගාස්තු අය කිරීම වලංගු වන්නේ ය.

**දෙවන උපලේඛනය**

*ගෘහ සේවා සඳහා ගාස්තු :*

| | *නගර සීමාව තුළ* | *නගර සීමාවෙන් පිටත* |
|---|---|---|
| සේවා ගාස්තු | 2,250.00 | 4,500.00 |
| ප්‍රවාහන ගාස්තු | 0.0 | 01 කි. මී. කට රු. 300.00 |
| කම්කරු / රියදුරු යැපීම් දීමනා | 0.00 | 1,200.00 |
| අමතර ද්‍රව්‍ය නැවත ගෙන ඒම සඳහා ගාස්තු | 2,025.00 | 4,500.00 |
| අදාළ වැට් මුදල | 2% සහ 12% | 2% සහ 12% |
| ගෙවිය යුතු මුදල | | |

වාණිජ සේවා සඳහා ගාස්තු (බවුසර් ලෝඩ් 01ක් සඳහා)

| | *නගර සීමාව තුළ* | *නගර සීමාවෙන් පිටත* |
|---|---|---|
| සේවා ගාස්තු | 5,000.00 | |
| ප්‍රවාහන ගාස්තු | 0.00 | 01 කි. මී. කට රු. 300.00 |
| කම්කරු / රියදුරු යැපීම් දීමනා | 0.00 | 1,200.00 |
| අමතර ද්‍රව්‍ය නැවත ගෙන ඒම සඳහා ගාස්තු | 5,000.00 | රජයේ නිළ නිවාස 3,000.00 |
| අදාළ වැට් මුදල | 2% සහ 12% | 2% සහ 12% |
| ගෙවිය යුතු මුදල | | |

**XXXVII වන කොටස**

*ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 සහ 267 වන වගන්ති අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

02. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් නොමැතිව බදුල්ල මහා නගර සභාවට අයත් ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීම නොකළ යුතු ය.

03. (i) මිය ගිය යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විභාග සංග්‍රහය අනුව මහේස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් සිදු කරන්නේ නම්, එම පරීක්ෂණය අවසන් වූ පසු මෘත දේහය ආදාහනය කිරීමට එකී මහේස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් අවසරය ලබාදී ඇත්තේ නම් මිස, මෙම මෘත දේහය ආදාහනය කිරීමට භාර

ගැනීම හෝ ආදාහනය කිරීමට, අවසර පත්‍රයක් නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් නොකළ යුතු ය.

(ii) මිය ගිය යම් තැනැත්තකුගේ මරණ සහතිකයේ 07 වන තීරුවේ ''මරණයට හේතුව භූමදානය හෝ ආදාහනය කරන ස්ථානය'' යන්නෙහි බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරය යන නම සඳහන්ව ඇත්තේ මිස, ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් සිදුකල යුතු ය.

04. (i) 03 වන වගන්තියෙහි සඳහන්වන අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තකු, මෙහි පහත දැක්වෙන ලේඛණ සමග පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) මියගිය තැනැත්තා සහ ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කිරීමට පහත සඳහන් කුමන හෝ ලේඛනයක් ඉදිරිපත් කළ යුතු ය.

(අ) ජාතික හැඳුණුම්පත හෝ,
(ආ) ඉල්ලුම්කරුගේ උප්පැන්න සහතිකය හෝ,
(ඇ) මියගිය අයගේ උප්පැන්න සහතිකය හෝ,
(ඈ) ඉල්ලුම්කරුගේ විවාහ සහතිකය හෝ,
(ඉ) මියගිය තැනැත්තා පදිංචිව සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය.

(iii) මියගිය යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විභාග සංග්‍රහය අනුව මහේස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එම පරීක්ෂණය පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41 (ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීමට අවසරය දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතක් බිහිකල මෘත ශරීරයක් නම් උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41 (ඉ) ඡේදය යටතේ 43 (ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය,

(iv) මියගිය තැනැත්තාගේ මරණ සහතිකය

05. (i) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරන අතර එවැනි යෝජනා සම්මතයක් මගින් ගාස්තු කළින් කළ සංශෝධනය කළ සංශෝධිත ගාස්තු රජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(ii) ඉහත 1 ඡේදය යටතේ පනවන ලද හෝ සංශෝධනය කරන ලද ගාස්තු ගැසට් පත්‍රයේ පළකල යුතු අතර කාර්යාල පරිශ්‍රය තුළ සහ ආදාහනාගාරයේ විනිවිදවත්, පැහැදිලිවත් පෙනෙන සේ දැන්වීම්වල ප්‍රදර්ශණය කල යුතු ය.

(iii) මෘත දේහයක් ආදාහනය කිරීමට අය කරන ගාස්තු මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණයට අනුව පනවනු ලැබේ.

06. (i) සතියේ සෑම දිනකම උදේ 10.00,සවස 2.00 සවස 5.00 සහ රාත්‍රී 7.00 යන වේලාවන් තුළ පමණක් මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් සිදු කරනු ලැබේ.

(ii) යම් තැනැත්තකු රාත්‍රී 7.00 වෙන් කර ගන්නේ නම් ගරු නගරාධිපතිවරයාගේ විශේෂ අවසරය ලබා ගත යුතු වන්නේ ය.

07. (i) යම් මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා නිකුත් කරන අවසර පත්‍රයේ ලැබී ඇති වේලාවට හෝ ඊට පෙර ආදාහනාගාරය වෙත භාර දීමට ඉල්ලුම්කරුගේ වගකීම වන්නේ ය.

(ii) යම් මෘත දේහයක් ආදාහනාගාරය වෙත භාරදීම ප්‍රමාද වීම මත ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාට යම් අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ පාඩුවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් බදුල්ල මහා නගර සභාව, නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් කිසිදු වගකීමක් භාර නොගන්නේ ය.

08. (i) සෑම මෘත දේහයක්ම ආදාහනය කර දින 03ක් ගතවීමට පෙර ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු මගින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතු ය.

(ii) එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක මත නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාලසීමාව දීර්ඝ කිරීම සිදු කරනු ලැබිය හැකිය.

(iii) (11) ඡේදයේ සඳහන් පරිදි ආදාහනාගාරයේ භාරකරුගේ භාරයේ භෂ්මාවශේෂ තබා ගැනීමේ කාලය උපරිමය මාස 02 (දෙකකට) සීමා වන්නේ ය.

(iv) එසේ භෂ්මාවශේෂ ඉවත් කර ගැනීමට ඉඩදෙන කාලසීමාව අවසන් වූ පසු ඉවත් කර නොගන්නා භෂ්මාවශේෂ බැහැර කිරීමට නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියාට හෝ ආදාහනාගාර භාරකරුට බලය ඇත්තේ ය.

(v) කිසියම් ඉල්ලුම්කරුවකු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් භාර නොගන්නා භෂ්මාවශේෂ ආදාහනාගාර පරිශ්‍රය තුළ හෝ සුසාන භූමිය තුළ වළදැමීමට කටයුතු කිරීම නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිළධාරියාගේ වගකීම වන්නේ ය.

09. (i) කිසියම් ආදාහනාගාරයක ආදාහන කුටියට මෘත දේහය ඇතුලුකර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයන් හැර වෙනත් යම් තැනැත්තකු ඇතුල්වීම නොකළ යුතු ය.

(ii) නාගරික කොමසාරිස්වරයාගේ හෝ බලයලත් නිළධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ හෝ අවසරය නොමැතිව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුලුවීම තහනම් කර ඇත්තේ ය.

(iii) (ii) ඡේදයේ කුමක් සඳහන් වුව ද,

(අ) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තකුට අවසරපත්‍රයක් ලැබී ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු සමග එකී අවස්ථාවට සහභාගීවන යම් තැනැත්තකු හෝ තැනැත්තන් සහ,

(ආ) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර අවසර පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන යම් තැනැත්තකු හෝ තැනැත්තන්, ආදාහනාගාර පරිශ්‍රයට ඇතුලුවීම සඳහා අවසරය ලබා ඇති තැනැත්තන් වන්නේ ය.

10. මෘත දේහය සමග ආදාහනාගාරයට ඇතුළුවන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් නොකළ යුතු කාර්යයන් ;

(අ) සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,
(ආ) ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති බදුල්ල මහා නගර සභාවට අයත් කිසියම් දේපළකට හෝ දේපළවලට අලාභහානියක් කිරීම හෝ කිරීමට තැත් කිරීම,
(ඇ) ආදාහනාගාර භාරකරුගේ සහ ඔහුගේ සාහයකයින්ගේ රාජකාරියට බාධා කිරීම,
(ඈ) ආදාහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීමක් ඇලවීම,
(ඉ) ආදාහනාගාර පරිශ්‍රය තුළ දුම්බීම සහ මත්පැන් පානය කිරීම හෝ රැගෙන ඒම,
වන්නේ ය.

11. බදුල්ල මහා නගර සභාව විසින් කළයුතු කාර්‍යයන් ;

(අ) මෘත දේහයක් ආදාහනය කිරීමට සුදුසු තත්වයකින් ආදාහනාගාරය නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම.

(ආ) ආදාහනාගාරය යම් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය්‍ය සඳහා ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ දැන්වීමක් භාෂා තුනෙන්ම (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) ආදාහනය සඳහා අවසරපත්‍ර නිකුත් කරන කාර්යාලයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුලුවන ස්ථානයේ පැහැදිලිව පෙනෙනසේ ප්‍රදර්ශනය කිරීම.

(ඇ) ආදාහනාගාර භාරකරු විසින් ආදාහනාගාරයේ පිළියෙල කරනු ලබන ලේඛනයක් යාවත්කාලීන කිරීම. (සිව්වන උපලේඛනය)

(ඈ) මෘත දේහයක් ආදාහනය කිරීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින්, අවසර පත්‍ර නිකුත් කරන්නේ නම්, එවැනි අයදුම්පත්‍ර ලැබෙන අනුපිළිවෙල අනුව ලේඛනයක් පවත්වාගෙන යාම. (තුන්වන උපලේඛනය)

(ඉ) (i) ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයකට අනුව යම් මෘත දේහයක් ආදාහනය කිරීම සඳහා භාරගැනීම තීරණය කරන්නේ නම්, 05 වන අතුරු ව්‍යවස්තාව අනුව නියමිත ගාස්තු අයකිරීමෙන් පසුව නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිළධාරියා විසින් අදාළ අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කිරීම.

(ii) එකී අවසර පත්‍රයේ ආදාහනය කිරීමට නියමිත මෘත දේහය ආදාහනාගාර භාරකරු වෙත ගෙනවිත් භාරදිය යුතු දිනය සහ වේලාව පැහැදිලිව අවසර පත්‍රයේ සටහන් කිරීම.

(ඊ) කිසියම් හේතුවක් මත මෘත දේහය ආදාහනය සඳහා භාර නොගන්නේ නම් නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිළධාරියා විසින් ඊට හේතුවූ කරුණු සමග ඒ බව වහාම ඉල්ලුම්කරුට හයවන උපලේඛනයට සාරානුකූලව ලිඛිතව දැන්වීමක් කිරීම.

12 ආදාහනාගාරය වටේ ඉදිකරනු ලබන තාප්පය සමඟ බිම් කොටසක් එක් පවුල් ඒකකයක් වෙනුවෙන් භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා වෙන් කර ඇති අතර, එම බිම් කොටස් මිල දී ගැනීම සඳහා ගාස්තු නියම කිරීම සහ සංශෝධනය කිරීම බදුල්ල මහා නගර සභාව විසින් තීරණය කර වාර්ෂිකව රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වලංගු වන්නේ ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝන කරන සෑම තැනැත්තෙකුම වරදකරු කරනු ලැබූ විට, මහා නගර සභා ආඥාපනතේ 267 (3) වගන්තියෙන් සඳහන් දණ්ඩනයන්ට යටත් වන්නේ ය.

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1000/= ක් නො ඉක්මවන දඩයකට ද,
(ii) දෙවනිවර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2000/= ක් නො ඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන්වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නො ඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

14. අර්ථ නිරූපනයන් ඃ

- ''ඉල්ලුම්කරුවකු'' යන්නෙන් හඳුන්වනු ලබන්නේ මෘත දේහය ආදාහනය කිරීමට අවසර ඉල්ලා සිටින තැනැත්තෙකු වන්නේ ය.
- ''ආදාහන කුටීරය'' යනු ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය වන්නේ ය.
- ''ආදාහනාගාර පරිශ්‍රය'' යනු, සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය.
- ''ආදාහනාගාර භාරකරු'' යනු, අදාළ කාලයේ දී බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු වන්නේ ය.
- ''භශ්මාවශේෂ'' යනු, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව මෘත දේහය සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂවන යම් ද්‍රව්‍යයන් ද වන්නේ ය.
- ''මෘත ශරීරය / මෘත දේහය'' යනු, මිය ගිය කිසියම් තැනැත්තකුගේ සම්පූර්ණ මෘත දේහය සහ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහයකින් කිසියම් කොටසක් ද වන්නේ ය.

**පළමුවන උපලේඛනය**

*(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු ය.)*

***බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම***

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................
ලිපිනය :..........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................
ග්‍රාම නිළධාරි කොට්ඨාසය සහ නම :..........................................................

02. මිය ගිය අයගේ සම්පූර්ණ නම :..........................................................
ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................
පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :..........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................
ග්‍රාම නිළධාරි කොට්ඨාසය සහ නම :..........................................................

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධතාව (තහවුරු කිරීමට 04 වන අතුරු ව්‍යවස්ථාවේ 11 ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න.)
:..........................................................

04. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය සහ දිනය :..........................................................
(මරණ සහතිකයේ පිටපතක් අමුණන්න.

05. මරණය ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ :..........................................................
නම සහ කොට්ඨාසය ..........................................................

06. මරණයට හේතුව :..........................................................

07. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේනම් (4 වන අතුරු ව්‍යවස්ථාවේ iii ඡේදයේ සඳහන් සහතික අමුණන්න.)

පරීක්ෂණ නිළධාරියාගේ නම සහ තරාතිරම :..........................................................

පරීක්ෂණය පැවැත් වූ දිනය :..........................................................

පරීක්ෂණ නිළධාරියාගේ නිගමන :..........................................................

මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිළධාරියා අවසර දී තිබේ ද ? :..........................................................

08. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය සහ වේලාව (කැමැත්තෙන් අනුපිළිවෙල අනුව) :

| *දිනය* | *වේලාව* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|
| i. .......................... | .......................... | i. .................................. | .............................. |
| ii. ......................... | .......................... | ii. ................................. | .............................. |

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය සහ නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතික අමුණා ඇත.

...............................................

දිනය :................................. අයදුම්කරුගේ අත්සන.

---

.......................................................................මහත්මා/මහත්මිය/මෙනෙවිය,

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනවියනි,

*මෘත දේහයක් ආදාහනය කිරීමට අවසරපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම :*

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසුපිටෙහි දැක්වෙන අයදුම්පත්‍රයට අනුව, අවසරපත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

(i) ................................................................................................................................................

(ii) ................................................................................................................................................

(iii) ................................................................................................................................................

(iv) ................................................................................................................................................

(v) ................................................................................................................................................

.............................. ...................................................................

දිනය බලයලත් නිලධාරියාගේ අත්සන.

(නිල මුද්‍රාව තබන්න)

---

ආදාහනාගාර භාරකරු,

*මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය*

(අ) ....................................................................................................................... යන අයගේ මෘත දේහය 20.................ක් වූ ...................... මස ............... දින පෙරවරු/පස්වරු ............ ට බදුල්ල මහා නගර සභා ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසරය දෙමි.

(ආ) පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු 11 අතුරු ව්‍යවස්ථාවේ 'ඇ' ඡේදයට අනුව ලේඛනයේ සටහන් කරන ලදී.

(ඇ) 20 ................ දින අංක .................... දරන ලදුපත මගින් රු. ............................. ක් අයකරගෙන ඇත.

(ඈ) මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 08 වැනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාල ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට කටයුතු කරන්න.

(ඉ) අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය ............................................................ වේ.

...................................................................

දිනය :................................ බලයලත් නිලධාරියාගේ අත්සන.

(නිල මුද්‍රාව තබන්න)

---

**දෙවැනි උපලේඛනය**

පහත සඳහන් මිල ගණන් මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරන අතර එවැනි යෝජනා සම්මතයක් මගින් ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකිය. සභාවේ අනුමැතිය ඇතිව වාර්ෂිකව ගාස්තු සංශෝධන ගැසට් පත්‍රයේ පළවීමෙන් අනතුරුව ගාස්තු අයකිරීම වලංගු වන්නේය.

*ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අය කරන ගාස්තු*

| *විස්තරය* | *වටිනාකම* |
|---|---|
| 01. නගර සීමාව තුළ | |
| (අ) වැඩිහිටි අයකුගේ මෘත දේහය ආදාහනය සඳහා | 6,000.00 |
| (ආ) වැඩිහිටි නොවන අයකුගේ මෘත දේහය ආදාහනය සඳහා | - |
| (ඇ) රාත්‍රී 7.00 පැයට මෘත දේහය ආදාහනය සඳහා | 6500.00 |

**XXXVIII** වැනි කොටස

***ශබ්ද විකාශන යන්ත්‍ර සහ ශබ්ද ප්‍රතිජනනය වන උපකරණ***

252 වැනි අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තිය සමග කියවිය යුතු 30 වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පවත්වාගෙන යන තැටි වාදන යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර සහ ශබ්ද ප්‍රතිජනනය වන උපකරණ ආදිය ක්‍රියා කරවීම, සම්බන්ධව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යන තැටි වාදන යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර, සහ ශබ්ද ප්‍රතිජනනය වන උපකරණ ආදිය ක්‍රියාකරවීම සම්බන්ධ පාලනය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථා යි.

02. බදුල්ල මහා නගර සභා සීමාව ඇතුළත කිසිම තැනැත්තකු විසින් ශබ්දයේ ප්‍රමාණය හෝ එහි අඛණ්ඩ ස්වභාවය නිසා හෝ අවට ඇති ස්ථානවල පදිංචිකරුවන්ට හෝ යම් වීදියක ගමන් කරන මගීන්ට පීඩාවක් වන ශබ්දයක්, යම් තැටිවාදන යන්ත්‍රයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක්, ඇම්ප්ලිෆයරයක් හෝ ස්වයංක්‍රීයව හෝ යාන්ත්‍රිකව හෝ ශබ්දය උපදවන හෝ නැවත උපදවන වෙනත් යන්ත්‍රයක් ක්‍රියා කරවීමෙන් හෝ එය ක්‍රියාකරවීමට වෙනත් තැනැත්තකුට අවසර දීමෙන් ශබ්දය ඇති කිරීම හෝ නැවත ඇති කිරීමට ඉඩදීම නොකළ යුතු ය.

03. වීථියක්, ප්‍රසිද්ධ ස්ථානයක්, සාප්පුවක් හෝ ව්‍යාපාර ස්ථානයක් හෝ මහජනයාට ප්‍රවේශයක් ලැබෙන්නා වූ යම් වීථියක හෝ ප්‍රසිද්ධ ස්ථානයකට යා වූ ද ස්ථානයක් හෝ හැර වෙනත් ස්ථානයකට ඉහත කී පරිදි යම් උපකරණයක් ක්‍රියාකරවීමට හෝ ක්‍රියාකරවීමට වෙනත් තැනැත්තකුට සැලැස්වීම හෝ ඉඩදීම සම්බන්ධයෙන් එවැනි යම් කඩකිරීමක් පිළිබඳ යම් තැනැත්තකුට විරුද්ධව නඩු පැවරිය හැක්කේ,

(අ) පීඩාවෙන් බලපෑමට ලක් වූ අවට පදිංචිකරුවන් තුන්දෙනකුට නො අඩු සංඛ්‍යාවක් විසින් නාගරික කොමසාරිස්වරයා වෙත ලියවිල්ලක් මගින් එම පීඩාව පිළිබඳ පැමිණිල්ලක්කර ඇතොත් සහ,

(ආ) පැමිණිල්ලේ සහ පීඩාවේ ස්වාභාවය දක්වමින් ද, නොපමාව හෝ නිශ්චිතව සඳහන් කාල සීමාවන් ඇතුළත නාගරික කොමසාරිස්වරයා විසින් එම පුද්ගලයා වෙත ලිඛිත දැන්වීමක් භාර දී ඇත්නම් සහ,

(ඇ) එම දැන්වීම ලැබීමෙන් පසු නොපමාවම හෝ එහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත හෝ එම දැන්වීමට අනුකූලව ක්‍රියාකිරීම එම තැනැත්තා විසින් පැහැරහැර හෝ ප්‍රතික්ෂේපකර ඇත්නම්.

04. (i) යම් තැටි වාදන යන්ත්‍රයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක්, ඇම්ප්ලිෆයරයක් හෝ වෙනත් ශ්‍රව්‍ය උපකරණයක් හෝ ස්වයංක්‍රීයව හෝ යාන්ත්‍රිකව ශබ්දය උපදවන හෝ නැවත උපදවන වෙනත් උපකරණයක් පිළිබඳ ව්‍යාපාරයක් පිහිටුවීම හෝ කරගෙන යාම හෝ තත් කාර්යය සඳහා වෙනත් බලධාරියකු විසින් නිකුත්කර ඇති අවසරපත්‍රයක් හෝ බලපත්‍රයක් ඇතත්, එය නොසලකා නාගරික කොමසාරිස් විසින් බලපත්‍රයක් නිකුත්කළ යුතු ය. මෙම බලපත්‍ර නිකුත් කිරීම හෝ නොකිරීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් කාල වේලාවන්, කාල පරිච්ඡේද සහ වෙනත් ස්ථාන සම්බන්ධව සැලැකිළිමත් විය යුතු අතර බලපත්‍ර නිකුත් කිරීම ඔහුගේ අභිමතය පරිදි සිදුකළ හැකි ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම සභාව විසින් නියම කර වාර්ෂිකව රජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශ කරන ලද ගාස්තුවකට යටත් විය යුතු අතර, මේ අතුරු ව්‍යවස්ථාව යටතේ මේ බලපත්‍රය කලින් අවසන් කරනු ලැබුවහොත් මිස, එය නිකුත් කිරීමට පදනම් වූ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් (31) වැනි දිනෙන් අවසන් විය යුතු ය.

05. නාගරික කොමසාරිස් විසින් හෝ තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස් විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මගින් බලය දෙන ලද සභාවේ බලය පවරා ඇති සභාවේ කවර හෝ නිලධාරියකු විසින් ඉර උදාවත්, ඉර බැසීමත් අතර කවර හෝ යුක්තිසහගත වේලාවක දී බලපත්‍රලත් ස්ථානයකට ඇතුළුවීමත් එම ස්ථානය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර ඒ සඳහා සෑම බලපත්‍රධාරියකුම අවසරය ලබාදිය යුතු ය.

06. බලපත්‍රලත් ස්ථානය, බලපත්‍රයේ හෝ යම් අතුරු ව්‍යවස්ථාවල නියමිත කොන්දේසිවලට අනුකූලව පැවැතීම අවසන් වුවහොත්, බලපත්‍රලාභියා වෙත බලපානු ලබන දැන්වීමක් මගින් එම ස්ථානය මේ කොන්දේසිවලට අනුකූල තත්වයකට ගෙන ඒම සඳහා එම දැන්වීමේ නිශ්චිතව සඳහන් පියවරවල් ගන්නා ලෙස නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍රලාභියාට නියම කළ හැකිය.

07. යම් හේතුවක් නිසා 06 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමක්, සඳහන් නිවේදනයක් බලපත්‍රධාරියා වෙත පෞද්ගලිකව භාර කරවිය නොහැකි වුවහොත් එම නිවේදනය හෝ දැන්වීම ඔහු අන්තිමයට පදිංචිව සිටි ස්ථානය ලෙස දන්නා ස්ථානයෙහි තබා එම හෝ බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන කිසියම් දෙයක නැතහොත් කිසියම් ප්‍රකට තැනක අලවා තැබීම හෝ එය ඔහුට විධි වූ පරිදි බාරදීමක් ලෙස සැලකිය යුතු ය.

08. බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබූ යම් දැන්වීමක සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුළත හෝ එවැනි කාලයක් සඳහන් කර නැත්නම්, දැන්වීම භාරදීමෙන් දින හතක් (07) ඇතුළත එම දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හරිනු ලැබුවහොත් නාගරික කොමසාරිස් විසින් බලපත්‍ර අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කළ හැකිය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් නොමැතිව පළමු වැනි වගන්තියෙහි සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත පරිදි,

(i) පළමු වර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= නො ඉක්මවන දඩයකට ද.

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= නො ඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහ (250.00) නො ඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

## XXXIX වැනි කොටස

### *කුකුල් මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 08-(ආ) උප වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන කුකුල් මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන කුකුල් මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

2 කවර හෝ තැනැත්තෙකු විසින් වෙළෙඳ පොළක් නොවන වෙනත් කිසියම් ස්ථානයක නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව කුකුල් මස් විකිණීමේ කාර්යය සඳහා ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

3. බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළෙඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ තැනැත්තෙකුට කුකුල් මස් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය :-

(අ) විකිණීම සඳහා කුකුල් මස් ප්‍රදර්ශනය කිරීම කළ යුතු වන්නේ ප්‍රදර්ශනය කළ හැකි අධිශීතකරණයක් තුළ බහා පමණි ;

(ආ) කුකුල් මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(ඇ) විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කුකුල් මස් කෙලින්ම හිරු එළිය නොවැටෙන සේ ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය ;

(ඈ) අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය ;

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර එකී අප ජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය ;

(ඊ) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය ;

(ඇ) කුකුල් මස් වෙළෙඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 0.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ බදුල්ල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව බදුල්ල මහා නගර සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දිය යුතු ය ;

(ඉ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය ;

(එ) කුකුල් මස් විකිණීම කරනු ලබන ස්ථානය අවම වශයෙන් වර්ග අඩි 150 ක කාමරයක් විය යුතු ය.

4. කිසියම් ස්ථානයක නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් සහිත ස්ථානයක දී මරනු ලැබූ කුකුලෙකුගේ මස් වන්නේ නම්, මිස කවර හෝ කුකුල් මස් වෙළෙඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

5. බලපත්‍රලත් කවර හෝ කුකුල් මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද කුකුල් මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, කුකුල් මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

6. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුළ් විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කුකුල් මස් ප්‍රවාහනය නොකළ යුතුවාත් හැර එකී කුකුල් මස් ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ කුකුල් මස් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජනය විෂ බීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ කුකුල් මස් වෙළෙඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, කුකුල් මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අළුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන කුකුල් මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ කුකුල් මස් වෙළෙඳ සැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවතී තිබුණේ නම් මිස ශේෂවන කුකුල් මස් ඊළඟ දිනයේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි කුකුල් මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කුකුල් මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන් හෝ කෘමීන්ගෙන් තොරව තබා ගත යුතු ය.

11. (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ කුකුල් මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළෙඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කුකුල් මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) කුකුල් මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

(ඈ) කුකුල් මස් වෙළෙඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් කුකුල් මස් වෙළෙඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කුකුල් මස් වෙළෙඳ ස්ථානයේ කුකුල් මස් වෙළෙඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

14. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය,

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ වසා තැබිය හැකි භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස් වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

15. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් කුකුල් මස් වෙළෙඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති කුකුල් මස් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

16. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කුකුල් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 3 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක්. නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

17. 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

18. 17 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

19. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උප වගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= කට නො ඉක්මවන දඩයකට,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= කට නො ඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (250.00) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

## XL වන කොටස

### *ගෝඝාතකාගාර පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාව*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 09 වැනි වගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන ගෝඝාතක ස්ථාන භාවිතා කිරීම සඳහා ගාස්තු නියම කර අයකර ගැනීම ඇතුළුව, ගෝඝාතක ස්ථානවල කළමණාකරණය විධිමත් කිරීම, පාලනය කිරීම, සහ අධීක්‍ෂණය සහ එම ස්ථානවල සතුන්ට හිංසා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. (අ) බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන ගෝඝාතක ස්ථානවල කළමණාකරණය විධිමත් කිරීම, පාලනය කිරීම,සහ අධීක්‍ෂණය සහ එම ස්ථානවල සතුන්ට හිංසා කිරීම වැලැක්වීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි ;

(ආ) සෑම පොදු ඝාතනාගාරයක්ම, තත් කාර්ය සඳහා නිසි බලධාරියා විසින් පත් කරන ලද නිලධාරියෙකුගේ අධිකාරිත්වය යටතේ විය යුතු අතර, ඔහු නාගරික පශු වෛද්‍ය නිලධාරියා යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු හෝ ඔහු වෙනුවට වැඩ බලන නිලධාරියා අදහස් වේ.

2. නිසි බලධාරියා විසින් කලින් කළ නියම කරනු ලැබිය හැකි වේලාවන් තුළ පමණක් හැර, කිසිම බලපත්‍රයක් ඝාතකයෙකු විසින් සතුන් ඝාතනය නොකළ යුතු ය.

3. බලපත්‍රලත් ඝාතකයෙකු විසින් සතුන් ඝාතනය කළ යුත්තේ නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඒ ඝාතකයාට ඝාතනාගාරය ඇතුළත වෙන් කර දෙනු ලැබූ ස්ථානවල දී පමණි.

4. නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ආකෘතියෙහි වූ යථා පරිදි සම්පූර්ණ කරන ලද මුද්‍රිත අවසර පත්‍රයක් නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් නිකුත් කරනු ලැබ ඇත්නම් මිස, කිසිම බලපත්‍රලත් ඝාතකයෙකු විසින් කිසිම සතෙකු ඝාතනය නොකළ යුතු ය. මුද්‍රිත අවසර පත්‍රය නිකුත් කිරීමට ප්‍රථම, එය නාගරික පශු වෛද්‍යවරයා විසින් යථා පරිදි පුරවා, ඔහු විසින් ද, එය නිකුත් කරනු ලබන ඝාතක විසින් ද, අත්සන් කරනු ලැබිය යුතු අතර,එය නිකුත් කරන ලද දිනය එහි සඳහන් විය යුතු ය.

5. 473 වැනි අධිකාරිය වන,ගවයන් හණ සලකුණු කිරීම,විකිණීම සහ පැවරීම පිළිබඳ ආඥාපනතින් නියමිත, අදාළ ආකෘති පත්‍රය මත, තමාගේ වාසියට වූ සහතිකයක්, බලපත්‍රලත් ඝාතකයෙකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, හෝ ඒ සතා ඝාතකයාට විකිණීමට කැමැත්තෙන් සිටින තැනැත්තා ඝාතකයා ද, සමඟ නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හමුවට ඉදිරිපත් වී ඒ තැනැත්තාගේ වාසියට වූ ඒ හා සමාන සහතිකයක් ඉදිරිපත් කර,ඔහු ඒ සතා ඝාතකයාට විකිණීමට සූදානම් බවට ප්‍රකාශයක් අත්සන් කලහොත් මිස,ගවයන් ඝාතනය කිරීම සඳහා, අනුමැතිය ලබා නොදිය යුතු ය. මෙහි සඳහන් සහතිකය ඝාතනාගාර භූමිය ඇතුළට ඒ සතා භාර ගැනීමට ප්‍රථම,නාගරික පශු වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. ඝාතනය සඳහා ඉදිරිපත් කරන සතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද සහතිකයක් නොවන හෝ යම් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ හෝ ඒ සහතිකය ඉදිරිපත් කරනු ලබන්නේ යම් සතෙකු සම්බන්ධව ද, ඒ සතාගේ විස්තරයට සහ හණ නිවරණවලට සර්වප්‍රකාරයෙන්ම අනුකූල නොවන සටහන් ඇතුළත් වන්නා වූ හෝ කිසිම සහතිකයක් යම් බලපත්‍රලත් ඝාතකයෙකු විසින් හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් හෝ ඝාතන අනුමැතිය ලබා ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය සහතිකයක් වශයෙන් ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය. එවැනි යම් සතෙකු ඒ සතා ගෙන ආ තැනැත්තා විසින් වහාම ඉවත් කරගෙන යා යුතු අතර, ඝාතනාගාර භූමියට ඇතුළත් කර නොගත යුතු ය.

7. ඝාතනය කිරීමට ප්‍රථමයෙන් ඝාතනාගාර භූමියට ප්‍රදර්ශනය කොට සිටිය දී යම් තැනැත්තකු විසින් යම් සතෙකු සඳහා හිමිකම් පානු ලැබුවහොත් ඒ සතා වෙනුවෙන් අය විය යුතු ගාස්තුවක් වෙතොත් ඒ ගාස්තුව වහාම ගෙවා, ඒ සතා සම්බන්ධයෙන් 17 වන වගන්තිය යටතේ කටයුතු කළ හැකිය. තවද,ඒ බවට අදාළ පොලිස් ස්ථානයට දැනුම් දීමක් කළ යුතු ය.

8. ඝාතනාගාරයට ගෙන එනු ලබන හෝ එහි රඳවා තබන සියලු සතුන් පැන යාම වැළැක්වීම පිණිස කඹ වලින් නිසි පරිදි බැඳ තැබිය යුතු ය.

9. ඝාතකයෙකු වශයෙන් තමාගේ ව්‍යාපාරය හා සම්බන්ධ ඝාතකාගාරයෙහි සේවයේ නියුක්ත කිරීමට අපේක්ෂා කරන සේවකයන්ගේ නම්, සෑම බලපත්‍රලත් ඝාතකයෙකු විසින්ම මහා නගර සභා කාර්යාලයන්හි ලියා පදිංචි කළ යුතු අතර, කිසිම නමක් ලියාපදිංචි කිරීම,ප්‍රතික්ෂේප කිරීම හෝ ඒ වන විටත් ලියාපදිංචි කර ඇති අය අතුරෙන් කිසිවෙකුගේ නම අවලංගු කිරීම හෝ නාගරික කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකිය. එසේ ලියාපදිංචි කරනු නොලැබූ හෝ එසේ නම අවලංගු කරනු ලැබූ කිසිම තැනැත්තෙකු, එවැනි බලපත්‍රලත් ඝාතකයෙකු විසින් සේවයේ නියුක්ත කිරීම හෝ සේවයෙහි තබා ගැනීම නොකළ යුතු ය.

10. සෑම බලපත්‍රලත් ඝාතකයෙකු විසින්ම ඔහුගේ බලපත්‍රයේ සහතික කළ පිටපතක් සහ ඔහු විසින් ඝාතකාගාරයේ සේවයේ නියුක්ත කරන සෑම සේවකයෙකුගේම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් ඒවා ලබාගත් වහාම නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත තැබිය යුතු ය.

11. ඝාතනය කරන ලද ගවයින්ගේ සම්,බඩවැල් සහ ඉවත දමන කොටස් ඝාතකයා විසින් හෝ ඔහුගේ සේවා නියුක්තිකයන් විසින් , ඉවත් කිරීමට පෙර සෝදා පිරිසිදු කිරීම පිණිස ඒ සඳහා වෙන් කර ඇති ස්ථානවල එකතු කළ යුතු ය.

12. බලපත්‍රලත් ඝාතකයෙකු හෝ ඔහුගේ ලියාපදිංචි කළ සේවකයින් විසින් ඝාතනාගාරය පාවිච්චි කරන විට දී, ඔහුගේ ක්‍රියාවන් හෝ ඔහුගේ සේවකයන් කිසිවෙකුගේ ක්‍රියාවක් හේතුවෙන් ඝාතනාගාරයට සිදුවන යම් අලාභ හානියක් සම්බන්ධයෙන්, බලපත්‍රලත් ඝාතකයා වගකිව යුතු අතර,එසේ සිදු වූ අලාභ හානිය සඳහා සුදුසු යැයි නාගරික කොමසාරිස්වරයා කල්පනා කරන මුදල් ප්‍රමාණයක් ඉල්ලා සිටි විට ගෙවීමට ඝාතකයා බැඳී සිටිය යුතු ය. එසේ මුදල් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍ර අවලංගු කිරීම හෝ විකල්පයක් වශයෙන් ඒ අලාභහානියේ මුදල බලපත්‍රලත් ඝාතකයාගෙන් සහ ඔහුගේ ඇපකරුවන්ගෙන් අය කිරීම හෝ ඒ දෙකම හෝ කරනු ලැබිය හැකිය.

13. යම් චර්ම රෝගයකින්,ලාදුරු රෝගයකින් හෝ යම් ආසාධන හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙකුට ඝාතනාගාරයට ඇතුල්වීම හෝ ඝාතනාගාරය තුළ සේවය කිරීමට ඉඩ නොදිය යුතු ය.

14 නාගරික ඝාතනාගාරයේ ඝාතනය කරනු ලබන සතුන්ගේ මස්, නාගරික සීමාව තුළ වෙළඳසැල්වලට ප්‍රවාහනය කළ යුත්තේ සභාව විසින් සපයා ඇති වාහන වලින් පමණි. මේ සඳහා මහා සභාව විසින් වාර්ෂිකව සංශෝධනය කරන ලද ගාස්තු රජයේ ගැසට්පත්‍රයේ පල කරන ලද ගාස්තු ප්‍රමාණයක් ඝාතකයා විසින් ගෙවිය යුතු ය.

15. ගව ආදී සතුන් සම්බන්ධයෙන් එක් සතෙකු වෙනුවෙන් මෙහි පහත දැක්වෙන කාර්යයන් සඳහා අය කළ යුතු ගාස්තු සභාව විසින් කලින් කළ යෝජනා සම්මතයෙන් නියම කරනු ලැබේ.

(1) (අ) ගවයන් (පිරිමි එළ ගවයන්)
(ආ) ඌරන්
(ඇ) බැටළුවන් සහ එළුවන් සඳහා ඝාතකාගාරය පාවිච්චි කිරීම

(2) (අ) ගවයන්ට
(ආ) ඌරන්ට කෑම දීම (පැය විසි හතරක කාලයක් හෝ ඉන් කොටසක් සඳහා)

(3) මඩුව පාවිච්චි කිරීම
(අ) ගවයන් සඳහා

(4) ගව වෙළඳපොළක් පාවිච්චි කිරීම.
(අ) ගවයන් සඳහා

16. ඝාතනාගාරයට අය විය යුතු සියලු ගාස්තු හා වියදම් ගෙවනතෙක්, ඝාතක බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසිම සතෙකු ඝාතනය කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය. ඒ ගාස්තු හා වියදම් ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ සතා සම්බන්ධයෙන් 17 වන වගන්තිය අනුව කටයුතු කළ හැකිය.

17. අය විය යුතු ගාස්තු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් ඝාතනාගාරයේ රඳවා ගන්නා ලද සතෙකු, ප්‍රචාරය කිරීමෙන් දවස් දෙකකට කලින් දැනුම් දීමෙන් පසුව නාගරික කොමසාරිස්වරයා විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය හැකිය. එසේ විකිණීමෙන් ලැබෙන මුදලින්, ඒ සතා වෙනුවෙන් අය විය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය තමා වෙත රඳවා තබාගෙන, ඉතිරි මුදලක් වෙතොත්, එය ඒ සතා වෙනුවෙන් අය විය යුතු යම් ගාස්තුවක් සහ දරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය තමා වෙත රඳවා තබාගෙන, ඉතිරි මුදලක් වෙතොත්, එය ඒ සතා ඝාතනය කිරීම සඳහා ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තාට, ඔහු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට, නාගරික කොමසාරිස්වරයා විසින් ගෙවනු ලැබිය යුතු ය. වර්ෂයක් ඉක්මවීමට පෙර එම මුදල ඉල්ලා නො සිටියහොත් වර්ෂය අවසන් වූ පසු එම මුදල නාගරික අරමුදලට බැර කළ යුතු ය.

18. රෝගීව සිටීම හෝ ඝාතනය කිරීමට යෝග්‍ය නොවන බවට නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් තීරණය කරනු ලබන කිසිම සතෙකු ඝාතනය කිරීමට,ඒ වන විට අවසර පත්‍රයක් නිකුත් කර තිබුනත්,නැතත් ඒ සතා ඝාතනය කිරීම නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් තහනම් කිරීම නීත්‍යානුකූල වන්නේය.තවද,එවැනි සතෙකු කිසිම තැනැත්තෙකු විසින් ඝාතනය නොකළ යුතු ය.

19. මිය යාමට ආසන්න හෝ මිය ගිය සතුන් හෝ කිසිදු රෝගයකින් පෙළෙන සතුන් ඝාතනාගාරයට ගෙන ඒමට ඉඩ නොදිය යුතු ය. ඝාතනාගාරයට ගෙන එනු ලැබූ එවැනි යම් සතෙකු තහනමට ගෙන, ආසාධන හෝ ස්පර්ශක රෝග වැළඳී ඇති සතුන් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයට, ඔවුන් සම්බන්ධව කටයුතු කළ යුතු ය.

20. ආසාධක හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන සතුන් ඝාතනාගාරයට ගෙන එනු ලැබූ විට, ඔවුන් තහනමට ගෙන, සුදුසු යැයි නාගරික කොමසාරිස්වරයා කල්පනා කරන ආකාරයට විනාශ කිරීම හෝ බැහැර කිරීම සඳහා ඒ සතුන් තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කළ නියම කරනු ලබන ස්ථානයකට හෝ ස්ථානවලට ගෙන යනු ලැබිය යුතු ය.

21. ඝාතනය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබ හෝ ඝාතනය කිරීම තහනම් කරනු ලැබූ සතෙකු ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තා, එසේ අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබ හෝ ඝාතනය තහනම් කරනු ලැබ පැය දොළහක් ඇතුළත ඒ සතා, ඝාතනාගාරයෙන් ඉවත් කර ගැනීම පැහැර හැරියහොත්, ප්‍රචාරය කිරීමෙන් දවස් දෙකකට කලින් දැනුම් දීමෙන් පසුව නාගරික කොමසාරිස්වරයා විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය හැකිය. එසේ විකිණීමෙන් ලැබෙන මුදලින්, ඒ සතා වෙනුවෙන් අය විය යුතු යම් ගාස්තුවක සහ දරන ලද යම් වියදමක මුදල් ප්‍රමාණය තමා වෙත රඳවා තබා ගෙන, ඉතිරි මුදලක් වෙතොත් එය, ඒ සතා ඝාතනය කිරීම සඳහා, ඝාතනාගාරයට ගෙන ආ තැනැත්තා විසින් ඉල්ලුම් කරනු ලැබූ විට ඔහුට නාගරික කොමසාරිස්වරයා විසින් ගෙවනු ලැබිය යුතු ය. එම මුදල වර්ෂයක් ඉක්මවීමට පෙර ඉල්ලා සිටිය යුතු අතර, වර්ෂයක් ඉක්මවීමෙන් පසු එම මුදල නාගරික අරමුදලට බැර කළ යුතු ය.

22. (1) නාගරික කොමසාරිස්වරයා අනුමත කළ ආකෘතියක වුව ද, නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ පාස් පත්‍ර නිකුත් කිරීමට පත් කරන ලද වෙනත් නිලධාරියෙකු විසින් හෝ අත්සන් කර ඇත්තා වූ ද පාස් පතක් ඇතිව මිස, පොදු ඝාතනාගාරයක ඝාතනය කළ කිසිම සතෙකුගේ මස්, හම්, බඩවැල් හෝ ගවමස් කිසිම තැනැත්තෙකු විසින් ඉවත් කරගෙන නොගිය යුතු ය. එසේ එවැනි මස්, හම්, බඩවැල් හෝ ගවමස් ඉවත් කරගෙන යන යම් තැනැත්තෙකු, මහා නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටි විට, ඒ පාස්පත්‍ර හෝ පාස්පොත්, පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ ඉදිරිපත් කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත්, මස්,හම්,බඩවැල් ආදිය හෝ ඉවත දමන කොටස් තහනමට ගෙන මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් විධාන කරන ආකාරයට හෝ විනිසුරුවරයා විසින් විධානය කරන ආකාරයට වන්දි ගෙවීමකින් තොරව බැහැර කිරීම සඳහා මහා නගර සභා කාර්යාලවලට හෝ පොලිස් ස්ථානයට හෝ ගෙන යනු ලැබීමට යටත් විය යුතු ය.

(2) යම් සතෙකු ඝාතනය කිරීමට ප්‍රථම ඝාතනාගාරයේ භූමියේ ප්‍රදර්ශනය කොට සිටිය දී, යම් හේතුවකින් මරණයට පත්වුවහොත්, එම මිය ගිය සතා ඝාතන භූමියෙන් පිටතට ගෙන යාමට ඒ සතා ගෙන ආ තැනැත්තාට අවසර නොදිය යුතු අතර, එම සතා වළලා දැමීම හෝ වෙනත් යම් ආකාරයකට කටයුතු කිරීමට නාගරික පශු වෛද්‍යවරයා හෝ ඒ සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු ය.

23. කිසිම සුනඛයෙකු ඝාතනාගාරය තුළට ගෙන ඒමට ඉඩ නොදිය යුතු අතර,කිසිම සුනඛයෙකු අයිතිකරු හෝ භාරව සිටින තැනැත්තෙකු විසින් එසේ සුනඛයෙකු ඝාතනාගාරයට ගෙන ඒම හෝ සුනඛයෙකුට ඝාතනාගාරයකට ඇතුළුවීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය. ඝාතනාගාරයක සිට හමුවන සියළු සුනඛයන්, දඩාවතේ යන සුනඛයින් ලෙස සලකා ක්‍රියා කළ යුතු ය.

24. කිසිම බලපත්‍රලත් ඝාතකයෙකු හෝ ඝාතකයෙකුගේ ලියාපදිංචි කළ යම් සේවකයෙකු හෝ ඝාතනාගාරය තුළට පැමිණීමට ඉඩ දෙන ලද වෙනත් යම් තැනැත්තෙකු හෝ විසින්, ඝාතනාගාරය තුළ යම් ශබ්ද නැගීම,කෝලාහල හෝ දඩබර කිරීම, අපහාසාත්මක, අපවාදාත්මක හෝ අශිෂ්ඨ වචන පාවිච්චි කිරීම නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු නාගරික පශු වෛද්‍යවරයා විසින් හෝ ඔහුගේ සහායකයන් විසින් ඝාතනාගාරයෙන් පිට මංකරනු ලැබිය හැකිය.

25. නිසි බලධාරියාගෙන් විශේෂ බලපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස,බලපත්‍රලත් ඝාතකයෙකු නොවන කිසිම තැනැත්තෙකු විසින් මහා නගර සභා සීමාව ඇතුලත කිසිම ගවයෙකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන අතර, එවැනි විශේෂ බලපත්‍රයක් ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ බලපත්‍රයෙහි සඳහන් ස්ථානයේ දී හෝ එහි දැක්වෙන කොන්දේසි යටතේ හෝ හැර ඒ ඝාතනය සිදු නොකළ යුතු ය.එවැනි විශේෂ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රයක ඝාතනය කිරීමට ඇති සතා සම්බන්ධයෙන් (473 වැනි අධිකාරය වන) ගවයන් හංවඩු ගැසීම, විකිණීම සහ පැවරීම පිළිබඳ ආඥා පනතේ උප ලේඛනයේ 'අ' ආකෘතියට හා සමානව විස්තර ඇතුළත් විය යුතු අතර, ඉල්ලුම්කරුට ඒ සතා අයත් බවට ඉල්ලුම්කරුගේ ප්‍රදේශයේ පොලිස් නිළධරයෙකුගේ හෝ මහා නගර සභා නිළධරයෙකුගේ හෝ ග්‍රාමසේවා නිලධාරියාගේ හෝ වාර්තාවක් ඒ සමඟ එවිය යුතු ය. මෙම විශේෂ බලපත්‍රය සඳහා සභාව විසින් කලින් කලට තීරණය කරන ලද යම් මුදලක් අය කළ යුතු ය.

26. සෑම ඝාතනාගාරයක්ම නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වේලාවන්හි, යටත් පිරිසෙයින් දිනකට දෙවරක්වත් හොඳින් සෝදා අතු ගෑ යුතු ය.

27. සෑම ඝාතනාගාරයක්ම නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වේලාවන්හි, යටත් පිරිසෙයින් සෑම තුන් මසකට වරක්, හුණු පිරියම් කළ යුතුය,

28. සෑම ඝාතනාගාරයකම බිම කළුගල් හෝ පැතලි බිම ගඩොල් නැතහොත් උළු හෝ කොන්ක්‍රීට් හෝ ගල් තාර හෝ යොදා ඒවා සන්ධි වන කුහර, අවුරුද්දකට යටත් පිරිසෙයින් එක් වරක්වත් බදාම යොදා අලුතින් සකස් කළ යුතු ය.

29. ඝාතනය සඳහා ඉහත කී පරිදි අනුමත කරන යම් සතෙකු ඝාතනය කිරීමෙන් පසුව,එම සතාගේ මළකඳ රෝගයකට පාත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය ආහාරය සඳහා අයෝග්‍ය බව පෙනී ගියහොත්, එකී නාගරික පශු වෛද්‍යවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තෙකු හෝ විසින් එය වහාම එහිදීම විනාශ කිරීමට සැලැස්විය යුතු ය. නැතහොත් එය විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ මනුෂ්‍ය ආහාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වනු පිණිස අන් ආකාරයකින් බැහැර කිරීමට සැලැස්විය යුතු ය. මේ සම්බන්ධයෙන් නාගරික පශු වෛද්‍යවරයාගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

30. සතුන් ඝාතනය කිරීමේ, හම ගැසීම හෝ මස් කිරීමේ ක්‍රියාවලිය අතරතුර ඝාතකයන්, ඔවුන්ගේ සහායකයන් ඝාතනාගාරයට අනුයුක්ත මහා නගර සභා නිළධරයන් සහ බලයලත් අයවළුන් හැර වෙනත් කිසිම තැනැත්තෙකු, ඝාතනාගාර ස්ථානය තුළට ඇතුළත් කර නොගත යුතු ය.

31. ඝාතකයන් හෝ ඔවුන්ගේ සහායකයන් විසින්, ඝාතනාගාරයෙහි දමා යන සියලු ගවමස්, බඩවැල් හෝ වෙනත් කුණු කසල, සාමාන්‍ය ගවමස් බැහැර කරන ආකාරයෙන් බැහැර කළ යුතු ය.

32. නාගරික පශු වෛද්‍යවරයා විසින් නියම කරන ලද වේලාවන්ගෙන් පසුව ඒ නිලධරයාගේ අනුමැතියක් නොමැතිව, ඝාතනාගාරයේ තබා තිබෙන සම්, බොකු, බඩවැල් හෝ වෙනත් කුණු කසල, අත්හැර දමනු ලැබූ දේවල් සේ සැලකිය යුතු අතර, ඒවා මහා නගර සභාව සුදුසු යැයි කල්පනා කරන ආකාරයකට බැහැර කළ හැකි, මහා නගර සභාවේ දේපළ බවට පත් වන්නේය.

33. (i) මහා නගර සභා සීමාවෙන් පිටත දී ඝාතනය කරන ලද කිසිම බැටළුවෙකු, එළුවෙකු, ගවයෙකු, ඌරෙකු ආදී සතුන්ගේ මස්, එහි බලධාරියා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර, කිසිම තැනැත්තෙකු විසින් මහා නගර සභා සීමාව ඇතුලතට ගෙන නොආ යුතු ය.

එසේ වුව ද, වායුරෝධිත ලෙස සම්මුද්‍රිත ටින්වල ඇසුරු මාළු වලට මේ ඡේදයේ මීට පූර්වයෙන් ඇති විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(ii) (1) වන ඡේදයේ සඳහන් මස් කිසිවක් වෙනුවෙන් ඒ ඡෙදය යටතේ යම් තැනැත්තෙකුට කිසිම බලපත්‍රයක්, නිකුත් කිරීම, ඒ මස් ලබා ගන්නා ලද්දේ යම් සතෙකුගෙන් ද, ඒ සතා ඝාතනය කරන අවස්ථාවේ දී නිරෝගිව සිටි බවට සහ ඝාතනය කිරීමේ දී සහ ඉන් පසුව, ඒ මස් අපවිත්‍ර වීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්වාරක්ෂක පියවර ගන්නා ලද බවට ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කර, ප්‍රධාන නාගරික පශු වෛද්‍යවරයා හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නිලධාරියෙකු, ඒ තැනැත්තා විසින් සෑහීමට පත් කළහොත් මිස, නොකළ යුතු ය.

(iii) යම් තැනැත්තෙකුට (1) වන ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම නිසි බලධාරියා විසින් ඔහුගේ අභිමතය පරිදි,ප්‍රතික්ෂේප කළ හැකිය.එවැනි බලපත්‍රයක් අවලංගු කිරීමට ද නිසි බලධාරියාට බලය ඇති අතර, ඒ සම්බන්ධයෙන් කිසිම වන්දියක් ලබා ගැනීමට අයදුම්කරුට කිසිම අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

34. (i) කිසිම තැනැත්තෙකු විසින්, මහා නගර සභා සීමාව තුළ මෙහි පහත සඳහන් කිසිම මසක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

(අ) මහා නගර සභා සීමාවෙන් පිටත දී ඝාතනය කරන ලද කිසිම බැටළුවෙකුගේ, එළුවකුගේ, ගවයෙකුගේ, ඌරෙකුගේ ආදී සතුන්ගේ මස් හෝ

(ආ) දිවයිනට ආනයනය කළ (ශීතකල, හිමායික, ලුණු දැමූ දුම් ගැස්වූ, හෝ අන්‍යාකාරයකින් පරිරක්ෂිත) කිසිම මසක්, ඒ මස් ප්‍රධාන නාගරික පශු වෛද්‍යවරයා විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ පරීක්ෂා කර බලා, ඒවා මනුෂ්‍ය පරිභෝජනය සඳහා යෝග්‍ය බව අනුමත කර ඇත්නම් මිස,එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ මීට ඉහතින් ඇති විධිවිධාන වායුරෝධික ලෙස සම්මත ටින්වල ඇසුරූ මස් වලට අදාළ නොවිය යුතු ය.

(ii) මහා නගර සභා සීමාවෙන් පිටත දී ඝාතනය කරන ලද කිසිම බැටළුවෙකුගේ, එළුවකුගේ, ගවයෙකුගේ ආදී සතෙකුගේ මස් 1 වන වගන්තියේ (ආ) ජෙදයේ සඳහන් නිළධරයෙකු ලවා පරීක්ෂා කරවා ගැනීමට අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම, එම මස් පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඒවා මහා නගර සභා ඝාතනාගාරයට ප්‍රවාහනය කිරීමට සැලැස්විය යුතු ය. තමන් මහා නගර සභා ඝාතනාගාරයට මස් ප්‍රවාහනය කිරීමට අදහස් කරන බවට නාගරික පශු වෛද්‍යවරයා හෝ තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද නිලධරයෙකු, යටත් පිරිසෙයින් පැය දොලහකට කලින් දැනුම් දීමක් කර ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් මස් කිසිවක් ඝාතනාගාරයට ප්‍රවාහනය නොකළ යුතු ය.

(iii) කිසිම තැනැත්තෙකු විසින්, මහා නගර සභා ඝාතනාගාරයට (2) වන ඡේදයේ සඳහන් මස් කිසිවක් ප්‍රවාහනය කිරීම සඳහා තමාගේ නියෝජිතයා හෝ සේවකයා වශයෙන් වෙනත් යම් තැනැත්තෙකු ඒ වෙනත් තැනැත්තාගේ නම සහ ලිපිනය මහා නගර සභා කාර්යාලයේ ලියාපදිංචි කර ඇත්නම් මිස, සේවයේ නියුක්ත නොකළ යුතු ය.

(iv) 2 වන ඡේදයේ සඳහන් මස් කිසිවක්, නාගරික පශු වෛද්‍යවරයා හෝ තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයෙකු ලවා පරීක්ෂා කරවා ගැනීමේ කාර්යය සඳහා නාගරික ඝාතනාගාරයට ගෙන එන සෑම තැනැත්තෙකුම, ඒ කාර්යය සඳහා, ඝාතනාගාරයට ගෙන එන එක් එක් මස් කිලෝ එකක් සඳහා, ගෙවිය යුතු බවට සභාව විසින් යෝජනා සම්මතයෙන් තීරණය කරන ගෙවීම් ප්‍රමාණයක් මත ගණන් බලන ලද ගාස්තුවක්, මහා නගර සභා ඝාතනාගාරය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු ය.

(v) කිසිම තැනැත්තෙකු විසින්, කවර හෝ ස්ථානයක සිට මහා නගර සභා ඝාතනාගාරයට හෝ මහා නගර සභා ඝාතනාගාරයේ සිට මස් විකුණනු ලබන යම් ස්ථානයකට හෝ මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලව මිස, (2) වන ඡේදයේ සඳහන් මස් කිසිවක් ප්‍රවාහනය නොකළ යුතු ය.

(අ) එම මස්, සම්පූර්ණයෙන් ආවරණය කළ මෝටර් වාහනයකින් ප්‍රවාහනය කළ යුතු ය.
(ආ) එම මස්, එම වාහනයේ තත් කාර්යය සඳහා සවිකර ඇති කොකුවල එල්ලා හෝ රාක්කවල අසුරා හෝ තැබිය යුතු ය.
(ඇ) 35 වන වගන්තියේ සහ මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා, මස් යන්නට යම් ගවමස් ඇතුළත් වේ.

35. කිසිම තැනැත්තෙකු විසින් කවර හෝ සතෙකුගේ මස් කිසිවක්, ඒ මස් හිරු එළියෙන්, දූවිල්ලෙන් සහ වැස්සෙන් සාර්ථකව ආරක්ෂා වන ආකාරයට සහ මහජනයාට නොපෙනෙන පරිදි ආවරණය සහිතව තැනූ මෝටර් වෑන් රථයකින්, ගෙන යන්නේ නම් මිස, මහා නගර සභා ඝාතනාගාරයේ සිට හෝ වෙනත් ඝාතන ස්ථානයක සිට වෙළඳපොලට හෝ මහා නගර සභා සීමාව ඇතුළත වෙනත් ස්ථානයකට ගෙන යාම හෝ ගෙන යාමට ඉඩ දීම නොකළ යුතු ය. අලුත් සමක් හෝ සම්, එක් තැනක සිට තවත් තැනකට ගෙන යාමේ දී කිසිම තැනැත්තෙකු විසින් ඒවා මහජනයාට පෙනෙන පරිදි නිරාවරණය කිරීම හෝ නිරාවරණය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

36. නාගරික පශු වෛද්‍ය නිලධාරියා හෝ ඉහත කී පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකු විසින් පරීක්ෂා කරන ලද, සියලු ගව ආදී සතුන් පිළිබඳ විස්තර සහ ඔවුන්ගේ හණ නිවරණ ද මහා නගර සභාව විසින් අනුමත කළ ආකෘති පත්‍රයේ දැක්වෙන පරිදි වූ වෙනත් සියලු විස්තර ද, ඇතුළත් ලේඛනයක් ඔහු විසින් තබා ගත යුතු ය. ඒ ලේඛනය ඉරු දින සහ රජයේ නිවාඩු දින හැර අනෙකුත් දිනවල, ඝාතනාගාර කාර්යාලයේ දී පස්වරු එකත් (1.00) පස්වරු හතරත් (4.00) ත් අතර කාලය තුල දී මහජනයාට බලාගත හැකි විය යුතු ය.

37. බලපත්‍රලත් ඝාතකයෙකු නොවන කිසිම තැනැත්තෙකු විසින්, නිසි බලධාරියාගෙන් ලබාගත් විශේෂ බලපත්‍රයක් නොමැතිව හෝ ඒ බලපත්‍රයක සාමාන්‍ය අර්ථයට පටහැනිව යම් ගවයෙකු, බැටළුවෙකු, එළුවකු හෝ ඌරෙකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය. තවද, එවැනි සෑම බලපත්‍රයක් සඳහා, සභාව විසින් යෝජනා සම්මතයෙන් තීරණය කරන ලද පරිදි වූ ගාස්තුවක් අය කළ යුතු ය.එසේ වුවද හදිසි අවශ්‍යතාවයක් වන්නා වූ සහ එම ඝාතනය, විකිණීමේ කාර්යය සඳහා නොවන්නා වූ අවස්ථාවක, නිසි බලධාරියා විසින් යථා පරිදි බලය දෙන ලද කවර හෝ නිලධාරියෙකු විසින් ඒ බලපත්‍රය නිකුත් කළ හැකි අතර, ඔහු විසින් සභාව වෙනුවෙන් ඒ ගාස්තුව අයකර ගෙන නාගරික ගණකාධිකාරිවරයාට එය ගෙවිය යුතු ය.

38. යම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවෙන් කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර, බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක නඩු පවරනු ලැබීමකින් පසුව වරදකරු බවට පත් වන්නේ නම්, පහත සඳහන් දණ්ඩනයන්වලට,

(අ) පළමු වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ද, (රු. 1,000)
(ආ) දෙවන වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු.2000) නොඉක්මවන දඩයකට ද,
(ඇ) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් (250)නොඉක්මවන අතිරේක දඩයකට ද, හෝ
(ඈ) දෙවන වරට හෝ ඊට වැඩි වාර ගණනක දී මෙම අතුරු ව්‍යවස්ථා උල්ලංඝණය කිරීමේ වරදට වරදකරු වන බලපත්‍රධාරියාගේ බලපත්‍රය අවලංගු කිරීමට යටත් වන්නේ ය.

## XLI වන කොටස

### *මුදල් නියෝග*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 සහ 267 වන වගන්ති අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ ආදාහනාගාරය විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. අර්ථ නිරූපනය -

1. ''ප්‍රධාන නිලධරයා'' යන ''අභිධානයට'' ''නාගරික කොමසාරිස්වරයා'' යනුවෙන් ඇතුළත් වේ.

2. ප.මු.නි. යන අකුරු වලින් ප්‍රධාන මුදල් නිලධාරියා අදහස් වන අතර, මෙම නාගරිකයේ නාගරික කොමසාරිස්වරයා අදහස් වේ. මින් ඉදිරියට මෙය නාගරික කොමසාරිස් වශයෙන් අදහස් වන අතර, එයින් සියලු ආදායම් එකතු කිරීමේ කාර්ය ඇතුලුව සභාවේ මුදල් කටයුතු කළමනාකරණය පරිපාලනය භාරව සිටින නිලධාරියා සඳහන් කරනු ලැබේ.

3. (i) ප.පා.වි.අ. යන අකුරු වලින් ඌව පළාතේ විෂයය භාර අමාත්‍යාංශය අදහස් වේ.
(ii) ප.ප.අ., යනුවෙන් හඳුන්වනු ලබන්නේ පළාත් සභා සහ පළාත් පාළන අමාත්‍යාංශය ලෙස හඳුන්වනු ලැබේ.
(iii) ප.ප.කො., යන්නෙන් හඳුන්වනු ලබන්නේ පළාත් පාළන කොමසාරිස්තුමා යනුවෙනි.

4. (1) ''නිසි වාර්තා'' හෝ එවැනි යෙදුමකට පළාත් පාලන අමාත්‍යාංශය විසින් නියම කරන ලද යම් ආකෘතියක් හෝ වාර්තාවක් ඇතුළත් වෙයි. යම් නියමිත ආකෘතියක් හෝ වාර්තාවක් නිකුත් කර නොමැති අවස්ථාවක දී වාර්තාවක් හෝ ලේඛණයක් නාගරික කොමසාරිස් විසින් අනුමත කරන ලද ආකෘතියට අනුව පිළියෙල කළ යුතු ය.

(2) සාමාන්‍ය විධිවිධාන :

(අ) ප්‍රධාන මුදල් නිලධරයා වන නාගරික කොමසාරිස් සභාවේ මුදල් කටයුතු පිළිබඳ සමස්ථ කළමනාකරණය හා නිසි පරිපාලනය සම්බන්ධයෙන් වගකීම දැරිය යුතු අතර සභාවට සහ එකී කමිටුවලට උචිත පරිදි වූ මූල්‍ය උපදෙස් දිය යුතු ය.

(ආ) එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධාන නිලධාරියකු කාර්ය මණ්ඩලයේ වගකීම හා පාලනය ගැන ද ගොඩනැගිලි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ද්‍රව්‍ය, මුදල් සහ ගබඩා ඇතුලු ඔහුගේ දෙපාර්තමේන්තුවට අයත් අනිත් සියලු සම්පත්වල ආරක්‍ෂාව, භාරය හා පාලනය ගැන ද වගකීම දැරිය යුතු ය.

(ඇ) මේ මුදල් නියෝග තම මෙහෙයුම් හා කටයුතු ක්ෂේත්‍රය ඇතුලත පිළිපදිනු ලබන බවට එක් එක් දෙපාර්තමේන්තුවල ප්‍රධාන නිලධාරියා වගබලා ගත යුතු ය.

5. (1) අයවැය පාලනය :

(අ) පුනරාවර්තන වියදම් සහ ආදායම් (එනම් පුනරාවර්තන අයවැය ලේඛනය)

(ආ) ප්‍රාග්ධන යෝජනා ක්‍රම සහ යෝජනා (එනම් ප්‍රාග්ධන අයවැය ලේඛනය) පිළිබඳ වූ කෙටුම්පත් අය වැය ලේඛනයක් නාගරික කොමසාරිස්ගේ අධීක්‍ෂණය යටතේ ප්‍රධාන ගණකාධිකාරීගෙන් විමසා එක් එක් වර්ෂයේ දී සකස් කළ යුතු ය.

(2) කෙටුම්පත් අයවැය ලේඛන පිළියෙල කිරීම සඳහා අවශ්‍ය සියලු මූල්‍ය සංඛ්‍යා ලේඛණමය හා වෙනත් අදාළ තොරතුරු සභාවේ අනෙක් නිලධාරීන්ගෙන් ලබා ගැනීමට නාගරික කොමසාරිස්ට හිමිකම තිබේ.

(3) කෙටුම්පත අයවැය ලේඛන නියමිත කාර්ය පටිපාටිවලට අනුකූලව සකස් කළ යුතු අතර එහි දී වියදම් හා ආදායම් වර්ගීකරණය පිළිබඳව සම්මත ආකෘති අනුගමනය කළ යුතු ය.

(4) කෙටුම්පත් අයවැය ලේඛනයේ කොටස් පළමුවෙන් ස්ථාවර කාරක සභා ඒකාබද්ධ රැස්වීමට ඉදිරිපත් කර නාගරික කොමසාරිස් විසින් ඊට පසුව මහා සභාවට ඉදිරිපත් කිරීම සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය පුනරාවර්ථන සහ ප්‍රාග්ධන අයවැය ලේඛන ඒකාබද්ධ කළ යුතු ය.

(5) වාර්ෂික ප්‍රාග්ධන අයවැය ලේඛණය සභාව විසින් අනුමත කල ද මහා නගර සභා ආඥා පනතේ 252 වන අධිකාරියේ 215 (අ) වගන්තිය ප්‍රකාර සම්මත වුවක් සේ සලකනු ලබන අවස්ථාවකදී ද අලුත් ව්‍යාපෘතියක් සඳහා වියදම් දැරීමට නිසි මුල්‍ය ඇගයුම් වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් පිළියෙල කොට මුදල් කාරක සභාවට සහ මහා සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.

(6) අනුමත අයවැය ලේඛනවලින් විශේෂිතවම බලයලත් කාර්යයන් සඳහා පමණක් වියදම් දරන බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගබලා ගත යුතු ය.

(7) යම් වැය ශීර්ෂයක් යටතේ වූ වියදම් ඉක්මවීමට ඉඩ ඇති බව පෙනී යන අවස්ථාවක නාගරික කොමසාරිස්ගෙන් විමසා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් යම් අවශ්‍ය අනුමැතියක් පතා මුදල් කාරක සභාව හවුල් වාර්තාවක් ඉදිරිපත් කල යුතු ය.

(8) ඉතිරි වැය ශිර්ෂයන් මෙසේ වියදම් ඉක්මවා යන වැය ශිර්ෂයකට මුදල් මාරු කිරීම අනුමත කිරීමට හෝ පරිපුරක අයවැය ලේඛණයක් සම්පාදනය කොට ඉදිරිපත් කිරීමට නගරාධිපති විසින් විධානයක් කල හැකි ය.

6. **ගිණුම් පද්ධති**

(1) සියලුම ගිණුම් පද්ධති වාර්තා සහ කාර්ය පටිපාටි නියමිත ආකෘතිවලට හා උපදෙස් වලට අනුකුල විය යුතුය. යම් සම්මත ක්‍රමයක් හෝ ආකෘති නියම කර නොමැති අවස්ථාවක වෙනත් දෙපාර්තමේන්තුවක් සම්බන්ධ වන්නේ නම්, මුල්‍ය වාර්තාව හා කාර්ය පටිපාටිය අදාළ ප්‍රධාන නිලධාරියා විමසීමෙන් පසුව ප්‍රධාන මුදල් නිලධාරි විසින් අනුමත කරන ලද ආකෘතියක විය යුතු ය.

(2) ප.ප.කො. විසින් ඉල්ලා සිටිනු ලබන සියලුම නිල මුදල් වාර්තා සමග වාර්ෂික ආදායම් හා වියදම් ශේෂ පත්‍රය නාගරික කොමසාරිස් විසින් සම්පුර්ණ කල යුතු ය.

(3) ගිණුම් කාර්ය පැවරීමේ දී පහත දැක්වෙන ප්‍රතිපත්ති පිළිපදිනු ලබන බවට සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතු ය.

7. **බැංකු ගිණුම් හා චෙක්පත් :**

(1) සභාවේ සහ ප.ප.අ. යේ යම් විධිවිධාන වලට යටත්ව නාගරික කොමසාරිස් සභාවේ ගිණුම් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ පිළිවෙල යෙදීම ගැන වගකිව යුතු ය.

(2) සියලුම චෙක්පත් ප්‍රධාන මුදල් නිලධාරිගේ බලය මත පමණක් ඇණවුම් කරනු ලැබිය යුතු ය. ඒවා මනා රැකවරණය සහිතව තබා තිබෙන බවට ඔහු වගබලා ගත යුතු ය.

(3) සභාවේ බැංකු ගිණුම් වලින් ලියන සියලුම චෙක්පත් සභාව විසින් විශේෂයෙන් බලය දෙන ලද නිලධාරින් දෙදෙනෙකු විසින් අත්සන් කළ යුතු ය.

(4) සභාවේ අනුමැතිය නොමැතිව කිසිම බැංකු ගිණුමක් අයිරා තත්ත්වයට පත් වීමට ඉඩ නොතැබිය යුතු ය.

8. **වැඩ භාණ්ඩ හා සේවා සඳහා වූ ඇණවුම් :**

(i) පහත දැක්වෙන කාරණාවල දී එනම්,

(අ) මහජන උපයෝගිතා සේවා සැපයීම (උදා.- ජලය තොග විදුලිබල සපයා ගැනීම)
(ආ) බදු ගිවිසුම් වලින් ආවරණය වූ වාර ගෙවීම (උදා.- කුලී)
(ඇ) සුළු මුදල් වලින් කෙරෙන සුළු මිලදී ගැනීම්,
(ඈ) ගොඩනැගිලි ඉදි කිරීම ඉංජිනේරු වැඩ කොන්ත්‍රාත් ගිවිසුම් ආදිය යටතේ සපයනු ලබන වෙනත් තාක්‍ෂණික සේවා සම්බන්ධයෙන් වූ විට දී හැර සියලු වැඩ භාණ්ඩ හා සේවා සැපයීමට හෝ භාර දීමට පෙර ඒ සම්බන්ධයෙන් නියමිත නිල ආකෘතිය භාවිතා කල යුතු ය.

(ii) ඇණවුම් පොත් ආරක්ෂිතව තබා ගැනීම හා ඒවා දෙපාර්තමේන්තුවලට නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන නාගරික ගණකාධිකාරි වගබලා ගත යුතු ය.

(iii) සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුම තමාගේ දෙපාර්තමේන්තුවේ නිල ඇණවුම් අත්සන් කිරීමට බලය ලත් නිලධාරින්ගේ ලැයිස්තුවක් සැපයිය යුතු ය.

9. **ගෙවීම :**

(1) සියලුම ඉන්වොයිස්වලට නොපමාව මුදල් ගෙවීම ගැන නාගරික කොමසාරිස් වගකිව යුතු ය.

(2) බලයලත් හා නිශ්චිත වර්ගවල ගෙවීම් වල දී (උදා. සේවක වැටුප්) සරප් නමින් නිකුත් කරනු ලබන චෙක්පත් මඟින් මුදල් ගෙවීම් කල හැකිය.

(3) ඇණවුමක් නිකුත් කරන ප්‍රධාන නිලධරයා ඊට අදාල ඉන්වොයිස් පරීක්ෂා කිරීම හරි වැරදි බැලීම සහ සහතික කිරීම පිළිබඳව ද තම දෙපාර්තමේන්තුවේ කටයුතු වලින් පැන නගින වෙනත් යම් ප්‍රශ්නයක් පිළිබඳව ද වගකිව යුතු ය.

(4) ගෙවීම් සඳහා ඉන්වොයිසියක් සහතික කිරීමට පෙර සහතික කරන නිලධරයා පහත දැක්වෙන කාරණා ගැන සෑහීමකට පත් විය යුතුය :-

(අ) වැඩ භාණ්ඩ හෝ සේවා ඇත්ත වශයෙන් ඉටු කර පරීක්ෂා කර සෝදිසි කර ඇති බව සහ නියමිත ප්‍රමිතියකින් ඇති බව,
(ආ) ඉන්වොයිසියේ මිල ගණන්, ගණන් බැලීම, වට්ටම් ආදිය නිවැරදි බව,
(ඇ) වියදම නිසි ලෙසද අයවැය ලේඛණය ඇතුලත ද සිදු කර ඇති බව,
(ඈ) උචිත වන අවස්ථාවල වත්කම් ලේඛණයේ හෝ ගබඩා ලේඛණවල සටහන් යොදා ඇති බව,
(ඉ) ඉන්වොයිසියට ඊට කලින් මුදල් ගෙවා ඇති බව,

(5) දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ ඒ දෙපාර්තමේන්තුවේ සිටින්නා වූ ද, ඉන්වොයිස් සහතික කිරීමට බලය ලබා ඇත්තා වූ ද ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ ලැයිස්තුවක් ඔවුන්ගේ ආදර්ශ අත්සන ද සමඟ ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත යැවිය යුතු ය.

(6) සහතික කල ඉන්වොයිස් නොපමාව ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත යැවිය යුතු අතර අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන තොරතුරු පරීක්ෂා කිරීම තොරතුරු ඉල්ලා සිටීම ද ඔහු විසින් කළ හැකිය.

(7) බඩු භාර දීම හෝ වැඩ ඉටු කිරීම හෝ පරීක්ෂා කරන නිළධරයන් ඇණවුම් කරන හෝ මිළ ගණන් හෝ නියමයන් පිළිබඳව කථා බහ කරන්නන් පිළිබඳව කටයුතු කරන නිළධාරීන්ගෙන් ස්වාධීනව සිටින බව දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කළ හැකිය.

(8) සුළු මුදල් වියදම් දැරීම සඳහා සුළු ප්‍රමාණයක මුදල් ශේෂයක් ලබා ගැනීමට නාගරික කොමසාරිස් විසින් නිළධරයකුට බලය දිය හැකිය. එම ශේෂය අග්‍රිම පදනමක් මත තබා ගත යුතු අතර, එය නාගරික කොමසාරිස් විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

10. **ගමන් වියදම් යැපීම් දීමනා සහ සභිකයන්ගේ දීමනා :**

(1) නිළධරයන්ගේ සියලුම ඉල්ලීම් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිසි ලෙස සහතික කරනු ලැබ ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් ඉල්ලීම් ආකෘති පත්‍ර සහතික කර එවා ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත යැවිය යුතු ය. එසේ සහතික කිරීමට බලය පවරන ලද නිලධාරිගේ නම සහ ආදර්ශ අත්සන ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත යොමු කළ යුතු ය.

(3) දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් සහතික කිරීමක් කරනු ලැබීමෙන් ගමන් සහ වියදම් බලයලත් හා අවශ්‍ය ඒවා වූ බවට ද සභාව විසින් නිසි ලෙස ගෙවීම් අනුමත කරනු ලැබිය හැකි ඒවා බවට ද සහතික කිරීමේ නිලධාරියා සෑහීමකට පත්ව සිටින බව අදහස් වන්නේ ය.

11. **ණය මුදල් හා ආයෝජන :**

(1) මහා නගර සභාව විසින් ලබා ගන්නා ලද යම් ණය මුදලකට සභාවේ අනුමැතිය ලැබී ඇති බවට ද එය නියමිත ලේඛණවල නිසි ලෙස වාර්තා ගත කරනු ලබන බවටද ප්‍රධාන මුදල් නිලධාරියා විසින් වගබලා ගත යුතු ය.

(2) ණයවල මුල් මුදල හා පොළිය කලින් කළ පොලිය ගෙවීම සඳහා පුනරාවර්තන අයවැය ලේඛණයේ විධිවිධාන සලස්වා ඇති බවට හා ණයවල වාරික මුදල ගෙවීම සඳහා ප්‍රාග්ධන අයවැය ලේඛණයේ විධිවිධාන සලස්වා ඇති බවටත්, එම ගෙවීම නියමිත දිනයේ දී ණය හිමියාට ගෙවනු ලබන බවටත්, ප්‍රධාන මුදල් නිලධාරියා වගබලා ගත යුතු ය.

(3) සභාවේ අනෙකුත් කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන අතිරික්ත අරමුදල් ප්‍රධාන නාගරික ගණකාධිකාරී විසින් ප්‍රධාන මුදල් නිලධාරියාගෙන් විමසා නගරාධිපතිගේ අනුමැතිය මත බැංකුවක ආයෝජනය කළ හැකිය.

12. **වැටුප් වේතන හා විශ්‍රාම වැටුප් ගෙවීම :**

(1) සේවකයින්ගේ සියලු වැටුප් වේතන විශ්‍රාම වැටුප් හා දීමනා ප්‍රදානය කිරීම හා ගෙවීම් ප්‍රධාන නාගරික ගණකාධිකාරී විසින් අනුමත කරන ලද වැඩ පිළිවෙලක් අනුව හෝ කළ යුතු ය.

(2) පහත දැක්වෙන කාරණා ඇතුළුව ගෙවීම්වලට බලපාන සියලුම කාරණා ගැන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ප්‍රධාන නාගරික ගණකාධිකාරී මගින් ප්‍රධාන මුදල් නිළධාරියා වෙත දැනුම් දිය යුතුය :

(අ) පත් කිරීම් ඉල්ලා අස්වීම් මාරු වීම් :
(ආ) සේවයට නොපැමිණීම (උදා :- අසනීප අවසර නොලත් නිවාඩු) :

(ඇ) වැටුප් පරිමාණවල වෙනස්කම්

(3) සියළු ලේඛණ සහ වාර්තා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හෝ තත්කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිළධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතු ය. බලයලත් නිළධරයන්ගේ නම් සහ අත්සන් ප්‍රධාන නාගරික ගණකාධිකාරී වෙත යැවිය යුතු ය.

13. **ආදායම් එකතු කර ගැනීම :**

(1) සභාවට අයවිය යුතු සියළුම මුදල් එකතු කර ගැනීම ප්‍රධාන මුදල් නිලධාරියා විසින් පාලනය කරනු ලබන හෝ අනුමත කරන ලද වැඩ පිළිවෙලක් යටතේ සිදු කල යුතු ය.

(2) ණය ගැති ගිණුමක් නොපමාව ඉදිරිපත් කිරීමට පහසු වීම සඳහා කරන ලද වැඩ සපයන ලද භාණ්ඩ බදු ගිවිසුම් හෝ සපයන ලද සේවාවන් සඳහා සභාවට අයවිය යුතු යම් මුදල් ණය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ප්‍රධාන නාගරික ගණකාධිකාරී මගින් ප්‍රධාන මුදල් නිළධාරියා වෙත දැනුම් දිය යුතු ය.

(3) අයවිය යුතු නිවැරදි මුදල් ප්‍රමාණය ගැන තමා සෑහීමකට පත්වීම සඳහා යම් වාර්තා හෝ ලේඛණ පරීක්ෂා කිරීමේ අයිතිය ප්‍රධාන මුදල් නිළධාරියාට තිබිය යුතු ය.

(4) සියළුම ලදුපත් ආකෘති, ප්‍රවේශ පත්‍ර, ගිණුම් පොත් ආදිය ප්‍රධාන නාගරික ගණකාධිකාරී ඇණවුම් කර සැපයිය යුතුය. ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ඇමති විසින් අනුමත නොකරන ලද්දා වූ මුදල් එකතු කර ගැනීම සඳහා වූ යම් වාර්තාවක් භාවිතා කරනු ලබන අවස්ථාවක එය ප්‍රධාන නාගරික ගණකාධිකාරී විසින් නිර්දේශ කරන ලදුව ප්‍රධාන මුදල් නිළධාරී විසින් අනුමත කරන ලද ආකෘතියක විය යුතු ය.

(5) ලැබෙන සියළු මුදල් අප්‍රමාදව ප්‍රධාන මුදල් නිළධාරී විසින් ප්‍රධාන නාගරික ගණකාධිකාරී සමඟ යොදා ගත් වැඩ පිළිවෙලකට අනුව අනුමත බැංකුවක තැන්පත් කළ යුතු ය.

(6) ප්‍රධාන මුදල් නිළධාරී විසින් විශේෂිතවම බලය දෙන ලද අවස්ථාවල දී හැර ලැබුණු සියළු මුදල් ඉන් කිසිම මුදලක් රඳවා නොගෙන එලෙසින්ම අනුමත බැංකුවේ තැන්පත් කළ යුතු ය.

(7) සභාව වෙනුවෙන් ඇති මුදලෙන් පෞද්ගලිකව චෙක්පත් මාරු කරනු නො ලැබිය යුතුය

(8) එක් නිළධරයෙකුගෙන් තවත් නිළධරයෙකුට මාරු කරන ලද යම් මුදලකට සාක්ෂි වශයෙන් එම මුදල ලබන නිළධරයා අත්සන් කර තිබිය යුතු ය.

(9) මුදල්වල ආරක්ෂාව හා ප්‍රවේශම පිළිබඳව වැඩපිළිවෙලක් ප්‍රධාන නාගරික ගණකාධිකාරී සහ ප්‍රධාන මුදල් නිලධාරී විසින් යෙදවීමට වගබලා ගත යුතු ය.

(10) සභාව විසින් අන්‍ය ආකාරයකින් තීරණය නොකරන්නේ නම් මුදල් භාර ගැනීම පෙ.ව 9.00 සිට ප.ව. 3.00 දක්වා කළ යුතු ය. ක්ෂේත්‍රයේ මුදල් එකතු කිරීමට සභාවේ නිළධාරීන්ට බලය පැවරී ඇත්නම් මුදල් ලබා ගැනීම සඳහා ඔවුන් වෙත උප කුවිතාන්සි පොත් ප්‍රධාන නාගරික ගණකාධිකාරී විසින් නිකුත් කළ යුතු ය. උප කුවිතාන්සි පොත් අනු පිටපත් වලින් සහ මුල් පිටපත්වලින් පමණක් විය යුතු ය.

(11) ක්ෂේත්‍රයේ මුදල් භාර ගැනීමට බලය පැවරෙන නිළධාරීන් තමන් විසින් එකතු කරනු ලබන මුදල් එදිනම හෝ ඊට පසු දිනම සභාවේ තැන්පත් කළ යුතු ය. මෙම නිළධාරීන් නිකුත් කරනු ලබන ලදුපත්වල උපලේඛන සකස් කොට එම උපලේඛන ලදුපත් පොතක් සමඟ අදාළ විෂය භාර ලිපිකරු වෙත ඉදිරිපත් කළ යුතු ය. අදාළ විෂය භාර ලිපිකරු මෙම උපලේඛනයෙහි සඳහන් ලදුපතේ සටහන් මුදල අංකය අනු පිටපත් සමඟ සංසන්දනය කොට බලා එම ලදුපත් රතු තීන්තෙන් අවලංගු කොට අවසානයට නිකුත් කළ ලදුපතේ පිටුපස තම කෙටි අත්සන යොදා දිනය සටහන් කළ යුතු ය. ඉන් අනතුරුව පොදු ලදුපතක් ලියා අදාළ නිළධාරියා වෙත නිකුත් කළ යුතු ය. එම නිළධාරියා විසින් එම ලදුපතේ සඳහන් මුදල සරප්ට ගෙවිය යුතු ය.

14. **චෙක්පත් භාර ගැනීම :**

සභාව වෙත ලැබිය යුතු මුදල් සඳහා චෙක්පත් භාර ගැනීම ඉතා කල්පනාකාරීව කළ යුතු ය. යම්කිසි චෙක්පතක් ගරු වූ අවස්ථාවක දී එම ආදායකයාගෙන් ඉන්පසු චෙක්පත් භාර නොගත යුතු අතර අගරු වන චෙක්පතේ වටිනාකම මුදලින් භාර ගැනීමට කටයුතු කළ යුතු ය.

(1) චෙක්පත් මගින් යම් කෙනෙකු මුදල් ගෙවන විට එම චෙක්පත සඳහා ලදුපතක් නිකුත් කල යුතු ය. මෙම ලදුපතේ චෙක්පත උපලබ්ධි වූ විට වලංගු වන බවට මුද්‍රාව තබා අත්සන් කළ යුතු ය.

(2) කාර්යාලයට ලැබෙන සියලුම මුදල් සහ චෙක්පත් පසු දින බැංකුගත කළ යුතු ය. මුදල් චෙක්පත හෝ පෙරදාතම හෝ පසුදාතම යෙදූ චෙක්පත් භාර නොගත යුතු ය.

(3) සභාවේ දේපලක් විකිණීමේ දී හෝ ටෙන්ඩර් තැන්පත් හෝ තාවකාලික බදු කුළි මුදල් සඳහා චෙක්පත් භාර නොගත යුතු ය.

15. **ගොඩනැගිලි ඉදි කිරීම සහ ඉංජිනේරු වැඩ සඳහා කොන්ත්‍රාත්තු :**

(1) ගොඩනැගිලි ඉදිකිරීම් සහ ඉංජිනේරු වැඩ සඳහා සභාව විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුවක් සකස් කිරීමත්,එම ඇස්තමේන්තු කරනු ලබන ගෙවීම් සටහන් කිරීමටත්, ඇස්තමේන්තු ලෙජරයක් පවත්වාගෙන යා යුතු ය. මේ සඳහා මිණුම් සටහන් කිරීමට මිණුම් ලේඛණයක්ද පවත්වා ගෙන යා යුතු ය. අවස්ථාවෝචිත පරිදි මෙම කටයුතු අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට ගෙවනු ලබන මුදල් ප්‍රධාන ඉංජිනේරුවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිළධාරියෙකු විසින් නිකුත් කරන ලද සහතිකයක් මත පමණක් ගෙවිය යුතු ය.

(3) සෑම අතිරේක වැඩකට හෝ වෙනස් කිරීමකට අදාළ වන වියදම් ඇස්තමේන්තුවක් ප්‍රධාන ඉංජිනේරු විසින් ප්‍රධාන නාගරික ගණකාධිකාරිගෙන් විමසා ප්‍රධාන මුදල් නිළධාරියා මගින් මුදල් කාරක සභාව මගින් මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. සෑම අතිරේක වැඩකටම හෝ වෙනස් කිරීමකටම ප්‍රධාන ඉංජිනේරුවරයා හෝ ඔහු විසින් අනුමත කරන ලද වෙනත් ඉංජිනේරුවරයකු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබිය යුතු ය.

(4) සෑම වෙනස් කිරීමකම පිටපතක්, එහි මූල්‍ය ප්‍රතිඵලය පිළිබඳව සඳහනක් ද සහිතව ප්‍රධාන මුදල් නිළධාරියා වෙත යවනු ලැබිය යුතු ය.

(5) කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන අවසාන සහතිකය නිකුත් කිරීමට පෙර ප්‍රධාන ඉංජිනේරු විසින් පෞද්ගලිකවම එම කොන්ත්‍රාත්තුව පරීක්ෂා කර බලා අවසන් ගෙවීම සහතික කළ යුතු ය.

(6) ප්‍රධාන මුදල් නිළධාරියා විසින් කොන්ත්‍රාත්තු සඳහා වූ ගිණුම් අවශ්‍ය යැයි ඔහු විසින් අදහස් කරනු ලබනතාක් ප්‍රමාණයකට පරීක්ෂාකරනු ලැබිය යුතුයි. තව ද, ගිණුම්වල නිරවද්‍යතාවය ගැන තමාට සෑහීමකට පත්වීමට අවශ්‍ය වන ආකාරයේ සියළු විමසීම් කිරීමට ද, එසේ වූ තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගැනීමට ද ඔහුට හිමිකම් තිබිය යුතු ය.

(7) කොන්ත්‍රාත්තුවක් සම්පූර්ණ කිරීම් නිසි කාල සීමාවකට වඩා ප්‍රමාදවන අවස්ථාවක ප්‍රමාණ කළ අලාභ සඳහා යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීම සහ තමා ගත් ක්‍රියා මාර්ගය ගැන අදාළ කාරක සභාවට වාර්තා කිරීම අදාළ කාර්මික නිළධරයාගේ යුතුකම විය යුතු ය.

(8) යම් පවත්නා කොන්ත්‍රාත්තුවක නියමයන්ට ඇතුළත් නොවන බව පැහැදිලිව පෙනෙන කාරණා සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ආයතනයේ නෛතික බැඳීම සලකා ප්‍රධාන මුදල් නිළධාරියාට යොමු කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වන අවස්ථාවක එකඟත්වයක් ඇති කර ගැනීමට පළමුව මූල්‍යමය වශයෙන් සළකා බැලීම සඳහා ප්‍රධාන මුදල් නිළධාරියා වෙත යොමු කළ යුතු ය.

16. **අභ්‍යන්තර විගණනය :**

සභාවේ ගිණුම්, මූල්‍ය හා වෙනත් මෙහෙයුම් පිළිබඳව ප්‍රධාන මුදල් නිළධාරියා විසින් ස්වාධීනව පාලනය කරනු ලබන අඛණ්ඩ අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන යා යුතු ය.

(1) ප්‍රධාන අභ්‍යන්තර විගණන නිළධාරියාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට පහත සඳහන් දේ සඳහා බලය තිබිය යුතු ය.

(අ) විශේෂ හේතූන් මත ප්‍රධාන මුදල් නිළධාරියා විසින් අණදෙන පරිදි ඕනෑම වේලාවක දී හෝ කුමන අවස්ථාවක දී හෝ සභාවේ යම් ස්ථානයකට හෝ ඉඩමකට ඇතුළුවීම :

(ආ) සභාවේ යම් මුදල් හෝ වෙනත් ගනුදෙනුවලට අදාළ සියළු වාර්තා වවුචර් ලේඛන සහ ලිපිගොණු ලබා ගැනීම :

(ඇ) පරීක්ෂණයකට විෂය වී ඇති යම් කාරණයකට අදාළව අවශ්‍ය වන කරුණු පැහැදිලි කිරීම් කරන ලෙස ඕනෑම නිළධාරියෙකුට නියම කිරීම හා ලබා ගැනීම.

(ඈ) සභාවේ යම් සේවකයෙකුගේ පාලනය යටතේ ඇති මුදල් ගබඩා ද්‍රව්‍ය හෝ සභාවේ වෙනත් දේපළ ඉදිරිපත් කරන ලෙස ඒ සේවකයාට නියම කිරීම.

(2) සියළුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි මාසික වැඩ සටහන පිළියෙල කර ප්‍රධාන මුදල් නිළධාරියාගේ අනුමැතිය ලබාගෙන,අදාළ දෙපාර්තමේන්තුවලින් විමසා විගණනය කර,අදාළ වාර්තාව මාසය ඉකුත් වී ඊළඟ මාසය එළඹීමට පෙර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත වාර්තා කිරීම ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරිගේ වගකීම වේ.එක් එක් දෙපාර්තමේන්තු පිළිබඳව ඉදිරිපත් කරන ලද විමර්ශන වාර්තා පරිදි කටයුතු කරගෙන යන්නේද යන්න, පසු විපරම් සහිත කටයුතු කර ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි විසින් ප්‍රධාන මුදල් නිළධාරියා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

17. **අක්‍රමිකතා :**

(1) පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් එනම් :

(අ) මුදල්, ගබඩා ද්‍රව්‍ය, දේපළ, ගෙවීම්, පාරිශ්‍රමික හෝ දීමනා,

(ආ) සභාවේ පද්ධති, කාර්ය පරිපාටි හා උපදෙස් අදාළ වන වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් සිදුවී ඇතැයි සැක කරන යම් අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණන නිළධරයන් විසින් වහාම ප්‍රධාන මුදල් නිළධාරීට දැන්විය යුතු ය.

(2) යම් අක්‍රමිකතාවක් හෝ සැකයක් පිළිබඳව විමර්ශනය කිරීමට අවශ්‍ය කවර හෝ පියවර අභ්‍යන්තර විගණන නිළධාරී විසින් ගනු ලැබිය යුතු අතර,එහිදී සොයා දැනගත් දේ පිළිබඳව වාර්තාවක් ඔහු විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රධාන අභ්‍යන්තර විගණන නිළධාරී විසින් ප්‍රධාන මුදල් නිළධාරියාට වාර්තා කරන අතර,සාමාන්‍ය නීතිය හා සභාවේ සේවා නියුක්තිකයන් සඳහා ඇති විනය නීති සංග්‍රහයට අනුකූලව අවශ්‍ය යැයි සැලකෙන සියලු පියවර ප්‍රධාන මුදල් නිළධාරියා විසින් ගනු ලැබිය යුතු ය.

(4) ප්‍රධාන අභ්‍යන්තර විගණන නිළධාරිගේ වාර්තාවේ පිටපතක් ප්‍රධාන මුදල් නිළධාරි මඟින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

18. **භෞතික වත්කම් ලේඛන :**

(1) සභාවට අයත් පහත දැක්වෙන දේ සඳහා නිසි වාර්තා තබා ගන්නා බවට, කාර්මික නිළධාරියා සමඟ එක්ව ක්‍රියා කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් වගබලා ගත යුතු ය.

(අ) ඉඩම් ගොඩනැගිලි සහ සවිකළ යන්ත්‍ර/පිරිවිතරයන්
(ආ) වෙනත් ස්ථිර වත්කම් (උදා : මාර්ග, කසල කාණු හා කාණු, ප්‍රධාන ජලනල, විදුලි රැහැන් ආදිය)

(2) එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තමන්ගේ දෙපාර්තමේන්තුව ඇතුළත හෝ තමාගේ පාලනය යටතේ ඇති පහත දැක්වෙන වර්ගවල සියලු දේ පිළිබඳව ප්‍රමාණවත් විස්තර පෙන්නුම් කරන නිසි බඩු ලේඛන පවත්වා ගත යුතු ය.

(අ) වාහන සහ යන්ත්‍ර/උපකරණ .
(ආ) මෙවලම් .
(ඇ) කාර්යාලවල සහ ගොඩනැගිලි තුළ ඇති සවි කිරීම් හා ලීබඩු, කාර්යාල උපකරණ.

(3) එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා බඩු ලේඛනවල ඇති සියළු බඩු සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් කිරීම සම්බන්ධයෙන් ද, යම් භාණ්ඩ අඩු වීම් හෝ නැතිවීම් සම්බන්ධයෙන් ද, වාර්තා කිරීම හා ඒ පිළිබඳව ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් ද වගකිව යුතු ය.

(4) අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් බලය දී ඇත්නම් මිස, කිසිම සේවකයකු විසින් සභාවේ වාහන යන්ත්‍ර සූත්‍ර භාවිතා නොකළ යුතු ය. වාහන හා යන්ත්‍ර සූත්‍ර භාවිතය පාලනය කිරීම හා වාර්තාගත කිරීම සඳහා අවශ්‍ය ලේඛන එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවත්වා ගත යුතු ය.

(5) එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානියා තමාගේ දෙපාර්තමේන්තුවේ තබා ඇති බඩු තොග සහ ගබඩා ද්‍රව්‍යවල ආරක්ෂාව හා භාරය සම්බන්ධයෙන් වගකිව යුතු අතර, ගබඩා භාරකරුවන් සහ ගබඩාවල භාරයට හා පාලනයට සම්බන්ධ කාර්ය මණ්ඩලය හැර අනෙකුත් නිළධරයන් ලවා කලින් කලට ගණන් ගැනීම් සහ සමීක්ෂණය කර බැලීම් සිදු කරවීමට වැඩ පිළිවෙලක් යෙදිය යුතු ය.

(6) ලැබීම්, නිකුත් කිරීම්, මාරු කිරීම්, තොග ගණන් ගැනීම්, ලියා අස් කිරීම් ආදිය ඇතුළුව සියළු ගබඩා ගනුදෙනු ලේඛනගත කිරීමේ කාර්යය සඳහා නිසි ලේඛන පවත්වා ගත යුතු ය.

(7) මුදල් කාරක සභාවේ නිර්දේශය මත, මහ සභාව විසින් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට බලය දුනහොත් මිස, අතිරික්ත හෝ නිෂ්ප්‍රයෝජන ද්‍රව්‍ය, ගබඩා සහ උපකරණ බැහැර කිරීම් තරඟකාරී ටෙන්ඩර් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් සිදු කළ යුතු ය.

19. **රක්ෂණ :**

(1) සභාවේ සහ ප්‍රධාන මුදල් නිළධාරිගේ විධිවිධානවලට යටත්ව, සියලු රක්ෂණ කටයුතු පිළියෙල කිරීම සම්බන්ධයෙන් නාගරික ලේකම් වගකිව යුතු ය.

(2) රක්ෂණ හිමිකම් අවශ්‍ය වන සියලු අවදානම්, බැරකම්, දේපළ හෝ වාහන/යන්ත්‍ර පිළිබඳව ද අවදානම් හෝ රක්ෂණවලට බලපාන යම් වෙනස්වීම් පිළිබඳව ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නොපමාව ප්‍රධාන මුදල් නිළධාරියාට දැන්විය යුතු ය. අවශ්‍ය ආවරණයේ ගණන එක් එක් දැන්වීමේ සඳහන් විය යුතු ය.

(3) යම් ගින්නක්, හානියක්, අනතුරක්, අලාභයක් හෝ රක්ෂණ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට හේතු වන යම් සිද්ධියක් ඇති වුවහොත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ බව ප්‍රධාන මුදල් නිළධාරියාට වහාම දැනුම් දිය යුතු ය.

(4) අනෙකුත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් විමසා ප්‍රධාන මුදල් නිළධාරි විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක් සියළුම රක්‍ෂණ සමාලෝචනය කළ යුතු ය.

(5) සභාව විසින් කළ යුතු යැයි ඉල්ලුම් කරන ලද යම් හානි පූර්ණයක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ප්‍රධාන මුදල් නිළධාරිගෙන් විමසිය යුතු ය.

(6) ගිනි හානි සම්බන්ධ වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

20. **වරිපනම් බදු එකතු කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව :**

(1) සෑම වර්ෂයකම අගෝස්තු මස 31 දින වන විට ඉදිරි වර්ෂය සඳහා බදු පැනවීම ක්‍රියාත්මක කළ යුතු ය.

(2) මෙම බදු මුදල කාර්තු 4කින් අයකර ගැනීමට සභාව විසින් තීරණය කළ යුතු ය. එනම් මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31.

(3) වරිපනම් බද්දේ ප්‍රතිශතය වෙනස් කරන්නේ නම්, ගරු පළාත් පාලන විෂය භාර ඇමතිවරයාගේ අනුමැතිය මත සැප්තැම්බර් මස 30 දිනට පෙර එය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

(4) බදු පැනවීමෙන් අනතුරුව,එම බදු පැනවීමේ නිවේදනය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේත්, බදුල්ල නාගරික ප්‍රදේශය තුළ සංසරණය වන ජාතික ප්‍රවෘත්ති පත්‍ර අවම වශයෙන් දෙකක්වත් පළ කළ යුතු ය.

වරිපනම් ලේඛනයක් සකස් කිරීම :

(5) සෑම වර්ෂයකම සැප්තැම්බර් මස 30 දින වන විට ඉදිරි වර්ෂය සඳහා වරිපනම් ලේඛනය සකස් කළ යුතු ය.

(6) වරිපනම් ලේඛනය සකස් කොට එය නිවේදනය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේත්, බදුල්ල නාගරික ප්‍රදේශය තුළ සංසරණය වන ජාතික ප්‍රවෘත්ති පත්‍ර දෙකක්වත් එම ලේඛණ මහජන ප්‍රදර්ශනය සඳහා විවෘතව ඇති බවට නිවේදනයක් පළ කළ යුතු ය.

(7) සෑම වර්ෂයකම ඔක්තෝබර් මස 31 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා මහ නගර සභා ආඥා පනතේ එනම්,252 වන අධිකාරියේ 235(3) හි සඳහන් දැන්වීම් ලියා අවසන් කළ යුතු ය.

(8) සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා 235 (3) යටතේ සඳහන් දැන්වීම්, සෑම බදු අයකරන ස්ථානයකටම භාර දිය යුතු ය.

(9) වරිපනම් බදු ගෙවීමේදි සභාව ලබා දෙනු ලබන වට්ටම් ප්‍රමාණය බදු ගෙවන්නන්ට ලබා දීමත්,කාර්තුව ඉකුත්වීමෙන් පසු අයකරනු ලබන අධිභාරය (වරෙන්තු ගාස්තු) අය කිරීමටත්, කටයුතු කළ යුතු ය. ලබාදිය යුතු වට්ටම් ප්‍රමාණයත්, කාලසීමාවත්, අයකළ යුතු අධිභාර මුදලත් විටින් විට පළාත් පාලන විෂය භාර ඇමතිවරයා විසින් රීති පැනවීමෙන් නියම කරනු ඇත.

(10) මහා නගර සභා ආඥා පනතේ 235(3) අනුව,භාරදෙනු ලැබූ දැන්වීම් අනුව,වාර්ෂික තක්සේරුව ගැන අතෘප්තිමත් වන දේපළ අයිතිකරුවෙකුට/පදිංචිකරුවෙකුට එම දැන්වීම ලැබී දින තිහක් (30) ඇතුළත විරෝධතා ඉදිරිපත් කළ හැක.

(11) විරෝධතා ලැබුණු පසු එම විරෝධතා, පොතෙහි සටහන් කොට එම විරෝධතා ලැබුණු බව දින 14ක් ඇතුළත අදාළ අය වෙත ලිඛිතව දැන්විය යුතු ය.

(12) මෙම විරෝධතා ලැබී මාස පහක් (5) ඇතුළත පරීක්‍ෂා කොට අවසාන තීරණය නාගරික කොමසාරිස්වරයා විසින් අදාළ පුද්ගලයාට දැනුම් දිය යුතු ය.

(13) මහා නගර සභා ආඥා පනතේ අංක 253(3) ඡේදය යටතේ නිකුත් කරනු ලබන දැන්වීම අනුව,විරෝධතා ඉදිරිපත් කරන්නේ නම්, එම වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල විරෝධතා පරීක්‍ෂා කිරීමට යටත්ව බදු ගෙවන්නන් විසින් ගෙවිය යුතු බවට කොන්දේසියක් එම දැන්වීමෙහි ඇතුළත් විය යුතු ය.

(14) විරෝධතා පරීක්‍ෂා කිරීම නාගරික කොමසාරිස් විසින් හෝ ඒ සඳහා නගරාධිපති විසින් පත්කරනු ලබන වෙනත් නිළධාරියෙකු විසින් ඉටු කළ යුතු ය.

(15) විරෝධතා පරීක්‍ෂා කිරීමෙන් පසු වාර්ෂික තක්සේරුවේ යම්කිසි වෙනසක් කරන්නේ නම් හැකි තරම් ඉක්මනින් එම වෙනස තක්සේරු ලේඛනයේ සටහන් කොට මාණ්ඩලික නිළධාරියෙකු විසින් ඒ බව සනාථ කිරීම වශයෙන් අත්සන් කළ යුතු ය.

වරෙන්තු නිකුත් කිරීම :

(16) සෑම කාර්තුවක් අවසානයේ දී ම 252 ඡේදය යටතේ විනිග්‍රහ බලපත්‍රය හැකි තරම් ඉක්මනින් හිඟ බදු අය කරන නිළධාරියා වෙත නිකුත් කළ යුතු ය. නාගරික කොමසාරිස්වරයා හෝ ඒ සඳහා බලය පවරන නිළධාරියෙකු විසින් එය ඉටු කළ යුතුවේ.

(17) මෙම විනිග්‍රහ බලපත්‍රය සම්පූර්ණ කර එය ආපසු භාරදීමේ කාලය එම විනිග්‍රහ බලපත්‍රයෙහි සඳහන් විය යුතු ය. එම කාලය උපරිම දින හැටක් (60) විය යුතු අතර ඒ කාලය අවසාන වීමෙන් පසු හිඟ බදු අය කරන නිළධාරියා විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ගය සඳහන් වාර්තාවක් සමඟ විනිග්‍රහ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(18) අවශ්‍ය වූ විටෙක දේපළ තහනම් කිරීමේ නිළධාරීන් පත් කිරීම නගරාධිපතිවරයාගේ අනුමැතිය මත නාගරික කොමසාරිස් විසින් කළ යුතු ය.

(19) දේපළ තහනම් කිරීම සඳහා නගර සභාවේ සේවයේ නියුතු නිළධාරීන් යොදවන්නේ නම් ඒ සඳහා සභාව විසින් නියම කරනු ලබන දිරි දීමනා ප්‍රමාණයක් ගෙවිය හැකිය.

(20) අවශ්‍ය වූ විටෙක බාහිර නිළධාරීන් යොදවන්නේ නම් ඔවුනට ගෙවනු ලබන කොමිස් ප්‍රමාණය වරින් වර සභාව විසින් තීරණය කළ යුතු ය. එහෙත් එම මුදල එකතු කරනු ලබන මුදලින් 15% ඉක්ම නොවිය යුතු ය.

(21) බාහිර පුද්ගලයන් දේපළ තහනම් කිරීමේ නිළධාරීන් වශයෙන් සභාව විසින් පත් කරන්නේ නම් එම නිළධාරීන්ගෙන් සුදුසු යැයි හැඟී යන ඇප මුදලක් සහ රක්ෂණ සමාගමකින් ආවරණයක් ද ලබා ගත යුතු ය.

(22) බාහිර නිළධාරීන් දිනපතා එකතු කරනු ලබන මුදල ඊලඟ වැඩ කරන දිනයේ දී සභාවේ තැන්පත් කළ යුතු ය. එහෙත් සති අන්තයේ වැඩ කරන අවසාන දිනයේ දී එම මුදල තැන්පත් කළ යුතු ය.

(23) බාහිර නිළධාරීන් සඳහා අනුපිටපතක් සහිත ලදුපත් පොත් නිකුත් කළ යුතු ය. එම නිළධාරීන් රු. 100 කට වැඩි මුදලක් එකී ලදුපතකින් අය කරන්නේ නම් රජය නියම කර ඇති වටිනාකමින් යුත් මුද්දරයක් අලවා අත්සන් කර මුදල් ගෙවන්නා වෙත එම ලදුපත නිකුත් කළ යුතු ය. එම මුදල නොඉක්ම වන විට ලදුපත් රහිතව තමා විසින් අත්සන් කර නිකුත් කළ යුතු ය.

(24) තමා වෙත නිකුත් කර ඇති විනිග්‍රහ බලපත්‍රය මත පවත්නා කාර්තුව සඳහා මුදල් එකතු කිරීම දේපළ තහනම් කරන නිළධාරියා විසින් නොකළ යුතු ය.

(25) දේපළ තහනම් කිරීමේ නිළධාරීන් මුදල් බැඳීමට කටයුතු කරන අවස්ථාවේ දී ම ඔවුන් විසින් නිකුත් කර ඇති ලදුපත්වල උපලේඛන සකස් කොට ලදුපත් පොත් සමඟ ආදායම් ලිපිකරු වෙත ඉදිරිපත් කළ යුතු ය.

(26) ලදුපත් පොත සහ උපලේඛන ලැබුණු විට ආදායම් ලිපිකරු ලදුපත් පොතේ අදාළ උප පත්‍රිකාව සහ උපලේඛනයේ සඳහන් මුදල පරීක්ෂා කර බලා නිවැරදිව සඳහන් වී ඇත්නම් රතු තීන්තෙන් එම දෙවෙනි ලදුපත අවලංගු කළ යුතු ය. අවසානයේ දී අවසානයට නිකුත් කර ඇති ලදුපතෙහි උප පත්‍රිකාවේ පිටුපස තම කෙටි අත්සන යොදා දිනය සටහන් කළ යුතු ය. ඉන් අනතුරුව මුදල් බිල්පතක් ලියා අදාළ මුදල සරප්පට ගෙවන ලෙසට උපදෙස් දිය යුතු අතර ඒ අනුව දේපළ තහනම් කරන නිළධාරියා මුදල් තැන්පත් කළ යුතු ය.

(27) නිකුත් කර ඇති ලදුපත් හා උප ලේඛනවල සඳහන් ප්‍රමාණවල යම් කිසි දෝෂයක් ඇත්නම් වහාම එය බදු තහනම් කිරීමේ නිළධාරියාට හා අංශ භාර ප්‍රධානියාට විෂය භාර ලිපිකරු විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(28) දේපළ තහනම් කිරීමේ නිළධාරීන්ට පෞද්ගලික ස්ථානවලට ඇතුල්වීමට නගරාධිපති විසින් බලය පැවරීමේ ලිපියක් නිකුත් කළ යුතු ය. පෞද්ගලික ස්ථානවලට ඇතුල්වීමට බලය පැවරිය හැක්කේ හිරු උදාවේ සිට හිරු බසින තෙක් පමණි.

(29) දේපළ තහනම් කිරීමේ නිළධාරීන් විසින් මහා නගර සභා ආඥා පනතේ 252 ඡේදය යටතේ නිකුත් කරනු ලබන විනිග්‍රහ බලපත්‍රය මත යම්කිසි චංචල දේපළ තහනමට ගන්නේ නම් එම දේපළ සම්බන්ධයෙන් විස්තරයක් එම ස්ථානයේ පදිංචිකරුට නිකුත් කළ යුතු ය.

(30) තහනමට ගන්නා ලද බඩුවල විස්තරයක් පිටපත් 03කින් සකස් කොට දේපළ තහනම් කරන නිළධාරියා එම භාණ්ඩවල අයිතිකරු හෝ පදිංචිකරු ලවා අත්සන් කරවා ගෙන එහි මුල් පිටපත දේපලයෙහි පදිංචිකරුට නිකුත් කළ යුතු අතර 2 වන පිටපත ආදායම් අංශය භාර ගණකාධිකාරී වෙත හෝ ඒ වෙනුවෙන් වැඩ බලනු ලබන නිළධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. තෙවැනි පිටපත තමා වෙත රඳවා ගත යුතු ය. මෙම විස්තරය අත්සන් කිරීම දේපළ අයිතිකරු හෝ පදිංචිකරු ප්‍රතික්ෂේප කරන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කරන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කළ බවට පිටපත් තුනේම සටහන් තැබිය යුතු ය.

(31) චංචල දේපළ තහනම් කිරීමෙන් අනතුරුව එම දේපළ වහාම නගර සභාවේ ගබඩා භාරකරු වෙත භාරදීමට කටයුතු කළ යුතු ය.

(32) දේපළ තහනම් කිරීමේ නිළධාරීන්ට ගෙවිය යුතු කොමිස් මුදල් ඔවුන් විසින් ක්ෂේත්‍රයේ දී අයකර ගන්නා ලද මුදලින් හා ඔවුන් විසින් නිකුත් කරන ලද දේපළ තහනම් කිරීමේ නිවේදන මත කාර්යාලයට ලැබෙන මුදලින් ගෙවිය හැක.

(33) දේපළ තහනම් කිරීමේ නිළධාරීන් විසින් බදු ගෙවන්නන්ගෙන් අය කරනු ලබන මුදල සඳහා ලදුපත් නිකුත් කිරීමේ දී දෙපිටම ලියවෙන කාබන් කඩදාසි භාවිතා කළ යුතු අතර නොමැකෙන පැන්සලකින් හෝ පෑනකින් ලදුපත ලිවිය යුතු ය.

(34) දේපළ තහනම් කිරීමේ නිළධාරියකු නිවාඩු යන විට එම නිවාඩු නාගරික කොමසාරිස්ගෙන් හෝ ඒ සඳහා බලය පැවරී ඇති නිළධාරියෙකුගෙන් අනුමත කරවා ගත යුතු ය. නිවාඩු යන අවස්ථාවේ නගර සභාව සතු විනිග්‍රහ බලපත්‍ර ලදුපත් පොත් සහ සභාව සතු ඔහු භාරයේ ඇති දේපළ සියල්ලක්ම විෂය භාර ලිපිකරුට භාරදිය යුතු අතර එතෙක් අයකර ඇති මුදල සඳහා 25 අතුරු ව්‍යවස්ථාව හා 26 අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතු ය.

දිළිඳුකම මත බදු කපා හැරීම :

(35) දිළිඳුකම මත බදු කපා හැරීමේ දී ඒ සම්බන්ධයෙන් ප්‍රදේශයේ ග්‍රාම සේවා නිළධාරී ප්‍රාදේශීය ලේකම් මහතාගෙන් ද ආදායම් පරීක්ෂක මහතාගෙන් ද වාර්තාවක් ලබා ගත යුතු ය. ඊට අමතරව මහජනාධාර නිළධාරී තැත්තන්ගෙන් ද දිළිඳු බව තහවුරු කරගත හැක.

(36) දිළිඳුකම මත බදු කපා හැරීමේ දී එම ස්ථානයේ අයිතිකරු සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගුනහොත් අයිතිකරු සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ වාර්තාවක් ලබාගෙන සභා තීරණයක් මත බදු කපා හැරීමට කටයුතු කළ යුතු ය.

(37) අවුරුදු 10 ක අඛණ්ඩ පදිංචි ඇති පුද්ගලයකු තම පදිංචි නිවස මත අයවිය යුතු බද්ද දිළිඳුකම මත කපා හැරීමට කටයුතු කරන්නේ නම්, එම පදිංචි කාල සීමාව ග්‍රාම සේවා නිළධාරි මහතාගෙන් හා ප්‍රාදේශිය ලේකම්ගෙන් ලබා ගන්නා ලද සහතිකයක් මත බදු කපා හැරීමට කටයුතු කළ යුතු ය.

තැනතියාව මත බදු කපා හැරීම :

(38) යම්කිසි ගොඩනැගිල්ලක් පදිංචියෙන් තොරව තිබෙන්නේ නම්, ඒ සඳහා බදු සහනයක් ඉල්ලන අවස්ථාවේ දී එම ලිපිය ආදායම් පරීක්ෂකවරුන් වෙත යොමු කොට වාර්තාවක් ලබා ගත යුතු ය. ඉන් අනතුරුව සෑම මාසයකම තැනතියාව පවතින්නේදැයි යන්න ගැන වාර්තාවක් ආදායම් පරීක්ෂක නිළධාරි විසින් ඉදිරිපත් කළ යුතු ය.

(39) ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබාදීමෙන් අනතුරුව එම තැනතියාව නොපවතින කාලයට බදු කපා හැරීමට කටයුතු කළ යුතු ය.

(40) ව්‍යාපාර ස්ථානයක් සම්බන්ධයෙන් එම ව්‍යාපාරය පවත්වාගෙන යාමක් සිදු නොකරන අවස්ථාවක එනම් ව්‍යාපාරයක් පවත්වාගෙන නොයන අවස්ථාවක දී එම ව්‍යාපාරය පවත්වාගෙන නොයන කාලසීමාව සඳහා බදු ගෙවීමට සහනයක් සලසන ලෙස ඉල්ලා සිටින්නේ නම්, එම ස්ථානය ව්‍යාපාර කටයුතු වලට අදාළ වන ද්‍රව්‍ය ගබඩා කර නොමැති නම්, හෝ වෙනත් ආකාරයකින් ආර්ථික වශයෙන් පාවිච්චියට ගන්නා බව තහවුරු නොවන්නේ නම්, එම කාල පරිච්ඡේදයට 38 දරන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වාර්තාව ලබාගෙන බදු කපා හැරීමට කටයුතු කළ යුතු ය.

(41) ව්‍යාපාර ස්ථානයක තැනතියාව නැති කාලසීමාව තුළ දී බදු ගෙවීම නිදහස් කිරීම සඳහා අයදුම් කළ යුත්තේ එම ගොඩනැගිල්ලේ අයිතිකරු විසින්මය.

## XLII වන කොටස

### *කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමග කියවිය යුතු 23 වැනි වගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන කිරිපට්ටි ස්ථානවල කළමණාකරණය විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය සහ එම ස්ථාන වල සතුන්ට හිංසා කිරීම වැලැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කිරිපට්ටි විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ කිරි පට්ටියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ කිරි පට්ටියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) එක් සත්ත්වයෙකු රඳවා තැබීමට අවම වශයෙන් වර්ග මීටර් 3 ක් බැගින් වනසේ කිරි පට්ටියේ සිටින සත්ත්වයන් රඳවා තැබීමට ප්‍රමාණවත් ගොඩනැගිලි ඉදිකර තිබිය යුතු ය.

(ආ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි බිත්තිවල උස මීටර් 1 කට වඩා උසින් යුක්ත නොවිය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් බැඳ සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතුවාත් හැර බිත්තියේ දෙපැත්ත ම සිමෙන්තියෙන් මැද තිබිය යුතු ය.

(ඇ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදිකෙරෙන කණු ශක්තිමත් දැවයෙන් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් තනා තිබිය යුතු අතර එකී කණුවල ඉහළ කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3 ක් උසින් යුක්ත විය යුතුවාත් හැර කණුවල තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(ඈ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර වහළය කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.3 ක් උසින් යුක්ත විය යුතු ය;

(ඉ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලිවල බිම සිමෙන්ති දමා තිබිය යුතු ය.

(ඊ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි මනා අලුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතු ය.

(උ) කිරි පට්ටියේ සත්ත්වයන්ට පානය කිරීම, සතුන් නෑවීමට සහ ගොඩනැගිලි සේදීමට දූෂණය නොවූ ප්‍රමාණවත් ජල පහසුකම් සපයා තිබිය යුතු ය.

(ඌ) සත්ත්වයන් නැවීමෙන් පසු බැහැර කරන ජලය, සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිලි සේදීමෙන් පසු බැහැර කරන ජලය, මුත්‍රා සහ වසුරු කොටස් උරා ගන්නා වළකට පහසුවෙන් ගලායන පරිදි සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට්වලින් තැනූ කාණු සකසා තිබිය යුතු ය.

(එ) සත්ත්වයන්ගේ වසුරු සහ ඉතිරිවන තණකොළ සහ වෙනත් කෑම වර්ග ඉවත් කිරීම සඳහා වෙනමම ස්ථානයක් ඇතිකර තිබිය යුතු අතර එකී ස්ථානය සතුන් රඳවා තබන ගොඩනැගිලිවලින් සහ කිරි කාමරයෙන් යටත් පිරිසෙයින් මීටර් 10 ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය. එසේම එකී ස්ථානය පොදු ජල මාර්ගයක හෝ ජලය ලබා ගන්නා කිසියම් ළිඳක සිට අවම වශයෙන් මීටර් 10 ක් දුරින් පිහිටුවා තිබිය යුතු ය.

(ඒ) කිරි දොවන ස්ථානය සහ තාවකාලිකව කිරි ගබඩා කරන ස්ථානය සතුන් රඳවා තබන ස්ථානයෙන් අවම වශයෙන් මීටර් 6 කට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතු ය.

(ඔ) කිරි දොවන ගොඩනැගිල්ල ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ දෙපැත්තම සිමෙන්තියෙන් මැද තිබිය යුතු ය. එහි බිත්තිවල උස අවම වශයෙන් මීටර් 1.2 ක් විය යුතු අතර බිත්තියේ ඉහළ කෙළවරේ සිට වහළය දක්වා ඉදිකෙරෙන කණු ශක්තිමත් දැවයෙන් හෝ යකඩවලින් හෝ කොන්ක්‍රීට්වලින් තනා තිබිය යුතුවාත් හැර එකී කණුවල තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(ඕ) කිරි දොවන ගොඩනැගිල්ලේ බිම සිමෙන්ති දමා තිබිය යුතු අතර බිම සහ බිත්ති සම්බන්ධවන ස්ථාන කවාකාර හැඩයට සකස් කර තිබිය යුතු ය. එසේම එකී ගොඩනැගිල්ලේ පියසි කෙළවර පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 1.8 කට ඉහළින් විය යුතු ය.

(ක) කිරි දොවන ගොඩනැගිල්ලේ මේසයක් තිබිය යුතු අතර එහි මතුපිට පිඟන් ගඩොල් හෝ පිරිද්දුම් නොමැති මල නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ වෙනත් යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් අතුරා තිබිය යුතු ය.

(ග) කිරි දොවන ස්ථානය තුළ සනීපාරක්ෂක කසළ භාජනයක් තිබිය යුතු ය.

(ච) කිරි දොවන ගොඩනැගිල්ල, කිසියම් වැසිකිළියකින්, කසළ වළකින්, පොහොර ගොඩකින් හෝ පොහොර වලකින්, විවෘත කසළ කාණුවකින් යටත් පිරිසෙයින් මීටර් 10 ක දුර ප්‍රමාණයක දුරකින් පිහිටා තිබිය යුතු ය.

(ජ) සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට යටත් පිරිසෙයින් මීටර් 20 කට නොඅඩු දුරකින් රෝගීවන සතුන් රඳවා තැබීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් තනා තිබිය යුතු අතර සත්ත්වයන් රඳවා තබන ගොඩනැගිල්ලේ නියමයන්ට අනුකූලව මේ ගොඩනැගිල්ල ද ගොඩනගා තිබිය යුතු ය.

(ට) රෝගී සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ සිට ගලායන අප ජලය අනෙක් සතුන් රඳවා තබන ගොඩනැගිල්ල දෙසට ගලා නොයන සේ කාණු නිර්මාණය වී තිබිය යුතු ය.

(ඩ) කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම් එකී යන්ත්‍ර සහ දොවාගන්නා කිරි රැස්කරන භාජන දිනපතා ජීවානුහරණය කිරීමට අවශ්‍ය උපකරණ සපයා තිබිය යුතු ය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යයි 4 වන අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති සෑම කොටසක ම අවම වශයෙන් සෑම වර්ෂකට ම එක් වරක් බැගින් තීන්ත අලේප කිරීම කළ යුතු ය.

6. නීරෝගී සතුන් සහ රෝගී සතුන් රඳවා තබාගන්නා ගොඩනැගිල්ලේ ගෙබිම සහ බිත්ති, යටත් පිරිසෙයින් සෑම දිනයකම එක් වරක් බැගින් සේදීමට සැලැස්විය යුතු ය.

7. කිරි පට්ටිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

8. (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

9. කිරි පට්ටියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් කිරි පට්ටියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම අවස්ථාවෝචිත පරිදි එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් කිරි දෙවීමේ කාර්යයන්හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟ සෝදා පිරිසිදු වී සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. සතුන් රඳවා තබන ගොඩනැගිලි සහ කිරි දොවන කාමරයේ බිම සහ මේසය මතුපිට යටත් පිරිසෙයින් දිනකට එක් වරක් බැගින් සෝදා හැරීමට සැලැස්විය යුතු ය.

11. කිරි දොවා ගැනීමට, කිරි තැන්පත් කිරීමට සහ කිරි ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා භාජන ඔප දැමූ මැටි, ගැල්වනයිස් කළ යකඩ හෝ ටින්, එනැමල් ආලේපිත යකඩ, මතුපිට සුමට කළ ඇළුමිනියම්, වීදුරු හෝ පෝසිලෙන් යන කවර හෝ වර්ගයක භාජන යොදාගත යුතු අතර එකී භාජන සතුන් රඳවා තබන ගොඩනැගිල්ලේ ගබඩා නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා සියලුම භාජන සහ කිරි දෙවීම යන්ත්‍රානුසාරයෙන් කරනු ලබන්නේ නම් එකී උපකරණ ද යටත් පිරිසෙයින් දිනකට එක් වරක් බැගින් ජීවානුහරණය කළ යුතු අතර වෙනත් භාණ්ඩ සහ උපකරණ දිනපතා පිරිසිදු කරවීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. සතුන් රඳවනු ලැබ ඇති ස්ථානයේ රැස්වන වසුරු සහ ඉතිරි වන තණකොළ කොටස් යටත් පිරිසෙයින් දිනකට එක් වරක් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී ස්ථාන දිනපතා ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා භාජන, ඒවාට නියමිත කාර්යයට හැර වෙනත් කවර හෝ කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

15. කිරි දොවා ගැනීම ආරම්භ කිරීමට පෙර -

(i) කවර හෝ කිරි දෙනකගේ බුරුල්ල පිරිසිදු ජලයෙන් සේදීම කර;
(ii) කිරි දොවන්නා සබන් හෝ සබන් දියර යොදාතම දෑත් සෝදාගෙන;
(iii) යන්ත්‍රානුසාරයෙන් කිරි දෙවීම කරනු ලබන අවසථාවක එකී උපකරණ ජීවානුහරණය කර

ඇත්තේ නම් මිස කිරි දෙවීමට ඉඩ දීම නොකළ යුතු ය.

16. කිරි පට්ටියේ ඇති කරන සෑම සතෙකු ම යටත් පිරිසෙයින් වර්ෂයකට තුන් වතාවක් පශු වෛද්‍යවරයාගේ හෝ ඔහු විසින් නම් කරනු ලබන කවර හෝ නියෝජිතයෙකුගේ අධීක්ෂණයට ලක්කර අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සහ එකී උපදෙස් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

17. කිරි පට්ටියේ කවර හෝ සතෙකුට කිසියම් රෝගයක් වැළඳී ඇති බව දැනගන්නට ලැබුණු වහාම එකී සතා සතුන් රඳවන ගොඩනැගිල්ලෙන් ඉවත්කර රෝගී සතුන් රඳවන ගොඩනැගිල්ලේ රැඳවීමට ක්‍රියාකිරීම සහ ඒ පිළිබඳව පශු වෛද්‍ය නිලධාරියා දැනුවත් කිරීමට ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

18. කිරි බුරුල්ලේ හෝ අන් තැනක ඇතිවන ක්ෂය රෝගයෙන්, තීව්‍ර ස්තන ප්‍රදාහයෙන්, කුර හා මුඛ රෝගයෙන්, අන්ත්‍රැක්ස් රෝගයෙන් හෝ කිරි බුරුල්ලේ ඇක්ටිනොමයිකෝසිස් රෝගයෙන් පෙළෙන හෝ බෲසෙල්ලෝසීස් රෝගයෙන් පෙළෙන බවට පශු වෛද්‍ය නිලධාරියා තීරණය කරන ලද යම් සතෙකුගේ කිරි විකිණීම හෝ විකිණීමට ඉඩ දීම හෝ මනුෂ්‍ය පරිභෝජනයට ඇති යම් වෙනත් සතුන්ගේ කිරිවලට එකතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ දීම කවර හෝ තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයේ ප්‍රයෝජනය සඳහා ඇති තණකොළ හා පිදුරු හැර සියලුම සත්ත්ව ආහාර මීයන්ට ඇතුල්විය නොහැකි වනසේ සුදුසු භාජනවල තබා තිබිය යුතු ය.

20. කිරි ගබඩා කර තැබීමේ සහ සකස් කිරීමේ කාර්යය හැර වෙනත් කවර හෝ කාර්යයක් සඳහා කිරි කාමරය යොදා ගැනීම හෝ යොදා ගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

21. ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කිරීමෙන් කිරි බාල කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

22. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය.
(ii) වීදුරු.
(iii) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය.
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය.
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්.
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්.
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද (ආ) ඡේදයේ (i) උපඡේදයේ සඳහන් වන ජෛවහායන අප ද්‍රව්‍ය අතරට ගැනෙන සත්ත්ව වසුරු සහ ඉතිරි වන තණකොළ කොටස් පොහොර වශයෙන් යොදා ගැනීමට එකී නියමය බාධාවක් නොවිය යුතු ය. කෙසේ වුව ද එකී අප ද්‍රව්‍ය කිරි පට්ටියෙන් බැහැරට ප්‍රවාහනය කරනු ලබන්නේ නම් ආවරණයක් සහිතව ප්‍රවාහනය කරන්නේ නම් මිස කිරි පට්ටිය පිහිටා තිබෙන පරිශ්‍රයෙන් බැහැරට ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

23. දොවා ගන්නා කිරි තැන්පත් කර තැබීමට ඒ සඳහා ම වෙන්වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිතවූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුල් විය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතු ය.

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර කිරි පට්ටියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද කිරි පට්ටියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

25. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වන සේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතු ය. එසේම එකී වැසිකිළි කිරි පට්ටියේ සතුන් රඳවා තිබෙන ගොඩනැගිලි, කිරි දොවන ස්ථානය සහ කිරි තැන්පත් කරන කාමරවල සිට අවම වශයෙන් මීටර් 15 ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය.

26. කිරි පට්ටියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18 කට අඩු දුරකින් කසළ වළක් හෝ පෝර වළක් හෝ අළු වළක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

27. කිරි පට්ටියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

28. කිසියම් කිරි පට්ටියකින් ලබා ගන්නා කිරි දූවිලි හෝ වෙනත් අප ද්‍රව්‍ය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ භාජන යොදා ගන්නේ නම් මිස ඒ කිරි බලපත්‍රලත් ස්ථානයෙන් බැහැරට ගෙනයාම නොකළ යුතු ය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

30. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍ර ලාභියෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

32. 31 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍ර ලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

33. 32 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍ර ලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

34. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් නොමතිව පළමු වන වගන්තියේ සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1000/= කට නොඉක්මවන දඬයකට ද,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2000/= කට නො ඉක්මවන දඬයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

34. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

''කිරි පට්ටි'' යන්නෙන්, කිරි ලබා ගැනීමේ හා කිරි විකිණීමේ කාර්යය ප්‍රමුඛ වශයෙන් ක්‍රියාත්මක කිරීමට එක් වර්ගයක සත්ත්වයන් හෝ වර්ග එකකට වැඩි වර්ග ගණනක සත්ත්වයන් රඳවා තබා ගන්නා ගොඩනැගිලි ද, ඒ පරිශ්‍රය ද අදහස් වන අතර එකී සත්ත්වයන් ද ඊට ඇතුළත් විය යුතු ය,

''පශු වෛද්‍ය නිලධාරිවරයා'' යන්නෙන් බදුල්ල මහා නගර සභාවේ පශු වෛද්‍ය නිලධාරියා අදහස් වන අතර, බදුල්ල මහා නගර සභාවේ පශු වෛද්‍ය නිලධාරියෙකු නොමැති යම් අවස්ථාවක බල ප්‍රදේශය ආවරණය වනසේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරනු ලැබූ පශු වෛද්‍ය නිලධාරිවරයා අදහස් විය යුතු ය,

''සත්ත්වයා'' යන්නෙන්, එළ ගවයන්, මී ගවයන්, බැටළුවන් සහ එළුවන් යන වර්ගවලට අයත් සත්ත්වයන් ද,

අදහස් වේ.

## XLIII වන කොටස

### *ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ගබඩා*

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 වන වගන්තිය සහ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 02 වැනි උප වගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම, සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථා යි.

02. ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හෝ ගබඩා පවත්වාගෙන යාමේ කර්මාන්ත හෝ ව්‍යාපාර මහා නගර සභා ආඥා පනතේ 147 වන වගන්තියේ කාර්යයන් සඳහා අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් ලෙස මෙය ප්‍රකාශ කරනු ලැබේ.

03 (අ) නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථානයක් හෝ ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථානයක් පවත්වාගෙන යෑම නොකළ යුතු ය.

(ආ) (අ) වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය යම් තැනැත්තෙකු විසින් මෙහි උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරන ලද ඉල්ලුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

04 මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස 3 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින යම් තැනැත්තෙකු වෙත බලපත්‍රයක් නිකුත් කිරීම නාගරික කොමසාරිස්වරයා විසින් නොකළ යුතු ය.

05. 03 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් 13 වන වගන්තිය යටතේ කලින් අවලංගු කළහොත් මිස එය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතු ය.

06. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ ඉල්ලා සිටින බලපත්‍රය, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්තයක් වන විට, එකී කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ -

(i) ආසන්නයේ ම පවතින යම් නේවාසික ස්ථානයක සිට අවම වශයෙන් මීටර් 30 දුරින් පිහිටා තිබිය යුතු ය.

(ii) ජනනය වන කිසියම් දූවිලි හෝ වාෂ්ප හෝ ආසන්නයේ තිබෙන නේවාසික ස්ථානවලට පැතිරීම වැළැක්වීම පිණිස ප්‍රදේශීය සෞඛ්‍ය වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(iii) සේවකයන් සඳහා ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි ඉදිකර තිබිය යුතු අතර ස්නානය සඳහා ස්ථාන ඉදිකර තිබිය යුතු ය.

(iv) අප ජලය ගලායාම පිණිස ප්‍රමාණවත් කාණු ඉදිකර තිබිය යුතු ය.

(v) විදුලි උපකරණ සවිකිරීමට සපයා ඇති උපාංගවල සහ විදුලි පරිපථවල ආරක්ෂිත තත්ත්වය තහවුරු කර තිබිය යුතු ය.

07. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ ඉල්ලා සිටින බලපත්‍රය, ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන ගබඩා කිරීමේ ස්ථානයක් වන විට, එකී ස්ථානයේ —

(i) ආසන්නයේ ම පවතින යම් නේවාසික ස්ථානයක සිට අවම වශයෙන් මීටර් 5ක් දුරින් පිහිටා තිබිය යුතු ය.
(ii) ජනනය වන කිසියම් දූවිලි හෝ වාෂ්ප හෝ ආසන්නයේ තිබෙන නේවාසික ස්ථානවලට පැතිරීම වැළැක්වීම පිණිස ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍යවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලස්වා තිබිය යුතු ය.
(iii) සේවකයන් සඳහා ප්‍රමාණවත් වැසිකිළි හා කැසිකිළි ඉදිකර තිබිය යුතු අතර ස්නානය සඳහා ස්ථාන ඉදිකර තිබිය යුතු ය.
(iv) අප ජලය ගලායාම පිණිස ප්‍රමාණවත් කාණු ඉදිකර තිබිය යුතු ය.
(v) විදුලි උපකරණ සවිකිරීමට සපයා ඇති උපාංගවල සහ විදුලි පරිපථවල ආරක්ෂිත තත්ත්වය තහවුරු කර තිබිය යුතු ය.
(vi) ගබඩා ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා පැමිණෙන වාහන නවතා තැබීමට ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය.

08. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ තැනැත්තෙකු විසින් —

(i) තම පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය හෝ අපවිත්‍ර ජලය හෝ වෙනත් යම් දියරයක් පොදු ජල මාර්ගයකට ගලායාමට හෝ එකතුවීමට, සැලැස්වීම හෝ එසේ වීමට ඉඩහැරීම නොකළ යුතු ය.

(ii) තම පරිශ්‍රය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(අ) ජෛවභායන අපද්‍රව්‍ය,
(ආ) වීදුරු,
(ඇ) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය,
(ඈ) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(ඊ) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේදී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු ය,

(iii) ඉහත (ii) ඡේදයේ විධිවිධාන අනුව වර්ග කළ අපද්‍රව්‍ය කොටස් සභාවේ අපද්‍රව්‍ය රැස්කිරීමේ වාහනයකට හෝ සභාවේ අවසරය ඇතිව අපද්‍රව්‍ය රැස්කිරීමේ කාර්යයේ නියුක්ත තැනැත්තෙකුට අපද්‍රව්‍ය රැස්කිරීමේ කාල සටහනට අනුව වෙන් වෙන්ව භාරදීමට සැලැස්විය යුතු ය.

09. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නිර්දේශිත ආකාරයට තම පරිශ්‍රය තුළ ජනනය වන —

(i) අපවිත්‍ර ජලය පවිත්‍රකරණයට ලක්කළ යුතු ය,
(ii) අපවිත්‍ර ජලය නොවන වෙනත් යම් දියර වර්ග බැහැර කිරීම කළ යුතු ය.

10. කර්මාන්තය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ ප්‍රවාහනය කිරීම පරිසරයට නිරාවරණය නොවන පරිදි සිදුකළ යුතු අතර කිසියම් පොදු ස්ථානයක ඉදිකිරීමක් සඳහා යොදා ගැනීමට ඒවා තබන්නේ නම් මිස කවර හෝ පොදු ස්ථානයක ගබඩාකර තැබීම හෝ තැන්පත්කර තැබීම නොකළ යුතු ය.

11. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් සෑම ස්ථානයක ම —

(i) නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් යොදා තිබිය යුතු ය,
(ii) ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නියම කරනු ලබන ආකාරයේ ප්‍රථමාධාර සහ ප්‍රතිකාර වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය,
(iii) කර්මාන්ත ස්ථානයෙහි නියුක්ත සේවකයන්ට ආහාර ගැනීමට හා ඇඳුම් පැළඳුම් මාරුකර ගැනීමට සුදුසු ස්ථානයක් ඇතිකර තිබිය යුතු අතර නිෂ්පාදන ක්‍රියාවලියෙහි නියුක්ත වන අවස්ථාවේ දී මුඛ ආවරණ, අත් ආවරණ සහ අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබිය යුතු ය.

12. (1) නාගරික කොමසාරිස්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා බලයලත් යම් නිළධරයෙකු හෝ නිළධරයන් විසින් බලපත්‍රලත් ස්ථානයේ කර්මාන්තය කරගෙන යනු ලබන ඕනෑම වේලාවකදී, එකී ස්ථානයකට ඇතුල්වීම ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානයන් අනුව ක්‍රියාකරන්නේ ද යන්න පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) ඉහත (1) වන ඡේදයේ සඳහන් කිසියම් තැනැත්තෙකු විසින් සිදුකරනු ලබන පරීක්ෂා කිරීම් සඳහා අවශ්‍ය සහාය ලබාදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර එකී පරීක්ෂා කිරීම් වැළැක්වීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

13. (1) 12 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් පරීක්ෂා කිරීමකදී, එකී බලපත්‍රලත් ස්ථානය මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට පටහැනි බව අනාවරණය වුවහොත් එකී පටහැනි තත්ත්වයන් නිවැරදි කරන ලෙස එකී පරීක්ෂාව කරනු ලැබූ තැනැත්තා විසින් බලපත්‍රලාභියා වෙත ලිඛිතව දැන්වීමක් කළ යුතු ය.

(2) ඉහත (1) වන ඡේදය යටතේ දැන්වීමක් ලද සෑම තැනැත්තෙකු විසින් ම, එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් වන දිනට පෙර එහි සඳහන් නිවැරදි කිරීම් සම්පූර්ණ කිරීමට ක්‍රියාකළ යුතු ය.

(3) ඉහත (2) වන ඡේදයේ සඳහන් ආකාරයෙන් ක්‍රියාකිරීමට බලපත්‍රලාභියා අපොහොසත් වන අවස්ථාවක, එකී බලපත්‍රලාභියා වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

14. (1) 13 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන් අනතුරුව, එකී කර්මාන්තය තවදුරටත් පවත්වාගෙන යාම සඳහා ස්ථානය පාවිච්චි කිරීමට නැවත බලපත්‍රයක් ඉල්ලා සිටීමට එකී අවලංගු කළ බලපත්‍රය දරන ලද තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

(2) ඉහත (1) ඡේදයේ සඳහන් ආකාරයට අලුත් බලපත්‍රයක් ඉල්ලා සිටින අවස්ථාවක, 03 වන, 04 වන සහ 05 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

15. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි ;

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= ක් නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= ක් නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල්දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකටද, යටත් වන්නේ ය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

''ඉදිකිරීම් ද්‍රව්‍ය'' යන්නෙන්, කළුගල් විවිධ ප්‍රමාණයේ සමාහාරක, කළුගල් කුඩු, වැලි, සිමෙන්ති, යකඩ වැනි ඉදිකිරීම් සඳහා යොදා ගන්නා සියළුම ද්‍රව්‍ය අදහස් වේ.

## XLIV වන කොටස

### *පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති ආශ්‍රිතව මහජනතාව ගැවසෙන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

252 වන අධිකාරය වන මහා නගර සභාවේ ආඥාපනතේ 267 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 28 (ආ) උපවගන්තිය පරිදි බදුල්ල මහා නගර සභාව විසින් පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති ආශ්‍රිතව මහජනතාව ගැවසෙන ස්ථාන පිළිබඳ නියමයන් මෙයින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති ආශ්‍රිතව මහජනතාව ගැවසෙන ස්ථාන පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථායි.

02. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්නම් මිස, කවර හෝ තැනැත්තකු හෝ තැනැත්තන් විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති ආශ්‍රිතව මහජනතාව ගැවසෙන ස්ථාන පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාම නිත්‍යානුකූල නොවන්නේය.

03. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථා මගින් නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍ර නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් තිස්එක් වැනි (31) දිනෙන් අවසන් විය යුතු ය.

04. බලපත්‍රලත් ස්ථානය මෙහි පහත සඳහන් කොන්දේසිවලට හෝ නාගරික සංවර්ධන අධිකාරියේ අදාල නියෝගවලට, නියමයන්ට අදාලව ඉදිකරණ ලද ගොඩනැගිල්ලක් වන්නේ නම් මිස, කිසිම තැනැත්තකුට පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති පැවැත්වීම සිදුනොකළ යුතු ය.

(අ) අදාළ ගොඩනැගිල්ල සඳහා අනුමත බිම් සැලැස්ම, ගොඩනැගිලි සැලැස්ම, අනුකූලතා සහතිකය ලබා තිබිය යුතු ය.

(ආ) අදාල ස්ථානය ශක්තිමත්ව ඉදිකර තිබිය යුතු අතර මනා අලුත්වැඩියා තත්වයෙන් තිබිය යුතු ය.

(ඇ) ස්ථානයේ සෑම පංති කාමරයකම බිත්ති මීටර් 03කට නොඅඩු උසකින් යුක්ත විය යුතුඅතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගඩොලින්, කබොක් ගලින් තනා තිබිය යුතු අතර දෙපැත්ත බිත්ති කපරාරු කර ඔප දමා තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(ඈ) සෑම පංති කාමරයකටම හොඳින් වාතාශ්‍රය සහ ආලෝකය තිබිය යුතු අතර විවෘත කළ හැකි ජනෙල් සහ දැල් සහිත ආවරන බිත්තිවලින් සකස් කර තිබිය යුතු අතර වායු සමනය කර තිබීම නීතිමය අවශ්‍යතාවක් නොවන්නේ ය.

(ඉ) වහල යම්කිසි ස්ථිර ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු අතර සෙවිලි තහඩු වලින් ආවරණය කර ඇත්නම් සිවිලිමක් තනා තිබිය යුතු ය. තව ද, ඇස්බැස්ටෝස් සහ උළු සෙවිලිකර තිබිය හැකිය. සිවිලිම සවිකරන්නේ නම් පොළෝ මට්ටමින් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(ඊ) සෑම පංති කාමරයකම බිම සිමෙන්තිවලින් කපරාරුකර ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ තිබිය යුතු ය.

(උ) පියසි කෙලෙවරවල් පොළෝ මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.2 කට නොඅඩු උසකින් පිහිටා තිබිය යුතු අතර අගුපියස අවම වශයෙන් මීටර් 01ක් වත් තිබිය යුතු ය.

(ඌ) ස්ථානය මහල් කිහිපයක් ඇති විට බිම් මහලේ වැඩ අවසන්කර තිබිය යුතු ය.

05. ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා ප්‍රමාණවත් විශාලත්වයකින් යුතු වෙන් කරන ලද කසළ බඳුන් තිබිය යුතු අතර සියළු භාජන සියළු සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතු අතර කසළ බඳුන් තුළ මැස්සන් හෝ කෘමි සතුන්ට ඇතුල්වීමට නොහැකි ආකාරයෙන් වසා තිබිය යුතු ය.

06. ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 07 වන වගන්තියෙහි නියමයන් අනුව ක්‍රියාකළ හැකි ආකාරයේ විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

07. බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසල අපහරණය කිරීම සඳහා පහත සඳහන් නියමයන් අනුගමනය කර තිබිය යුතු ය.

(අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියළුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය ;

i. ජෛවභාගනය අපද්‍රව්‍ය,
ii. වීදුරු,
iii. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
iv. පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
v. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය කොටස්,
vi. නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන සහ අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
vii. අන්තරායක අපද්‍රව්‍ය, යන වර්ගය යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට වෙන් කර ඇති භාජනවලට හෝ ටැංකිවලට දැමීම බලපත්‍රලාභියාගේ වගකීම වන්නේ ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමණාකරන වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස කොමසාරිස්වරයා විසින් නියම කරන ආකාරයෙන් අවසන් බැහැරලීම සිදුකළ යුතු ය.

08. ස්ථානයේ සුදුසු පරිදි ජලසම්පාදන ක්‍රමයන් පිළියෙල කර තිබිය යුතු ය.

09. පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති පවත්වන ස්ථානවල වැසිකිළි කැසිකිළි පහසුකම් සඳහා පහත සඳහන් ප්‍රතිපාදන අනුගමනය කර තිබිය යුතු ය.

(අ) ස්ථානවල ඇති සෑම වැසිකිළියක සහ කැසිකිළියක බිත්ති ගඩොලින්, සිමෙන්ති ගඩොලින්, කබොක් ගලින්, මල නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ තනා තිබිය යුතු අතර දෙපැත්ත බිත්ති කපරාරු කර ඔප දමා තීන්ත ආලේපකර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ආ) සෑම ස්ථානයකම ළමයින්ගේ අවශ්‍යතා වෙනුවෙන් වැසිකිළි සහ කැසිකිළි පහසුකම් ස්ත්‍රී පුරුෂ ලෙස වෙන් වෙන් වශයෙන් තිබිය යුතු ය. එක් පාර්ශවයකට අයත් වැසිකිළියක් අනෙක් පාර්ශවය විසින් භාවිතා කිරීමට ඉඩ ලබානොදිය යුතු ය.

(ඇ) ස්ථානවල ඇති සෑම වැසිකිළියක් සහ කැසිකිළියක් සඳහාම ප්‍රමාණවත් පරිදි ජල පහසුකම් තිබිය යුතු අතර ළමයින් 50කට එක් වැසිකිළියක් බැගින් තනා තිබිය යුතු අතර පිරිමි සහ ගැහැණු ළමයින් සිටින ස්ථානවල 50කට වැසිකිළි දෙකක් බැගින් තනා තිබිය යුතු ය.

10. ස්ථානයේ ලීයෙන් හෝ යකඩයෙන් හෝ වෙනත් ලෝහ වර්ගයෙන් හෝ තනා ඇති සියළු කොටස් පින්තාරුකර හෝ තීන්ත ආලේප කර තිබිය යුතු ය.

11. ස්ථානයේ ඇති අඩි 20X20 පංති කාමරයක ළමයින් 40 දෙදෙනකු සිටිය යුතු අතර එක් ළමයෙකු වෙනුවෙන් අඩි 1.5X1.5 ක බිමෙහි ඉඩ ප්‍රමාණයක් අවම වශයෙන් තිබිය යුතු ය.

12. එක් ළමයෙකු වෙනුවෙන් අඩි 1.5X2 ක ඩෙස් එකක ඉඩ ප්‍රමාණයක් අවම වශයෙන් තිබිය යුතු ය.

13. සෑම ස්ථානයකම පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය :

(i) හදිසි අවස්ථාවක දී ප්‍රතිකාර කිරීම සඳහා ප්‍රථමාධාර පහසුකම් තිබිය යුතු ය.

(ii) ළමයින්ට කෑම සඳහා ස්ථානයක් වෙන්කර තිබිය යුතු අතර භෝජනාගාර පහසුකම් සපයා තිබිය හැකිය.

(iii) ළමයින් අපචාර සඳහා යොදවා ගැනීමට ඇති ඉඩකඩ අහුරා තිබිය යුතු ය.

(iv) ළමයින්ගේ විනය ආරක්‍ෂාව සඳහා විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(v) සෑම ළමයකුගේ විස්තර පළමුවන උපලේඛනයට සාරානුකූලව අයදුම්පත්‍රයක් මගින් තොරතුරු ලබා ගත යුතුය.

(vi) ඉහත 13/(v) අනුව ලබා ගන්නා තොරතුරු පදනම් කර ගනිමින් දෙවන උපලේඛනයට සාරානුකූලව නාම ලේඛනයක් පවත්වාගත යුතුය.

14. සෑම ස්ථානයකට සහභාගීවන ගුරුවරයකුට සහ ළමයකුට අදාල වාහන ප්‍රසිද්ධ ස්ථානයක, පාරක, වීථියක නතර කර තැබීම සිදුනොකළ යුතු අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් එම ආයතනය විසින් සම්පූර්ණ කර තිබිය යුතු ය.

15. ළමයින් 40 කට වැඩියෙන් පවත්වාගෙන යනු ලබන පංති වෙනුවෙන් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කළ යුතු අතර, බංකු සවිකිරීමේ දී සෑම ළමයකුටම ඉතා පැහැදිලිව ශ්‍රවනය වන ලෙසට සකස් කර තිබිය යුතු ය.

16. ළමයින් 80 කට වැඩියෙන් පවත්වාගෙන යනු ලබන පංති වෙනුවෙන් බංකු කිහිපයක් එනම් ළමයින් 20 කට එකක් වන ලෙස සවිකර යුතු අතර සෑම ළමයකුටම ඉතා පැහැදිලිව ශ්‍රවනය වන ලෙසට සකස්කර තිබිය යුතු ය.

17. ළමයින්ට ඉතා පැහැදිලිව දෘෂ්‍යවන ලෙසට කළුලෑලි වයිට් බෝඩ් භාවිතා කිරීම සහ බහු මාධ්‍ය යන්ත්‍ර උපයෝගීකර ගනිමින් කරනු ලබන ඉදිරිපත් කිරීම ඉතා පැහැදිලිව දෘෂ්‍යවන ලෙසට හා ශ්‍රවනය වන ලෙසට සකස්කර තිබිය යුතු ය.

18. සෑම ස්ථානයකම හිමිකරු විසින් බදුල්ල මහා නගර සභාවේ මහසභාව විසින් විටින් විට සංශෝධනයකර වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රයේ පළවීමෙන් පසු ගාස්තු ගෙවිය යුතු ය.

(i) උපකාරක පංතියක ළමයින් 40 දෙදෙනකු සිටින එක් පංතියක් වෙනුවෙන් මාසිකව රුපියල් 100.00 බැගින්ද, ඊට වැඩි ළමයින් 40ක් වෙනුවෙන් අමතරව රුපියල් 25.00 ක් වන ලෙස ගෙවිය යුතු ය.
(ii) ජාත්‍යන්තර පාසලක එක් ශ්‍රේණියක් සඳහා මාසිකව රුපියල් 200.00ක මුදලක් ගෙවිය යුතු ය.
(iii) පෞද්ගලික පාසලක එක් ශ්‍රේණියක් සඳහා මාසිකව රුපියල් 150.00ක මුදලක් ගෙවිය යුතු ය.

19. නාගරික කොමසාරිස් විසින් හෝ තත් කාර්යය සඳහා නාගරික කොමසාරිස් විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මඟින් බලය දෙන ලද සභාවේ බලය පවරා ඇති සභාවේ කවර හෝ නිළධාරියකු විසින් ඉර උදාවත්, ඉර බැසීමත් අතර කවර හෝ යුත්ති සහගත වේලාවක දී බලපත්‍රලත් ස්ථානයකට ඇතුළුවීමත් එම ස්ථානය පරීක්‍ෂා කිරීමත් නීත්‍යානුකූල වන අතර ඒ සඳහා සෑම බලපත්‍රධාරියකුම අවසරය ලබාදිය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානය, බලපත්‍රයේ හෝ යම් අතුරු ව්‍යවස්ථාවල නියමිත කොන්දේසිවලට අනුකූලව පැවැතීම අවශ්‍ය නොවුවහොත් බලපත්‍රලාභියා වෙත බලපානු ලබන දැන්වීමක් මගින් එම ස්ථානය මේ කොන්දේසිවලට අනුකූල තත්වයකට ගෙන ඒම සඳහා එම දැන්වීමේ නිශ්චිතව සඳහන් පියවරවල් ගන්නා ලෙස නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍රලාභියාට නියම කළ හැකිය.

21. යම් හේතුවක් නිසා 05 වන වගන්තිය යටතේ වූ දැන්වීමක්, සඳහන් නිවේදනයක් බලපත්‍රධාරියා වෙත පෞද්ගලිකව භාර කරවිය නොහැකි වුවහොත් මෙම නිවේදනය/දැන්වීම ඔහු අන්තිමට පදිංචිව සිටි ස්ථානය දන්නා ස්ථානයෙහි තබා ඒම හෝ බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන කිසියම් දෙයක නැතහොත් කිසියම් ප්‍රකට තැනක අලවා තැබීම හෝ එය ඔහුට විධි වූ පරිදි බාරදීමක් ලෙස සැලකිය යුතු ය.

22. බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබූ යම් දැන්වීමක සඳහන් කරනු ලැබිය හැකි කාලය ඇතුලත හෝ එවැනි කාලයක් සඳහන් කර නැත්නම්, දැන්වීම භාර දීමෙන් දින හතක් (07) ඇතුළත එම දැන්වීමේ නියමයන් අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියා විසින් පැහැර හරිනු ලැබුවහොත් නාගරික කොමසාරිස් විසින් බලපත්‍රය අත්හිටුවීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කළ හැකිය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් නොමැතිව පළමු වන වගන්තියේ සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන්වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නො ඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

24. අර්ථ නිරූපනය

1. ''ස්ථානය'' යන්නෙන් අදහස් වන්නේ බදුල්ල මහා නගර බල ප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, උපකාරක පංති පවත්වන ස්ථානයකි.

## XLV වන කොටස

### *ගබඩා පිළිබඳ*

252 වන අධිකාරය වන මහා නගර සභාවේ ආඥා පනතේ 267 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 272 වන වගන්තිය පරිදි මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව බදුල්ල මහා නගර සභාව විසින් ගබඩා රීති පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙයින් පනවනු ලැබේ.

1 බදුල්ල මහා නගර සභාවට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගත් පසු එම ද්‍රව්‍ය තැන්පත් කර තැබීම සඳහා ගබඩාවක් හෝ ගබඩා තිබිය යුතු ය.

2 එම ගබඩා හෝ ගබඩාව ස්ථිර ද්‍රව්‍යයන්ගෙන් සෑදූ ශක්තිමත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලිවල ස්ථාපිත කළ යුතු ය. ගබඩා පරිශ්‍රය තාප්පයකින් හෝ කම්බි ගැසීමෙන් අනවසර පුද්ගලයන්ට ඇතුළුවීමට නොහැකි අන්දමක ආරක්ෂිත ක්‍රමයක් ඇති කර තිබිය යුතු ය.

4 ගබඩාවට ඇතුල්වීම සඳහා එක් දොරක් පමණක් තිබිය යුතු අතර විශාල පරිමාණයේ භාණ්ඩ එය තුලට ගෙන යාමට හැකි වන අයුරින් එම දොර සකස් කර තිබිය යුතු ය.

5 ගබඩාව භාරව ගබඩා භාරකරුවෙකු හෝ භාරකරුවන් සහකරුවන් හා අවශ්‍ය ප්‍රමාණයට සේවකයින් පත්කර තිබිය යුතු ය. මෙම අය හැරුණු විට ගබඩාවේ අභ්‍යන්තරයට නාගරික කොමසාරිස් හෝ ගබඩා කටයුතු අධීක්ෂණය කරනු ලබන ගණකාධිකාරිගේ අවසරය (ගබඩා භාරකරුගේ එකඟත්වය මත) නොමැතිව කිසිම බාහිර පුද්ගලයකු ඇතුළු කර නොගත යුතුය.

6 ගබඩාව කොටස් දෙකකින් සමන්විත විය යුතු අතර ප්‍රධාන කොටසේ සභාවට භාරගත් ද්‍රව්‍ය තැන්පත් කිරීමටද,දෙවන කොටසේ සැපයුම්කරුවන් විසින් සපයනු ලබන එහෙත් පරීක්ෂාකර තත්ත්ව සහතිකය දී නොමැති භාණ්ඩ තැන්පත් කිරීමටත් උපයෝගී කර ගත යුතු ය.

7 සැපයුම්කරුවන් විසින් සපයනු ලබන භාණ්ඩ සඳහා තත්ත්ව සහතිකයක් නොමැතිව අංක 21 දරන රීතියේ සඳහන් අන්දමට ගබඩාවට භාණ්ඩ ලැබීමේ පත්‍රිකාවක් නොලියා එම භාණ්ඩ ප්‍රධාන ගබඩාවේ තැන්පත් නොකළ යුතු ය.

8 ගබඩා භාරකරු ගබඩාව හා ඒ අවට පිරිසිදුව තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

9 ගබඩා භාණ්ඩ ඉක්මනින්ම සොයා ගැනීමට හැකි වන ආකාරයට ක්‍රමානුකූලව තැන්පත් කිරීමට වගබලා ගත යුතු ය.

10 ගබඩාවේ ආරක්ෂාව සහතික කිරීම සඳහා යෝජනා අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම ගබඩා භාරකරුගේ වගකීම විය යුතු ය.

11 ගබඩා දොරෙහි අගුළු දැමීම සඳහා යතුරු හා අනු යතුරක් සහිත අගුලක් සවිකර තිබිය යුතු අතර අනු යතුරු නාගරික කොමසාරිස් වෙත භාර දිය යුතු අතර නාගරික කොමසාරිස් විසින් එම අනු යතුර කවරයක බහා මුද්‍රා තබා තම සේප්පුවේ තැන්පත් කළ යුතු ය. අංක 13 දරන රීතියේ සඳහන් අවස්ථාවක දී හැර මෙම අනු යතුර භාවිතා නොකල යුතු ය.

12 (i) ගබඩා භාරකරු නිවාඩු යන අවස්ථාවක දී ඔහු විසින් විශ්වාසය තැබිය හැකි සමාන්තර ශ්‍රේණියක සිටින නගර සභාවේ නිළධාරියෙකු තම රාජකාරි ආවරණය කිරීමට නම් කළ යුතු ය. එහෙත්, සහායකයින් පත්කර ඇත්නම් එම සහායකයින් අතුරෙන් විශ්වාස කටයුතු සහායකයෙකුට යතුර භාර දී නිවාඩු යා යුතු ය.

(ii) කෙසේ වුවද නිවාඩු යන අවස්ථාවක දී ඔහු වෙනුවෙන් රාජකාරි ඉටු කිරීම සඳහා ඔහුට විශ්වාසවන්ත සහායකයෙකු කලින් ලිඛිතව නම් කර තිබිය යුතු ය.

13 කුමන හේතුවක් මත හෝ අංක 12 දරන රීතිය අනුව කටයුතු නොකර ගබඩා භාරකරු යතුර භාර නොදී නිවාඩු ගියහොත් අත්‍යාවශ්‍ය හා හදිසි කටයුත්තක් සඳහා භාණ්ඩ අවශ්‍ය වන්නේ නම්, නාගරික කොමසාරිස් විසින් ගබඩා කටයුතු අධීක්ෂණය කරනු ගණකාධිකාරී හා වෙනත් මාණ්ඩලික නිළධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත්කර තමා වෙත ඇති ගබඩාවේ අනු යතුර එම මණ්ඩලයට භාර දී ගබඩාව විවෘත කර අවශ්‍ය ද්‍රව්‍ය නිකුත් කරවීමට කටයුතු කළ හැකිය.ගබඩා භාරකරු නැවත රාජකාරියට වාර්තා කළ විගස මෙලෙස නිකුත් කරනු ලැබූ ද්‍රව්‍ය සඳහා අදාළ සටහන් අදාළ ලිපි ලේඛනවල සටහන් කිරීම ගබඩා භාරකරුගේ වගකීම විය යුතු ය.

14 මහා නගර සභාවේ සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට උපයෝගී කරගනු ලබන ද්‍රව්‍ය සාධාරණ තොගයක් ගබඩාවෙහි තබා ගැනීමට අවශ්‍ය සෑම උත්සාහයක්ම ගබඩා භාරකරු විසින් දැරිය යුතු අතර බින් කාඩ් පත්‍රයෙහි සඳහන් උපරිම තොග මට්ටම ඉක්ම නොයාමට ද වග බලා ගත යුතු ය.

15 ගබඩා ද්‍රව්‍ය මිළ දී ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී -

(1) යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා නම්,එම ව්‍යාපෘතිය භාරව කටයුතු කරන මාණ්ඩලික නිළධාරියා විසින් මෙහි දැක්වෙන ගංපඃ 1 දරන ආකෘති පත්‍ර විධිමත්ව සකස් කර ගබඩා භාරකරු මගින් සැපයුම් කටයුතු භාරව ක්‍රියාකරන නිළධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය. එහෙත් මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ලේඛනයේ හෝ පරිපූරක අයවැය ලේඛණයක මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බවටත්, අදාළ ඇස්තමේන්තු බලධාරීන් විසින් අනුමත කර ඇති බවටත්, ව්‍යාපෘතිය භාරව කටයුතු කරන නිළධාරියා විසින් වාර්තා කළ යුතු ය.

(2) එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගබඩා භාරකරු විසින් ග.ප. 1 නිසි පරිදි සකස් කොට සැපයුම් භාර නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

16 සැපයුම් භාර නිලධාරියා විසින් ගඃපඃ 1 පත්‍රිකාව ලැබීමෙන් පසු අනුමත මිළ ගණන් ඇත්නම් මෙහි සටහන් වන ගඃපඃ 2 ආකෘති පත්‍රය මගින් ඇනවුමක් පිළිගත් සැපයුම්කරු වෙත නිකුත් කළ යුතු ය. අනුමත මිළ ගණන් නැත්නම් මහා නගර සභා ආඥාපනතේ 229 දරන වගන්තිය අනුව කටයුතු කොට සැපයුම්කරුවකු තෝරා ඔහු වෙත ගඃ පඃ 2 දරන ආකෘති පත්‍රයේ ඇනවුමක් නිකුත් කළ යුතු ය. එහෙත් රු.1,500ට නොවැඩි වටිනාකමකින් යුක්ත වන ද්‍රව්‍යයක් ලබා ගැනීමේ දී අනුගමනය කළ යුත්තේ මහා නගර සභා ආඥාපනතේ අංක 227 දරන වගන්තියේ දැක්වෙන විධිවිධානයන්ය.

17 වටිනාකම රු. 15,000 ඉක්මවන වටිනාකමකින් යුත් ද්‍රව්‍ය මිළ දී ගැනීමේ දී ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙහි දැක්වෙන විධිවිධානයන් හෝ සභාව විසින් ගනු ලබන තීරණ අනුගමනය කළ යුතු ය.

18 ගඃපඃ 2 පත්‍රිකාව පිටපත් 4කින් සමන්විය විය යුතු අතර ඉන් එක් පිටපතක් සැපයුම්කරු වෙත ද දෙවන පිටපත ගබඩා භාරකරු වෙත ද යැවිය යුතු අතර තුන්වැනි පිටපත ගෙවීම් කරන විට වවුචරයට යා කිරීමට තබාගත යුතු ය. හතර වන පිටපත පාලන පිටපත වශයෙන් තබා ගත යුතු ය.

19 සැපයුම්කරු විසින් තමා වෙත ලැබුණු පිටපත අනුව.භාණ්ඩ ගබඩා භාරකරු වෙත සැපයිය යුතු ය.

20 සැපයුම්කරු විසින් සපයනු ලබන භාණ්ඩ ගබඩාවේ පළමුවන කොටසෙහි තැන්පත් කර පරීක්ෂාකර තත්ත්ව වාර්තාව ලබාදෙන ලෙස එම භාණ්ඩ පාවිච්චි කරනු ලබන හෝ ඒ වෙනුවෙන් පත්කර ඇති තාක්‍ෂණික කමිටුවේ තාක්‍ෂණික දැනුම ඇති වගකිව යුතු නිලධාරියෙකුගෙන් ගබඩා භාරකරු විසින් ඉල්ලා සිටිය යුතු ය. එවිට එම නිලධාරියා හෝ කමිටුව එම භාණ්ඩ පරීක්‍ෂාකර විධිමත් තත්ත්ව වාර්තාවක් ගබඩා භාරකරුට නිකුත් කළ යුතු ය. සවිස්තර තත්ත්ව වාර්තාවක් අවශ්‍ය වන භාණ්ඩ (උදා :- විදුලි ජනක යන්ත්‍රයක් ජල පොම්පයක්) සෑම අතින්ම සුදුසු බවට වාර්තාවක් සැපයිය යුතු ය.

21 තත්ත්ව වාර්තාව ලැබීමෙන් පසු සතුටුදායක බවට නිර්දේශ කර ඇති භාණ්ඩ සඳහා මෙම රීතිවලට යා කර ඇති ගඃපඃ 3 දරන ආකෘති පත්‍රය පිටපත් හතරකින් සකස් කර එයින් මුල් පිටපත සැපයුම්කරු වෙත නිකුත් කර දෙවැනි හා තෙවැනි පිටපත් සැපයුම් විෂය භාරව කටයුතු කරන ලිපිකරු වෙත යවා හතරවන පිටපත උපයෝගී කරගෙන එම ද්‍රව්‍ය ප්‍රමාණයන් අදාල බින් කාඩ්පතේ හෝ බින් කාඩ්පත්වල ලැබීම් තීරුවේ සටහන් කළ යුතු ය. බින් කාඩ්පත මෙහි දක්වා ඇති ග.ප 4 දරන ආකෘති පත්‍රයට අනුරූපි විය යුතු ය.

22 සැපයුම් කටයුතු භාර ලිපිකරු විසින් තමන් වෙත ලැබී ඇති ගඃපඃ 3 නේ පිටපත් දෙකෙහිම තමා වෙත ඇති අදාළ භාණ්ඩ සඳහා වන මිළ ගණන් අනුව අදාළ භාණ්ඩවල මිළ සටහන් කර තොග පොත් නඩත්තු කරනු ලබන ලිපිකරු වෙත යැවිය යුතු ය.

23 ගඃපඃ 3 තමා වෙත ලැබුණු පසු ගබඩා තොග පොත් නඩත්තු කරන ලිපිකරු විසින් එහි සටහන්ව ඇති ද්‍රව්‍ය ප්‍රමාණයන් මිළ තොග පොතේ හෝ තොග පොත් වල අදාළ පිටුවල සටහන් කර ගඃපඃ 3 පිටපත්වල තොග පොතේ පිටු අංක ගබඩා ද්‍රව්‍ය සටහන් කර ඇති සටහන් ඉදිරියෙන් සටහන් කර එක් පිටපතක් ගබඩා ද්‍රව්‍ය සැපයුම් භාරව සිටින ලිපිකරු වෙත යැවිය යුතු ය. ගබඩා තොග පොත මෙහි ගඃපඃ 5 වශයෙන් දක්වා ඇති ආකෘති පත්‍රයට අනුරූපි විය යුතු ය.

24 ගඃපඃ 3 නේ පිටපත ලැබුණු පසු ගබඩා සැපයුම් ලිපිකරු විසින් වවුචර්පතක් සකස් කර තමා වෙත ඇති ගඃපඃ 2 පිටපතක් සැපයුම්කරු විසින් එවන ලද ඉන්වොයිසියක් අමුණා ගෙවීම් කිරීම සඳහා ගිණුම් අංශයට ඉදිරිපත් කළ යුතු ය. ගබඩා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීමේ දී ගබඩා ණය හිමි ගිණුමෙන් ගෙවීම් කළ යුතු අතර කුමන හේතුවක් මත හෝ වැය ශීර්ෂයෙන් ගෙවීම් නොකළ යුතු ය. පොත් තබන නිළධාරි විසින් සෑම මාසයක් අවසානයේ දී ගබඩා ණය හිමි ගිණුමෙන් කරන ලද ගෙවීම් සියල්ල එකතු කර ගබඩා ගිණුම හර කිරීමෙන් ගබඩා ණය හිමි ගිණුම බැර කරමින් ජර්නල් සටහන් පිළියෙල කර එය ප්‍රධාන ලෙජරයේ අදාළ ගිණුම්වල සටහන් කළ යුතු ය.

25 සපයා ඇති භාණ්ඩ පරීක්‍ෂා කිරීමේ දී ප්‍රතික්ෂේප කරනු ලබන ද්‍රව්‍ය ආපසු රැගෙන යාමට දැන්වීම සඳහා ගබඩා සැපයුම් අධීක්‍ෂණය කරන ගණකාධිකාරි වෙත ගබඩා භාරකරු විසින් දැන්විය යුතු ය.

26 ගබඩාවට භාණ්ඩ සැපයීම සඳහා ගඃපඃ 2 අනුව ඇණවුම් ලබන සැපයුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයන්ට ද ප්‍රතික්ෂේප කර ඇති භාණ්ඩ ආපසු රැගෙන යාමට පැමිණෙන සැපයුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයන්ට ද පස්වන රීතියේ සඳහන්ව ඇති විධිවිධානයන් අදාළ නොවිය යුතු ය.

27 ගබඩාවට ලැබී ඇති භාණ්ඩ මහා නගර සභාවේ සේවාවන් සඳහා ලබා ගැනීමේ දී යාකර ඇති ගඃපඃ 6 දරන ආකෘති පත්‍රයට අනුරූපිව සකස් කරන ලද භාණ්ඩ නිකුත් කිරීමේ පත්‍රිකාවක් පිටපත් 4කින් යුක්තව සකස් කර, ගබඩා භාරකරු වෙත එයින් පිටපත් 3ක් භාර දී භාණ්ඩ ලබා ගත යුතු ය.

28 ගබඩා තොග පොත් ලිපිකරු මෙම ගඃපඃ 6 පිටපත් 3 අනුව එහි සඳහන් භාණ්ඩ නිකුත් කර බින් කාඩ්පත් වල නිකුත් කිරීමේ කොටසෙහි සටහන් කළ යුතු අතර එම සටහන් සනාථ කිරීම සඳහා ගඃපඃ 6 එක් පිටපතක් තමා වෙත රඳවාගෙන ඉතිරි පිටපත් දෙක ගබඩා තොග පොත් භාර ලිපිකරු වෙත යැවිය යුතු ය.

29 ගබඩා තොග පොත් ලිපිකරු මෙම ගඃපඃ 6 පිටපත් දෙකෙහි සඳහන් ද්‍රව්‍යවල මිළ සටහන් කර එක් පිටපතක් තමා වෙත තබාගෙන ඉතිරි පිටපත කාර්ය සාදන සටහන (ජොබ් ෂීට්) සකස් කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යැවිය යුතු ය. සෑම මාසයක්

අවසානයේදී තමා වෙත ඇති ගංපඃ 6 පත්‍රිකාවේ පිටපත් සියල්ල වැය ශීර්ෂ අනුව උපලේඛනගත කර පොත් තබන නිළධාරි වෙත යැවිය යුතු ය. මෙම උපලේඛනය අනුව පොත් තබන නිළධාරි විසින් අදාළ වැය ශීර්ෂ හර කර ගබඩා ගිණුම බැර කරමින් ජර්නල් සටහනක් සකස් කර අනුමත කරවා ගෙන ගාස්තු ලේඛනයේ (වැය ලේඛනයේ) අදාළ ශිර්ෂය යටතේ ගෙවීම් ලෙසටද, ප්‍රධාන ලෙජරයේ ඇති ගබඩා ගිණුම් බැරට ද සටහන් කළ යුතු ය.

30 ගංපඃ 6 යටතේ ලබා ගන්නා ලද භාණ්ඩවලින් යම් ප්‍රමාණයක් පාවිච්චි නොකරන ලද නම් ,එම භාණ්ඩ ප්‍රමාණය මෙයට යා කර ඇති ගංපඃ 7 දරන ආකෘති පත්‍ර පුරවා එම භාණ්ඩ සමඟ ගබඩා භාරකරු වෙත ඉදිරිපත් කළ යුතු ය. ගංපඃ 7 ද සකස් කළ යුත්තේ පිටපත් 4 කින් යුක්තවය. එයින් පිටපත් 3ක් ඉතිරි භාණ්ඩ සමඟ ගබඩා භාරකරු වෙත භාර දිය යුතු ය.

31 තමා වෙත ලැබුණ ගංපඃ 7 හි පිටපත් අනුව ඉතිරි භාණ්ඩ අදාළ බින්කාඩ්වල ලැබීම් තීරුවේ සටහන් කර ගංපඃ 7 පිටපත් දෙකක් ගබඩා තොග පොත් ලිපිකරු වෙත යැවිය යුතු ය.

32 ගබඩා තොග පොත් ලිපිකරු තමා වෙත ලැබී ඇති ගංපඃ 7 පිටපත් දෙකෙහි අදාළ ද්‍රව්‍ය වල මිළ සටහන් කර එකී පිටපතක් තමා වෙත තබා ගෙන ඉතිරි පිටපත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යැවිය යුතු ය. තමා වෙත තබා ගන්නා ලද පිටපතේ සඳහන් ද්‍රව්‍යවල වටිනාකම 29 රීතිය යටතේ සකස් කරනු ලබන උපලේඛනයේ අදාළ වැය ශීර්ෂයෙන් අඩු කිරීමට වගබලා ගත යුතු අතර තොග පොතෙහි අදාළ ද්‍රව්‍ය ලැබීමක් ලෙසට සටහන් කළ යුතු අතර 29 රීතිය යටතේ සකස් කරනු ලබන උපලේඛනය පොත් තබන නිළධාරි වෙත යැවිය යුත්තේ මෙම ද්‍රව්‍යවල වටිනාකම අදාළ වැය ශීර්ෂයෙන් අඩු කිරීමෙන් පසු ගැළපීම් කිරීම් කිරීමෙන් අනතුරුව ය.

33 ගිණුම් අංශයෙහි ඇති ප්‍රධාන ලෙජරයෙහි ගබඩා ගිණුම, යනුවෙන් ගිණුමක් පවත්වා ගෙන යා යුතු අතර මෙම ගිණුම 23 වන රීතිය අනුව සකස් කරනු ලබන ජර්නල් සටහනින් හර කළ යුතු අතර 29 වන රීතිය අනුව සකස් කරනු ලබන ජර්නල් සටහනින් මෙම ගිණුම බැර කර සෑම මාසයකම අවසානයේදී මෙම ගිණුම තුලනය කළ යුතු ය.

34 යම්කිසි ද්‍රව්‍යයක් පාවිච්චි කර නැවත එය ඉවත් කිරීමට සිදු වුවහොත් ඒ ද්‍රව්‍ය නැවත භාවිතා කළ හැකි තත්ත්වයක පවතින්නේ නම්, එම භාණ්ඩවල වටිනාකම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තක්සේරු කර ගංපඃ 7 ආකෘති පත්‍රයක් සකස් කර අංක 28 දරන රීතියේ විධිවිධානයන් අනුව ක්‍රියා කළ යුතු ය. එහෙත් මෙම ද්‍රව්‍ය සටහන් කිරීම සඳහා වෙනම බින් කාඩ් හා තොග පොත් භාවිතා කළ යුතු අතර මෙම භාණ්ඩවල වටිනාකම ගබඩා ගිණුමට හර කළ යුතු ය. නැවත එම ද්‍රව්‍ය නිකුත් කරන විට මෙම රීතිවල සඳහන් විධිවිධානයන් අනුව කටයුතු කළ යුතු ය.

35 කලාපවල සෘජුවම සපයන එම භාණ්ඩ සඳහා ද (උදා ඃ ගල්වැලි ආදිය) මෙම රීතිවල සඳහන් වන විධිවිධානයන් අනුගමනය කළ යුතු ය. එහෙත් මෙම රීතිවල සඳහන් ගබඩා භාරකරු වෙනුවට කලාපය භාරව සිටින තාක්‍ෂණ නිළධාරියා කටයුතු කළ යුතු අතර අදාළ ද්‍රව්‍යයන් සඳහා බින් කාඩ් වෙනුවට තොග පොතක් භාවිතා කිරීම සෑහේ.

36 සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 වන දිනට පෙර ගබඩාවෙහි හා කලාපවල වර්ෂාවසානයට ඇති ඉතිරි භාණ්ඩ සමීක්‍ෂණ මණ්ඩලයක් මගින් සමීක්‍ෂණ කළ යුතු ය. මෙම මණ්ඩලය හෝ මණ්ඩල නාගරික කොමසාරිස් විසින් පත් කළ යුතු අතර එය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය. සමීක්‍ෂණය අවසානයේ මෙම මණ්ඩලය විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර,එම වාර්තාවේ සඳහන් ද්‍රව්‍යයන් තොග පොතේ සඳහන් මිළ අනුව මිළ කර එම මිළවල එකතුව ගබඩා ගිණුමෙහි ශේෂය සමඟ සංසන්දනය කළ යුතු ය. යම් වෙනස් වීමක් ඇත්නම්, විගසින් ඒ ගැන සොයා බලා නිවැරදි කළ යුතු ය.

37 36 වන රීතිය යටතේ සමීක්‍ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව මුදල් කාරක සභාව වෙත හා මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර සභාව විසින් ගනු ලබන තීරණය අනුව එම වාර්තාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

38 අර්ථ නිරූපන -

''ග. ප.'' යන්නෙන් අදහස් කරන්නේ ගබඩ් පත්‍ර ලෙස හඳුන්වනු ලැබේ.

(ගැණුම්කරුට)

**බදුල්ල මහා නගර සභාව**

ගබඩාවට භාණ්ඩ ලැබීම

පළවෙනි පිටපත

ඇනවුම් අංකය ඃ.............................................. භාණ්ඩ ඉල්ලුම් පත්‍ර අංකය ඃ........................................

දිනය ඃ................................................................. දෙපාර්තමේන්තු/වැඩ ඃ........................................................

..........................................................ගෙන් පහත සඳහන් උපකරණ විස්තරාණුකූලව හා යට දැක්වෙන ප්‍රමාණයන් හොඳ තත්ත්වයෙන් මා වෙත ලැබුණු බව සහතික කරමි.

| කරුණ | ප්‍රමාණය | විස්තර | මිළ ප්‍රමාණය | | තොග ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|
| | | | | රු. ශත | |
| | | | | | |
| | | | | | |

දිනය :....................................... (ගබඩා භාරකරු) :.............................................

*වැදගත් සටහන් :-* ගබඩාවට ගෙනවිත් භාර දී තොග භාණ්ඩවලට ගණන්ගත් භාණ්ඩ සඳහා වූ අනුමත කළ එකම පෝර්මය මෙයයි. මෙම පෝර්මය ඔබේ ගෙවීම් ගිණුම බදුල්ල මහා නගර සභාව භාණ්ඩාගාරික තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

මිළ ගණන් ප්‍රමාණයන් හා ගණන් බැලීම්වල හරි වැරදි බලන ලදී.

ගැණුම් ලෙජරයට ඇතුළත් කරන ලදී.

පිටු අංකය :.............................................

.......................................
පරීක්ෂක ලිපිකරු.

.......................................
ගබඩා ලිපිකරු.

ගබඩා ගිණුම් ලෙජරය

| | | | | | |
|---|---|---|---|---|---|
| ද්‍රව්‍ය | : | ස්ථානය | : | තොග මට්ටම | : |
| සංකේතය | : | ගබඩා අංකය | : | උපරිම ප්‍රමාණය | : |
| ඒකකය | : | රාක්ක අංකය | : | අවම ප්‍රමාණය | : |
| | | බින්කාඩ් අංකය | : | නැවත ඇණවුම් කරන ප්‍රමාණය | : |

| දිනය | ලැබීම් | | | | නිකුත් කිරීම් | | | | තොග | | | පරීක්ෂා කරන නිලධාරියාගේ අත්සන හා දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ද. ලැ. ඉ අංකය | ප්‍රමාණය | මිළ | වටිනාකම | ද්‍රව්‍ය ඉල්ලුම් පත් අංකය | ප්‍රමාණය | මිළ | වටිනාකම | ප්‍රමාණය | මිළ | වටිනාකම | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

(ගැණුම්කරුට)

**බදුල්ල මහා නගර සභාව**

භාණ්ඩ නිකුත් කිරීම

1 වෙනි පිටපත

අංශය :.........................................................................
ගැණුම්කරුගේ නම :..............................................
දිනය :.........................................................................

වැඩපත් අංකය :.....................................................................
භාණ්ඩ ඉල්ලුම්පත්‍ර අංකය :...............................................
ඇස්තමේන්තු වැඩ :.................................................................

........................................................................................................................................................................

ගබඩා භාරකරුගෙන් පහත සඳහන් උපකරණ විස්තරානුකූලව හා යට දැක්වෙන ප්‍රමාණයන් හොඳ තත්ත්වයෙන් මා වෙත ලැබුණු බව සහතික කරමි.

| කරුණ | ප්‍රමාණය | විස්තර | මිළ ප්‍රමාණය | රු. | ශත | තොග ලෙජර් පිටුව |
|---|---|---|---|---|---|---|
| .............................. | ............................................................ | ......................................................... | ................................................. | ....... | ....... | .............................................. |
| .............................. | ............................................................ | ......................................................... | ................................................. | ....... | ....... | .............................................. |
| .............................. | ............................................................ | ......................................................... | ................................................. | ....... | ....... | .............................................. |
| .............................. | ............................................................ | ......................................................... | ................................................. | ....... | ....... | .............................................. |

............................................................................

ගබඩා ලිපිකරුගේ අත්සන/දිනය.

..............................................................

ගැණුම්කරුගේ අත්සන/දිනය.

මිළ ගණන්, මිළ ප්‍රමාණයන් හා ගණන් ගිණුම්වල හරි වැරදි බලන ලදී.

ගිණුම් ලෙජරයට ඇතුළත් කරන ලදී.

.............................. අංකය ..............................

....................................

පරීක්ෂක ලිපිකරු.

..............................

ගබඩා ලිපිකරු.

**XLV** වන කොටස

පෞද්ගලික රෝහල්, පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන, පෞද්ගලික වෛද්‍ය රසායනාගාර සහ පෞද්ගලික ඖෂධ ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 272 වන වගන්තියට අනුව ලැබී ඇති බලතල ප්‍රකාරව බදුල්ල මහා නගර සභාව විසින් පෞද්ගලික රෝහල්, පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන, පෞද්ගලික වෛද්‍ය රසායනාගාර සහ පෞද්ගලික ඖෂධ ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙයින් පනවනු ලැබේ.

1. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ පෞද්ගලික රෝහල්, පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන, පෞද්ගලික වෛද්‍ය රසායනාගාර සහ පෞද්ගලික ඖෂධ ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, නාගරික කොමසාරිස් වරයා විසින් කවර හෝ පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) යම් පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන තිබිය යුතු ය.

(2) යම් පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක්ම නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව තනන ලද ගොඩනැගිල්ලක මිස කිසිම අවස්ථාවක ඊට පරිබාහිරව තනන ලද ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම නොකල යුතු ය. සෑම ගොඩනැගිල්ලකටම ප්‍රමාණවත් ආලෝකය සහ වාතාශ්‍රය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතු ය. සෑම කාමරයකටම සෑම ශාලාවකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර විවෘත කළ විට ඒ ජනේලවල වර්ග ප්‍රමාණය, ඒ කාමරයේ හෝ ශාලාවේ මතුපිට බිම් ප්‍රදේශයේ සම්පූර්ණ වර්ග ඵලයෙන් පහලොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතු ය. කෙසේ වුව ද යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක යම් කාර්යයක් සංවෘත ගොඩනැගිල්ලක් නොවන ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම කළ නොහැකි වන අවස්ථාවක හෝ අදාල කාර්යය සඳහා භාවිතා කරන කාමරය හෝ ශාලාව වායුසමනය කර ඇති අවස්ථාවක මේ ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) සෑම කාමරයක ම සහ ශාලාවකම බිත්තිවල අවම උස මීටර් 2.14 ට අඩු නොවිය යුතු අතර, එකී බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා සිමෙන්ති බදාම යොදා කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතු ය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමග ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක මුළුතැන්ගෙයක් පවත්වාගෙන යනු ලබන්නේ නම්, එකී මුළුතැන්ගෙයි බිත්ති සෝදා පිරිසිදු කළ හැකි පරිදි පොළව මට්ටමේ සිට අවම වශයෙන් අඩි 06 කට නොඅඩු උස ප්‍රමාණයක් පිඟන් ගඩොල් සවිකර නිම කළ යුතු ය.

(4) වහළය ස්ථිර ද්‍රව්‍ය යොදා සකස් කර සෙවිලි කර තිබිය යුතු අතර, පියසි කෙලවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 ක් උසින් තිබිය යුතුවාත් හැර අගු වාසිය අවම වශයෙන් මීටර් එකක් විය යුතු ය.

(5) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත ආලේප කර මනා තත්වයකින් පවත්වාගෙන යා යුතු ය. නැතහොත් සෑම කාමරයක්ම සහ ශාලාවක් සඳහාම ස්ථිර ද්‍රව්‍යකින් සකස් කරන ලද සීලිමක් තිබිය යුතු අතර, එම සීලිම තීන්ත හෝ සායම් ආලේප කර මනා තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(6) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ වුවත්, යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක ඇති සෑම මුළුතැන්ගෙයකම, එන්නත් කාමරයකම, ශල්‍යාගාරයකම, සැරහුම් කාමරයකම, රසායනාගාරයකම, හදිසි ප්‍රතිකාර ඒකකයකම පොළව සෝදා පිරිසිදු කළ හැකි පරිදි පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(7) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක සේවයෙහි නියුක්තව සිටින තැනැත්තන් සෑම දස දෙනෙකුටම, යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන්ව වන වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතු ය. එමෙන්ම ඉහත කුමන හෝ ස්ථානයක් සඳහා නේවාසික හෝ බාහිර සේවාවක් ලබා ගැනීමට පැමිණෙන තැනැත්තන් සඳහා සෑම පනස් දෙනෙකුටම, යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන්ව වන වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතු ය.

(8) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක චැනල් සේවාව සිදු කරන්නේ නම් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන්ගෙන් 80% කට වැඩි ප්‍රමාණයකට ඉඳගැනීමේ පහසුකම් සලසා තිබිය යුතු ය.

(9) යම් පෞද්ගලික රෝහලකින් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයකින් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයකින් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවකින් සේවාවක් ලබා ගැනීමට ආබාධිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සපයා තිබිය යුතු ය.

(10) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව පවිත්‍රකරණය කිරීමක් කරන්නේ නම් මිස යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක සිදු කරන කටයුතුවලින් පසුව බැහැර කරන අපජලය පොදු ජල මාර්ගයකට හෝ ඇල මාර්ගයකට හෝ යම් කාණුවකට මුදා හැරීම නොකළ යුතු ය.

(11) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක සිදුකරන කටයුතුවලින් පසුව බැහැර කරන අපජලය පවිත්‍රකරණයට ලක්කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අපජලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයෙන් උරා ගන්නා වළකට ගලා යාමට සැලැස්විය යුතු ය. එසේම එකී උරාගන්නා වල වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ළිඳක සිට මීටර් පනහකට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතු ය.

(12) සෑම පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් සඳහාම භාවිත කරන ගොඩනැගිල්ල ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

(13) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක කාර්යයන් සඳහා පාවිච්චි කරන කාමරවලින්, කලින් පාවිච්චි කළ ඇසුරුම් හෝ වෙනත් ද්‍රව්‍යයන් නැවත පාවිච්චියට ගැනීම සඳහා සේදීමේදී සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් අභ්‍යන්තර ජලාපවහන ක්‍රමයක් ඇතිකර තිබිය යුතු ය.

(14) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක භාවිතා කරන ඖෂධ, රසායනික ද්‍රව්‍ය, උපකරන සහ ආම්පන්න, කිසියම් කටයුත්තක් සඳහා යොදාගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩාකර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර එකී කාමරය මීයන්ගෙන් සහ වෙනත් කෘමි සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතු ය. එමෙන්ම ශීතකරණ හෝ අධිශීතකරණ තුළ ගබඩාකර තැබිය යුතු යම් ඖෂධ හෝ රසායන ද්‍රව්‍ය වේ නම් ඒ සඳහා මනා ක්‍රියාකාරී තත්වයේ පවතින ශීතකරණ සහ අධිශීතකරණ භාවිතා කළ යුතු ය.

(15) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක භාවිතයට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා යොදා ගන්නේ නම් ඒ සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හතරකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය.

(16) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක පාවිච්චියට ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් බෝවීම වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු අතර එකී ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ස්ථානවල සිට මීටර් 18 කට අඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

(17) කලින් පාවිච්චි කළ ඇසුරුම් හෝ රෙදි සේදීම සඳහා යොදාගන්නා ස්ථානය, ස්ථානයේ කටයුතු සඳහා භාවිතා කරන කාමරවලින් වෙන්ව ස්ථානගත කර තිබිය යුතු අතර, ඉහත (15) ඡේදයේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතු ය.

(18) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක කාර්යයන් හේතුවෙන් ජනනය වන ඝණ අපද්‍රව්‍ය කසල බැහැරලීම සඳහා වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට වර්ග කර බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන තිබිය යුතු ය.

(19) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක සිදු කරනු ලබන ශල්‍යකර්ම හෝ වෙනත් කටයුතු වලින් ඉවත් කරනු ලබන ශරීර දේහ කොටස් බදුල්ල මහ නගර සභාවේ පොදු සුසාන භූමියක පමණක් භූමදාන කිරීමට අවශ්‍ය විධිවිධාන සලස්වා ගත යුතු ය.

(20) යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක භාවිතා කළ එන්නත් කටු, සිරින්ජ, ලේ තැවරුන පුළුන් හෝ වෙනත් අන්තරායකාරී ද්‍රව්‍යයන් සෞඛ්‍යාරක්ෂිතව බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් යොදා තිබිය යුතු ය. (ඉන්සිනරේටරයක් භාවිතා කිරීම)

5. සෑම පෞද්ගලික රෝහලකම, පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයකම, පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයකම, පෞද්ගලික ඖෂධ ශාලාවකම සේවයේ යෙදෙන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සඳහා වෙන වෙනම ප්‍රමාණවත් පහසුකම් සහිත සේවක විවේකාගාර සකස් කර තිබිය යුතු ය.

6. යම් පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස කිසියම් විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන කිසියම් ද්‍රව්‍යයක් යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැළැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

8. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව ශබ්ද දූෂණයක් විය හැකි සීමාවට වඩා අඩු සීමාවක ශබ්ද පාලනයක් පවත්වාගෙන ඇත්තේ නම් මිස කවර හෝ යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක ශබ්ද නිපදවීමක් ඇති වන කිසියම් යන්ත්‍ර සූත්‍ර හෝ වාෂ්ප බොයිලේරු හෝ ක්‍රියාත්මක කිරීමේ දී ශබ්ද උපදවන වෙනත් යම් ආකාරයක යන්ත්‍රයක් පාවිච්චි නොකළ යුතු ය.

9. යම් උඳුනකින් උත්පාදනය වන දුම් පිටකිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව, දුම් කවළුවක් තනා ඇත්තේ නම් මිස කවර හෝ පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක දුම් උත්පාදනය කෙරෙන යම් උඳුනක් පාවිච්චියට ගැනීම නොකළ යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂකට ම එක් වරක් බැගින් තීන්ත අලේප කිරීම කළ යුතු ය.

11. කවර හෝ පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

12. පාවිච්චි කළ රෙදි, ඇඳ ඇතිරිලි, අත් පිස්නා සහ වෙනත් උපකරණ පිරිසිදු කර නැවත පාවිච්චි කරන්නේ නම් එකී පාවිච්චි කළ රෙදි, ඇඳ ඇතිරිලි, අත් පිස්නා සහ වෙනත් උපකරණ පිරිසිදු කිරීමේ දී -

(අ) පාවිච්චි කළ රෙදි, ඇඳ ඇතිරිලි, අත් පිස්නා සහ වෙනත් උපකරණ මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

(ආ) එකී පාවිච්චි කළ රෙදි, ඇඳ ඇතිරිලි, අත් පිස්නා සහ වෙනත් උපකරණ අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,

යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිත කළ යුතු අතර එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මගින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

13. (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක කාර්යයන්හි යොදවා ගැනීම නොකළ යුතු ය.

(ආ) සෑම පෞද්ගලික රෝහලකම හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයකම හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයකම හෝ පෞද්ගලික ඖෂධ ශාලාවකම සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම යොදවා ඇති සේවයේ අවශ්‍යතාවය අනුව ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් අදාළ කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනයවන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය.
(ii) වීදුරු.
(iii) කඩදාසි හෝ කඩදාසි අශ්‍රිත ද්‍රව්‍ය.
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය.
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්.
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්.
(vii) අන්තරායකර අපද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට දැමීමට සලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

16. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට එකී ස්ථානයේ අදාළ කාර්යයන් සිදු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් යම් පෞද්ගලික රෝහලක් හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමකින් පසු මෙම කොටසේ සඳහන් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

18. 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහහතරකට නොවැඩි විය යුතු ය.

19. 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

20. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝණය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= ක් නො ඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(ii) දෙවනිවර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= ක් නො ඉක්මවන දඩයකට යටත් වන්නේ ය.

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වනවිට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට යටත් වන්නේ ය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල,

- නිලධාරියා යනු නාගරික කොමසාරිස්වරයා විසින් බලය ලබා දෙනු ලබන සභාවේ නිලධාරියෙකු වන්නේ ය.

- බලපත්‍රධාරියකු යන්නෙන් හඳුන්වනු ලබන්නේ යම් පෞද්ගලික රෝහලක හෝ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානයක හෝ පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක හෝ පෞද්ගලික ඖෂධ ශාලාවක අයිතිකරු හෝ කළමණාකරණ අධ්‍යක්ෂ හෝ කළමණාකරු වන්නේ ය.

## **XLVII** වන කොටස

### ගොඩනැගිලි සහ කාණු ඉදි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, ගොඩනැගිලි සහ කාණු ඉදි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. (අ) බදුල්ල මහා නගර සභාවේ යම් වීදියකට යාව යම් කාණුවක් සාදනු ලැබ හෝ කාණු ලැබ හෝ ඇත් ද, එම වීදියට යාබද යම් නිවසක, ඉඩමක හෝ පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් නාගරික කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව සහ නියම කිරීම අවශ්‍ය යයි නාගරික කොමසාරිස්වරයා සලකන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් විධාන කරන ආකාරයට මිස යම් කාණුවක් මත, යම් පාලමක්, වේදිකාවක්, ගොඩනැගිල්ලක් හෝ කවර හෝ ආකාරයක නිර්මිතයක් තැනීම හෝ තැබීම නොකළ යුතු ය.

(ආ) තව ද, ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ කවර හෝ වූ හෝ ආකාරයක නිර්මිතය නාගරික කොමසාරිස්වරයා සෑහීමට පතිවන පරිදි යහපත් තත්ත්වයකින් නඩත්තු කරනු ලැබිය යුතු ය.

(ඇ) කිසියම් පාර්ශවයකට එසේ පිහිටා ඇති යම් නිවාසයකට ඉඩමකට හෝ ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ ඉහත කී පරිදි වූ නිර්මිතය නොමැතිව ප්‍රවේශයක් පවතින බව හෝ ඉහත කී පරිදි කරන ලද්දක් හෝ තබන ලද්දක් නොවන වෙනත් පාලමක්, වේදිකාවක් ගොඩනැගිල්ලක් හෝ නිර්මිතයක් මගින් ප්‍රවේශයක් පවතින බව නාගරික කොමසාරිස්වරයාට දැන ගන්නට ලැබුණහොත් එහි අයිතිකරුට හෝ පදිංචිකරුට එය අප්‍රමාදව ඉදිකරන ලෙස, තබන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඒ පාලම, වේදිකාව, ගොඩනැගිල්ල හෝ නිර්මිතය නැතහොත් එය යටින් ඇති කාණුව යහපත් තත්ත්වයෙන් නඩත්තු කිරීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත් එය යහපත් තත්ත්වයට පත් කරන ලෙස එහි අයිතිකරුට හෝ පදිංචිකරුට දැන්වීමක් මගින් දැනුම් දීම නිත්‍යානුකූල වන්නේ ය.

(ඈ) ඒ දැන්වීම භාරදෙනු ලැබී දවස් තිහක් ඇතුළත හෝ එම කාර්යය හදිසි එකක් බව ඒ දැන්වීමේ නාගරික කොමසාරිස්වරයා විසින් සඳහන් කරනු ලැබ ඇත්නම් එසේ දැන්වීම භාර දීමෙන් දවස් දාහතරක් ඇතුළත හෝ එසේ දෙන ලද දැනුම් දීමක නියමයන් සපුරාලීම පැහැර හැරියහොත් අවස්ථාවෝචිත පරිදි ඒ අයිතිකරුහෝ පදිංචිකරු වරදක් කරන්නේ ය. තව ද, නාගරික කොමසාරිස්වරයා විසින් ඒ වැඩ කිරීමටත් සැලැස්විය හැකි අතර, එහි පිරිවැය සහ වියදම් එකී අයිතිකරු හෝ පදිංචිකරු ගෙවිය යුතු ය. අයිතිකරු හෝ පදිංචිකරු මුදල් ගෙවීම පැහැර හැරියහොත් එම මුදල වරිපනම් බද්දක් ලෙස අය කර ගැනීමට කටයුතු කළ යුතු ය.

2. (අ) අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයා සලකන්නේ නම් ගොඩනැගිල්ලකට යාව ඇති අංගනයක හෝ භූමියක නැතහොත් ගොඩනැගිලි අතර හෝ ගොඩනැගිලි පේළියක් අතර හෝ ඇති යම් පටු පාරක, පාරක හෝ අඩි පාරක අයිතිකරුට හෝ අයිතිකරුවන්ට නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ අංගනය, භූමිය, පටු පාර, පාර හෝ අවස්ථාවෝචිත පරිදි එවැනි යම් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලිවල හෝ ගොඩනැගිලි පේළියක සිට මීටර් 45ක් නොඉක්මවන දඩයක් දුරකට ගල් අතුරා නාගරික කොමසාරිස්වරයා විධාන කරන යම් ආකාරයකට සකස් කරන ලෙස ද, ඒ අංගනයේ, භූමියේ, පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ ජලය කාණු බැස යාමේ කාර්යය සඳහා ළඟම ඇති මහ නගර සභා පල්දෝරුව හෝ කාණුව දක්වා ප්‍රමාණවත් කාණු හෝ නල සපයන ලෙස ද නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලක් මගින් නියම කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

(ආ) ඒ කාණු හෝ නළ නාගරික කොමසාරිස්වරයා නියම කරන ද්‍රව්‍යවලින් ද, විශාලත්වයෙන් මට්ටමකින් ද බෑස්නාවකින් ද විය යුතු අතර, එකී මහ නගර සභා පල්දෝරුව හෝ කාණුව සමඟ එසේ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරන ලද තැනක දී සන්ධි වන පරිදි විය යුතු ය.

(ඇ) එවැනි දැන්වීමක නියම කරන ඇති කාලය ඇතුළත එහි නියමයන් කිරීම එහි අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු විසින් හෝ ඔවුන් විසින් වරදක් කරනු ලබන්නේ ය. තව ද, නාගරික කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයන් සහ කම්කරුවන් එම ස්ථානයට ඇතුළු ඒ නියමිත වැඩ කිරීමට සැලැස්විය හැකි අතර, එහි පිරිවැය අයිතිකරු විසින් ගෙවිය යුතු ය.

(ඈ) එසේ වුව ද, ළඟම ඇති මහ නගර සභා පල්දෝරුවට හෝ කාණුවට ඇති දුර ඒ අංගනයේ, භූමියේ පටු පාරේ, පාරේ හෝ අඩි පාරේ සිට මීටර් තිහකට වැඩි වේ නම්, මහ නගර සභාවේ කැමැත්ත කලින් ලබා නොගෙන එවැනි දැන්වීමක් නිකුත් නොකළ යුතු ය.

(ඉ) එසේ වුව ද අයිතිකරු විසින් සැපයිය යුතු ගොඩනැගිලි ද්‍රව්‍ය නාගරික කොමසාරිස් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය විය යුතු ය.

(ඊ) 2 වන අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමට අයිතිකරු විසින් නාගරික කොමසාරිස් ගෙන් ඉල්ලා සිටියහොත් නාගරික කොමසාරිස්වරයා එම කර්මාන්තය ක්‍රියාත්මක කොට ඒ සඳහා සැහිමට පත් වන්නේ නම්, ඒ සඳහා වැය වේ යැයි ඇස්තමේන්තු කරන සියලුම මුදල්, අයදුම්කරුගෙන් වේලාසනින් අය කර ගෙන එම කටයුතු ක්‍රියාත්මක කළ යුතු ය.

3. (අ) යම් පෞද්ගලික පල්දෝරුවක් හෝ කාණුවක් එය අයිතිකරුගේ ගොඩනැගිල්ලකට යටින් තිබුණ ද ඒ පල්දෝරුවට හෝ කාණුවට නිසි වාතාශ්‍රයක් ලැබීම පිණිස නාගරික කොමසාරිස්වරයා නියම කරන යුක්ති සහගත කාලයක් ඇතුළත අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයා සලකන යම් පයිප්ප සවි කරන ලෙස ඒ පල්දෝරුව හෝ කාණුව අයිතිකරුට නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මඟින් නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ආ) වාතාශ්‍ර කළ නාගරික කොමසාරිස්වරයා විධාන කරන විශාලත්වයකින් හා ද්‍රව්‍යයකින් විය යුතු අතර, එසේ විධාන කරන උසක් දක්වා ගෙන යා යුතු ය. නියමිත කාලය ඇතුළත ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම ඒ අයිතිකරු පැහැර හැරියහොත් ඔහු වරදක් කරන්නේ ය. තව ද, නාගරික කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය ලබා දෙන යම් නිලධාරයන් සහ කම්කරුවන් ඒ ස්ථානයට ඇතුළු වී නියමිත වැඩය නිම කිරීමට සැලැස්විය හැකි අතර, එහි පිරිවැය ඒ අයිතිකරු විසින් ගෙවිය යුතු ය. අයිතිකරු හෝ පදිංචිකරු මුදල් ගෙවීම පැහැර හරින්නේ නම්, එම මුදල වරිපනම් බද්දක් ලෙස අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.

4. කිසියම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධ වන ආවරණය කළ කාණුවක් හෝ නළය තැනීම හෝ එලීම 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 110 යන වගන්තිය යටතේ අවශ්‍ය බව පෙනී ගිය විටක ඒ කාණුව තැනීම හෝ නළය එලීම සඳහා එය ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ල හෝ ස්ථානය සහ පොදු කාණුව හෝ පල්දෝරුව අතර ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා ගෙන යාම අවශ්‍ය වන විට නාගරික කොමසාරිස්වරයා හෝ තත් කාර්යය සඳහා ඔහුගේ ලිඛිත අධිකාරියක් යටතේ ක්‍රියා කරන මහ නගර සභාවේ යම් නිලධරයෙකු හෝ විසින්ඒ කාණුව තැනීම හෝ නළ එලීම කර ගෙන ගොස් සම්පූර්ණ කිරීමට නාගරික කොමසාරිස්වරයා අදහස් කරන බවට ඒ අතරමැද ඇති ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට සතියක කල් දීමකින් පසු ඒ ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී ඒ කාණුව තැනීම හෝ නළ එලීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ ඉඩමේ අයිතිකරු බදුකරු හෝ පදිංචිකරු නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත කැමැත්ත ලබා නොගෙන ඒ කාණුවක් හෝ නළයක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නොකළ යුතු ය. කාණු පල්දෝරු ක්‍රමය ඉඩම් මැදින් ඉදි කරන අවස්ථාවේ දී එම ඉඩමේ හෝ ඉඩම්වල අයිතිකරුට හෝ අයිතිකරුවන්ට යම් කිසි අලාභයක් සිදු වන්නේ නම් එම අලාභය පල්දෝරු ක්‍රමය හෝ නළය සවි කරන තැනැත්තා විසින් ගෙවීමෙන් අනතුරුව එම වැඩය ක්‍රියාත්මක කළ හැකි ය.

5. (අ) යම් පල්දෝරුවක් හෝ කාණුවක් හා සම්බන්ධ වන ආවරණය කළ කාණුවක් හෝ නළයක් තනන ලෙස හෝ එලන ලෙස හෝ 252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 110 වන වගන්තිය යටතේ අවශ්‍ය බව පෙනී ගිය විටක ඒ කාණුව තැනීම හෝ නළය එලීම පිණිස ජලය බැස්සවීම අවශ්‍ය ගොඩනැගිල්ල ස්ථානය සහ පොදු පල්දෝරුවක් හෝ කාණුවක් අතර මැද ඇති ඉඩමක් හෝ ඉඩම් හරහා එය ගෙන යාම අවශ්‍ය බවට සහතිකයක් නිකුත් කිරීම සුදුසු යැයි නාගරික කොමසාරිස්වරයාට පෙනී යන්නේ නම් ඔහු විසින් එසේ ලිඛිත සහතිකයක් ඒ තැනැත්තාට නිකුත් කළ හැකි ය.

(ආ) එම සහතිකය නිකුත් කරනු කරනු ලැබීමෙන් පසුව සහ අතර මැද ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරුට හෝ අයිතිකරුවන්ට යුක්ති සහගත වන්දියක් ගෙවීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් පසුව කවර වේලාවක වුව ද, ඒ අතරමැද ඉඩමේ හෝ ඉඩම්වල අයිතිකරුට හෝ පදිංචිකරුට තමා ඒ කාණුව තැනීම හෝ නළ එලීම සම්පූර්ණ කිරීමට අදහස් කරන බවට සතියක කල් දීමකින් පසුව ඒ තැනැත්තා විසින් අවශ්‍ය නිසි සේවකයන්, කම්කරුවන්, වාහන හා සතුන් සහ වෙනත් උපයෝගී ද්‍රව්‍ය ද රැගෙන ඒ අතරමැද ඉඩමට හෝ ඉඩම්වලට ඇතුළු වී ඒ කාණුව තැනීම හෝ නළය එලීම කරගෙන ගොස් සම්පූර්ණ කිරීම නිතීත්‍යානුකූල වන්නේ ය. එකී යුක්ති සහගත වන්දි මුදල් ප්‍රමාණය සහ අවශ්‍ය වුවහොත් එය කොටස් කර දීම ඒ පිළිබඳ මතභේදයක් ඇති වූ අවස්ථාවක බේරුම්කරුවන් දෙදෙනෙකු විසින් තීරණය කිරීම සඳහා යොමු කළ යුතු ය.

(ඇ) මෙම බේරුම්කරුවන්ගෙන් එක්කෙනෙකු ඉහත කී තැනැත්තා විසින් ද අනෙක් බේරුම්කරු අදාළ ඉඩමෙහි හෝ ඉඩම්වල අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් ද නම් කළ යුතු ය. යුක්ති සහගත වන්දි මුදල් ප්‍රමාණය හෝ එය කොටස් කළ යුතු ආකාරය හෝ පිළිබඳව එකඟත්වයකට පැමිණීමට බේරුම්කරුවන් අපොහොසත් වුවහොත් තමන් එකඟ නොවන කරුණ හෝ කරුණු ඔවුන් විසින් එකී තීරකට යොමු කළ යුතු ය. ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය. බේරුම්කරුවෙකු නම් කරන ලෙස දැනුම්දීමක් අයිතිකරුට හෝ අයිතිකරුවන් සියලු දෙනාට ලැබී දවස් දහයක් ඇතුළත එසේ බේරුම්කරුවෙකු පත් කිරීම එකී අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් පත් කරන ලද බේරුම්කරු එම වන්දි මුදලේ ප්‍රමාණය සහ එය කොටස් කළ යුතු ආකාරය තීරණය කළ යුතු ය.

6. අනුමත කරන ලද ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ විශාල කරන හෝ වැඩි දියුණු කරන නැතහොත් ගොඩනැගිල්ලක ඉදිරිපස අලුත් කරන හෝ වෙනස් සෑම තැනැත්තෙක්ම හෝ තැනැත්තන්ම ද යම් කණුවක් ඉදිකිරීම නැතහොත් කාණුවකට උඩින් පාලමක්, වේදිකාවක් හෝ නිර්මිතයක් ඉදි කරන හෝ යම් වැසිකිළියක් හෝ කුණු දිය වළක් ඉදි කරන සෑම තැනැත්තෙක්ම හෝ තැනැත්තන්මද තමා වෙත නීතියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික කොමසාරිස්වරයා විසින් යම් ගොඩනැගිල්ලක්, කාණුවක්, වැසිකිළියක් හෝ කුණු දිය වළක් ඉදි කරන ලෙස, වෙනස් කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස නියම කරනු ලැබිය හැකි සෑම තැනැත්තෙක්ම හෝ තැනැත්තන්මද ඒ කටයුත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව දවස් දහ හතරක් අතුළත ඒ පිළිබඳව නාගරික කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

7. යම් තැනැත්තෙකු විසින් මෙහි පහත දැක්වෙන කොන්දේසි යටතේ හෝ නාගරික සංවර්ධන අධිකාරියේ සැළසුම් හා ගොඩනැගිලි පිළිබඳ නියෝග වල නියමිත පරිදි යන මෙයින් අදාළ වන්නේ යමක් ද ඒ අනුව හැර වාසස්ථානයක් වශයෙන් එවැන්නක පදිංචි වීමට ඉඩදීම නිත්‍යානුකූල නොවන්නේ ය.

(අ) කිසිම අවස්ථාවක බිත්ති පොල් අතුවලින් සාදා නොතිබිය යුතු අතර, නිසි පරිදි කපරාරු කර හුණු ගෑමට හැකිවන පරිදි වරිච්චි, කඩොල් කබොක් හෝ වෙනත් යෝග්‍ය ද්‍රව්‍යකින් තනා තිබිය යුතු ය. එහෙත් වරිච්චි වලින් බිත්ති සාදා ඇති ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් අවුරුදු 2ක කාලය තුළදී ස්ථිර ද්‍රව්‍ය වලින් සකස් කිරීමට කටයුතු කළ යුතු ය.

(ආ) මනුෂ්‍ය වාසය සඳහා ප්‍රයෝජනයට ගන්නා සෑම කාමරයක් සඳහාම යටත් පිරිසෙයින් මීටර් 2ක් උස හා මීටර් 9ක් පළල දොරක් හා කාමරයෙහි බිමෙහි වර්ග ප්‍රමාණයෙන් 1/7 ට සමාන වන ලෙසට ප්‍රමාණයෙන් යුක්ත වූ ජනේලයක් තිබිය යුතු ය.

(ඇ) බිම සෑම විටම මීටර් 3කට නොඅඩු ප්‍රමාණයක් පොළොව මට්ටමට තිබිය යුතු ය. එසේ වුව ද පිහිටීම අනුව ඊට වඩා වැඩි උසක් නියම කිරීමට සභාවට නිදහස ඇත්තේය. පැල්පත් පේළි හෝ කට්ටි දෙකක් අතර අඩුම වශයෙන් 4.5 ක විවෘත ඉඩක් තිබිය යුතු ය.

(ඈ) මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට, පටහැනිව ඉදිකරන ලද යම් ගෙයක් හෝ පැල්පතක් වෙනස් කරන ලෙස හෝ කඩා දමන ලෙස එහි එහි අයිතිකරුට ලියවිල්ලකින් දැනුම් දීමක් කර එක් මාසයක් ඇතුළත එසේ කිරීම ඔහු පැහැර හැරියහොත් හෝ නොසළකා හැරියහොත් නිසි බලය ඇති අධිකරණයක් මඟින් නිකුත් කරනු ලබන නියෝගයක් මත සභාව විසින්, කඩා දැමීමට සැලැස්වීම නිත්‍යානුකූල වන්නේ ය.

(ඉ) නාගරික කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක්, පොල්අතු, කොළ, පිදුරු, තණකොළ හෝ ලී පතුරු හෝ වෙනත් කවර වූ හෝ ස්වභාවයක දාහ්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරන, අලුත් කරන හෝ ඉදි කිරීමට නැතහොත් අලුත් කිරීමට සලස්වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය.

8. 1. වාසස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගැනීමට අදහස් කර ඇති හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් කවර හෝ හේතුවක් නිසා මනුෂ්‍ය වාසය සඳහා යෝග්‍ය නොවන බව නාගරික කොමසාරිස්වරයාට පෙනී ගියහොත් ඒ ගොඩනැගිල්ල ඒ කාර්යය සඳහා තවදුරටත් ප්‍රයෝජනයට ගැනීම තහනම් කරන මෙන් නාගරික මහේස්ත්‍රාත්වරයා වෙත සභාවේ නිලධරයකු ලවා ඉල්ලීමක් කරවීමට නාගරික කොමසාරිස්වරයා විසින් සැලැස්විය යුතු ය. සුදුසු යැයි ඒ මහේස්ත්‍රාත්වරයා සලකන පරීක්ෂණයකින් පසුව, ඔහු විසින් ඉහත කී පරිදි තහනම් කිරීමේ ලිඛිත ආඥාවක් කළ හැකිය. නැතහොත් සාධාරණ යැයි සහ යෝග්‍ය යැයි ඔහු විසින් සලකන වෙනත් යම් ආඥාවක් කළ හැකිය.

11. එවැනි යම් තහනම් කිරීමේ ආඥාවක් කරනු ලැබ ඇති විට එය මනුෂ්‍ය වාසය සඳහා අයෝග්‍ය බවට පත් කළ හේතු, තමා සෑහීමට පත් වන පරිදි වූ තහනම මහේස්ත්‍රාත්වරයා විසින් ලිඛිත ආඥා මඟින් ඉවත් කර ගන්නා තෙක් හෝ එවැනි ගොඩනැගිල්ලක් අයිතිකරු හෝ පදිංචිකරු එය මනුෂ්‍ය වාසය සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම නොකළ යුතු ය.

9. වාසස්ථානයක් හෝ ස්තාලයක් ලෙස හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ප්‍රයෝජනයට ගන්නා යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි පේළියක් ප්‍රමාණවත් උසකින් තොරව හෝ නිසි ජලාපවාහන ක්‍රමයකින් තොරව තනා තිබීමේ හේතුවෙන් හෝ, කසල ශෝධනය ප්‍රායෝගීකව කළ නොහැකි වීමේ හේතුවක් නිසා ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි පේළිය වෙනත් පැල්පත් හෝ මඩු එකට ආසන්නව ඇති ආකාරය නිසා හෝ, ඒවායේ පදිංචිකරුවන්ට නැතහොත් ඒ අවට පදිංචිකරුවන්ට රෝග වැළඳීමේ අන්තරාවක් පාත්‍ර වීමට ඉඩ ඇති බව නාගරික කොමසාරිස්වරයාගේ මතය වේ නම්, ඔහු විසින් ඒ පැල්පතේ හෝ මඩුවේ හෝ ප්‍රකටව පෙනෙන නැනක සවි කිරීමට සලස්වන ලිඛිත දැන්වීමක් මඟින්, ඒ අයිතිකරුට නැතහොත් ඒ පැල්පතේ හෝ මඩුව පිහිටා ඇති ඉඩමේ අයිතිකරුට, ඒ පැල්පත හෝ මඩුව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස නැතහොත් අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයා සලකන පරිදි එය වැඩි දියුණු කිරීමට ක්‍රියා කරන ලෙස නියම කළ හැකිය.

10. අතුරු ව්‍යවස්ථා 1.2.3. යටතේ සඳහන් වන මුදල් ගෙවීම අයිතිකරු හෝ පදිංචිකරු විසින් පැහැර හරින්නේ නම් එම මුදල් දේපළ බද්දක් ආකාරයට මහ නගර සභා ආඥාපනතේ 252 ඡේදය යටතේ විනිග්‍රහ බලපත්‍රය යටතේ අය කර ගත හැකිය.

11. පවතින ගොඩනැගිලි වල අප ජලය පොදු කානුවකට නිසි ලෙස බැසයාමක් සිදු නොවන්නේ නම් එම ජලය කාණු වලට හැරවිය හැකි අතර, කාණු අවශ්‍ය නොවන්නේ නම්, එම ජලය උරාගනු ලබන ලොකු වලකට යොමු කළ යුතු ය.

12. කිසිම පුද්ගලයෙකු ඉවත් කරන පස් හෝ අපද්‍රව්‍ය ඇලකට, කාණුවකට, මාර්ගයකට, පොදු විවෘත ප්‍රදේශයකට දැමීම නිත්‍යානුකූල නොවේ. අංක 13 අතුරු ව්‍යවස්ථාවේ විධි විධානවලට හානියක් නොවන පරිදි, එබඳු පස් හෝ අපද්‍රව්‍ය ඉවත් කරන ලෙසට අපොහොසත්

වන්නේ නම්, නාගරික කොමසාරිස්වරයා විසින් ලිඛිතව බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් එම පස් හෝ අපද්‍රව්‍ය ඉවත් කොට ඒ සඳහා වැය වන මුදල අදාළ පුද්ගලයාගෙන් වරිපනම් බද්දක් ලෙසට අය කර ගත හැක.

13. මෙම අතුරු ව්‍යවස්ථා වලින් කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් විය යුතු අතර, බදුල්ල මහ නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා යම් පුද්ගලයෙකු වැරදිකරු වුවහොත්, පහත සඳහන් දණ්ඩනවලට ද අදාළ පුද්ගලයා යටත් වන්නේ ය.

(අ) පමුවන වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයක් (රු. 1,000)
(ආ) දෙවන කරනු ලබන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයක් ද (රු. 2,000)
(ඇ) නොකඩවා කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ එය කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නාගරික කොමසාරිස්ගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකට යටත් කරනු ලැබේ.

14. අර්ථ නිරූපනය ඃ

මෙම අතුරු ව්‍යවස්ථාවල, නාගරික සංවර්ධන අධිකාරියේ නියෝග, යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ අංක 8 දරන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 21 වගන්තිය යටතේ පළාත් පාලන විෂය භාර ගරු ඇමතිවරයා විසින් සාදන ලද නියෝග අදහස් වේ.

''අප ජලය'' වැසිකිළි වලින් බැහැර කෙරෙන ජලය හැර දේපල වලින් බැහැර කරනු ලබන ජලය අදහස් වේ.

## **XLVIII** වැනි කොටස

## ''ගිනි නිවීමේ සේවය''

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 26 වැනි උප වගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන ගිනි නිවන හමුදාවේ සහය ලබාගත හැක්කේ යම් නියමයක් සහ කොන්දේසි මත ද ඒ නියමයන් සහ කොන්දේසි විධිමත් කිරීම, ඒ සඳහා ගාස්තු නියම කිරීම සහ අයකිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. බදුල්ල මහා නගර සභාවේ ගිනි නිවීමේ සේවය පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථා යි.

02. කලින් කල සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිළධාරින් සංඛ්‍යාවක් ගිනි නිවන හමුදාවට පත් කරනු ලැබිය හැකි අතර,යෝග්‍යවන අවස්ථාවන්හි පළාත් පාලන සේවයට අදාළ වු රීති විමසා බලා ඒ නිළධාරින්ගේ හැසිරීම, විනය, උසස්වීම සඳහා හෝ සේවයේ කොන්දේසි සඳහා විධිවිධාන ඇති කරනු ලැබිය හැකි ය.

03. ගිනි නිවන හමුදාව විසින් ගිනි සම්බන්ධයෙන් ඊට නියම කරනු ලබන සේවාවන් සැලැස්විය යුතු අතර, සභාව විසින් වරින් වර තීරණය කරනු ලබන ගාස්තු මෙහි උපලේඛන V වන කොටසේ සඳහන් කර ඇති ගාස්තු වලට යටත් විය යුතු නමුත් මෙම ගාස්තු මහා නගර සභාව විසින් වාර්ෂිකව සංශෝධනය කර රජයේ ගැසට් පත්‍රයේ පළ කරන්නේ ය.

04. (i) ප්‍රධාන නිළධාරියා විසින් නිසි ලෙස බලය පවරන ලද ගිනි නිවන හමුදාවේ යම් නිළධාරියෙකුට පහත සඳහන් බලතල ඇත්තේ යඃ-

(අ) ගින්නක් නිවීමට ක්‍රියා කිරීම පිණිස, ගින්නෙන් තැනැත්තන් බේරා ගැනීම පිණිස, හෝ ගින්නක් තවදුරටත් පැතිරී යාම වලක්වාලීම පිණිස, සහ එවැනි ක්‍රියා සම්බන්ධයෙන් අවශ්‍ය වේ යැයි ප්‍රධාන නිළධාරියා විසින් සලකනු ලබන වෙනත් පියවර ගැනීම පිණිස දවසේ දවල් කාලයේ හෝ රාත්‍රියේ ඕනෑම වේලාවක ඕනෑම පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුල්වීම, සහ

(ආ) ගිනි වැලැක්වීමේ පූර්වාරක්ෂක පියවර පරීක්ෂාකර බැලීමේ කාර්ය සඳහා ඒ පරිශ්‍රයේ හෝ ස්ථානයේ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු වෙත ප්‍රධාන නිළධාරියා විසින් භාරදෙනු ලැබිය හැකි ලිඛිත ලියවිල්ලක නිශ්චිතව සඳහන් කරන ලද කාල සීමාව තුළ ගිනි වැලැක්වීමේ පූර්වාරක්ෂක පියවර ඉටු කරන ලෙස ඒ අයිතිකරුට, බදුකරුට හෝ පදිංචිකරුට නියම කිරීම පිණිස සෑම සාධාරණ වේලාවකදීම යම් පරිශ්‍රයකට හෝ ස්ථානයකට ඇතුල් වීම,

(ii) ප්‍රධාන නිළධාරියා විසින් නිසි ලෙස බලය පවරන ලද ගිනි නිවන හමුදාවේ යම් නිළධාරියකුට පහත සඳහන් බලතල ඇත්තේ ය ඃ-

(අ) යම් පාරක් රථ ගමනාගමනය සඳහා වසා දැමීම සහ ගිනි නිවීමේ, නල, හෝස් පයිප්ප ඇදීමේ කාර්ය සඳහා හෝ ගිනි නිවීමේ උපකරණ නවතා තැබීම සඳහා ඔහුට අවශ්‍ය විය හැකි ප්‍රදේශවලින් රථ ගමනාගමනය වෙනතකට යොමු කිරීම.

(ආ) යම් පරිශ්‍රයක හෝ ස්ථානයක ගිනි නිවීමේ කාර්ය සඳහා හෝ එහි ගින්න පැතිරී යෑම වැලැක්වීමේ කාර්ය සඳහා යම් ළිඳකින් හෝ වතුර ටැංකියකින් ජලය ඇදීම.

(ඇ) ගිනි උපකරණයක් ඇදා ඇති හෝ සම්බන්ධ කර ඇති යම් වාහනයක් ඒ වාහනයේ රියදුරු විසින් අවශ්‍ය යයි සලකන වේගයෙන් ධාවනය කරවීම සහ ඒ වාහනයට මාර්ග ඉඩ සැලසීම පිණිස ඒ වාහනයේ සයිරන් නළාව නාද කිරීම. එක් පැත්තකට පමණක් වාහන ගමනාගමනයට නියම කර ඇති පාරක විරුද්ධ පැත්තට අවශ්‍ය නම් ගිනි නිවීමේ වාහනයක් පදවාගෙන යා හැකිය. (අවශ්‍ය නම් පමණි.)

(i) ගිනි නිවන හමුදාව විසින් ගිනි නිවීමේ ක්‍රියාව සඳහා ප්‍රමාණවත් ජල සැපයුමක් ලබා ගැනීම තහවුරු කර ගැනීම පිණිස සභාව විසින් යම් ව්‍යවස්ථාපිත ජල සැපයුම් ව්‍යවසායයක් සමග ගිවිසුමකට ඇතුළත් විය හැකි ය.

(ii) ව්‍යවස්ථාපිත ජල සැපයුම් ව්‍යවසායයක් විසින්, එවැනි ව්‍යවසායවල සැපයුම් ප්‍රදේශය ඇතුළත හටගත හැකි යම් ගින්නක් නිවීමට ජලය සැපයීමට හැකි වනු පිණිස, ඉතාම පහසුවෙන් ජලය සැපයීමට හැකි ස්ථානවල ප්‍රධාන ජලනළ වන ගිනි නිවන ජලනළ ඇති කිරීමට කටයුතු කළ යුතු ය. පැහැදිලිව පෙනෙන දැන්වීමක් හෝ සළකුණක් ප්‍රදර්ශනය කර වීමෙන් එවැනි ගිනි නිවන ජලනළ පිහිටීම ව්‍යවස්ථාපිත ජල සැපයුම් භාරකරුවන් විසින් පෙන්නුම් කරවීමට සැලැස්විය යුතු අතර එවැනි එක් එක් ස්ථානයක එහි යතුරද තැන්පත් කර තිබිය යුතු ය.

05. (i) කිසිදු ස්ථානයක්, ඒ ස්ථානය වෙනුවෙන් ප්‍රධාන නිළධාරියා විසින් නිකුත් කරන ලද ගිනි සහතිකයක් තිබේ නම් මිස, සහ තත් කාලයෙහි වලංගුව පවත්නේ නම්, මිස කර්මාන්ත ශාලාවක්, සාප්පුවක්, කාර්යාලයක් හෝ ආරෝග්‍ය ශාලාවක්, ව්‍යාපාරික ස්ථානයක් ලෙස මහල් ගොඩනැගිල්ලක් භාවිතා කරනු නොලැබිය යුතු ය.

(ii) ඒ පරිශ්‍රයෙහි පහත සඳහන් අවශ්‍යතාවයන්, එනම් :-

(අ) ආරක්ෂා සහිතව ගමන් කළ හැකි දුරක් ඇතුළත් ප්‍රමාණවත් තරම් ගින්නෙන් බේරීමේ තැන් හා පිටවීමේ තැන් තිබෙන බවට,
(ආ) මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් හා ප්‍රමාණවත් ගිනි නිවීමේ සේවා අංගෝපාංග තිබීම සහ එය විසින්ම ගින්නක් නිවා දැමීමේ ක්‍රියාවේ යෙදීමට වැඩ පිළිවෙළක් යොදා ඇති බවට,
(ඇ) පදිංචිව සිටින්නන්ට අනතුරු දැන්වීමේ ක්‍රියාශීලි වැඩ පිළිවෙළක් යොදා ඇති බවට,
(ඈ) ගොඩනැගිල්ලේ ගින්නට ඔරොත්තු දීමේ හැකියාවක් තිබෙන බවට, සහ
(ඉ) සාමාන්‍ය ගිනි පූර්වාරක්‍ෂ ඇති බවට,

ප්‍රධාන නිළධාරියා සෑහීමට පත් වන්නේ නම් මිස, ගිනි සහතිකයක් ලැබීමට කිසිදු තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද යම් පරිශ්‍රයක අයිතිකරුට, බදුකරුට හෝ පදිංචිකරුට, ඒ පරිශ්‍රය තුළ ඇති කිරීම අවශ්‍ය යැයි ප්‍රධාන නිළධාරියා විසින් සලකනු ලබන තත්ත්වයන්ට අනුකූල වන තත්ත්වයක් එහි ඇති කරන ලෙස ලිඛිත දැන්වීමක් මගින් ප්‍රධාන නිළධාරියා විසින් නියම කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

06 ප්‍රසිද්ධ රඟ දැක්වීම සඳහා පාවිච්චි කරන සිනමාහල්, රඟහල් සහ වෙනත් ස්ථාන වෙනුවෙන් ප්‍රසිද්ධ රඟ දැක්වීම් අතුරු ව්‍යවස්ථාවල සඳහන් ගිනි ආරක්‍ෂක විධිවිධානයන් මෙම කොටසට ද අදාළ විය යුතු ය.

*ගොඩනැගිලි සඳහා ගිනි ආරක්‍ෂක නියමයන් ඃ*

07 සභාව විසින් නියම කරනු ලැබූ හෝ වෙනත් ලිඛිත නීතියකින් නිශ්චිතව සඳහන් කරනු ලැබූ නියමයන්ට අමතරව, නේවාසික කාර්යය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලක් හැරෙන්නට, වෙනත් යම් ගොඩනැගිල්ලක්, පහත දැක්වෙන නියමයන් සඳහා ප්‍රමාණවත් විධිවිධාන සැලැස්වෙන ආකාරයට ඉදි කරනු ලැබිය යුතු ය.

01. (අ) තට්ටු නිවාසවලට, කාර්යාලවලට, රෝහල්වලට, අවන්හල්වලට, පාසැල්වලට සහ ලැගුම්හල්වලට පැය එකක ගිනි ප්‍රතිරෝධකයක් සැලැස්විය යුතු ය.

(ආ) සිල්ලර සාප්පුවලට, පැක්ටේරිවලට, කර්මාන්ත ශාලාවලට, සහ ඊට සමාන ගොඩනැගිලිවලට පැය දෙකක ගිනි ප්‍රතිරෝධකයක් සැලැස්විය යුතු ය.

(ඇ) බඩු ගබඩා සහ ගබඩාවලට පැය හතරක (04) ගිනි ප්‍රතිරෝධකයක් සැලැස්විය යුතු ය.

02. (අ) ගණ මීටර් 2833 ට වැඩි වූ පරිමාවකින් යුත් යම් ගොඩනැගිල්ලක සිට වෙනත් යම් ගොඩනැගිල්ලකට මීටර් 03 කට නොඅඩු අතරතුර දුරක් සඳහා, ඉඩකඩ සැලැස්විය යුතු ය. වෙනත් ගොඩනැගිල්ලක සිට ඇති මෙම දුර ප්‍රමාණයෙහි යම් අඩු කිරීමක් කරන්නේ නම්, බාහිර බිත්තියේහි ගිනි ප්‍රතිරෝධකය සෑම සෙන්ටි මීටර් 61 ක් සහ ඉන් කොටසක් සඳහා පැය 1/2 කින් වැඩි කරනු ලැබිය යුතු ය. කෙසේ කිසිදු ස්ථානයක දුර ප්‍රමාණය මීටර් 91 කට වඩා අඩු නොකරනු ලැබිය යුතු ය.

(ආ) ඝණ මීටර් 2833 ට වැඩි වූ පරිමාවකින් යුත් යම් ගොඩනැගිලිවල බාහිර බිත්තිවල ඒ ගොඩනැගිලි එක එකක් අතර මීටර් 4.5 ක් අවම දුර ප්‍රමාණයක් සලසා ඇත්තේ නම් හැර, විවරයක් සඳහා ඉඩකඩ නොසැලැස්විය යුතු ය.

03. (අ) පහත දැක්වෙන වක්‍රයේ ලැයිස්තු ගත කර ඇති ලෙස එක් දොරක් සඳහා අවසර දෙනු ලබන උපරිම අධිවාස බර ප්‍රමාණයට වඩා මුළු අධිවාස බර ප්‍රමාණයකින් යුතු කාමරයකින් හෝ ආවරණය කල ඉඩමකින් පිටවන ස්ථානය කරා විහිදෙන එකිනෙකින් වෙන්ව පිහිටියා වූ යටත් පිරිසෙයින් දොර විවරයන් දෙකක්වත් තිබිය යුතු ය.

| අනු අංක | අධිවාස වර්ගය | එක් දොරක් සමඟ උපරිම අධිවාස බර ප්‍රමාණය |
|---|---|---|
| 01 | අධික උපද්‍රව්‍ය | 10 |
| 02 | ගුදම්, ගබඩාකරන ගොඩනැගිලි | 50 |
| 03 | සාප්පු, අංශවලට බෙදූ ගබඩා සහ ව්‍යාපාරික ස්ථාන | 75 |
| 04 | අධික උපද්‍රව රහිත පැක්ටරි ගොඩනැගිලි | 50 |
| 05 | අධ්‍යාපනික ගොඩනැගිලි | 75 |
| 06 | රෝහල් | 25 |
| 07 | හෝටල්, කෑම දෙන නිවාස, ලැගුම්හල් ආදිය | 20 |

(i) රෝහල්වල හැර ඉහත සඳහන් වර්ගවලට අයත් කිසිදු තැනැත්තකු විසින් ගොඩනැගිල්ලේ කවර හෝ ස්ථානයක සිට පිටවන ස්ථානය දක්වා මීටර් 30 ට වැඩි දුර ප්‍රමාණයක් ගමන් නොකළ යුතු ය.

(ii) රෝහල් සම්බන්ධයෙන් වන විට කිසිදු තැනැත්තකු විසින් ගොඩනැගිල්ලේ කවර හෝ කොටසක සිට වුවද පිටවන ස්ථානයක් කරා මීටර් 15 ට වැඩි දුර ප්‍රමාණයක් ගමන් නොකළ යුතු ය.

(iii) ඉහත දැක්වෙන චක්‍රයේ සඳහන් කරන ලද ''අධ්‍යාපනික ගොඩනැගිලි'' හැර කවර හෝ පාසැල් පන්ති කාමරයකට යටත් පිරිසයෙන් පිටවන ස්ථාන 02 ක් වත් තිබිය යුතු ය.

(අ) මීටර් 12 ට වඩා උසින් වැඩි වූ සෑම ගොඩනැගිල්ලකම,සෑම මහලක් සඳහාම යටත් පිරිසයෙන් නිදහස් පිටවෙන ස්ථාන දෙකකවත් තිබිය යුතු ය. තව ද, ජනයා සේවයෙහි යොදවනු ලැබ ඇත්තා වූ හෝ ජීවත් වන්නා වූ හෝ පළමුවන මහලට ඉහලින් වූ යම් මහලක් සඳහා ගැලැවීමේ උපක්‍රමයක් සලස්වා තිබිය යුතු ය. රබර්, කොප්පරා, පුළුන්, කොහු, ලෑලි පෙට්ටි, දැව, සායම් වර්ග, කැල්සියම් කාර්බයිට්, ඛණිජ තෙල් නිෂ්පාදන තබා ඇති ගොඩනැගිල්ලේ කවර හෝ කොටසකට ඉහලින් ඇති යම් අංගනයක් නේවාසික කාර්ය සඳහා භාවිතා කිරීමට අවසරය ලබා නොදිය යුතු ය.

(ආ) සියලු පිටවන ස්ථාන සහ ඇතුළුවීමේ පහසුකම් පහත දැක්වෙන ලෙස ස්ථානගත කර තිබිය යුතු ය.

(i) ඒවා පැහැදිලිව පෙනෙන්නට තිබිය යුතු ය. නැතහොත්, ඒවායේ ස්ථානගත කිරීම පැහැදිලිව පෙන්නුම් කරනු ලැබ තිබිය යුතු අතර, සියලු වේලාවන්හිම ප්‍රවේශම් වීමට සුදානම් කර සහ අවහිර කරනු නොලැබිය යුතු ය.

(ii) ගොඩනැගිල්ලක මහලකින් පිටවන ස්ථාන 01කට වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වන විට, හැකිතාක් දුරට ප්‍රායෝගිකව, එක් එක් පිටවන ස්ථානය එකිනෙකින් දුරස්ථව පිහිටුවනු ලැබිය යුතු ය. තරප්පු පෙළවල්වලට ඇති දොර විවරයන් විවෘත කිරීමට පිටවන තල්ලු කරන වර්ගයේ ඒවා විය යුතු ය.

(04) (අ) ගිනි නිවීම සඳහා ප්‍රවේශය -

මීටර් 12 ට වැඩි උසකින් යුත් මහල් මට්ටමක් සහිත ගොඩනැගිලිවලට බිම් මට්ටම ඉහලින් මීටර් 12 ට වඩා වැඩි නොවූ උසකින් යුත් හෝ පරිමාව ඝන මීටර් 2833 ට වඩා වැඩි නො වූ මහල්වලට ගිනි නිවීමේ සහ ජීවිත බේරා ගැනීමේ උපකරණ ඇතුළ් කිරීමට ඉඩකඩ සැලැස්වීම පිණිස, මීටර් 3.65 ක් පළලින් යුක්ත වූ ද, මීටර් 4.6 ක උසකින් යුක්ත වූ ද, ඉදිරියට යා හැකි අවහිරයෙන් තොර ප්‍රවේශයක් සලසා තිබිය යුතු ය. අවහිරයෙන් තොර ප්‍රවේශයක් ඇතුළු එවැනි ඉඩකඩක් පූර්ණ සේවක පිරිස ද සමඟ, ගිනි නිවන හා ජීවිත බේරා ගැනීමේ උපකරණවල බර දරා සිටීමට තරම් ප්‍රමාණවත් ලෙස ශක්තිමත් විය යුතු ය.

(ආ) නැඟුම් මූලික නල -:

(i) පොළොව මට්ටමට ඉහලින් මීටර් 13 කට නොවැඩි උසකින් යුත් යම් මහලක බිම් මට්ටම සහිත ගොඩනැගිල්ලකට වියලි නැඟුම් මූලික නලයක් සවිකළ යුතු අතර මීටර් 13 කට වැඩි උසකින් යුත් ගොඩනැගිල්ලකට තෙත් නැඟුම් මූලික නලයක් සඳහා විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(ii) ගිනි සේවා වාහනවලින් ජලය පොම්ප කිරීම සඳහා නැඟුම් මූලික නල (වියලි සහා තෙත්) දෙකටම, එකකට දෙක බැගින් ඇතුළ් ප්‍රවිශ්ඨ සලස්වා තිබිය යුතු ය. එවැනි ඇතුළ් ප්‍රවිශ්ඨ ආපසු නොයන වැල්වලින් යුත්ත විය යුතු අතර, විශ්කම්භය සෙන්ටිමීටර් 1.2 ක ප්‍රමාණයේ ක්‍ෂණික ක්‍රියාකාරිවන වර්ගයේ පුරුෂ ඇදත්තන් ඊට සවිකළ යුතු ය. ඉහත 04-අ ඡේදයට අදාළ වන පරිදි ගිනි නිවන යන්ත්‍ර සඳහා වූ ප්‍රවේශ මාර්ග මේ ප්‍රවිශ්ඨ වලට සපයා තිබිය යුතු ය.

(iii) ප්‍රධාන නිළධාරියා විසින් අනුමත කරන ලද ස්ථානයන්හි පමණක් නැඟුම් මූලික නල සලස්වා තිබිය යුතු ය.

(iv) සෙන්ටි මීටර් 06 ක ප්‍රමාණයේ ගිනි නිවීමේ නළ ක්ෂණික ක්‍රියාකාරි වන පුරුෂ ඇඳුක්කකය සවිකළ යුතු පාලනය කළ හැකි බසින වැල්ව එක් එක් නැඟුම් මූලික නළයකට සවිකළ යුතු ය. වර්ග ප්‍රමාණය වර්ග මීටර් 1858 කට වඩා බිම් ප්‍රමාණයකට එක් බසින වැල්වයක් සැපයිය යුතු ය. එක් එක් වර්ග මීටර 1858 ක හෝ ඉන් කොටසක වර්ග ප්‍රමාණයක් සඳහා එක් එක් ප්‍රධාන

නලයකට අතිරේක වැල්ලයක් බැගින් සපයා තිබිය යුතු ය. බිම් මහලේ ඉහළින් ඇති එක් එක් මහලේ නැඟුම් මූලික නලයෙන්, බිම් මට්ටමෙන් මීටර් 91 ක් උසින් එවැනි පිටවාන ඇති කළ යුතු ය.

(v) මීටර් 36.5 කට වැඩි උසකින් යුත් ගොඩනැගිලිවලට සෙන්ටි මීටර් 15ක විශ්කම්භයෙන් යුත් නල සැපැයිය යුතු ය.

(vi) තෙත් නැඟුම් මූලික නල 11 වන උපලේඛනයේ 'ඈ' වගුයේ දැක්වෙන පරිදි ජල සම්පාදනයට සම්බන්ධ කළ යුතු අතර, සෙන්ටි මීටර් 125 ක විශ්කම්භය ඇති නැසින්නක් සෙන්ටිමීටර් 06 ක නල සවි කළ කල්හි උසම මහලයේ වර්ග මිලිමීටර් 645 කට කිලෝ ග්‍රෑම්ස් 13.5 ක පීඩනයක් ඇති කිරීමට පොම්ප කිරීමේ ඒකකයට සැලැස්විය යුතු ය.

(i) සවි කිරීම පිළිගත් විධිවිධාන සංග්‍රහයකට හෝ පිළිවලකට අනුව විය යුතු ය.

(අ) හයිඩ්‍රොලික් හෝස් ප්‍රධාන නල -

(i) මීටර් 30 කට වැඩි උසකින් යුත් ගොඩනැගිලිවල සෑම මහලකම

(ii) කර්මාන්ත ශාලාවල -

(iii) වර්ග මීටර් 371.5 ට වැඩි ගබඩා ගෙවල්වල යටත් පිරිසයෙන් එක් හයිඩ්‍රොලික් හෝස් නලයක් සඳහා ඉඩකඩ සලස්වා තිබිය යුතු ය. නලය දිගින් මීටර් 30ට වැඩි නොවිය යුතු, මීටර් 18, සෙන්ටි මීටර් 2.5 විශ්කම්භය ඇති බොකු නැම්මෙන් තොර සවිමත් කළ රබර් වලින් විය යුතු අතර, මිලි මීටර් 4.8 හෝ 6.3 විශ්කම්භයෙන් යුත් නැසින්නකින් සමන්විත වැසෙන ශාකාවලින් අවසන් වන එකක් විය යුතු ය. නැසිනයේ කෙලෙවර පීඩනය මිනිත්තුවකට ලීටර් 2279 බැගින් වූ ප්‍රමාණයකින් මීටර් 06 ට නොඅඩු විදීමක් ඇති කරවන ප්‍රමාණයකින් විය යුතු ය. නළයේ රිලය ප්‍රධාන නිළධාරියා විසින් අනුමත කරනු ලබන ස්ථානයක ස්ථිරව තබා තිබිය යුතු ය.

(ආ) ගිනි සීනුව.-

ස්වංක්‍රීයව හෝ අතින් ක්‍රියා කරවන වර්ගයේ ගිනි සීනු පහත සඳහන් ස්ථානයන්හි සවි කරනු ලැබිය යුතු ය.

(i) වර්ග මීටර් 3716 කට වැඩි බිම් ප්‍රමාණයකින් යුත් ගොඩනැගිල්ලක්,
(ii) යම් උස් ගොඩනැගිල්ලක්.-

අතින් ක්‍රියාකරවන ගිනි සීනු ක්‍රමයක් සම්බන්ධයෙන් වන විට, පහත දැක්වෙන දෑ සැපයිය යුතු ය.

(i) කැඳවුම් ලක්‍ෂ්‍යයන් රතු පාට කර තිබිය යුතු ය.

(ii) වීදුරු ආවරණය කඩන තුරු, කැඳවුම් ලක්‍ෂ්‍යයක් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන පරිදි වීදුරු ආවරණයක් සපයා තිබිය යුතු ය.

(iii) ක්‍රියා කරවන ක්‍රමය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.

(iv) සීනුව නාද කරන තැනැත්තකු විසින් අතපතගෑමට පිළිවන් වන ලෙස විදුලි බල සහිත ලක්‍ෂයක් අනාවෘත්තව නොතැබිය යුතු ය.

(v) ගොඩනැගිල්ලේ මිනිසුන් සිටිය හැකි සියලුම කොටස්වලට කැඳැවුම් ලක්‍ෂයක් ඇති කර තිබිය යුතු අතර, සීනුව නාද කරවීම පිණිස පරිශ්‍රයේ යම් ස්ථානයක සිට කිසිදු තැනැත්තකුට මීටර් 30 කට වැඩි දුරක් ගමන් කිරීමට අවශ්‍යතාවක් ඇති නොවන ලෙස ඒවා ස්ථාන ගත කර තිබිය යුතු ය.

(vi) කැඳවුම් ලක්‍ෂ්‍යයක් පිටවන මාර්ගවල ස්ථානගත කළ යුතු අතර, විශේෂයෙන්ම මහල්වල හෝ තරප්පු පෙළේ මහලට බසින ස්ථානයන්හි විය යුතු ය.

ඒවා මහලේ බිම් මට්ටමේ සිට මීටර් 1.4ක් උසින් පහසුවෙන් ලඟා විය හැකි හොඳින් ආලෝකමත් කළ ස්ථානයන්හි සවිකළ යුතු ය.

(vii) කැඳවුම් ලක්‍ෂ්‍යයක් ක්‍රියාත්මක කළ විට, කැඳවුම් ආරම්භ වූ ප්‍රදේශය ක්ෂණිකව පෙන්නුම් කරන පරිදි බිම් මහලේ මධ්‍ය ලක්‍ෂ්‍යයක දර්ශක පද්ධතියක් සවිකළ යුතු ය.

(ඇ) ස්ප්‍රින්ක්ලර් ක්‍රමය.- බිම් ප්‍රමාණය වර්ග මීටර් 1350 ට වැඩි නිවාසවලට ස්ප්‍රින්ක්ලර් සවි කිරීම සලකා තිබිය යුතු ය.

(i) එවැනි ක්‍රමයක් සඳහා වූ සැලැසුම් වැඩ ආරම්භ කිරීමට මත්තෙන් අනුමැතිය සඳහා ප්‍රධාන නිළධාරියට ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, හා ඒ අනුමැතිය යථා පරිදි ලබාගෙන ඇත්තේ නම් මිස, කිසිදු තැනැත්තකු විසින් සවි කිරීම ආරම්භ නොකල යුතු ය.

(ii) ස්ප්‍රින්ක්ලර් ක්‍රමය සවි කිරීම සඳහා හෝ පුලුල් කිරීම සඳහා වූ සැලැසුම්, ප්‍රධාන නිළධාරියා විසින් අනුමත කරන ලද සුදුසුකම්ලත් වෘත්තීය ඉංජිනේරුවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, දෙපිටපතකින් යුතුව, සවි කිරීම භාර ගන්නා නියෝජිතායතනය විසින් අත්සන් කොට ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) අතේ ගෙන ගිය හැකි ගිනි නිවනයක්.-

අතේ ගෙන ගිය හැකි ගිනි නිවනයන් අවශ්‍ය බව ප්‍රධාන නිළධාරියා විසින් අනුමත කරනු ලැබූ කල්හි පහත දැක්වෙන උපකරණ සවිකළ යුතු ය.

(i) බිම් වර්ග ප්‍රමාණයේ එක් එක් වර්ග මීටර් 209 කට හෝ ඉන් කොටසකට ලීටර් 9.09 එකතු ධාරිතාවක් එක් එක් මහලකට ඇති වනසේ අනුමත අතේ ගෙන ගිය හැකි ජල වර්ගයේ ගිනි නිවනයක්, එනමුත්, එක්එක් මහලක ධාරිතාවය ලීටර් 18.18 ට නොඅඩු විය යුතු ය.

(ii) සෑම විට ජලයෙන් පුරවන ලද බාහාලු උඩ සවිකරන ලද අනුමත, අතේ ගෙන යා හැකි, අතින් ක්‍රියාකරවන ගිනි නිවන පොම්ප බිම් වර්ග ප්‍රමාණයේ එක් එක් වර්ග මීටර් 209 ට හෝ ඉන් කොටසකට ලීටර් 9.09 එකතු ධාරිතාවක් එක් එක් මහලකට තිබිය යුතු අතර, එක් එක් මහලට එය ලීටර් 18.18 කට අඩු නොවිය යුතු ය.

(iii) ඒකක ධාරිතාව ලීටර් 9.09 ට නොඅඩු (රතු සායම් ආලේප කළ) පනිට්ටු, ඒ පනිට්ටු සෑම විටම වතුරෙන් පුරවා තිබිය යුතු අතර, සෑම මහලකම පනිට්ටු 06 (හයකට) නොඅඩු ගණනක් තිබීමේ කොන්දේසියට යටත්ව සෑම වර්ග මීටර් 209 ට හෝ ඉන් කොටසකට පනිට්ටු තුන (03) බැගින් තිබිය යුතු ය.

(ඉ) ඉහත (ඈ) වගන්තිය ප්‍රකාරව උපකරණ සැපයීමේ දී, ප්‍රධාන නිළධාරියා විසින්, තම අභිමතය පරිදි, 111 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සම්මතයන් අදාළ කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

08 (1) අභ්‍යන්තර පියගැටපෙළ, ගොඩනැගිලිවල යම් මහල් මට්ටමකට ඇතුල්විය හැකි වන පරිදි පිළියෙල කළ යුතු ය. මහලට බසින ස්ථාන,පඩිපෙළට සමාන පළලකින් විය යුතු එක් එක් තරප්පුවක මුදුනෙත් සහ පතුලේ ද සලස්වා තිබිය යුතු ය. තරප්පුව, 16 ට වැඩි නොවූ නගින පඩි වලින් සමන්විත විය යුතු අතර, ඒවා වක්‍ර නොවී ඍජුවම තිබිය යුතු ය.එක් එක් පඩිය, සෙන්ටිමීටර් 25 කට නොඅඩු පළලකින් යුත්ත පියගැට සමඟ සෙන්ටි මීටර් 19 කට නොඅඩු උසකින් විය යුතු ය. සියලු පියගැට පෙළවල දෙපසෙහිම, උසින් මීටර් 01 ට නොඅඩු ආරක්ෂිත අත්වැල සපයා තිබිය යුතු අතර, මහල්වලට බැසීමේ ස්ථාන බැසීමේ මට්ටමට හරි කෙලින් සිටින සේ ගිණුම් ගත කර තිබිය යුතු ය. පියගැටපෙළවල්, ගොඩනැගිල්ලේ අනෙක් කොටස්වලට සපයා ඇති, ගිනි ප්‍රතිරෝධක උපකරණවලට සමාන උපකරණවලින් සම්පූර්ණයෙන්ම ආවරණය කර තිබිය යුතු ය. ඇතුල්වන ස්ථාන සහ පිටවන ස්ථාන හැරෙන්නට පියගැට පෙළවල්වලට කෙළින්ම ඇතිවන විවරයන් සඳහා ඉඩදෙනු නොලැබේ. ඇතුල්වන ස්ථාන සහ පිටවන ස්ථාන වූ විවරවලට ගිනි ප්‍රතිරෝධක, දුම නවත්වාලන, පිටට විවෘත වන හා ඉබේ වැසෙන දොරක් සපයා තිබිය යුතු ය.

(02) (අ) මහල් තුනකට (03) වඩා ඇති ගොඩනැගිලිවලට හා මහලක බිම් මට්ටම උසින් මීටර් 12 ට වැඩි අවස්ථාවක,ගිනි නොගන්නා සුළු ද්‍රව්‍යයකින් සාදන ලද පඩිපෙළක් (ගින්නෙන් බේරී යාමට පඩිපෙලක්) සපයා තිබිය යුතු අතර, එය පිළියෙල කළ යුත්තේ ඒ ගොඩනැගිල්ලේ සිටින යම් තැනැත්තකුට, ඒ ගොඩනැගිල්ලේ දුරම ස්ථානයේ සිට ගින්නෙන් බේරෙන පඩිපෙළට ගමන් කිරීමට ඇති දුර ප්‍රමාණය මීටර් 30 ට නොවැඩි වන ආකාරයට තනා තිබිය යුතු ය.

(ආ) බාහිර ගින්නෙන් බේරන පඩිපෙළක සිට බිත්තිවල සිට මීටර් 1.5 ක දුර ප්‍රමාණයක් ඇතුළත් විවරයක් තනා නොතිබිය යුතු ය. එක් එක් මහල් මට්ටමේ සිට මෙම ගින්නෙන් බේරණ පඩිපෙළවල්වලට ඇතුල් විමට සාදා ඇති විවරයක්, ඉහත (අ) වගන්තියේ අභ්‍යන්තර පියගැටපෙළවල් සඳහා නියම කර ඇති නියමයන්ට අනුකූලව තිබිය යුතු ය.

(03) මෝටර් චෙම්බරය සම්පූර්ණයෙන්ම ගිනි නොගන්නා ද්‍රව්‍යකින් ආවරණය කරනු ලැබ, කම්බි සහ කේබල් ඇදීම පිණිස වූ අවශ්‍ය විවරයන් සඳහා හැර, විදුලි සෝපාන කවුළුවෙන් වෙන් කර තැබිය යුතු ය. වර්ග සෙන්ටිමීටර් 929 ට අඩු නොවූ ප්‍රමාණයේ පිටට විවෘත වූ දුම පිටවානයක් සලසා තිබිය යුතු ය.

(04) (අ) ගොඩනැගිල්ලේ ඉහලම මහලට වහලක් නොසපයා ඇති නමුත්, එය පහත දැක්වෙන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අවස්ථාවක සහ එහි නිදාගැනීමේ කාර්යය සඳහා රාත්‍රී කාලයේ පදිංචි වීමක් නොමැති අවස්ථාවක, එවැනි කොටස් ගොඩනැගිල්ලේ මහලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(i) මහල මත පිහිටි උද්‍යානය
(ii) හිරු රැස්විදින නිවසක්
(iii) කුඩා කුටියක්
(iv) මෝටර් කාමරයක්

(ආ) බේරා ගැනීමේ උපකරණ ක්‍රියාකාරි විය හැකි වන පරිදි ඉහළ මහලට ප්‍රවිශ්ඨ වීම ඒ ගොඩනැගිල්ලේ අවහිර නොකරන ලද ඉදිරිපසක් තිබීමට සහ වෙනත් යම් පැත්තක් තිබීමට යටත්ව, බේරාගැනීමේ උපකරණ ඉස්සීම පිණිස දෙපැත්තක් තිබීමේ අවශ්‍යතාව තේරුම්ගෙන තිබිය යුතු ය.

09 (iv) වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩ වෙළෙඳාම සහ ව්‍යාපාර සඳහා තබා ගැනීම සහ වෙනත් යම් කාරණයක් සඳහා තබා ගැනීම සහ ඒ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති වෙළෙඳාම් සහ ව්‍යාපාර ද ගිනි අවදානම් ගැන සැලකීමේ දී අන්තරාදායක ලෙස ප්‍රකාශ කරනු ලැබේ. (iii වන උපලේඛනය) මෙම පරිශ්‍රයක් ප්‍රධාන නිළධාරියා විසින් වාර්ෂිකව පරීක්ෂා කර බැලීමට යටත් වේ. එවැනි පරිශ්‍රවල අයිතිකරුවන් විසින් ප්‍රධාන නිළධාරියා සෑහීමට පත්වන ආකාරයට එහි ප්‍රමාණවත් ගිනි වැලැක්වීමේ ක්‍රම සපයා තිබිය යුතු ය.

10. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරන ලද කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත්,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1000/= ක් නොඉක්මවන දඩයකට ද,
ii. දෙවනි වර කරන ලද වරදක් වෙනුවෙන් නම්, රු. 2000/= ක් නොඉක්මවන දඩයකට ද,
iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250.00ක්) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,මෙම අතුරු ව්‍යවස්ථාවල :

(i) ''ප්‍රධාන නිළධාරියා'' යන්නෙන් සභාවේ ගිනි නිවීමේ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිළධාරියා අදහස් වේ.
(ii) ''ගිනි නිවන හමුදාව'' යන්නෙන්, මහා නගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ගිනි නිවන හමුදාව අදහස් වේ.

I වැනි උපලේඛනය

08 වැනි වගන්තිය

| අනු. අංක | ගිනි ප්‍රතිරෝධක අවශ්‍යතාවයන් | පැය 1/2 | පැය 01 | පැය 02 | පැය 04 |
|---|---|---|---|---|---|
| 01 | බිත්ති සහ වෙන් කිරීම්, | | | | |
| | (අ) ඝන ගඩොල්, මැටි, කොන්ක්‍රීට් ඝණකම සෙන්ටි මීටර්වලින් | 11 1/2 | 11 1/2 | 21 1/2 | 21 1/2 |
| | (ආ) ශක්ති වර්ධිත කොන්ක්‍රීට් ඝණකම සෙන්ටි මීටර්වලින් | 7 1/2 | 7 1/2 | 10 | 15 |
| | (ඇ) මැඳ කුහර සහිත කොන්ක්‍රීට් බ්ලොක්ස් සෙන්ටි මීටර්වලින් | 6 1/2 | 7 1/2 | 11 | 21 1/2 |
| 02 | මහල් සහ වහල ඝණ ශක්ති වර්ධිත - ඝණකම මීටර්වලින් | 09 | 10 | 13 | 15 |
| 03 | ආර්. එස්. එස්. කොන්ක්‍රීට් ඝණකම සෙන්ටි මීටර්වලින් | 2 1/2 | 2 1/2 | 05 | 06 |
| 04 | දොර සහ ජනෙල් ඝණකම සෙන්ටි මීටර්වලින්<br>(අ) ඝන දැව<br>(ආ) ප්ලයිවුඩ් | 1 1/4<br>4 1/2 | 2 1/2<br>05 | 05<br>- | 05<br>- |

II වැනි උපලේඛනය

උස් සහ වෙනත් ගොඩනැගිලි සඳහා වූ වතුර ටැංකිවල ධාරිතාවයට අදාළ චක්‍රය

| අනු. අංක | විස්තරය | වර්ග මීටර් 465 දක්වා බිම් වර්ග ප්‍රමාණය | වර්ග මීටර් 465 සිට 929 දක්වා බිම් වර්ග ප්‍රමාණය | වර්ග මීටර් 299 වැඩි බිම් වර්ග ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | තනි මහළ | ලීටර් 22,750 | ලීටර් 34,125 | සෑම අතිරේක වර්ග මීටර් 465 දක්වා බිම් වර්ග ප්‍රමාණයක් සඳහා ජලය ලීටර් 9.100 බැගින් වූ ප්‍රමාණයකින් ලීටර් 45,500 |
| 02 | මහල් 01 සිට 10 මහලකට | ලීටර් 13,650 | මහලකට ලීටර් 15,925 | මහලකට ලීටර් 18,200 |
| 03 | මහල් 10 ට වැඩියෙන් ඇති ගොඩනැගිලි | ඉහත (ආ)ට අමතරව මහලකට ලීටර් 11,375 | ඉහත (ආ)ට අමතරව මහලකට ලීටර් 9,100 | ඉහත (ආ)ට අමතරව මහලකට ලීටර් 9,100 |

III වැනි උපලේඛනය

සටහන්.- (1) විදුලි උපකරණවලින් සමන්විත වූ හෝ පහත සටහන් 03 නේ පරිදි බඩු/ද්‍රව්‍ය ගබඩා කර හෝ ඒවා භාවිතයට ගන්නා ස්ථානයක කොටස්වල, පහත දැක්වෙන චක්‍රයේ පළවන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වර්වලින් පෙන්වා දි ඇති පදනම මත සුදුසු අනුපාතයකින් භාණ්ඩ තෝරා ගැනීම උචිතය ඃ

(2) ඉහත සඳහන් කළ විවිධ භාණ්ඩවල යම් සංයෝජනයක් කරනු ලැබිය හැකි ය.

(3) ''අ'' පංතියේ විසංදේහ -ඃ දර, කඩදාසි, රෙදිපිළි, වසේ බඩුමුට්ටු සහ වෙනත් අංගාරමිශ්‍රිත ද්‍රව්‍ය,
''ආ'' පංතියේ විසංදේහ -ඃ පැට්‍රල්, තෙල් වර්ග, පැරපින්, සුදු ස්ප්‍රීතු, සායම් වර්ග, ලැකර්, වාර්නිස්, එනමල්, ග්‍රීස්, මේද, තාර, ද්‍රාවක සහ මද්‍යසාර වැනි ගිනි ඇවිලෙන සුලු ද්‍රව්‍ය වර්ග.
''ඇ'' පංතියේ විසංදේහ -ඃ කාර්, ලොරි, බස්, ට්‍රැක්ටර්, සුළු විදුලි සහ කුඩා පැට්‍රල් විසංදේහ.

| විස්තරය | වතුර පනිට්ටුව | ජල වර්ගයේ |
|---|---|---|
| ගිනි නිවනයක්<br>(i) (ඇ) ශීර්ෂය | | (i) (අ) ශීර්ෂය සහ අතේ ගෙනගිය හැකි අතින් ක්‍රියා කරවන ගිනි නිවන පොම්ප<br>(ii) (ආ) ශීර්ෂය |
| | පිළිගත හැකි නැවත සැපයීම් විසන්දේහ පනිට්ටු තුනක් සඳහා එක් එක් ලීටර් 9 ගිනි නිවනය පංතිය (3 වන සටහන) පනිට්ටු එකක් හෝ ගෙන යා හැකි අතින් ක්‍රියාකරවන ගිනි නිවන පොම්පයක් සඳහා<br><br>(i) ''අ'' පංතියේ ගිනි 3x9.9 ලීටර පනිට්ටු<br><br>(ii) ''ආ''පංතියේ ගිනි 1x9.9 ලීටර පෙන ගිනි නිවනයක් | 1x9.9 ලීටර් ජල වර්ගයේ ගිනි නිවනයක්<br><br>(i) කිලෝ ග්‍රෑම් 2.27 වියළි රසායනික කුඩු සහිත ගිනි නිවනයක්<br><br>(ii) කිලෝ ග්‍රෑම් 2.27 කාබන්ඩයොක්සයිඩ් ගිනි නිවනයක්<br>(iii) ලීටර් 4.5 සිට්සි ගිනි නිවනයක්<br>(iv) ලීටර් 4.5 වාෂ්පීකරණ ද්‍රව ගිනි නිවනයක් |
| | (iii) 'ඇ' පංතියේ කි.ග්‍රෑම් 1x1.25 කාබන්ඩයොක්සයිඩ් ගිනි නිවනයක් | (i) ලීටර් 1.25 සිට්සි ගිනි නිවනයක්<br>(ii) කිලෝ ග්‍රෑම් 1.125 රසායනික ගිනි නිවනයක්<br>(iii) ලීටර් 1.25 වාෂ්පීකරණ ද්‍රව ගිනි නිවනයක් |

සටහන්.- 2. (අ) විදුලි උපකරණ පමණක්ම ඇති අවස්ථාවක, යටත් පිරිසෙයින් කිලෝ ග්‍රෑම් 1.36 හෝ ලීටර් 1.137 ගිනි නිවීමේ ද්‍රව්‍ය අඩංගු ලීටර් 1.137 අනුමත කළ කාර්බන් ටෙට්‍රක්ලෝරයිඩ් හෝ මිකොලොප්‍රොමෝමේකේන් ගිනි නිවනයක් එක් පිනිට්ටුවක් සඳහා පිළිගත හැකි නැවත යෙදීමක් ලෙස සළකනු ලැබේ.

(ආ) ගින්නක් ඇතිවූ අවස්ථාවක දී පහසුවෙන් ඒ වෙත ළඟාවිය හැකි පරිද්දෙන් සහ වහාම ලබාගත හැකි පරිද්දෙන් වූ ස්ථානයන්හි ගිනි නිවනයක් පිහිටුවනු ලැබිය යුතු ය. ඒවා සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගන්නා මෙන් මාර්ග දිගේ සවි කරනු ලැබිය යුතු ය. ගිනි නිවනයක් කරා යම් තැනැත්තෙකුට මීටර් 15ට වඩා ගමන් කිරීමට අවශ්‍ය නොවිය යුතු ය.

(ඇ) ගිනි නිවනයක් මහල් මට්ටමේ සිට සෙන්ටි මීටර් 91ක් උසින් එල්ලා තබන රඳවනයකින් හෝ බ්‍රැකටයකින් සවි කරනු ලැබිය යුතු අතර, ගිනි නිවනය ක්‍රියාකරවීමේ උපදෙස් පිටතට මුහුණ ලා සිටින ආකාරයෙන් තැබිය යුතු ය.

IV වන උපලේඛනය

අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් හෝ ව්‍යාපාර

01 පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
02 සම් පදම් කිරීම
03 සම් විකිණීම
04 සත්ව පාලනය (මස්, කිරි සහ බිත්තර )
05 ජායාරූප ශාලාවක් පැවැත්වීම
06 පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
07 විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම

08 කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.
09 පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
10 දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
11 සත්ව ආහාර ගබඩා කිරීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.
12 පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13 සබන් නිෂ්පාදනය කිරීම.
14 සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
15 අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම.
16 ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
17 ගෘහ භාණ්ඩ හෝ දැව භාණ්ඩ හා උපාංග ගබඩා කර තබා ගැනීම.
18 වේවැල් භාණ්ඩ නිපදවීම.
19 වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
20 සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම.
21 රසකැවිලි වර්ග නිපදවීම.
22 පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම.
23 දත් බුරුසු වර්ග නිපදවීම.
24 අයිස් කර්මන්ත ශාලා පැවැත්වීම.
25 රා එකතු කිරීම.
26 විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම.
27 යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම.
28 පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ වා ලීටර්100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම.
29 සෝඩා නිපදවීම.
30 සම් භාණ්ඩ නිපදවීම.
31 පළතුරු, මාළු හෝ වෙනත් අහාර වර්ග ටින්වල ඇහිරීම.
32 මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම.
33 ඉටිපන්දම් නිපදවීම.
34 කපුරු නිපදවීම.
35 ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
36 රෙදි සෝදන නිල් නිපදවීම.
37 ලාකඩ නිපදවීම.
38 සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
39 පාසල් රටහුණු නිපදවීම.
40 ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
41 ටයර් නැවත පිරවීම.
42 ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
43 සිමෙන්ති කිලෝග්‍රෑම් 1000ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
44 සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
45 ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
46 යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
47 පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.
48 යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.
49 ධාන්‍ය හා මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
50 තොග වශයෙන් විකිණීම සඳහා පිටි හෝ ලුණු කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
51 මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම.
52 මුද්‍රණාලයක් පැවැත්වීම.
53 කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළන් ගාල්කර හෝ කුකුල් කොටුවක් පැවැත්වීම.
54 එළුවන්, ගවයන්, ඌරන් හෝ බැටළුවන් සඳහා ගාල්කර හෝ අංගන පැවැත්වීම.
55 ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
56 දර ගබඩාවක් පැවැත්වීම.
57 කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්.
58 සිසිල් බීම නිෂ්පාදන හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
59 අයිස්ක්‍රීම් නිෂ්පාදනය.
60 පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
61 ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
62 කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
63 පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
64 ස්වර්ණාභාරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
65 යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
66 යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම.
67 රබර් නිවාරණය කිරීම.

68 පෝර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අළුත් වැඩියා කිරීම.
69 තලාතු මිනිරන් නිවාරණය කිරීම.
70 හුණු ගබඩා කිරීම.
71 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් පොල් කටු අඟුරු ගබඩා කිරීම.
72 ගෙන්දගම් දුම් භාවිතා කරමින් කුරුඳු, කරදමුංගු හෝ කෙඳි නිවාරණය කිරීම.
73 ඔට්ටපාලු ඇඹරීම හෝ වේලීම.
74 බැටරි චාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වා ගෙන යාම
75 ටියුබ් හෝ ටයර් වෝල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
76 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම
77 කිලෝ ග්‍රෑම් 500 ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම
78 මිනී පෙට්ටි නිෂ්පානය හෝ ගබඩා කිරීම නැතහොත් මිනී පෙට්ටි නිෂ්පාදනය හා ගබඩා කිරීම
79 දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය හා ගබඩා කිරීම
80 බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම
81 වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය හා ගබඩා කිරීම
82 යාන්ත්‍රික බලය භාවිතා කරන්නා වූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම
83 පිටි හෝ තුනපහ වර්ග කෙටීම
84 රබර් බඩු නිෂ්පාදනය කිරීම
85 දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම
86 කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම
87 යන්ත්‍රානුසාරයෙන් පොල් නිෂ්පාදනය
88 යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය
89 තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරවන මෝලක් පවත්වාගෙන යාම
90 කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් කෙඳි නිෂ්පාදන හා ගබඩා කිරීම
91 ගිනි පෙට්ටි නිෂ්පාදනය
92 පුළුන් ගබඩා කිරීම
93 ලීටර් 227 1/2 ට වැඩියෙන් පොල් තෙල් ගබඩා කිරීම
94 මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම
95 ඇසිටිලින් නිෂ්පාදනය
96 සිගරට් නිෂ්පාදනය
97 බීඩි නිෂ්පාදනය
98 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් තීන්ත වර්ග හෝ වාර්නිස් ගබඩා කිරීම
99 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම
100 කොහු නිෂ්පාදනය
101 රස කැවිලි නිෂ්පාදනය
102 පෝර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම
103 පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150 ට වැඩියෙන් ගබඩා කිරීම
104 පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් ගබඩා කිරීම
105 ලී පෙට්ටි නිෂ්පාදනය
106 යාන්ත්‍රික බලය පාවිච්චි කරන ඔක්සිජන් හා වෙල්ඩින් වැඩකරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
107 යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ යකඩ හෝ ලෝහ වැඩ කරන හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
108 යාන්ත්‍රික බලය පාවිච්චි කරන මෝටර් වාහන අලුත්වැඩියා කරන හෝ සර්විස් කරන නැතහොත් මෝටර් වාහන අලුත්වැඩියා කරන හා සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
109 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන මෝටර් රථ අලුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගෙන යාම
110 යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
111 අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
112 පරණ ඇඳුම් ගබඩා කිරීම
113 ලීටර් 54 ට වැඩියෙන් පොල් තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩා කිරීම පිණිස අංගනයක් ගබඩාවක් පවත්වාගෙන යාම
114 ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වා ගෙන යාම
115 යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේප කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය කිරීම හෝ තඹ ආලේපනය කිරීම කරන්නා වූ ආලේපනයක් පවත්වාගෙන යාම
116 යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලොහාලේපනය කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
117 මෝටර් වාහන අලුත්වැඩියා කරන ගරාජ් සහ ආර්ක් වෙල්ඩින් වැඩ
118 කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිතා කෙරෙන යම් ස්ථානයක්
119 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් ඕනෑම වර්ගයක ප්ලස්ටික් බඩු තබා ගැනීම
120 සියළු වර්ගයේ ප්ලස්ටික් බඩු නිෂ්පාදනය
121 කිලෝ ග්‍රෑම් 50 ට වැඩියෙන් කවර වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම
122 සියළු වර්ගවල පොලිතින් බඩු නිෂ්පාදනය

123 කොහු නිෂ්පාදනය හා තබාගැනීම
124 කිලෝ ග්‍රෑම් 1000 ට වැඩියෙන් තේ කොළ තබාගැනීම
125 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් කඩදාසි සහ/හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු තබා ගැනීම
126 ඇඟලුම් නිෂ්පාදනය
127 බත් කඩ
128 රසායන ද්‍රව්‍ය
129 කිලෝ ග්‍රෑම් 50 ට වැඩි සියළු වර්ගවල ගිනිකෙළි භාණ්ඩ තබා ගැනීම
130 කිලෝ ග්‍රෑම් 150 ට වැඩියෙන් එල්සීජී සිලින්ඩර් ගබඩා කිරීම
131 හිස් වැසුම් සහ තොප්පි නිෂ්පාදනය
132 කිලෝ ග්‍රෑම් 100 ට වැඩියෙන් රබර් බඩු (සියළු වර්ගවල) ගබඩා කිරීම
133 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම
134 කිලෝ ග්‍රෑම් 250 ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම
135 ලීටර් 91 ට වැඩියෙන් ඇසිඩ්
136 එක් වරකට සේවා නියුක්තයන් 25 ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක්
137 ද්‍රව ඛණිජ තෙල් ගෑස් ඇතුළුව ඛණිජ තෙල් නිෂ්පාදනය ගබඩා කිරීම
138 පතරොම් සහ වෙඩි බෙහෙත්

## V වන උපලේඛනය

බදුල්ල මහා නගර සභාවේ සභා සම්මුතියක් මගින් කලින් කල සංශෝධනයකර රජයේ ගැසට් නිවේදනයේ පළකිරීමෙන් පසු ගිනි නිවීමේ සේවා කාර්යය සඳහා අදාල වන්නා වූ පහත දැක්වෙන ගාස්තු අය කරනු ලැබේ.

1. නගර සීමාව ඇතුළත සියළුම ව්‍යාපාරික ස්ථානයන්ගෙන් මාසිකව රු 100.00ක මුදලක් අය කරන අතරම එය වාර්ෂික ගෙවීමක් ලෙස රු. 1000.00 කින් එකවර ගෙවීම කළ හැක.

බදුල්ල මහ සභාවෙන් පිටත අපගේ සේවය ඔබට ලබා ගැනීම සඳහා පහත කොන්දේසි අදාළ වේ :
බදුල්ල මහ සභාවෙන් සීමාවෙන් පිටත එක් ගිනි ඇමතුමකට පහත පරිදි මුදල් අයකිරීම —

- වෙළඳ / සාමාන්‍ය (කඩ හොටෙල් සහ කුඩා සාප්පු) පැමිණීම සඳහා රු. 7000 ක් සහ එකතු කළ අගය මත බද්ද,
- විශාල ප්‍රමාණයේ කර්මාන්ත, සුපිරි වෙළඳ සැල් සහ හොටෙල් ගිනි නිවීමේ කාර්යයට පැමිණීම සඳහා රු. 15,000/- සහ එකතුකළ අගය මත බද්ද,
- පළමු පැයට හෝ ඉන් කොටසකට අයකරන මුදල රු. 1000/-
- දෙවන පැයට හෝ ඉන් කොටසකට අයකරන මුදල රු. 750/-
- ජල බවුසරයට අයකරන මුදල රු. 4000/- ලීටර් 8000 යි
- අමතර පොම්පයක් භාවිතා කිරීමේදී අයකරන මුදල රු. 2000/-
- වෙනත් ඕනෙම වාහනයක් යැවීමට අයකරන මුදල රු. 3000/-
- පෙන දාවන ලීටරයක් සඳහා රු. 800/-
- $CO_2$ 1Kg සඳහා රු. 600/-
- රසායනික කුඩු සඳහා රු. 750/-
- කෘත්‍රිම ස්වශන උපකරණ 01 සඳහා රු. 750/-

අවට ප්‍රාදේශීය සභා සමග ගිනි අවාරණ ලබා දීමේ ගිවිසුමකට එළඹීමට වසරක් සඳහා රු. 50,000/- ක මුදලක් ලබා ගැනීම.

විශාල කර්මාන්තශාලා සහ සංචාරක හොටෙල් සඳහා ගිනි ආවරණ ලබා දීමේ ගිවිසුමකට එළඹීමට වසරක් සඳහා රු. 25,000/- ක මුදලක් අය කිරීම.

කොන්දේසි අදාල වේ.

2. හදිසි අනතුරකට ලක්වූ තැනැත්තෙකු නිවැරදි ඉරියවුවෙන් සුරක්ෂිතව බදුල්ල මහා රෝහලට ගෙන යාම නිසා පසුව සිදුවිය හැකි අසාධ්‍ය හා සදාකාලික ආබාධිත තත්වයන් අවම කරවන ගිලන් රථ සේවාවන් නොමිලේ බදුල්ල නගර සීමාව තුළ ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ සඳහා මනා පුහුණුවලත් සත්කාර කණ්ඩායමක් නිරතුරුව සුදානම් වී සිටියි.

හදිසි අනතුරකට ලක්වූ තැනැත්තෙකු හැර අපගේ ගිලන් රථ සේවය ඔබට අවශ්‍ය නම් 1 Km ට රු. 35/- ක් අයකරනු ලැබේ.

ක්‍රීඩා තරඟ, ක්‍රීඩා උත්සව සඳහා දිනකට ගිලන්රථ සේවය ලබා ගැනීම නිළධාරින් දෙදෙනකු සමග පොරොත්තු සේවයේ යෙදවීම සඳහා දිනකට රු. 3000.00 ක් හා ඊට අදාල බදු මුදල් හා අවම පැය 02ට නොඅඩු තරඟ සඳහා රු. 1000.00 ක් හා ඊට අදාල බදු මුදල් අය කිරීම.

නිවාරණ අංශය ඔබට අවශ්‍ය වන්නේ,

1. සියලුම ගොඩනැගිලි වල (මහල් ගබඩා වෙළඳ සංකීර්ණ, පාසල්) වල ගිනි හා ජීවිත ආරක්ෂාව පිළිබඳ සැලසුම් කිරීම.

2. නව ගොඩනැගිලි සැලසුම් වල ගිනි හා ජීවිත ආරක්ෂාව පිළිබඳ උපදෙස් දීම හා ඒ සඳහා පළාත් පාලන ආයතන වලට අවශ්‍ය නිර්දේශ ලබාදීම.

3. නියමිත ගිනි ආරක්ෂාව නොමැති ව්‍යාපාර සම්බන්ධව විමර්ශන කටයුතු කිරීම හා නීති මගින් කටයුතු කිරීම.

4. නිවාරණ අංශය මගින් ඔබට සේවය සැපයීම සඳහා

- වර්ග මීටර් 300 දක්වා - රු. 2000/-
- 301 සිට 500 දක්වා - රු. 4000/-
- 501 සිට 700 දක්වා - රු. 6000/-
- 701 සිට 1000 දක්වා - රු. 8000/-
- 1000 වැඩි - රු. 10000/-

*පුහුණු කිරීමේ අංශය.-*

1. ගිනිනිවීම් ඒකකය තුළ පුහුණු කටයුතු ක්‍රියාත්මක කිරීම

2. ගින්නක් නිවා දැමීමේ ක්‍රම, ගින්නක් ඇති විටකදී ගිනි නිවන හමුදාව දක්වන ආකාරය ගින්නෙන් පිලිස්සුන කෙනෙකුට ලබා දිය හැකි ප්‍රථමාධාර පිළිබඳ පාසල් දරුවන් පොදු ජනතාව දැනුවත් කිරීමේ වැනි සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. කර්මාන්ත ශාලා මහල් ගොඩනැගිලි ගිනි ඇතිවෙන ක්‍රම හා හදිසි අවස්ථාවකදී ඉන් ක්‍රියාකරන ආකාර හා ගිනි ආරක්ෂණ වැඩ පිළිවලවල් දැනුවත් කිරීම් සිදු කිරීම

4. ගිනිනිවීම් ඒකකයේ ලබා ගත හැකි පාඨමාලා,

ගිනිනිවීම් ඒකකය තුළට පැමිණ ඒක දින මූලික ගිනිනිවීම් පාඨමාලාව හැදෑරීමට ඔබ කැමති නම්,

| | | | |
|---|---|---|---|
| i. | දේශණ ගාස්තු (පැයකට රු. 200/- බැගින් පැය 03 ක් සඳහා) | - | රු. 600/- |
| ii. | පුහුණු ගාස්තු (වරකට පුහුණු කරුවන් දෙදෙනෙකු බැගින්) | - | රු. 1,600/- |
| iii. | සංග්‍රාහ ගාස්තු | - | රු. 800/- |
| iv. | ලිපිද්‍රව්‍ය ගාස්තු | - | රු. 500/- |
| v. | සභාවට අයත් වන මුදල | - | රු. 2,500/- |
| | මුළු එකතුව | - | රු. 6,000/- |

ආයතනයට පැමිණ දින 3ක ගිනි නිවීම් පාඨමාලාව -

| | | | |
|---|---|---|---|
| i. | දේශණ ගාස්තු (පැයකට රු. 200/- බැගින් පැය 09 ක් සඳහා) | - | රු. 1,800/- |
| ii. | පුහුණු ගාස්තු (වරකට පුහුණු කරුවන් දෙදෙනෙකු බැගින්) | - | රු. 4,800/- |
| iii. | සංග්‍රාහ ගාස්තු | - | රු. 2,800/- |
| iv. | ලිපිද්‍රව්‍ය ගාස්තු | - | රු. 800/- |
| v. | සභාවට අයත් වන මුදල | - | රු. 6,800/- |
| | මුළු එකතුව | - | රු. 17,000/- |

දින 5ක ගිනි නිවීම් පාඨමාලාව

| | | | |
|---|---|---|---|
| i. | දේශණ ගාස්තු (පැයකට රු. 200/- බැගින් පැය 15 ක් සඳහා) | - | රු. 3,000/- |
| ii. | පුහුණු ගාස්තු (වරකට පුහුණු කරුවන් දෙදෙනෙකු බැගින්) | - | රු. 8,000/- |
| iii. | සංග්‍රාහ ගාස්තු | - | රු. 4,000/- |
| iv. | ලිපිද්‍රව්‍ය ගාස්තු | - | රු. 1,000/- |
| v. | සභාවට අයත් වන මුදල | - | රු. 10,000/- |
| | මුළු එකතුව | - | රු. 26,000/- |

ආයතනයෙන් බැහැරව එක් දින මූලික ගිනි නිවීම් පුහුණුව ලබා දීම සඳහා

| | | | |
|---|---|---|---|
| i. | දේශණ ගාස්තු පැය 3ක් සඳහා | - | රු. 2,000/- |
| ii. | පුහුණු ගාස්තු | - | රු. 2,000/- |
| iii. | සභාවට අයත් වන මුදල | - | රු. 3,000/- |
| | මුළු එකතුව | - | රු. 7,000/- |

**XLIX වන කොටස**

මාර්ගවලට අලාභහානි කිරීම, බාධක හා ප්‍රසර්පන

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරණ සංශෝදනයේ 267 සහ 272 වන වගන්තීය සමඟ කියවිය යුතු 06 (ආ) වගන්තිය අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන මාර්ගවලට අලාභහානි, බාධක හා ප්‍රසපන වැළැක්වීම සහ නතර කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභාවට අයත් වීථිවල හා මාර්ගවල අලාභහානි, බාධක හා ප්‍රසර්පන වැළැක්වීම සහ නතර කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථා යි.

2. කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථියකට හෝ යම් මාර්ගයකට හානි පැමිණවීම නොකළ යුතු අතර මාර්ගයේ ගමන් ගන්නා වාහනවලට හෝ පදිකයන්ට බාධාවන ආකාරයෙන් මාර්ගයේ -

(අ) වෙළෙදාම් කිරීම.

(ආ) ඉවත් කරගෙන යාම සඳහා පන ගැන්වීමට හෝ වෙනත් ආපදාවක් හේතුවෙන් බැහැරට පදවාගෙන යාමට නොහැකිවන කිසියම් හේතුවක් වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාව යටතේ බදුල්ල මහා නගර සභාව විසින් වාහන නතර කිරීමට ඉඩ දීමට තීරණය කරනු ලැබූ කිසියම් කොටසක් නොවන ස්ථානයක වාහන නතර කර තැබීම,

(ඇ) වාහන අළුත්වැඩියා කිරීම හෝ වාහන සේදීම,

(ඈ) කිසියම් මාර්ගයක කෙරෙන යම් අළුත්වැඩියාවක් සඳහා බදුල්ල මහා නගර සභාවේ හෝ නාගරික කොමසාරිස්වරයාගේ තීරණයක් මත කෙරෙන කාර්යයක දී හැර ගල්, වැලි, බොරළු, පස්, ගඩොල් හෝ ලී කොට බෑම හෝ රඳවා තැබීම,

(ඉ) ගර්හිත වාහන කොටස් රඳවා තැබීම,

(ඊ) මාර්ග පළුදු කිරීම නොකළ යුතු ය.

3. (අ) i. නාගරික සංවර්ධන ආඥාපනතේ විධිවිධානයන් උල්ලංගනය නොවන අයුරින් බදුල්ල මහා නගර සභාව විසින් සභාව සතු මාර්ග සඳහා නියම කරනු ලබන වීථි රේඛා සීමාවන් තුළ කවර හෝ ආකාරයක ඉදි කිරීමක්,කවර හෝ අයෙකු විසින් නොකල යුතු අතර වෙනත් යම් ඉදිකිරීමක් සඳහා ගෙන එන ලද කවර හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයක් කිසියම් මාර්ගයක හෝ එහි යම් කොටසක තැබීම නොකළ යුතු ය.

ii. අලුතින් තනන ලද හෝ වීථි රේඛා සීමාවන් නියම නොකරනු ලැබූ මාර්ග සම්බන්ධයෙන් වන කල්හී මහා නගර සභාවේ මහ සභාව විසින් ගනු ලබන තීරණ අනුව නියම කරනු ලබන මාර්ග සීමාවන් තුළ කවර හෝ ආකාරයක ඉදි කිරීමක්, කවර හෝ අයෙකු විසින් නොකල යුතු අතර වෙනත් යම් ඉදිකිරීමක් සඳහා ගෙන එන ලද කවර හෝ ඉදිකිරීම් ද්‍රව්‍යයක් කිසියම් මාර්ගයක හෝ එහි යම් කොටසක තැබීම නොකළ යුතු ය.

(ආ) 01. කවර හෝ තැනැත්තකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථියක හෝ මාර්ගයකට බදුල්ල මහා නගර සභාවේ විධිමත් අවසරයකින් තොරව,

(i) මාර්ග තලය පළුදු කිරීම,
(ii) නල එලීම සඳහා මාර්ග තලය හෝ මාර්ග උරහිස පලුදු කර හෑරීම,
(iii) දුරකථන රැහැන් සහා විදුලි රැහැන් වැනි මාර්ග රැහැන් වර්ග එලීම සඳහා මාර්ග තලයට හෝ මාර්ග උරහිසට යටින් මිහි විදුම් සිදු කිරීම නොකල යුතු ය.

02. ඉහත 3 - (ආ) - 01 සඳහා අනුමැතිය ලබාදීමේදී බදුල්ල මහා නගර සභාව විසින් නියම කරනු ලබන ගාස්තු ගෙවීමෙන් අනතුරුව පමණක් එම අවසරය ලබාදීමට සලකා බලනු ලැබේ.

4. 3 වන වගන්තියෙහි සඳහන් නියමයන් උල්ලංඝනය කරමින් කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් වීථියක හෝ යම් මාර්ගයක හෝ එහි කොටසක කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් තබනු ලැබ ඇති අවස්ථාවක නාගරික කොමසාරිස් වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් එකී ඉදිකිරීම් ද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමට හෝ එම ද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාව සතු කිරීමට ක්‍රියා කිරීම හෝ නීත්‍යානුකූල වන්නේ ය. නාගරික කොමසාරිස් වරයා විසින් හෝ බලයලත් නිලධාරියා විසින් ඉහත ආකාරයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් එකී ඉදිකිරීම් ද්‍රව්‍ය මාර්ගයේ තබන ලද හෝ තැබීමට සලස්වනු ලැබූ තැනැත්තාට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් එකී ද්‍රව්‍ය ඉවත් කිරීමට ක්‍රියා කළ තැනැත්තා හෝ බදුල්ල මහා නගර සභාව වගකීමට යටත් නොවනු ඇත. එසේම තවදුරටත් එසේ ඉවත් කළ ද්‍රව්‍ය වෙනුවෙන් කවර හෝ ප්‍රමාණයක වන්දියක් ගෙවීමට බදුල්ල මහා නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා යටත් නොවනු ඇත.

5. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සභාව සතු කිසියම් මාර්ගයක් නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කරන කාර්යයක් සඳහා -

(අ) එකී මාර්ගය සම්පූර්ණයෙන් ම හෝ මාර්ගයෙන් කොටසක් හෝ මාර්ගයේ කිසියම් දිසාවකට ධාවනය වන යම් මං තීරුවක් කිසියම් කාලයකට වාහන ගමනාගමනයට වසා තැබීමට,

(ආ) කිසියම් ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය එකී මාර්ගයේ කිසියම් කොටසක ගොඩ ගැසීමට,

(ඇ) එකී මාර්ගයට යාබද ඉඩමකට ඇතුල්වීමට, ඉදිකිරීම් ද්‍රව්‍ය කිසිවක් එකී ඉඩමේ තැන්පත් කිරීමට,

(ඈ) එකී මාර්ගයට යාබද ඉඩමේ යම් දේපළකට හානියක් නොවන ආකාරයෙන් එකී ඉඩමෙන් වාහන ධාවනය සඳහා ඉඩ සැලැස්වීමට, නියෝග කිරීම සඳහා නාගරික කොමසාරිස් වරයාට බලය තිබිය යුතු ය.

6. 5 වන වගන්තිය යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් කරනු ලැබූ යම් නියෝගයකට පටහැනි ආකාරයෙන් ක්‍රියාකිරීම හෝ එකී යම් නියෝගයකට අනුව ක්‍රියාකරන කිසියම් තැනැත්තෙකුට බාධා කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. නාගරික කොමසාරිස් වරයා විසින් නිකුත් කරනු ලැබූ ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභාව සතු කිසියම් මාර්ගයක රැඳී තිබෙන ගල්, බොරළු, වැලි, පස් හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ ගොඩගැසීම හෝ ඉවතට ගෙන යාම නොකළ යුතු ය.

8. කිසියම් ඉඩමකට හෝ ඉඩමක පිහිටා ඇති ගොඩනැගිල්ලක වහළයට පතිත වන වර්ෂා ජලය හැර වෙනත් කිසියම් ආකාරයකින් එකී ඉඩමේ හෝ ඉඩමේ පිහිටා ඇති ගොඩනැගිල්ලේ පවතින ජලය හෝ පාවිච්චියෙන් පසු බැහැර කෙරෙන අප ජලය, උරා ගන්නා වලකට ගලා යාමට සැලැස්විය යුතු අතර, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට බැහැර කිරීම නොකළ යුතු ය.

9. ප්‍රවාහනය කරනු ලබන ද්‍රව්‍යයන් හෝ දූවිලි හෝ වැලි හෝ කුඩා කැබලි වශයෙන් විසිරීම වළක්වන ආවරණයකින් ආවරණය කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් එවැනි කිසියම් ද්‍රව්‍යයක් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති මාර්ගයක කිසියම් වාහනයකින් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

10. කිසියම් මාර්ගයක් ඔස්සේ ඇති කාණුවක් ගොඩ කිරීම හෝ ඊට හානි කිරීම හෝ එකී කිසියම් කාණුවක් දිගේ ගලායන ජලය පහසුවෙන් ගලායාමට බාධා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුවාත් හැර එකී කාණුවක් හරහා කිසියම් ඉඩමකට ඇතුල්වීමට අවශ්‍ය වන්නේ නම් දිගින් මීටර් එකකට නොඅඩු වන පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් තැනීම එකී ඉඩමේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ කාර්යය විය යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ 05 සහ 06 වැනි වගන්තිවල විධිවිධානයන් මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් සභාව සතු මාර්ගවලට අදාල නොවන්නේ ය.

12. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ළංගනය කරන යම් තැනැත්තකු යම් හෙයකින් නිසි අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබීමෙන් පසු වරදකරුවකු මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උප වගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000/= කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000/= කට නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

i. ''මාර්ගය'' යන්නෙන්, බදුල්ල මහා නගර සභාව සතු කිසියම් මං මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමඟක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක්, ඒ දණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර බදුල්ල මහා නගර සභාව සතු කිසියම් මං මාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමඟකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක් බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

ii. ''වාහනය'' යන්නෙන් රථවාහන ආඥාපනතේ ඊට දී ඇති අර්ථ නිරූපනය අදහස් වියයුතු අතර කරත්තයක් පාපැදියක් හෝ රෝද සවිකරන ලද යාන්ත්‍රිකව හෝ වෙනත් අයුරකින් ක්‍රියාකරනු ලබන උපකරණයක්ද අදහස් වේ.

iii. ''හානි පැමිණවීම'' හෝ 'බාධක' යන්නෙන්, විනාශ කිරීම, ගලවා දැමීම, විකෘති කිරීම, පෙරලා දැමීම, බැහැර කිරීම, වෙනත් කවර හෝ ආකාරයෙන් හානි පැමිණවීම, කිසියම් කොටසක් මත පෝස්ටරයක් හෝ අත් පත්‍රිකාවක් ඇලවීම හෝ තීන්ත හෝ වෙනත් යම් ලාටු වර්ගයක් හෝ තාර ගෑම අදහස් වන අතර කිසියම් නාම පුවරුවක අකුරු වෙනස් කිරීම, මකා දැමීම, සූරා දැමීම හෝ ගලවා දැමීම ද ඊට ඇතුළත් විය යුතු අතර බදුල්ල මහා නගර සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ නාගරික

කොමසාරිස්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු විසින් හෝ මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් සභාව විසින් හෝ කිසියම් මාර්ගයක් අළුත්වැඩියාවක් සඳහා කරවනු ලබන යම් කාර්යයක් ඊට ඇතුළත් නොවිය යුතු ය.

**L වන කොටස**

ළිංතැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 28 (ඉ) වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ යම් නිවසක, ඉඩමක, යම් පරිශ්‍රයක අයිතිකරු හෝ යම් පදිංචිකරුවකු විසින් නාගරික කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව සහ නියම කිරීම අවශ්‍ය යයි නාගරික කොමසාරිස්වරයා සලකනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් විධාන කරන ආකාරයට මිස, කිසියම් තැනැත්තකු විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත ළිඳක් තැනීමට සැලැස්වීම හෝ නොකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

01. නාගරික කොමසාරිස්වරයාගෙන් තත් කාර්ය සඳහා ලිඛිත අවසරයක් ලබාගෙන ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත ළිඳක් තැනීමට සැලැස්වීම හෝ නොකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි.

02. (i) යම් ළිඳක සැලැස්ම සහ පිරිවිතර නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කර ඇත්නම් මිස, හෝ එසේ අනුමත කරන සැළැස්ම සහ පිරිවිතරවලට අනුකූල කොටස වෙනත් ආකාරයකින්, කිසිම තැනෙත්තෙකු විසින්, පානය හෝ වෙනත් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීම පිණිස හෝ මහජනයාට ජලය විකිණීම හෝ සැපයීමට හෝ යම් ළිඳක් තැනීමට සැලැස්වීම නොකළ යුතු ය.

(ii) යම් වැසිකිළි වලක කුණු දිය වලක, දියබස්නා වලක, ඌරු කොටුවක, ගාලක, ගව මඩුවක, වල වැසිකිළියක හෝ පලුදු වූ නැතහොත් බැමි බැඳ නොමැති කාණුවක් හෝ වගා කිරීමේ කාර්යය සඳහා සෑම වර්ෂයකම නොකඩවා පොහොර යොදන ඉඩමක හෝ සිට යටත් පිරිසයෙන් මීටර් 16 දුර ප්‍රමාණයක් ඇතුළත කිසිම ළිඳක් ඉදිකිරීම සඳහා යම් සැලැස්මක් නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කිරීම හෝ තැනීම සඳහා අවසරදීම හෝ නොකළ යුතු ය.

03. පානය සඳහා හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා හෝ ජල සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක සිට මීටර් 30ක දුර ප්‍රමාණයක් ඇතුළත යම් ස්ථානයක, කිසිම තැනැත්තෙකු විසින්,

(අ) කිසිම වැසිකිළි වළක්, උණු දිය වළක්, දියබස්නා වලක්, වලවැසිකිළියක්, ගාලක්, ගව මඩුවක් හෝ බැමි බැඳ නොමැති කාණුවක් තැනීම නැතහොත් තැනීමට සැලැස්වීම හෝ අවසර දීම හෝ,

(ආ) පොහොර කිසිවක් හෝ දිරාපත්වන සත්ව හෝ ශාක කොටස් කිසිවක් තැන්පත් කිරීම නැතහොත් තැන්පත් කිරීමට සැලැස්වීම හෝ අවසර දීම හෝ,

(ඇ) සතියකට යටත් පිරිසෙයින් එක් වරක්වත් ඉවත් කරනු නොලබන කසළ කිසිවක් එකතුවීමට සැලැස්වීම හෝ එකතු වීමට ඉඩදීම හෝ,

(ඈ) කිසියම් කාණුවක් පලුදු වූ තත්ත්වයෙන් තිබෙන්නට ඉඩහැරීම හෝ නොකළ යුතු ය.

04. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා ජලය සැපයීමට ප්‍රයෝජනය ගන්නා ළිඳක් පිහිටා ඇති ඉඩකඩ අයිතිකරු බදුකරු හෝ පදිංචිකරු, විසින්, සෑම විටම,

(අ) කවර හෝ දුරක සිට ළිඳක මතුපිට ජලය එක එල්ලේම ගලා ඒම,

(ආ) ළිඳේ ඉවුරේ සිට මීටර් 05ක අඩු දුරක සිට මතු පිට ජලය ළිඳට කාන්දු වීම,

(ඇ) ළිඳට යාව පිහිටි බිමේ, බිම මට්ටමේ සිට මීටර් 03කට වඩා අඩු ගැඹුරකින් යටි බිම් ජලය ළිඳට කාන්දු වීම වැළැක්වීම පිණිස අවශ්‍ය විය හැකි තත්ත්වයකින් සහ අලුත්වැඩියාවෙන් යුතුව තබා ගත යුතු ය.

05. පානය පිණිස හෝ වෙනත් යම් ගෘහස්ථ කාර්යයක් සඳහා හෝ ජලය සැපයීමට ප්‍රයෝජනයට ගන්නා ළිඳකින් ජලය ඇදීමට, කිසිම තැනෙත්තෙකු විසින්, කිසිම අපිරිසිදු භාජනයක් පාවිච්චි නොකළ යුතු ය.

06. මහජනයාට ජලය සැපයීම පිණිස ප්‍රයෝජනයට ගන්නා ළිඳක සිට මීටර් 5 ක් දුරක් ඇතුළත කිසිම තැනැත්තෙකු විසින් රෙදි සේදීම නොකළ යුතු ය.

07. පානය හෝ ගෘහස්ථ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගන්නා ළිඳක් ඉසීම, ශුද්ධ කර ව්‍යාසාදන කිරීම හෝ අලුත්වැඩියා කිරීම අවශ්‍ය බව නාගරික කොමසාරිවරයා සලකන කවර හෝ අවස්ථාවක, එවැනි ළිඳක් පිහිටා ඇති යම් ඉඩමක අයිතිකරුට, බදුකරුට හෝ පදිංචිකරුට ලිඛිත දැන්වීමක් මඟින් ඒ දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන යම් කාල සීමාවක් ඇතුළත, එම ළිඳ ඉසින ලෙස සහ එය ශුද්ධ කර ව්‍යාසාධනය කරන ලෙස ද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ උපදෙස් අනුව යැයි නාගරික කොමසාරිස්වරයා සලකන වෙනත් යම් අලුත්වැඩියාවන් කරන ලෙස ද, දැනුම්දීමට සැලැස්විය හැකි අතර, එම දැන්වීමේ නිශ්චය කොට දැක්වෙන කාල සීමාව ඇතුළත, ඒ අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් දැන්වීම අනුව ක්‍රියා කළ යුතු ය.

08. පොදුවේ පාවිච්චි කරන ළිඳක් හෝ පිහිල්ලක් කිසිවෙකු විසින් නාගරික කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව වැසීම නොකළ යුතු ය. නාගරික ප්‍රදේශය තුළ ඇති සියළුම ළිං (පුද්ගලික හෝ පොදු) නාගරික කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු ය. යම් ළිඳක් පිහිටා ඇත්තේ යම්

ඉඩමක ද, එම ඉඩමේ පදිංචිව සිටින පුද්ගලයා හෝ බදුකරු එම ළිඳ නාගරික කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු ය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවල කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය යුතු අතර, බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය හිමි විනිසුරුවරයෙකු ඉදිරියේ නඩු පවරා වරදකරු වුවහොත්,

(අ) පළමු වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් (රු.1000) නොඉක්මවන දඩයකට ද,

(ආ) දෙවන වරට කරනු ලබන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2000) නොඉක්මවන දඩයකට ද,

(ඇ) නොකඩවා කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ එය කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නාගරික කොමසාරිස්වරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

## LI වන කොටස

### පීඩා වැලැක්වීම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 05 -(අ) උපවගන්තියට අනුව බදුල්ල මහා නගර සභාව විසින් පීඩා වැලැක්වීම පිළිබඳ නියමයන් මෙයින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභාව විසින් පීඩා වැලැක්වීම පිළිබඳ නියමයන් පිළිබඳ අතුරු ව්‍යවස්ථා නමින් හඳුන්වනු ලැබේ.

2 කවර හෝ වේලාවක සහ අවශ්‍ය යැයි තමාට පෙනී යන අවස්ථාවල දී නාගරික කොමසාරිස් හෝ ඔහු විසින් ලිඛිත බලය පවරනු ලබන වෙනත් නිළධාරියකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නාගරික සීමාව තුළ වූ යම් නිවසක, පිටත නිවසක, ගොඩනැගිල්ලක, ආවරිත ස්ථානයක හෝ පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ නිවසට, පිට නිවසට, ගොඩනැගිල්ලට, ආවරිත ස්ථානයකට හෝ පරිශ්‍රයකට අයත් වූ එහි පිහිටියා වූ යම් වැසිකිළියක හෝ ජල මුද්‍රා වැසිකිළියක අඩංගු දේ එකී දැන්වීමෙහි සඳහන් කරනු ලැබ ඇති කාලයක් තුළ හා ආකාරයකට එහි සඳහන් කර ඇති ස්ථානයට හෝ ස්ථානවලට ඉවත් කරගෙන යන ලෙස හෝ ඉවත් කරගෙන යාමට සලස්වන ලෙස නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

3. කිසිදු තැනැත්තෙකු විසින්, යම් වැසිකිළියක අතු මඩුවක, වලක හෝ ජලමුද්‍රා වැසිකිළියක අඩංගු ද්‍රව්‍ය යම් නිවසක්, පිටත නිවසක්, ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක් තුළ හෝ යම් නේවාසික නිවාසයක, ළිඳක, පොකුණක, විලක,ඇලක, කාණුවක, කසළ නලයක, දිය පාරක හෝ ජල මාර්ගයක සිට අඩි 50 ක් ඇතුළත වූ යම් ඉඩමක් හෝ ස්ථානයක් තුළ හෝ ඒ මත වැළලීමට හෝ වැළලීමට සැලැස්වීම හෝ තැන්පත් කිරීම හෝ තැන්පත් කිරීමට සැලැස්වීම නොකළ යුතු ය. දැන්වීම ලැබුණු පසු ඔහු විසින් වහාම නාගරික කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්යය සඳහා බලය පවරනු ලබන වෙනත් නිළධාරියකු විසින් විධාන කෙරෙන ආකාරයට හා ස්ථානයට විධාන කෙරෙන කාලය ඇතුළත ඒ ද්‍රව්‍ය ඉවත් කරනු ලැබිය යුතු ය.

4. යම් කර්මාන්තයක් කිරීමෙන් හෝ යම් පරිශ්‍රයක යම් ව්‍යුහමය වෙනස් කිරීමක් කිරීමෙන් හෝ වැසිකිළි වළක් හෝ වැසිකිළියක් තවදුරටත් පාවිච්චියට ගැනීම අනවශ්‍ය කරන්නා වූ යම් තැනැත්තෙකු විසින් සහ පාවිච්චියට නොගන්නා වැසිකිළි වළක් හෝ වැසිකිළියක් පිහිටියා වූ යම් පරිශ්‍රයක නැතහොත් අනවශ්‍ය වී ඇති වැසිකිළි වළක හෝ වැසිකිළියක අයිතිකරු විසින් ඒ වැසිකිළි වළේ හෝ වැසිකිළියේ අඩංගු සියලු අසුචි හෝ අප්‍රසන්න ද්‍රව්‍යයෙන් සම්පූර්ණයෙන් ඒ වැසිකිළිවල හෝ වැසිකිළිය හිස් කරනු ලැබිය යුතු ය. තව ද ආරක්‍ෂා සහිතව ඉවත් කරනු ලැබිය හැකි තරමට ඒ වැසිකිළි වළේ හෝ වැසිකිළියේ බිම බිත්ති සහ වහළ ද ඊට විහිදෙන හා ඉන් සම්බන්ධ කර ඇති පයිප්ප හා කාණු ද අසුචි හෝ අප්‍රසන්න ද්‍රව්‍යයෙන් අපවිත්‍ර වූ පස හෝ වෙනත් ද්‍රව්‍ය සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු ය. ඔහු විසින් පීඩාවක් ඇති නොවන අයුරින් වැසිකිළිවල සුදුසු ද්‍රව්‍යයකින් සම්පූර්ණයෙන් වසා පුරවා දැමිය යුතු ය.

5. යම් වැසිකිළි වලක් හෝ වැසිකිළියක් වසා දැමීමට හෝ පුරවා දැමීමට අදහස් කරන සෑම තැනැත්තෙකුම ඒ කාර්යය සඳහා යම් වැඩක් ආරම්භ කිරීමට මත්තෙන් තමා ඒ වැසිකිළි වල හෝ වැසිකිළිය වසා දැමීම හෝ පුරවා දැමීම හෝ ආරම්භ කරන වේලාව නිශ්චිතව දන්වමින් නිවාඩු දිනයන් හැර දින හතකට නොඅඩු දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ලිඛිත බලය පවරනු ලබන වෙනත් නිළධාරියකු වෙත ලිඛිතව කරනු ලැබිය යුතු අතර, ඒ වැඩය කරගෙන යද්දී මහා නගර සභාවේ යම් නිළධාරියෙකුට එය පරීක්‍ෂාකර බැලීමේ කාර්යය සඳහා පරිශ්‍රයට නිදහස් ප්‍රවේශය ලබා දිය යුතු ය.

6. එකී නිවසේ හෝ ඉඩමේ වූ යම් වැසිකිළියක, වලක හෝ ජල මුද්‍රාවක අඩංගු ද්‍රව්‍ය ඉවත් කිරීමට කැමති හෝ අංක 1 දරන වගන්තියේ විධිවිධාන අනුව ඉවත් කිරීමට නියම කරනු ලැබ ඇති හෝ නාගරික සීමාව ඇතුළත වූ යම් නිවසක හෝ ඉඩමක අයිතිකරු විසින් හෝ පදිංචිකරුවන් විසින් තමා වැඩය කිරීමට අදහස් කරන දිනය හා නිවස පිළිබඳව නාගරික කොමසාරිස්වරයාට දැන්වීමක් කරනු ලැබිය යුතු ය. ඉන් පසු නාගරික කොමසාරිස්වරයා විසින් ඒ අයිතිකරු හෝ පදිංචිකරුට නාගරික නිළධාරියෙකුගේ අධීක්‍ෂණය යටතේ සහ නාගරික කොමසාරිස්වරයා විසින් නිසි පරිදි බලය පවරන ලද තැනැත්තෙකු විසින් ඒ අවසර පත්‍රයේ සඳහන් කරනු ලබන නියමයන් හා කොන්දේසි මත වැඩය කිරීමට අවසර පත්‍රයක් දිය යුතු ය.

7. නාගරික සීමාව තුළ වූ යම් නිවසක් හෝ ඉඩමකින් එම කාර්යය සඳහා නිසි පරිදි බලය පවරන ලද සභාවේ සේවකයෙකු විසින් හැර වෙනත් කිසිදු තැනැත්තෙකු විසින් අසුචි ඉවත් කරනු නොලැබිය යුතු ය.

8. අසුචි ඉවත් කිරීමේ බාල්දි වැසිකිළි ක්‍රමය භාවිතා කෙරෙන්නා වූ ද කුළී නිවැසියා පිළිබඳව වෙන වෙනම වූ ගිවිසුම් යටතේ එකී නේවාසික ස්ථානයකට වැඩි නේවාසික ස්ථාන ගණනකින් හෝ එක් ගෘහවාසීන් පිරිස් ගණනාවකින් සෑදුනා වූ යම් නිවසක්, ගොඩනැගිල්ලක්,

ඉඩමක් හෝ කුළී නිවාසයක් පිළිබඳ කරුණේ දී ඒ නිවාසයේ, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ කුළී නිවාසයේ අයිතිකරු හෝ බදුකරු විසින් ඒ නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ කුළී නිවාසය සම්බන්ධයෙන් විධිමත් අසූචි දැමීම හා ඉවත් කිරීම සඳහා අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයා විසින් සලකනු ලබන එහි පදිංචි වී සිටින සෑම තැනැත්තන් දහ දෙනෙකුට එක් සම්මත බාල්දියකට වැඩි නොවන වැසිකිළි පහසුකම් සළස්වා දෙනු ලැබිය යුතු ය.

9. එක් එක් සම්මත බාල්දියක ගැල්වනයිස් යකඩ තහඩුවලින් සාදනු ලැබිය යුතු අතර, බරින් කිලෝ ග්‍රෑම්ස් 4.54 ට වැඩි නොවැඩි විය යුතු ය. තව ද එය පහත දැක්වෙන අභ්‍යන්තර මිණුම් වලින් යුක්ත විය යුතු ය. උස සෙන්ටිමීටර් 28 ක්ද, විශ්කම්භය සෙන්ටිමීටර් 31 ක් ද, පතුලේ විශ්කම්භය සෙන්ටිමීටර් 23 ක් ද, විය යුතු ය.

10. යම් පරිශ්‍රයක අසූචි එකතු කිරීමේ කාර්ය සම්බන්ධයෙන් සභාව විසින් සළස්වන සේවය සඳහා සභාව විසින් සුදුසු යැයි කල්පනා කරන ගාස්තුවක් ඒ පරිශ්‍රයේ අයිතිකරු හෝ බදුකරු වෙත පනවා සභාව විසින් ඔහුගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

11. ඉහත සඳහන් කරන ලද වගන්තිය යටතේ සභාවට අය විය යුතු යම් මුදලක් නිසි ලෙස ගෙවනු නොලැබුවේ නම්, නාගරික සීමාව තුළ බලය ඇති විනිසුරුවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, ලඝු නඩු විභාගයකින් පසු ඒ මුදල ලැබිය යුතු බව පෙන්වන්නේ නම්, එය ගෙවීමට යටත් වන තැනැත්තාට එය ගෙවන ලෙස විනිසුරුවරයා විසින් ආඥා කරනු ලැබිය යුතු ය. තව ද එය ඒ විනිසුරුවරයා විසින් පනවන ලද දඩයක් සේ අයකරනු ලැබිය යුතු ය. එය ද ගෙවනු නොලැබුවේ නම් නාගරික කොමසාරිස්වරයා විසින් වරිපනම් බද්දක් ලෙසට අය කර ගත යුතු ය.

12. නාගරික කොමසාරිස්වරයා විසින් නියම කර ඇති වේලාවන් තුළ දී අසූචි ඉවත් කිරීමට, නිවසක, ඉඩමක හෝ පරිශ්‍රයක සෑම පදිංචිකරුවෙකු විසින්ම මහා නගර සභාවේ සේවකයින්ට, සිය වැසිකිළියට නිදහසේ ප්‍රවේශ වීමට ඉඩදිය යුතු ය.

13. (i) නාගරික කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ස්ථානයක සහ සැලසුම්වලට අනුකූලව හැර, කිසිදු වැසිකිළියක් ඉදි කරනු නොලැබිය යුතු ය.

(ii) සෑම වැසිකිළියක්ම, ඒ වැසිකිළියට ඇතුල්වන ස්ථානයේ අභ්‍යන්තරයේ සියලු කොටස් යම් වීථියකට, දුම්රිය මාර්ගයකට, පොදු ගෙඋයනක, පොදු උද්‍යානයකට හෝ ඒ වැසිකිළිය අයත් වන නේවාසික ගොඩනැගිල්ලට හැර වෙනත් යම් නේවාසික නේවාසික ගොඩනැගිල්ලට පෙනීමෙන් සාර්ථකව වැළැක්වෙන අයුරින් ආවරණය කළ යුතු ය.

14. මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 131 වන වගන්තිය යටතේ ඉඩ සලසා ඇති ස්ථානවල හැර වෙනත් කිසිදු ස්ථානයක් තුළ හෝ ඒ මත, කිසිදු තැනැත්තෙකු විසින් අසූචි, ගොම හෝ වෙනත් කැත ද්‍රව්‍ය, දූවිලි, කුණු, අළු, කුණු රොඩු හෝ අතු ගා දමන කසළ, කිසිවක් තැන්පත් කරනු නොලැබිය යුතු ය.

15. නාගරික කොමසාරිස්වරයාගෙන් ලිඛිතව ලබාගත් අවසරයක් නොමැතිව, කිසිදු තැනැත්තෙකු විසින්, ඉන් පස් ගැනීමේ කාර්ය සඳහා හෝ එහි අප්‍රසන්න ද්‍රව්‍ය හෝ කුණුරොඩු ගබඩා කර තැබීම සඳහා හෝ යම් වසුරු වලක්, වැවක්, ලිඳක්, හෝ වලක්, යම් කැනීමක් නොකළ යුතු ය.

16. යම් පරිශ්‍රයක අයිතිකරු, බදුකරු හෝ පදිංචිකරු විසින් එකී පරිශ්‍රයෙන් යම් වීථියකට හෝ විවෘත පොදු කාණුවකට අප්‍රසන්න දුගඳකින් යුත් ද්‍රව කිසිවක් බැහැර කරනු ලැබීමට ඉඩ නොදිය යුතු ය.

17. (අ) යම් පරිශ්‍රයක කිසිදු පදිංචිකරුවකු විසින් —

(i) යම් කුණු රොඩු ද්‍රව්‍යයක්, ආවරිත භාජනයක හෝ එවැනි භාජනයක බහාලන ලද තදින් ගැට ගැසූ පොලිතින් මල්ලක හැර, වෙනත් ස්ථානයක තැන්පත් කිරීම හෝ තැන්පත් කිරීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය. තව ද,

(ii) නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කල යථා පරිදි දෙනු ලබන දැන්වීමකින් නියම කර ඇති වේලාවන් තුළ දිනපතා සිය පරිශ්‍රයෙන් පිටත, වීථිය, අයිනේ හැර වෙනත් ස්ථානයක යම් භාජනයක් තැබීම හෝ තැබීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

(ආ) යම් පරිශ්‍රයක කිසිදු පදිංචිකරුවෙකු විසින් වීථියක යම් කුණු රොඩු ද්‍රව්‍යයක් තැන්පත් කිරීමට හෝ රඳවා තැබීමට ඉඩ නොදිය යුතු අතර, පදික වේදිකාවක ද ඇතුළු ඒ වීථිය සහ සිය පරිශ්‍රයට ඉදිරියෙන් වූ, සම්බන්ධ වූ හෝ අනුබද්ධිත සියලු මතුපිට කාණු පිරිසිදු කිරීම හා කුණු රොඩුවලින් නිදහස්ව තැබීම ඒ පදිංචිකරුගේ කාර්යය විය යුතු ය.

18. නාගරික කොමසාරිස්වරයා විසින්, ලියවිල්ලකින් බලය පවරන ලද්දේ නම් මිස, කිසිදු තැනැත්තෙකු විසින්, නාගරික සීමාව තුළ යම් වීථියකින් හෝ පොදු ස්ථානයකින් කුණු රොඩු එකතු කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

19. සභාව විසින් කලින් කල නියම කරනු ලබන ප්‍රමාණයක් අනුව, යම් පරිශ්‍රයකින් කුණු රොඩු එකතු කිරීම හා ඉවත් කිරීම වෙනුවෙන් ද සභාව විසින් යම් භාජනයක් සැපයීම සඳහා ද ඒ පරිශ්‍රයේ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් සභාව විසින් යම් ගාස්තුවක් අය කරනු ලැබිය හැකි ය.

20. පහත සඳහන් කරන සේවාවන් සඳහා, සභාව විසින් සභා සම්මතයන් මගින් නියම කරනු ලබන ගාස්තු වාර්ෂිකව සංශෝධනය *රජයේ ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු අය කරනු ලැබිය යුතු ය.

(අ) වාණිජ හා වෙළඳ පරිශ්‍රවලින් කුණු රොඩු ඉවත් කිරීම —

(1) සම්පූර්ණ කුණු බක්කියට
(2) අර්ධ කුණු බක්කියට

මේ අතුරු ව්‍යවස්ථාවේ, සම්පූර්ණ කුණු බක්කිය, යන්නෙන්, උස සෙන්ටිමීටර 61 සහ සෙන්ටිමීටර 76 අතර වූ ද, විශ්කම්භය සෙන්ටිමීටර් 38 හා සෙන්ටිමීටර් 61 අතර වූ ද, කුණු බක්කියක් අදහස් වේ. තව ද, අර්ධ කුණු බක්කිය, යන්නෙන් උස සෙන්ටිමීටර් 30.5 සහ සෙන්ටිමීටර් 38 අතර වූ ද , විශ්කම්භය සෙන්ටිමීටර් 19 සහ සෙන්ටිමීටර් 13.5 අතර වූ ද, කුණු බක්කියක් අදහස් වේ.

(ආ) යම් පරිශ්‍රයකින් කැපූ ගස් රිකිළි සහ සුන් බුන් ඉවත් කිරීම -

(1) පිරවූ ට්‍රැක්ටරයක් සඳහා
(2) අර්ධ පිරවූ ට්‍රැක්ටරයක් සඳහා
(3) පිරවූ කරත්තයක් සඳහා

(ඇ) කසළ දිරවන ටැංකි පිරිසිදු කිරීම

(ඈ) කාණු අවහිර වීම පිරිසිදු කිරීම

(1) පුද්ගලික (ගෘහස්ථ) පරිශ්‍රයක කාණුවක් සඳහා
(2) වාණිජ හෝ ව්‍යාපාරික ආයතනයක කාණුවක් සඳහා

සභාව විසින් අනුමත කරන ලද ගාස්තු නාගරික කාර්යාලයට කලින් ගෙවනු ලැබිය යුතු ය.

21 කිසිදු තැනැත්තෙකු විසින්, යම් කුණු රොඩු ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් අපද්‍රව්‍යයක් තත් කාර්යය සඳහා විශේෂයෙන් වෙන්කර තබා ඇති කුණු බක්කියේ හෝ වෙනත් භාජනයේ හැර, යම් වීථියක, පදික වේදිකාවක, කාණුවක, උද්‍යානයක හෝ යම් පොදු ස්ථානයක තැන්පත් කිරීම, එහි විසිකිරීම හෝ දැමීම නොකළ යුතු ය.

22 (i) යම් පරිශ්‍රය කිසිදු අයිතිකරුවෙකු, බදුකරුවෙකු, හෝ පදිංචිකරුවෙකු විසින්, ඒ පරිශ්‍රය තුළ යම් කුණුරොඩු හිංසක හෝ අප්‍රසන්න ද්‍රව්‍යයක් හෝ එවැනි ද්‍රව්‍යයක් බහාලූ භාජනයක්, සිය අසල්වාසීන්ට පීඩාවක් වන අයුරු කැත හෝ හිංසක තත්ත්වයෙන් තබා ගැනීම හෝ තැබීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

(ii) මෙහි (1) වන උපවගන්තිය පිළිබඳ යම් කඩ කිරීමක් සිදුවී ඇති බව දැන ගන්නට ලැබූ අවස්ථාවක, ඒ පරිශ්‍රයේ පදිංචිකරුට සාධාරණ දැනුම් දීමක් කිරීමෙන් පසු නාගරික කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් තැනැත්තෙකු විසින් කඩ කිරීම සිදුව ඇති පරිශ්‍රයට ඇතුල් වී ඒ පීඩාව ඇති කළ කාරණය ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේය. ඒ වෙනුවෙන් දරන ලද වියදම, ඒ පරිශ්‍රයේ පදිංචිකරුගෙන් සභාව විසින් අයකර ගනු ලැබිය හැක.

23 යම් ගොඩනැගිල්ලක අයිතිකරු විසින් ඒ ගොඩනැගිල්ලේ කොටසක් ලෙස පවත්නා හෝ එහි ප්‍රයෝජනයට ගන්නා කුණු රොඩු, පහලට බස්සවන නලයක හෝ නල ගර්භයක අළුත්වැඩියා කිරීම්, ප්‍රතියෝජනය කිරීම් සහ විධිමත් නඩත්තු කිරීම් සඳහා වගකිව යුතු ය. නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ අයිතිකරුට අවශ්‍ය යැයි සළකනු ලබන එවැනි වැඩ කරන ලෙස විධාන කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාල සීමාව තුළ අයිතිකරු විසින් ඒ දැන්වීමේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු ය.

24 කිසිදු තැනැත්තෙකු විසින්, මහජනයාට විවෘත ගොඩනැගිල්ලක හෝ කුළියට දුවන වාහන ද ඇතුළු පොදු වාහන රථයක හෝ පොදු පදික වේදිකාවක හෝ සකස්කළ අඩි පාරක කෙළ නොගැසිය යුතු ය.

25 (i) කිසිදු තැනැත්තෙකු විසින්, කිසිම වේලාවක දී, අළු, වැලි, ගල් අඟුරු, හිස කෙස්, පිහාටු හෝ වෙනත් යම් දෙයක්, ඒවා යම් පරිශ්‍රයක හෝ පොදු ස්ථානයකට සුළඟින් ගසා ගෙන යා හැකි පරිදි තැන්පත් කිරීම, තැබීම, හැලීම, සෙළවීම, ගැසීම, ඉවත් කිරීම, දැමීම, විසි කිරීම හෝ ඇවිස්සීම නොකළ යුතු ය.

(ii) ධාවනය වෙමින් පවත්නා හෝ නවත්වා තිබෙන හෝ වාහනයක්, ඉහත (1) වන උපවගන්තියේ යම් කඩ කිරීමක් සිදුවූයේ නම්, ඒ වේලාවේ ඒ වාහනයේ රියදුරු හෝ එහි පාලනය භාරව සිටි තැනැත්තා හෝ ඒ කඩකිරීම කරන ලද සේ සලකුණු තැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් එසේ නොවන බවට ඔප්පු කරන්නේ නම් මිස, වරදකරු කරනු ලැබීමට යටත් විය යුතු ය.

(iii) අවමගුල් පෙරහැරක් යන විට දී වැලි, බොරලු, කලු ගල් ආදිය කිසිවක් වීථිවල විසිර යන පරිදි හැලීම නොකළ යුතු ය.

26 කිසිදු තැනැත්තෙකු විසින්, නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව, නාගරික සීමාව තුළ යම් පොදු පිට්ටනියක හෝ මහා නගර සභාවට අයත් හෝ එහි භාරයේ පවත්නා යම් පිට්ටනියක හෝ ස්ථානයක සතුන් දිගෙලි කිරීම හෝ කරත්ත එක් රැස් කිරීම හෝ කුඩාරම් ගැසීම නොකළ යුතු ය.

27 නාගරික සීමාව තුළ වූ පොදු පිට්ටනියක් හෝ ස්ථානයක් මහා නගර සභාවට අයත් හෝ එහි භාරයේ පවතින පිට්ටනියක් හෝ ස්ථානයක්, නාගරික කොමසාරිස්වරයා විසින් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කරනු ලැබ ඇති යම් කාර්යයක් සඳහා නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව පාවිච්චි නොකළ යුතු ය.

28 මහා නගර සභාවට අයත් වූ හෝ එය භාරයේ පවතින්නා වූ යම් පොදු පිට්ටනියක් හෝ විනෝද උයනක් පාවිච්චි කරන තැනැත්තෙකු විසින් එහි කැළඹීමක් සිදුකිරීම හෝ එය පිට්ටනිය නීත්‍යානුකූල පාවිච්චි කරන වෙනත් තැනැත්තන් කෝප කරවන අන්දමට හෝ පීඩාවට පත් කරන අන්දමට හැසිරීම හෝ නොකළ යුතු ය. එවැනි පිට්ටනි යහපත් ලෙස හැසිරීමේ කොන්දේසියට සහ මහා නගර සභාව විසින් නියම කර ඇති රීතිවලට අනුකූලවීමට යටත්ව, රාත්‍රිය සඳහා එහි ගේට්ටුව වසන තෙක් සාමාන්‍යයෙන් දිවා එළිය පවතින කාලය තුළ මහජනයාට විවෘතව පවතින්නේය.

29 මහා නගර සභාවට අයත් හෝ එය භාරයේ පවත්නා වූ වැවක් හෝ පොකුණක් සහිත යම් පිට්ටනියක් හෝ විනෝද උයනක් පාවිච්චි කරන කිසිදු තැනැත්තෙකු විසින්, ඒ වැවේ හෝ පොකුණේ නෑම හෝ එහි ජලය නරක් කිරීමට හේතුවන වෙන යම් ක්‍රියාවක් කිරීම හෝ ඒ තුළ යම් පීඩාවක් සිදු කිරීම හෝ නාගරික කොමසාරිස්වරයාගේ අවසරය නොමැතිව, පැලැටි හෝ ගස් කැඩීම හෝ පිට්ටනියේ ඇති ගස්වලට සහ පඳුරුවලට යම් හානියක් කිරීම හෝ නොකළ යුතු ය.

30 කිසිදු තැනැත්තෙකු විසින් , යම් පොදු ස්ථානයක හෝ විනෝද උයනක මහා නගර සභාව විසින් සපයා ඇති යම් ආසනයක නිදා ගැනීම හෝ තම පතුල් දෙක ඒ මත තැබීම නොකළ යුතු ය.

31 යම් පිළිකුල් සහගත, බෝවන හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් පෙළෙන කිසිදු තැනැත්තෙකු විසින්, යම් පොදු ස්ථානයක හෝ විනෝද උයනක මහා නගර සභාව විසින් සපයා ඇති යම් ආසනයක වාඩිවීම හෝ එය පාවිච්චියට ගැනීම හෝ නොකළ යුතු ය.

32 යම් පොදු ස්ථානයක, හෝ විනෝද උයනක ඇති, කාන්තාවන් සහ ළමයින් සඳහා පමණි යන ලේබලය ගැසූ ආසනයක, වයස අවුරුදු දොළහකට වැඩි කිසිදු පිරිමියෙකු වැඩිවීම හෝ එය පාවිච්චි කිරීම හෝ නොකල යුතු ය. තමාගේ වයස අවුරුදු 12ට අඩු බව ඔප්පු කිරීමේ භාරය, මේ අතුරු ව්‍යවස්ථාව යටතේ චෝදනා නගනු ලැබූ යම් තැනැත්තාගේ වගකීම වන්නේය.

33 කිසිම තැනැත්තෙකු විසින්, යම් වාසස්ථානයක, ආලින්දයක හෝ යම් වාසස්ථානයක තත් කාර්යය සඳහා නිසි ලෙස පිළියෙල කරනු ලැබූ සහ නාගරික කොමසාරිස්වරයා විසින් කලින් අනුමත කරනු ලැබ නොමැති යම් කොටසක් හෝ යම් වීථියක හෝ පදික වේදිකාවක කොටසක් හෝ වෙනත් මහා නගර සභා දේපළක් හෝ සතුන් තබා ගැනීම, සේදීම හෝ සූදානම් කිරීම සඳහා භාවිතා නොකළ යුතු ය.

34 කිසිම තැනැත්තෙකු විසින් යම් පදික වේදිකාවක්, වීථියක් හෝ වාහන සඳහා වූ ප්‍රසිද්ධ නැවතුම්පලක් වශයෙන් වෙන්කර ඇති යම් ස්ථානයක් හෝ යම් පොදු ස්ථානයක් හෝ උද්‍යානයක් තුළ හෝ මත යම් වාහනයක් හෝ සතෙකු සේදීම හෝ සූදානම් කිරීම හෝ සේදීමට හෝ සූදානම් කිරීමට අවසර දීම හෝ සැලැස්වීම නොකළ යුතු ය.

35 යම් හරකෙකු, අශ්වයෙකු, බැටළුවෙකු, එළුවකු හෝ ඌරෙකු මියගිය යම් නිවසක හෝ ස්ථානයක පදිංචිකරු විසින්, එම සතාගේ මරණයෙන් පසු පැය හතරක් ඇතුළත හෝ එම මරණය සිදුවූයේ රාත්‍රි කාලයේ දී නම් ඉරු උදාවෙන් පසු පැය හතරක් ඇතුළත, එම මරණය පිළිබඳව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාට වාර්තා කළ යුතු අතර, මෙම මළකුණ බලපත්‍රලත් නිළධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව පදිංචිකරුට නාගරික කොමසාරිස්වරයා විසින් විධාන කරනු ලබන ආකාරයටද තත් කාර්ය සඳහා නියම කර ඇති ස්ථානයට ද පදිංචිකරු විසින් තමාගේම වියදමින් බැහැර කිරීම හෝ නාගරික කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයකට අනුව ඒ මළකුණ ඉවත් කිරීමේ වියදම බලයලත් නිලධාරියාට ගෙවීම හෝ කළ යුතු ය.

36 මායිම් තාප්ප හෝ හොඳ වැටවල් නොමැති යම් ඉඩමක හෝ ස්ථාන වටා ඇති එවැනි තාප්ප හෝ වැටවල් ඉදි කරන ලෙස නාගරික කොමසාරිස්වරයා විසින් එවැනි යම් ඉඩමක් එවැනි ස්ථානයක අයිතිකරුට නියම කළ හැකි අතර එවැනි තාප්ප හෝ වැටවල් ඇති අවස්ථාවක නම්, ඒවා නිසි අලුත්වැඩියා තත්ත්වයකට පත් කරන ලෙස හෝ යාබද මාර්ගයේ පාදමේ සිට නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කල නියම කරනු ලබන උසක් නොඉක්මවන උසක් දක්වා එම වැටවල, කපා හැඩ ගන්වන ලෙස හෝ තාප්ප පහත් කරන ලෙස නාගරික කොමසාරිස්වරයා විසින් එම ඉඩමේ හෝ ස්ථානයේ අයිතිකරුට, බදු ගැණුම්කරුට හෝ පදිංචිකරුට නියම කිරීම හෝ නාගරික කොමසාරිස්වරයාගේ මතය අනුව යම් වීථියක බාධාවක් හෝ හානියක් විය හැකි ලෙසට වීදියට පාත් වී ඇති සියලු ගස් කපා ඉවත් කරන හෝ අතු පාහින ලෙස නියම කිරීම නාගරික කොමසාරිස්වරයා විසින් කළ හැකිය.මේ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ නියමයන් පිළිබඳව ලිඛිත දැන්වීමක් අවස්ථාවෝචිත පරිදි අයිතිකරු, බදු ගැනුම්කරු හෝ පදිංචිකරු වෙත භාර දීම හෝ ඔහුගේ ලිපිනයට තැපැල් කර යැවීම කළ හැකි අතර, එම දැන්වීමේ සඳහන් කාල ඇතුළත හෝ නාගරික කොමසාරිස්වරයා විසින් දීර්ඝ කළ හැකි යම් කාල සීමාවක් ඇතුළත අයිතිකරු, බදු ගැනුම්කරු හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නියමයන් අනුව කටයුතු කළ යුතු ය. යම් ඉඩමක හෝ ස්ථානයක අයිතිකරු හෝ බදු ගැනුම්කරු හෝ පදිංචිකරු විසින් එම ඉඩම හෝ ස්ථානය පිරිසිදුව ද, පඳුරු, අකුල් හා වල්පැලැටි වලින් තොරව ද පවත්වාගත යුතු ය.

37 මහා නාගරික ප්‍රදේශයේ සීමා තුළ ඇති යම් ගසක අත්තක් හෝ ගෙඩියක් යම් නිවසක් හෝ ගොඩනැගිල්ලක් මත වැටී එහි පදිංචිකරුවන්ට තුවාල සිදු විය හැකි බව නාගරික කොමසාරිස්වරයා විසින් සලකනු ලබන කවර හෝ අවස්ථාවක හෝ එවැනි ගසක්, අත්තක් හෝ ගෙඩියක් වීදියකට පාත් වී තිබෙන කවර හෝ අවස්ථාවක එම ගස හෝ අත්ත හෝ ගෙඩිය කපා දමන හෝ ඉවත් කරන ලෙසට වූ ලිඛිත දැන්වීමක්, එම ගස ඇති භූමියේ අයිතිකරුට හෝ පදිංචිකරුට දීමට නාගරික කොමසාරිස්වරයා විසින් සැලැස්වීම නීත්‍යානුකූල වන්නේය. තවද, එවැනි දැන්වීමක් කිරීමෙන් දින තුනක් ඇතුළත එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් එය කැපීම හෝ ඉවත් කිරීම සිදු නොකළහොත් නාගරික කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් කම්කරුවන් විසින් එම භූමියට ඇතුළුවීම එම කාර්යය ඉටු කරවිය හැකිය. ඒ සඳහා දරන්නට සිදු වූ වියදම එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවිය යුතු වන අතර, එම වියදම (252 වන අධිකාරිය වන)

මහා නගර සභා ආඥාපනත මගින් ගෙවීමට විධාන කරන ලද වියදමක් වූ කලෙක මෙන් එම ආඥාපනතේ 294 සහ 295 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති පරිදි නිශ්චය කර, අයකර ගත යුතු ය.

38 යම් තැනැත්තෙකු විසින් ඉටු කරන, පහත දැක්වෙන ක්‍රියාවලින් කිසිම ක්‍රියාවක් නීත්‍යානුකූල නොවිය යුතු ය.

(1) දිගින් මීටර් 600 කට වැඩි දැව හෝ වෙනත් ද්‍රව්‍යයක් එහි කෙළවරවල් එකිනෙකට හෝ සිලිංග කරත්තයකට නොබැඳ රැගෙන යාම,

(2) දිගින් මීටර් 600 කට වැඩි යම් දැව හෝ වෙනත් ද්‍රව්‍ය එහි කෙළවරක් තවත් තැනැත්තෙකු විසින් ඔසවා ගනු ලැබ නොමැතිව ගෙන යාම.

(3) යම් කරත්තයක යකඩ කූරු ගෙන යන විට ඒවා කෙළවරවල් වලින් එකට නොබැන්දොත් ඇති වන ශබ්දය වැළැක්වීම සඳහා ඒවායේ කෙළවරවල් එකිනෙක එක්කොට නොබැඳ රැගෙන යාම,

(4) කරත්තයක තට්ටුවේ සිට මීටර් දෙකකට වැඩි උසකට දර, පීප්ප හෝ වෙනත් ද්‍රව්‍ය එම කරත්තයට පැටවීම,

(5) දැව, දර, රීප්ප, පිදුරු හෝ වෙනත් කවරාකාරයෙන් වූ හෝ බඩු කරත්තයක හෝ වාහනයක හරස් අතට රෝද වලින් පිටතට විහිදෙන සේම කරත්තයට හෝ වාහනයට පැටවීම.

39 මීට පෙරාතුවම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනිව යම් දැව හෝ ඉහත කී ද්‍රව්‍යක් පටවා ඇති හෝ ගෙනයනු ලබන යම් කරත්තයක් එම දැව හෝ වෙනත් ද්‍රව්‍ය එකී අතුරු ව්‍යවස්ථාවෙන් තහනම් කර නැති ආකාරයකට පටවනු ලබන තෙක් හෝ එසේ තහනම් කරනු ලැබ නැති ආකාරයට ගෙන යා හැකි වන සේ පිළියෙල කරනු ලබන තෙක් බලයලත් යම් මහා නගර සභා නිළධාරියෙකු හෝ පොලිස් නිළධරයෙකු විසින් රඳවා තබා ගැනීම නීත්‍යානුකූල වන අතර, එය එසේ රඳවා තබා ගැනීමට එවැනි නිළධරයෙකුට මෙයින් බලය දෙනු ලැබේ.

40 යම් කසල, කුණු රොඩු, ගඩොල්, කබොක්, කට්ටගල්, කළුගල්, හුණු හෝ වෙනත් භාණ්ඩ හෝ ද්‍රව්‍ය කරත්තවල තිරික්කවල හෝ වෙනත් වාහනවල මහා නගර සභා ප්‍රදේශය ඇතුළත යම් පීඩාවකට හේතුවන පරිදි යම් පාරක, වීදියක හෝ මංමාවතක අවහිරයක් හෝ පීඩාවක් ඇති වන පරිදි නොසැලකිලිමත් හෝ අනාරක්ෂිත ආකාරයකට හෝ ඒවායින් යම් කොටසක් වීදියට වැටීම වැළැක්වෙන පරිදි නිසි ලෙස ආරක්ෂා නොකර හෝ ගෙනයාම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

41 බඩු හෝ බර භාණ්ඩ ගෙන යාම සඳහා සාදන ලද යම් කරත්තයක් හෝ වාහනයක් බඩු හෝ බර වාහන ගෙන යාම වැළැක්වෙන වීථියට හෝ වීථි බවට නාගරික කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබ ඇති වීථි දිගේ පැදවීම, නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

42 (1) රැඳී නොසිට ගමන් කරන ලෙස පොලිස් නිලධරයකු විසින් අණ කරනු ලැබූ පසු යම් වීථියක නැවතී සිටින හෝ නිකරුනේ ගැවසෙන යම් තැනැත්තෙකු දඬුවම් ලැබිය හැකි වරදක් කරන්නෙකු ලෙස සැලකිය යුතු අතර ඔහුට විරුද්ධව 56 වන වගන්තිය අනුව ක්‍රියා කළ යුතු ය.

(2) බලපත්‍රලත් වාහනයක් හිමින් පදවන අවස්ථාවක හෝ ඇදගෙන යන අවස්ථාවක එම වාහනය වීථියේ වම් කෙළවර දිගේ හිමින් ගමන් කළ යුතු අතර, පිටුපස යන වාහන වලට වේගයෙන් ගමන් කරවීමට අවස්ථාව ලබාදිය යුතු ය.

(3) කිසිම තැනැත්තෙකු විසින් බයිසිකලයක්, ට්‍රයිසිකලයක් හෝ යාන්ත්‍රිකව ක්‍රියා කරන වාහන ඇතුළු වෙනත් වාහනයක් හෝ සතුන්, පදිකයන් සඳහා පමණක් වෙන් කර ඇති පා මඟක හෝ පදික වේදිකාවක ගමන් කරවීම, පැදවීම, ඇදගෙන යාම, තල්ලුකර ගෙන යාම හෝ ඒ මත මගීන් හෝ බඩු පැටවීම නොකළ යුතු ය. මේ රීතියේ ඇති තහනම ළදරු කරත්තවලට අදාල නොවිය යුතු ය.

(4) යාන්ත්‍රිකව ක්‍රියා කරන වාහනයකින් දුම් හෝ දෘශ්‍යමාන වාෂ්ප කරදරයක් වන පරිදි හෝ මහජනයාට පීඩාවක් හෝ අන්තරායක් ඇති කිරීමට හේතු වන පරිදි වූ ප්‍රමාණයකින් පිටකිරීමට සැලැස්වීම හෝ පිටවීමට ඉඩදීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

(5) යම් පොදු රථ නැවතුම්පලක නවතා තැබීමට බලය දී ඇති සංඛ්‍යාව ඉක්මවන පරිදි එම පොදු නැවතුම් පොලේ බලපත්‍රලත් වාහනයක් තබා ගෙන සිට අසුවන්නා වූ ද, එය ඉවත් කර ගන්නා ලෙස නාගරික කොමසාරිස් විසින් බලයලත් නිළධාරියෙකු හෝ පොලිස් නිළධාරියෙකු විසින් අණ කරනු ලැබූ විට එය ඉවත් කර ගැනීමට ප්‍රතික්ෂේප කරන්නා වූ ද, තැනැත්තෙකු දඬුවම් කරනු ලැබිය යුතු වරදක් කරන්නෙකු ලෙස සැලකිය යුතු ය. (රථ නැවතුම් පොලේ පිටවීමේ කෙළවරේ සිට බලයලත් සංඛ්‍යාව ගණන් කිරීමෙන් පසු අතිරික්ත බවට සොයා ගනු ලබන සංඛ්‍යාව අතිරික්ත වාහන ලෙස මේ වගන්තියේ කාර්ය සඳහා සැලකිය යුතු ය.)

43 ගොඩනැගිලිවල පිට පැත්තේ බිත්ති හා යම් ප්‍රසිද්ධ වීථියක යාව ඇති යම් බිත්තියක් අයිතිකරු, බදු ගැණුම්කරු හෝ පදිංචිකරු විසින් පිරිසිදුව ද තීන්ත හෝ හුණු ආලේප කිරීම්කර පවත්වා ගත යුතු ය.

44 (1) සභාවේ පරිපාලන සීමා ඇතුලත ඇති යම් ජලාශයක හෝ එහි ශාඛාවල යම් කොටසක කවර හෝ ක්‍රමයකින් මසුන් ඇල්ලීම හෝ ඇල්ලීමට තැත් කිරීම කිසිම තැනැත්තෙකු විසින් නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව නොකළ යුතු ය.

(2) සභාවේ පරිපාලන සීමා ඇතුලත ඇති යම් ජල ප්‍රදේශයක ජලය, කසල හෝ මල මුත්‍රා නිසා දූෂිත වී ඇති ලෙස යම් නිශ්චිත කාල සීමාවක් සඳහා, සැලකිය යුතු බව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් සහ එම ස්ථානයේ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් නාගරික කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක එම කාල පරිච්ඡේදය තුළ එම ජල ප්‍රදේශය තුළ කවර හෝ ක්‍රමයකින් මසුන් ඇල්ලීම හෝ ඇල්ලීමට තැත් කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

45 යම් ජලාශයක හෝ එහි ශාඛාවල හෝ එහි ඉවුරුවල හෝ ඒ මත කිසිම තැනැත්තෙකු විසින් මසුන් ඇල්ලීම සඳහා වූ යම් දැලක් හෝ වෙනත් උපක්‍රමයක් තම සන්තකයේ තබා නොගත යුතු ය.

46 කිසිම තැනැත්තෙකු විසින් යම් ජලාශයක හෝ එහි ශාඛාවල හෝ ඒ මත හෝ ඊට ඉහලින් හෝ සිටින්නා වූ ද, තමන්ගේ පුද්ගලික දේපල නොවන්නා වූ ද,යම් සතෙකු කවර හෝ ක්‍රමයකින් මැරීම, අල්ලා ගැනීම හෝ මැරීමට හෝ අල්ලා ගැනීමට තැත් කිරීම හෝ නොකළ යුතු ය.

47 (1) කිසිම තැනැත්තෙකු විසින් යම් කසළ, කුණු, රොඩු, කැත කුණු හෝ වෙනත් දුගඳ හමන හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් හෝ දෙයක් යම් ජලාශයකට හෝ ජලාශයකට වැටෙන යම් දිය පහරකට හෝ ජල මාර්ගයකට දැමීම හෝ දැමීමට ඉඩදීම නොකළ යුතු ය.

(2) සභාව විසින් අවසර දෙනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ යම් ජලාශයක, දිය පහරක හෝ ජල මාර්ගයක කෑම හෝ රෙදි, සතුන් හෝ වාහන සේදීම නොකළ යුතු ය.

48 මහා නගර සභාව විසින් යම් ජලාශයක නිශ්චිත ප්‍රදේශ, වන පක්ෂීන් සඳහා වෙන් කර තැබිය හැකිය. නාගරික කොමසාරිස්වරයා විසින් නිසි ලෙස බලය පවරනු ලැබුවහොත් මිස කිසිම තැනැත්තෙකු කවර හෝ කාර්යයන් සඳහා එවැනි නිශ්චිත ප්‍රදේශයකට හෝ ඒ තුළට ඇතුළු නොවිය යුතු ය.

49 කිසිම තැනැත්තෙකු විසින් පැදුරු, රෙදි හෝ වෙනත් දේ හෝ ද්‍රව්‍ය යම් වීථියක හෝ වීථියේ භූමි ප්‍රදේශයේ එල්ලා තැබීම හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රදර්ශනය කර තැබීම නොකළ යුතු ය. අවමංගල්‍ය, දේශපාලන හෝ කුමන උත්සවයක් සඳහා හෝ යොදා ගනු ලබන සැරසිලි සඳහා, නාගරික කොමසාරිස්ගේ අවසරය ලබාගත යුතු අතර, එම උත්සවය අවසානයේ දී අදාල තැනැත්තන් විසින් එම සැරසිලි ඉවත් කර ගත යුතු අතර, එසේ ඉවත් කිරීමට අපොහොසත් වුවහොත් උත්සවය අවසන් වී දින දෙකක් තුළ දී නාගරික කොමසාරිස් විසින් එම සැරසිලි ඉවත් කිරීම සඳහා වන වියදම අදාල තැනැත්තන්ගෙන් අයකර ගත යුතු ය.

50 නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ස්ථානයක හැර, යම් තැනැත්තෙකු විසින් යම් පෝස්ටර්, පත්‍රිකා, අත්පත්‍රිකා, හෝ වෙනත් දැන්වීම් යම් බිත්තියක, ගොඩනැගිල්ලක, නිවස, ස්ථානයක, ගසක හෝ වෙනත් ස්ථානයක ඇලවීම හෝ ගැසීම එයට ආධාර උපකාර කිරීම, අනුබලදීම නීත්‍යානුකූල නොවිය.

51 (1) යම් කරත්තයකට බඩු පටවන විට හෝ බඩු බාන විට එම කරත්තයේ යම් කොටසක බැඳ හෝ ගැට ගසා ඇති, එම කරත්තයට අයිති සතෙකු හැර, යම් නාගරික හෝ රජයේ ඉඩමක හෝ මහා නගර සභා ප්‍රදේශය ඇතුලත යම් මංමාවතක බැඳ, දිගෙලි කර අයාලේ යමින් හෝ සාත්තු කරනු ලබමින් සිට යම් තැනැත්තෙකු හමුවන යම් ගවයෙක, අශ්වයෙකු, බැටළුවෙකු, එළුවෙකු, හෝ වෙනත් සතෙකු එම තැනැත්තා විසින් අල්ලා ගැනීම හෝ නාගරික කොමසාරිස්වරයා විසින් ඒ සඳහා බලය දෙන ලද යම් තැනැත්තෙකු ලවා අල්ලා ගැනීමට සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) එසේ වුවද ඉහත කී පරිදි ඔහු විසින් අල්ලා ගනු ලබන සෑම සතෙකුම, ළගම පොලිස් ස්ථානය භාරව සිටින පොලිස් නිළධරයෙකුගේ භාරයට නොපමාව පත් කරනු ලැබිය යුතු ය. ඉහත කී පරිදි එවැනි යම් සතෙකු අල්ලා ගන්නා හෝ භාර ගන්නා සෑම එවැනි නිළධරයෙකුම එම අල්ලා ගැනීම පිළිබඳව නොපමාව නාගරික කොමසාරිස්වරයාට වාර්තා කළ යුතු ය. එම වාර්තා කිරීම කරන වේලාව වන විට එම සතා වෙනුවෙන් කිසිම හිමිකම් පෑමක් කරනු ලැබ නොමැති නම්, එම සතාගේ ආරක්ෂා භාරය සඳහා සහ නඩත්තුව සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසද, එම අල්ලා ගැනීම පිළිබඳව සිරිත් පරිදි දැන්වීම් පළකරන ලෙස ද, නාගරික කොමසාරිස්වරයා විසින් තම නිළධරයාට විධාන කළ යුතු ය.

(3) එවැනි යම් සතෙකු අල්ලා ගත් තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලබන මුදලක් සහ එම සතා එකී නිළධරයා භාරයේ තබාගත් එක් එක් දිනය සඳහා නියම කරනු ලබන වැඩිපුර මුදලක් එකී නිළධරයාගේ ප්‍රයෝජනය සඳහා නාගරික කොමසාරිස්වරයාට ගෙවනු ලැබුවහොත් මිස, එම සතා උගේ අයිතිකරුට භාරදෙනු නොලැබිය යුතු ය.

(4) එම සතා අල්ලා ගනු ලැබූ දිනයෙන් පසු දස දිනක් ඇතුළත කිසිම තැනැත්තෙකු ඒ සතා වෙනුවෙන් හිමිකම් පෑමක් නොකළහොත් හෝ ඉහත කී පරිදි වූ අය විය යුතු මුදල් නොගෙවුවහොත් එම නිළධරයා විසින් එම සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද, එම සතා අල්ලා ගත් තැනැත්තාට අනුමත මුදල ගෙවීමෙන් පසුව එම සතාගේ භාරය හා නඩත්තුව සඳහා තමාට අයවිය යුතු මුදල ලබා ගැනීමෙන් පසුව ඉතිරි වන එම විකිණීමෙන් ලත් මුදලක් වේ නම්, එය මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයාට ගෙවීමද නීත්‍යානුකූල වන අතර, එම කාර්යය එසේ සිදු කරන ලෙස එම නිළධාරියාට මෙයින් නියම කරනු ලැබේ.

52 එවැනි යම් සතෙකු අල්ලා ගනු ලැබ කොටු කරන ස්ථානයට ගෙන එන අතරතුර දී එම සතුන් අල්ලා ගන්නට යම් තැනැත්තෙකු විසින් විරෝධය පෑමක් කිරීම හෝ එවැනි යම් සතෙකු අල්ලා ගැනුමට ආසන්න අවස්ථාවේ දී එම සතුන් අල්ලන්නාට යම් තැනැත්තෙකු විසින් බාධාවක් කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

53 මහා නගර සභාවේ සීමා ඇතුලත යම් වීථියක ඇති යම් පහනක් දැල්වීම හෝ දැල්වීමට හෝ නිවීමට හෝ තැත් කිරීම හෝ කවර හෝ ව්‍යාජයකින් එවැනි යම් පහනක් අලුත්වැඩියා කිරීමට තැත් කිරීම හෝ ඉණිමගක ආධාරය ඇතිව හෝ නැතිව එවැනි යම් පහනක් සවි කර ඇති යම් කණුවකට නැගීම, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයෙන් හෝ සභාවෙන් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය ලබා ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

54 යම් පොදු කාණුවක් හෝ වෙනත් දිය පහරක් හෝ අපතේ යන ජලය හෝ වැසි ජලය බැහැර කිරීම සඳහා ස්ථාන දෙකකට නොඅඩු ගණනකට සේවය සැපයෙන වෙනත් කාණුවක් යම් තැනැත්තෙකු විසින් වැසීම, පුරවා දැමීම හෝ එහි ජලය නිදහසේ ගලා යෑමට බාධා කිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

55 අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයා විසින් සලකනු ලබන යම් කාණු, දැන්වීමේ දක්වනු ලබන කාල සීමාවක් ඇතුළත එම දැන්වීමේ දක්වනු ලබන ආකාරයට සාදන ලෙස ද, එම කාණු නිසි ලෙස නඩත්තු කරන ලෙස ද, නාගරික කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් යම් ස්ථානයක අයිතිකරුවන්ට නියම කිරීම අවශ්‍ය යැයි නාගරික කොමසාරිස්වරයාට පෙනී යන කවර හෝ අවස්ථාවක නාගරික කොමසාරිස්වරයා විසින් එසේ නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

56 දූෂිත ජලය බැසගෙන එන යම් ඉඩමක, කිසිම තැනැත්තෙකු විසින් විකිණීම හෝ පරිභෝජනය සඳහා එළවළු වැවීම හෝ යම් එළවළු වගාවකට දූෂිත ජලය යෙදීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

57 යම් පුද්ගලයකු මෙම අතුරු ව්‍යවස්ථාවෙන් කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර, බදුල්ල මහා නගර සභා සීමාව තුළ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක නඩු පවරනු ලැබීමකින් පසුව, වරදකරු බවට පත් වන්නේ නම්,

(අ) පළමු වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දාහක් (රු. 1,000) නොඉක්මවන දඩයකට ද,
(ආ) දෙවන වරට කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක (රු. 2,000) නොඉක්මවන දඩයකට ද,
(ඇ) නොකඩවා කෙරෙන වරදක් සම්බන්ධයෙන් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසු, එම කඩ කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ගරු නගරාධිපතිවරයා විසින් ලිඛිත දැන්වීමක් භාර දෙමින් පසුව වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

## LII වන කොටස

### බදුල්ල ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකාංගනය පවත්වා ගෙන යාම සඳහා වන අතුරු ව්‍යවස්ථාව

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්ති සමඟ කියවිය යුතු 28 (ආ) වැනි උපවගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාව විසින් ග්‍රීන්ලේන් ඩ්‍රයිව් මාර්ගයේ නාගරික අංගනය අසල පවත්වාගෙන යනු ලබන පිහිණුම් තටාකාංගනය නියමයන් සහ කොන්දේසි විධිමත් කිරීම, ඒ සඳහා ගාස්තු නියම කිරීම සහ අයකිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

මෙම අතුරු ව්‍යවස්ථාව සඳහා මෙම කෙටසේ xxxi වන අතුරු ව්‍යවස්ථාවේ පොදු කොන්දේසි අදාල වේ.

01. පිහිනුම් තටාකාංගනය පවත්වා ගෙන යාම —

මහා නගර සභාව විසින් පවත්වා ගෙන යනු ලබන්නේ නම් සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතු වේ. ඒ අනුව,

සේවා මුර 02 ක් ද, වේලාව :

1. පෙරවරු 7.00 - පස්වරු 3.00
2. පස්වරු 3.00 - රාත්‍රී .10.00

මහජනයාට විවෘතව තබන වේලාව : පෙරවරු 11.00 - රාත්‍රී 9.00

දෛනික නඩත්තු වේලාවන් : පෙ. ව. 7.00 - පෙරවරු 11.00
රාත්‍රී 9.00 - රාත්‍රී 10.00

එක් මුරයකට යොදවන සේවක සංඛ්‍යාව :

| | | |
|---|---|---|
| ස්ථාන භාර නිලධාරි | - | 01 |
| ජීවිතාරක්ෂක | - | 02 |
| තටාකාංගන සහයක | - | 03 |
| ආරක්ෂක නිලධාරි | - | 01 |

02. අවශ්‍ය සම්පූර්ණ කාර්ය මණ්ඩලය :

| | | |
|---|---|---|
| ඒකක භාර නිලධාරි | - | 01 |
| ජීවිතාරක්ෂක | - | 04 |
| තටාකාංගන සහයක | - | 01 |
| ආරක්ෂක නිලධාරි | - | 02 |
| | | 13 |

තටාකාංගනයේ වැඩ මුර 02 ක් පවත්වා ගෙන යාම සඳහා ඉහත සේවකයින් 13 දෙනා අත්‍යාවශ්‍ය වේ. මීට අමතරව දීමනා පදනම මත හෝ පිහිනුම් උපදේශකවරයෙකුගේ සේවය නිශ්චිත කාල සීමාවකට ලබා ගත යුතු වේ. ඒ අනුව පිහිනුම් උපදේශක අවම වශයෙන් දිනකට පැය 04 ක් වත් සේවය කළ යුතු වේ.

03. භාවිතය —

මෙම තටාකාංගනය සතියේ දිනවල උදය වරුවේ දී එනම් පෙරවරු 11.00 සිට පස්වරු 2.00 දක්වා, පාසැල් සඳහා ද සවස් වරුව මහජනතාව සඳහා ද ලබාදීම සුදුසු වේ.

මෙහි දී,

01. දෛනිකව පිහිනුම් තටාකාංගනය භාවිතා කරන්නන්ට පැයකට ගාස්තුවක් නියමකර භාවිතයට ලබා දීම,
02. මාසික ගාස්තුවක් හා ඇතුළත්වීමේ ගාස්තුවක් අයකර සාමාජික කාඩ්පත් ක්‍රමයක් හඳුන්වා දී භාවිතයට අවසර ලබාදීම,
03. පාසැල් ළමුන් සඳහා සතියේ දිනවල උදය වරුවේ දී පිහිනුම් තටාකාංගනය භාවිතයට අවස්ථාව ලබාදීම හා ඒ සඳහා සහනදායි ගාස්තුවක් අය කිරීම,
04. පාසැල් ළමුන් භාවිතයේ දී පිහිනුම් උපදේශකවරයෙකුගේ අධීක්ෂණය යටතේ පමණක් භාවිතයට අවසර ලබාදීම සුදුසු බවට යෝජනා කෙරේ.

04. *ගාස්තු අය කිරීම* : පහත පරිදි යෝජනා කරනු ලබයි.

| | | |
|---|---|---|
| පාසැල් ළමුන් සඳහා ඇතුළත් වීමේ මුල් ගාස්තු | = | 1000.00 |
| මාසික ගාස්තුව | = | 275.00 |
| 12% VAT | = | 153.00 |
| ඇතුළත් වීමේ ගාස්තුව | | 1428.00 |

සතියකට පැය 7 1/2
දිනකට පැය 2 1/2
පුහුණුකරු සමඟ පැමිණිය යුතු ය.
(වයස අවු. 08 ඉහළ ළමුන් සඳහා)

| | | |
|---|---|---|
| මාසික ගාස්තු | = | 275.00 |
| 12% VAT | = | 33.00 |
| | | 308.00 |

| | | |
|---|---|---|
| වැඩිහිටි අය සඳහා ඇතුළත් වීමේ ගාස්තුව | = | 2500.00 |
| මාසික ගාස්තුව | = | 1475.00 |
| 12% VAT | = | 477.00 |
| | | 4452.00 |

| | | |
|---|---|---|
| මාසික ගාස්තුව සඳහා | = | 1,475.00 |
| | = | 177.00 |
| | | 1,652.00 |

| | | |
|---|---|---|
| වැඩිහිටි අය සඳහා පැයකට | = | 220.00 |
| 12% VAT | = | 26.40 |
| | | 246.40 |

| | | |
|---|---|---|
| ළමුන් සඳහා පැයකට | = | 120.00 |
| 12% VAT | = | 14.40 |
| | = | 134.40 |

| | | |
|---|---|---|
| විදේශිකයෙකු සඳහා (සියලු ගාස්තු සමග) පැයකට | = | 1000.00 |

05. නඩත්තු කිරීම :

සේවය සඳහා යොදවන කාර්ය මණ්ඩලය දෛනිකව අනිවාර්යයෙන්ම පිහිනුම් තටාකාංගනයේ කළයුතු නඩත්තු කටයුතු පිළිබඳව වගකීමට බැඳී සිටී. මේ සම්බන්ධව ස්ථානභාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කළ යුතු වේ.

නඩත්තු වියදම (දළ)
දිනකට නඩත්තු කටයුතු සඳහා
(වැඩ මුර දෙකක් සඳහා)

| | | |
|---|---|---|
| ස්ථාන භාර නිලධාරි | - | 01 |
| ජීවිතාරක්ෂක | - | 04 |
| කම්කරු සහයක | - | 06 |
| ආරක්ෂක නිලධාරි | - | 02 |
| | | 13 |

පෙරවරු 7.00 - පස්වරු 3.00 දක්වා
පස්වරු 3.00 - රාත්‍රී 10.00 දක්වා

| | | |
|---|---|---|
| ස්ථානභාර නිලධාරි | = | 1,200.00 |
| පුහුණුකරු / උපදේශක සඳහා 1/2 DAY | = | 1,500.00 |
| ක්ලෝරීන් 5 Kg x 750/= | = | 3,750.00 |
| ජීවිතාරක්ෂකකරුවන් 4 x 1500/= | = | 6,000.00 |
| සහයකවරු 6 x 900/= | = | 5,400.00 |
| ආරක්ෂක (මුරකරු) 2 x 1200/= | = | 2,400.00 |
| | | 20,250.00 |
| ක්ෂය වීම් 5% | = | 1,012.50 |
| 25% add ජල හා විදුලි සඳහා | = | 5,062.50 |
| මුළු මුදල | = | 26,325.00 |
| එක් දිනක් සඳහා දැනට වියදම | = | 26,325.00 |
| මසක් සඳහා වියදම | = | 7,89,750.00 |

05. මෙම පිහිණුම් තටාකය භාවිතා කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවක පැකේජය හා පවුල් පැකේජය මගින් ද කළ හැකි වේ. මේ සඳහා සහනදායි මිල කිරීමක් ද හඳුන්වා දී ඇත.

මෙහි සඳහන් මිල ගණන් මහා නගර සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරන අතර එවැනි යෝජනා සම්මතයක් මගින් ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකිය. සභාවේ අනුමැතිව ඇතිව වාර්ෂිකව ගාස්තු සංශෝදන ගැසට් පත්‍රයේ පළවීමෙන් අනතුරුව ගාස්තු අයකිරීම වලංගු වන්නේ ය.

01-177

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2016** | | | |
| **ජනවාරි** | 2016.01.01 | සිකුරාදා | 2015.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.08 | සිකුරාදා | 2015.12.23 | බදාදා | දහවල් | 12.00 |
| | 2016.01.14 | බ්‍රහස්පතින්දා | 2016.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.22 | සිකුරාදා | 2016.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.29 | සිකුරාදා | 2016.01.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2016.02.05 | සිකුරාදා | 2016.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.12 | සිකුරාදා | 2016.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.19 | සිකුරාදා | 2016.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.02.26 | සිකුරාදා | 2016.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2016.03.04 | සිකුරාදා | 2016.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.11 | සිකුරාදා | 2016.02.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.18 | සිකුරාදා | 2016.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.24 | බ්‍රහස්පතින්දා | 2016.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.